කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சு

Ministry of Industry and Entrepreneurship Development











# ප්‍රගති වාර්තාව
# முன்னேற்ற அறிக்கை
# PROGRESS REPORT 2025

# ප්‍රගති වාර්තාව - 2025

**මෙම වාර්තාව දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට ද පරිවර්තනය කර ඇත.**

# නායකත්වය සහ මග පෙන්වීම



**ගරු. සුනිල් හඳුන්නෙත්ති**
**අමාත්‍ය, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය**



**ගරු. චතුරංග අබේසිංහ**
**නියෝජ්‍ය අමාත්‍ය, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය**



**ජේ.එම්. තිලකා ජයසුන්දර**
**ලේකම්, කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය**

# දැක්ම

“තිරසර සහ සැමට ප්‍රතිලාභ සැලසෙන වර්ධනයක් උදෙසා වන ගෝලීය තරඟකාරී ජාතික කර්මාන්ත පදනමක් ශ්‍රී ලංකාවේ ස්ථාපිත කිරීම”

# මෙහෙවර

"තාක්ෂණය, දැනුම සහ නවෝත්පාදන චින්තනය මත පදනම් වූ හිතකර පරිසරයක් නිර්මාණය තුලින් විවිධාංගීකරණය වූ, ඉහළ අගය එකතු කළ, නව්‍ය කාර්මික නිෂ්පාදන, පරිසර හිතකාමී ක්‍රමවේදයන් භාවිතය, ඉහළ වෙළඳපල ප්‍රවේශ අවස්ථා සහ සැමට ප්‍රතිලාභ ලැබෙන කර්මාන්ත සංවර්ධනයක් සඳහා දිරිගැන්වීම"

# අරමුණු

- **2024 වසරේ 26.7% ක් වූ දළ දේශීය නිෂ්පාදිතය සඳහා කර්මාන්ත අංශයේ දායකත්වය 2030 වසර වන විට 28% දක්වා වැඩි කිරීම.**

- **2024 වසරේ 16.4% ක්වූ දළ දේශීය නිෂ්පාදිතය සඳහා නිෂ්පාදන කර්මාන්ත අංශයේ දායකත්වය 2030 වසර වන විට 20% දක්වා වැඩි කිරීම.**

- **2023 වසරේ 3.2% ක්වූ ජාතික ආර්ථිකයට ව්‍යවසායකත්ව දායකත්වය 2030 වසර වන විට 10% දක්වා ඉහළ නැංවීම.**

- **2024 වසරේ ඇමරිකානු ඩොලර් බිලියන 12.7 ක් වූ කාර්මික (වෙළඳ භාණ්ඩ) අපනයන 2030 වසර වන විට ඇමරිකානු ඩොලර් බිලියන 28 දක්වා වැඩි කිරීම.**

- **2023 වසරේ 0.01% ක්වූ කර්මාන්ත කටයුතු සඳහා වෙන් කල ඉඩම් ප්‍රමාණය 2030 වසර වන විට 1% දක්වා වැඩි කිරීම. (ජාත්‍යන්තර සම්මතය 3%).**

## අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අංශ

1. ප්‍රතිපත්ති සංවර්ධන අංශය
2. කර්මාන්ත සංවර්ධන අංශය
3. ආංශික සංවර්ධන අංශය
   - 3.1 සංවර්ධන අංශ 1
   - 3.2 සංවර්ධන අංශ 2
   - 3.3 සංවර්ධන අංශ 3
4. කර්මාන්ත ලියාපදිංචි අංශය
5. ව්‍යාපෘති කළමනාකරණ ඒකකය
6. පොදු ව්‍යාපාර හා ප්‍රතිව්‍යුහගතකරණ අංශය
7. සාම්ප්‍රදායික කර්මාන්ත, මැණික් හා ස්වර්ණාභරණ අංශය
8. ව්‍යවසායකත්ව සංවර්ධන අංශය
9. සැලසුම් අංශය
10. පාලන අංශය
11. ගිණුම් හා ප්‍රසම්පාදන අංශය

## අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා

1. පේෂකර්ම දෙපාර්තමේන්තුව (DTI)
2. ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB)
3. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA)
4. කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් (KGLL)
5. ලංකා පිඟන් සංස්ථාව (ගඩොල් සහ උළු අංශය) (CCC)
6. ලංකා ඛනිජ වැලි සමාගම (LMSL)
7. ජාතික කඩදාසි සමාගම (NPC)
8. ලංකා ලේලන්ඩ් සමාගම (LLL)
9. සී/ ස ලංකා ෆොස්පේට් සමාගම (LPL)
10. ජාතික ලුණු සමාගම (NSL)
11. ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව (SLCC)
12. පරන්තන් කෙමිකල්ස් ලිමිටඩ් (PCCL)
13. සීමාසහිත බී.සී.සී. ලංකා සමාගම (BCC)
14. ජාතික මෝස්තර මධ්‍යස්ථානය (NDC)
15. ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟළුම් ආයතනය (SLITA)
16. ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල) (SLHB)
17. ජාතික ශිල්ප සභාව (NCC)
18. සීමාසහිත ලංකා සළුසල (LSL)
19. ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය (NGJA)
20. මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය (GJRTI)
21. කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය
22. උක් පර්යේෂණ ආයතනය (SCRI)
23. ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය (NPS)
24. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (SLEDB)
25. කන්තලේ සීනි සමාගම (KSCL)
26. සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම
27. ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම

# පටුන



| | |
|---|---|
| පෙරවදන | xiii |
| අමාත්‍යාංශයේ දිශානතිය | 01 |
| **ප්‍රධාන අංශ** | |
| ප්‍රතිපත්ති සංවර්ධන අංශය | 13 |
| කර්මාන්ත සංවර්ධන අංශය | 19 |
| ආංශික සංවර්ධන අංශය | |
| සංවර්ධන අංශ 1 | 25 |
| සංවර්ධන අංශ 2 | 29 |
| සංවර්ධන අංශ 3 | 32 |
| කර්මාන්ත ලියාපදිංචි අංශය | 35 |
| ව්‍යාපෘති කළමනාකරණ ඒකකය | 38 |
| පොදු ව්‍යාපාර හා ප්‍රතිව්‍යුහගතකරණ අංශය | 41 |
| සාම්ප්‍රදායික කර්මාන්ත, මැණික් හා ස්වර්ණාභරණ අංශය | 46 |
| ව්‍යවසායකත්ව සංවර්ධන අංශය | 52 |
| සැලසුම් අංශය | 57 |
| පාලන අංශය | 60 |
| ගිණුම් හා ප්‍රසම්පාදන අංශය | 62 |

# පටුන



| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | |
|---|---|
| රෙජිකර්ම දෙපාර්තමේන්තුව (DTI) | 67 |
| ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB) | 72 |
| ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA) | 77 |
| කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් (KGLL) | 81 |
| ජාතික කඩදාසි සමාගම (NPC) | 85 |
| ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ් (LMSL) | 88 |
| ලංකා පිගන් සංස්ථාව (CCC) | 90 |
| සී/ ස ලංකා ෆොස්පේට් සමාගම (LPL) | 93 |
| සී/ ස බී.සී.සී. ලංකා සමාගම (BCC) | 95 |
| සී/ස පරන්තන් කෙමිකල්ස් සමාගම (PCCL) | 98 |
| ජාතික ලුණු සමාගම (NSL) | 102 |
| ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව (SLCC) | 105 |
| ලංකා ලේලන්ඩ් සමාගම (LLL) | 108 |
| ශ්‍රී ලංකා රෙජිකර්ම සහ ඇඟළුම් ආයතනය (SLITA) | 109 |
| ජාතික මෝස්තර මධ්‍යස්ථානය (NDC) | 112 |
| ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල) (SLHB) | 118 |
| ජාතික ශිල්ප සභාව (NCC) | 120 |
| සී/ ස ලංකා සළුසල (LSL) | 125 |
| ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය (NGJA) | 128 |
| මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය (GJRTI) | 131 |
| සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම | 139 |
| කන්තලේ සීනි සමාගම (KSCL) | 142 |
| ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම | 144 |
| උක් පර්යේෂණ ආයතනය (SCRI) | 147 |
| ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (SLEDB) | 151 |
| ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය (NPS) | 157 |
| කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය | 162 |
| **මූල්‍ය ප්‍රගතිය** | |
| කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය | 165 |

# පෙරවදන

"පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" තේමාව කරගත් ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුකූලව ශ්‍රී ලංකාවේ කර්මාන්ත අංශයේ වර්ධනය සඳහා උපකාරී වන දැක්මක් සහිතව, අමාත්‍යාංශයේ මූලික අරමුණු සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය උපායමාර්ගික සැලසුම් සකස් කරමින් ඒවාට අදාළ සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පහසුකම් සැපයීම කර්මාන්ත අමාත්‍යාංශයේ මූලික කාර්යයභාරයයි.

ආර්ථික වර්ධනයේ නව පුනරුදයක් ඇති කරලීමට දේශීය නිෂ්පාදන කර්මාන්ත නැවත පනගැන්වීම සඳහා අවශ්‍ය මූල්‍ය සහන ලබා දීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට මෙන්ම නව කර්මාන්ත ක්ෂේත්‍රයන්හි ආයෝජනය සඳහා අවශ්‍ය පහසුකම් සැපයීමට මූල්‍ය ආයතන (බැංකු) සහ මුදල් අමාත්‍යාංශය සමග ඒකාබද්ධව මේ වසර තුළදී ක්‍රියාමාර්ග රාශියක් ගෙන ඇත.

තිරසර කර්මාන්ත සංවර්ධනයක් උදෙසා ඉවහල් වන ජාතික ප්‍රතිපත්තියක් මේ වන විට සකස් කර ඇති අතර ඊට අනුකූලව පස් අවුරුදු උපාය මාර්ගික ක්‍රියාකාරි සැලැස්ම (2025 - 2030) අමාත්‍යාංශය සහ අනුබද්ධ ආයතන විසින් සකස් කරමින් පවතින අතර එහි කටයුතු අවසන් අදියරේ පවතී.වේගවත් කර්මාන්ත සංවර්ධනයක් සඳහා අදාල වන පරිදි කර්මාන්ත සංවර්ධන පනත සංශෝධනය කිරීමේ කටයුතුද මූලික වශයෙන් නිමකොට ඇත.

සංවර්ධිත ප්‍රදේශවලට පමණක් කේන්ද්‍රගත වී ඇති කර්මාන්ත සංවර්ධනය ප්‍රාදේශීය මට්ටමින් ව්‍යාප්ත කිරීම සඳහා ප්‍රාදේශීය වශයෙන් ආයෝජන දිරි ගැන්වීමට අවශ්‍ය යටිතල පහසුකම් ලබාදීම සඳහා වූ වැඩසටහන් ගණනාවක් අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කර ඇත.

ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් හා ව්‍යවසායකයින් සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන්, මූල්‍ය පහසුකම් සැපයීම මෙන්ම උපාධිධාරී ව්‍යවසායකයින් ක්ෂේත්‍රයට හඳුන්වා දීම ආදී වැඩසටහන් රාශියක් අමාත්‍යාංශය යටතේ ඇති ආයතන මගින් පවත්වා ඇත.

කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන එළිදැක්වීම, ප්‍රවර්ධනය මෙන්ම විවිධ රටවල ජාත්‍යන්තර අත්දැකීම් හුවමාරු කර ගැනීම සඳහා ජාත්‍යන්තර කර්මාන්ත ප්‍රදර්ශනයක් පැවැත්වීමට කටයුතු කර ඇත.

ඛනිජ සම්පත් ප්‍රශස්ථ ලෙස භාවිතය, අගය එකතු කිරීම මෙන්ම අලාභ ලබන රාජ්‍ය ව්‍යවසායයන් ලාභ ලබන සහ වානිජමය ශක්‍යතාවයකින් හෙබි ව්‍යවසායයන් ලෙස ශක්තිමත් කිරීමට අවශ්‍ය පියවර රාශියක් ද අමාත්‍යාංශය මගින් හඳුන්වා දී ඇත.

# කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ දිශානතිය
## (2025 ජනවාරි සිට සැප්තැම්බර් මස දක්වා)

## 1. කර්මාන්ත සඳහා හිතකර නෛතික, නියාමන සහ ආයතනික පරිසරයක් නිර්මාණය කිරීමට සහාය වීම

### ජාතික කර්මාන්ත ප්‍රතිපත්තිය

- නව රජයේ "පොහොසත් රටක්, ලස්සන ජීවිතයක්" ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුකූල වන පරිදි නිෂ්පාදන ආර්ථිකයක් ගොඩනැඟීම සඳහා උපකාරී වන, ශ්‍රී ලංකාවේ කර්මාන්ත සංවර්ධනය සඳහා දැඩි අවශ්‍යතාවයක්ව පැවති ජාතික කර්මාන්ත ප්‍රතිපත්තිය (NaPID) සකස් කර ඇත.
- කර්මාන්ත ප්‍රතිපත්තියට අදාල 2025 – 2030 දක්වා කාලය සඳහා වන පස් අවුරුදු උපාය මාර්ගික සැලැස්ම ද (Strategic Plan) සකස් කරමින් පවතී. මේ පිළිබඳව දැනුවත් කිරීම සඳහා ඔක්තෝබර් 31, නොවැම්බර් 01 සහ 02 දිනවල අමාත්‍යාංශය සහ සියලු අනුබද්ධ ආයතනවල නිලධාරීන් සඳහා වැඩමුළුවක් පැවැත්වීමට සැලසුම් සකස් කර ඇත.

### කර්මාන්ත ප්‍රවර්ධන පනත සංශෝධනය කිරීම

- 1990 අංක 46 දරණ කර්මාන්ත ප්‍රවර්ධන පනත වත්මන් හා අනාගත අවශ්‍යතාවයන්ට ගැලපෙන අයුරින් සංශෝධනය කිරීමේ කටයුතු මේ වන විට අවසන් කර මුලික කෙටුම්පත සඳහා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ නිර්දේශ ලබා දී ඇති අතර අවසන් කෙටුම්පත සඳහා නව කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු කඩිනමින් ක්‍රියාවට නැංවීමට අපේක්ෂා කෙරේ.

### විද්‍යුත් වාහන එකලස් කිරීම සඳහා පහසුකම් සැපයීම.

### මෝටර් රථ එකලස් කිරීමේ කර්මාන්තය සඳහා ජාතික ප්‍රතිපත්ති සැකසීම

- මෝටර් රථ එකලස් කිරීමේ කර්මාන්තය සඳහා වන ජාතික ප්‍රතිපත්තියේ අවසන් කෙටුම්පත අවසන් කර ඇති අතර එය ක්‍රියාත්මක කිරීමට මඟ පෙන්වීම සඳහා සවිස්තරාත්මක උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමේ කටයුතු දැන් සිදුවෙමින් පවතී. මෙම උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්ම මඟින් මෝටර් රථ එකලස් කිරීමේ කර්මාන්තයේ සංවර්ධනය හා පරිවර්තනය මෙහෙයවීම සඳහා මැනිය හැකි අරමුණු, නිශ්චිත ක්‍රියාමාර්ග සහ නිශ්චිත කාලරාමු සහිත පැහැදිලි රාමුවක් සපයනු ඇත.

### ශ්‍රී ලංකාවේ මෝටර් රථ නිෂ්පාදන / එකලස් කිරීමේ කර්මාන්තය සහ මෝටර් රථ කොටස් නිෂ්පාදන කර්මාන්තය සඳහා සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටිය (SOP)

සම්මත මෙහෙයුම් පටිපාටිය ක්‍රියාත්මක කිරීමෙන් පසු, එකලස් කරන ලද මුළු මෝටර් රථ සංඛ්‍යාව 167,094කි. 2025 වර්ෂය තුල එකලස් කරන ලද මුළු වාහන සංඛ්‍යාව 70,792 ක් වන අතර එයට සිව් රෝද රථ 1,838 ක්, විදුලි ත්‍රිරෝද රථ 60 ක් සහ බයිසිකල් 68,894 ක් ඇතුළත් වේ.

### විදුලි හා ඉලෙක්ට්‍රොනික අයිතම දේශීය එකලස් කිරීම / නිෂ්පාදනය කිරීම

2025 දී ශීතකරණ, රෙදි සෝදන යන්ත්‍ර සහ අධිශීතකරණ වැනි විදුලි හා ඉලෙක්ට්‍රොනික උපකරණ දේශීයව එකලස් කිරීම සහ නිෂ්පාදනය කිරීම කැපී පෙනෙන වර්ධනයක් වාර්තා විය. දේශීය එකලස් කිරීම සඳහා උපකරණ ආකෘති 69 ක් අනුමත කර ඇති අතර ශීතකරණ ආකෘති 35 ක්, රෙදි සෝදන යන්ත්‍ර ආකෘති 26 ක් සහ අධිශීතකරණ ආකෘති 8 ක් ඇතුළත් වේ. මෙම වසර තුළ දේශීය නිෂ්පාදකයින්ගේ වර්ධන ධාරිතාව සහ තරඟකාරිත්වය පිළිබිඹු කරමින් දේශීය වෙළඳපොළට නව විදුලි උපකරණ මාදිලි 18 ක් හඳුන්වා දීමෙන් මෙම අංශය නවෝත්පාදනය සහ ව්‍යාප්තිය පෙන්නුම් කර ඇත.

### උපදේශක කමිටු පිහිටුවීම

දේශීය කර්මාන්ත ශක්තිමත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීමේ අවශ්‍යතාව සපුරාලීම මත කර්මාන්ත අංශ සඳහා නව උපදේශක කමිටු 20ක් පෞද්ගලික අංශය සහ රාජ්‍ය අංශයේ සහභාගීත්වය සහිතව පිහිටුවීමට කටයුතු කර ඇත. නව උපදේශක කමිටුවල ක්‍රියාකාරිත්වය හරහා ආනයනික නිෂ්පාදන අමුද්‍රව්‍ය සඳහා අයකරන තීරු බදු සඳහා සහන ලබා දීම සම්බන්ධයෙන් වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව සමඟ අවශ්‍ය කටයුතු සිදු කරමින් නිෂ්පාදන ගණනාවක් සඳහා තීරු බදු සහන ලබා දී ඇත. කර්මාන්ත ක්ෂේත්‍රයේ වර්ධනයක් ඇති කරලීම සඳහා මෙම කමිටු මේ වන විට ඉතා සාර්ථකව ක්‍රියාත්මක වේ.

### අමාත්‍යාංශය යටතේ පවතින සියළුම අංශ සහ ආයතන කාර්යසාධන ගිවිසුම් වලට එළඹීම

අමාත්‍යාංශය යටතේ පවතින සියළුම අංශ සහ ආයතනවලට කාර්යසාධන දර්ශක (KPI) ඇතුළත් කාර්යසාධන ගිවිසුම් සකස් කිරීමට මඟ පෙන්වීම හා එම ගිවිසුම් ප්‍රකාරව කටයුතු කිරීම වෙනුවෙන් ලේකම්තුමිය සමඟින් අදාළ අංශ/ ආයතන ප්‍රධානීන් ගිවිසුම්ගත කිරීමට කටයුතු කර ඇත. එම ගිවිසුම්වලට අනුකූලව කටයුතු ක්‍රියාත්මක වීමේ ප්‍රගතිය සමාලෝචනය සිදු කෙරෙනු ඇත.

### ජේෂකර්ම හා ඇඟලුම් අධ්‍යයන පීඨය ස්ථාපිත කිරීම

ශ්‍රී ලංකා ජේෂකර්ම හා ඇඟලුම් ආයතනය වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයන්හි සුවිශේෂී සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් ජේෂකර්ම හා ඇඟලුම් අධ්‍යයන පීඨය ස්ථාපිත කල අතර ජේෂකර්ම හා ඇඟලුම් ක්ෂේත්‍රය ආශ්‍රිත උපාධි පිරිනැමීමේ අනුමැතිය ලබා ගෙන ඇත.

### ශ්‍රී ලංකාවේ පාසල් ව්‍යවසායකයින් උදෙසා පවත්වන ජාතික පදක්කම් ප්‍රදානෝත්සවය

ජාතික පාසල් - කර්මාන්ත ව්‍යවසායකත්ව කව වැඩසටහනේ ප්‍රමුඛතම අවස්ථාව වන ජාතික පදක්කම් ප්‍රදානෝත්සවය, කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය, ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය සහ අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ එක්ව සාර්ථකව පවත්වන ලදී. මෙම පරිවර්තනීය මුලපිරීම පාසල් දරුවන් අතර ව්‍යවසායක චින්තනය පෝෂණය කිරීමට ඉවහල් වන අතර, කුඩා කල සිටම නවෝත්පාදනය, ඵලදායිතාව සහ කාර්මික වර්ධනයට දායක වීමට ඔවුන් බලගන්වයි.

## 2. කර්මාන්ත සහ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (MSME) සංවර්ධනය

### 2.1 කර්මාන්තපුර සහ යටිතල පහසුකම් ස්ථාපිත කිරීම

- අමාත්‍යාංශය යටතේ ඇති ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමින් ඇති කර්මාන්ත කලාප/කර්මාන්තපුර ස්ථාපනය කිරීමේ විශේෂ ජාතික වැඩසටහන යටතේ ප්‍රාදේශීය මට්ටමින් හඳුනාගත් ඉඩම් කඩිනමින් නිම කල හැකි අක්කර 1073.8 කින් යුත් කර්මාන්තපුරවල මූලික සංවර්ධන කටයුතු සිදු කරනු ලබයි. මේ යටතේ පවතින කර්මාන්තපුර 34ක සංවර්ධන කටයුතු ක්‍රියාත්මක වේ. මීට අමතරව කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB) යටතේ පවතින සහ නව කර්මාන්ත උද්‍යාන වලද සංවර්ධන කටයුතු ක්‍රියාත්මක වේ.

- මාර්ග සංවර්ධනය සඳහා රු.මි.271.77ක්ද සමඟ සූරියවැව කර්මාන්තපුරයේ සංවර්ධන කටයුතු අවසන් වන අතර එහි ඉඩම් ආයෝජකයින් අතර බෙදාදිය හැක.

### 2.2 නිෂ්පාදන කර්මාන්තයන්හි උප අංශ සඳහා සහය දැක්වීම

#### කර්මාන්ත ප්‍රවර්ධනය හා අලෙවිකරණය - කර්මාන්ත ප්‍රදර්ශන

- දේශීය කර්මාන්තකරුවන් සවිබල ගැන්වීමේ අරමුණින් කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය, ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB), අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අනෙකුත් ආයතන, අනෙකුත් රාජ්‍ය ආයතන සහ පෞද්ගලික අංශයේ සහයෝගයෙන් සංවිධානය කරන ජාත්‍යන්තර කර්මාන්ත ප්‍රදර්ශනය “Industry EXPO 2025” සැප්තැම්බර් 18 සිට 21 දක්වා BMICH හිදී පවත්වන ලදී.

- 2007 සිට වාර්ෂිකව පවත්වනු ලබන පාවහන් සහ සම්භාණ්ඩ අලෙවි ප්‍රදර්ශනය 2025 වර්ෂයේ පෙබරවාරි මස 6,7,8 සහ 9 යන දිනයන්හි දී බණ්ඩාරණායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී සාර්ථකව පවත්වන ලදී. මේ සඳහා දේශිය පාවහන් හා පාවහන් ආශ්‍රිත නිෂ්පාදකයින්ගේ වෙළඳකුටි 262ක් සංවිධානය කෙරිණි.

- දේශීය හා විදේශීය ප්‍රදර්ශකයින් විශාල පිරිසකගේ සහභාගීත්වයෙන් අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා ආහාර සැකසුම්කරුවන්ගේ සංගමය සමග ඒකාබද්ධව Profoods/Propack ප්‍රදර්ශනය 2025 අගෝස්තු මස 22, 23 සහ 24 යන දිනයන් වල දී බණ්ඩාරණායක සම්මන්ත්‍රණ ශාලාවේදී සාර්ථකව නිමකරන ලදී. මෙම ප්‍රදර්ශනයේ දී තෝරා ගනු ලැබූ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත වෙනුවෙන් සහන ගාස්තු මත විශේෂ ප්‍රදර්ශන මණ්ඩපයක් මගින් ප්‍රදර්ශන ඇතුළුව ප්‍රදර්ශන කුටි 380 ක් සඳහා දේශීය හා විදේශීය කර්මාන්ත 250 ක් පමණ සම්බන්ධ වීය.

- ඇසුරුම් නිෂ්පාදනයේ යෙදී සිටින දේශීය කර්මාන්ත වලට විදේශීය වෙළඳපොළ අවස්ථා වැඩිකර ගැනීමට “ලංකා පැක් -2025” ප්‍රදර්ශනය 2025 ඔක්තෝබර් මාසයේ 23, 24 හා 25 යන දිනයන්හි බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලවේදී පැවැත්වීමට සැලසුම් කර ඇත.

**අපනයන පිරිසැකසුම් සඳහා තාවකාලික ආනයන යෝජනා ක්‍රමය (TIEP)**

- තීරුබදු රහිතව අමුද්‍රව්‍ය ආනයනය කිරීමට පහසුකම් සැලසීම (අපනයන පිරිසැකසුම් සඳහා තාවකාලික ආනයන යෝජනා ක්‍රමය (TIEP)) මගින් කර්මාන්තවල අපනයන දිරිගන්වනු ලැබේ. මේ වන විට ඇසුරුම් අංශය, සැකසූ ආහාර, කුළුබඩු අංශය, කොහු ආශ්‍රිත නිෂ්පාදන අංශය, තේ අංශය, මැණික් හා ස්වර්ණාභරණ අංශය හා කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන අංශය වැනි නිෂ්පාදන වල අගය එකතු කිරීමේ නියුක්ත වෙමින් ඍජු හා වක්‍ර වශයෙන් 2025 සැප්තැම්බර් දක්වා අපනයනයට සම්බන්ධ කර්මාන්ත 263 ක් සඳහා TIEP පහසුකම් ලබා දී ඇති අතර ලිපි 456 සඳහා නිර්දේශ ලබා දී ඇත.

**නිෂ්පාදන කර්මාන්තවල තත්ත්වය හා ගුණාත්මකභාවය ඉහල නැංවීමේ වැඩසටහන්**

- කර්මාන්ත සඳහා තත්ත්ව සහතික, සුරක්ෂිතතා සහ ක්‍රමවේද සම්බන්ධව සහතික ලබා ගැනීම සඳහා (ISO 9001, ISO 14001, ISO 22000, ISO 50001) අමාත්‍යාංශය විසින් තත්ත්ව හා ඵලදායිතාවය ඉහළ නැංවීමේ වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.

- මෙම වැඩසටහන සැකසූ ආහාර කර්මාන්ත අංශය සඳහා සහ ඇසුරුම්කරණ කර්මාන්ත, අගය එකතු කළ තේ කර්මාන්ත, අගය එකතුකළ කුළුබඩු සහ කොහු කර්මාන්ත යන අනෙකුත් කර්මාන්ත අංශ නියෝජනය වන පරිදි 2025 වර්ෂය සඳහා කර්මාන්ත 58 ක් වෙනුවෙන් පහසුකම් ලබා දීමට අවස්ථාව සලසා ඇත. ISO සහතිකකරණය ක්‍රියාවලිය සාර්ථකව නිමකරන කර්මාන්ත සඳහා මූල්‍යමය පහසුකම් සැපයීම සිදු කරණු ලැබේ.

- අමාත්‍යාංශය විසින් ආහාර නිෂ්පාදනයේ යෙදී සිටින සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා යහපත් නිපැයුම් පරිචයන් (GMP) පිළිබඳ සහතිකපත් වැඩසටහන ක්‍රියාත්මක කර ඇත. තෝරාගත් කර්මාන්ත සඳහා GMP සහතිකයන් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI) හෝ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ GMP සඳහා ප්‍රතීතනය ලබා ඇති ආයතනයන් ගෙන් ලබා ගැනීමේ දී ඒ සඳහා අවශ්‍ය මාර්ගෝපදේශනය ලබාදේ. මෙම වැඩසටහන සඳහා කර්මාන්ත 27ක් 2025 වර්ෂයේදී තෝරා ගන්නා ලදී.

**ජාතික කර්මාන්ත දත්ත පද්ධතිය**

අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් ජාතික කර්මාන්ත දත්ත පද්ධතිය සකස් කිරීමේ කටයුතු මේ වන විට අවසන් කර ඇති අතර නොවැම්බර් මස 06 වන දින මෙහි සමාරම්භය සඳහා කටයුතු සිදු කෙරෙමින් පවතී.

## 2.3 ව්‍යවසායකත්ව සංවර්ධනය

**"උපාධිධාරී ව්‍යවසායකත්ව උද්‍යානය" වැඩසටහන**

- උපාධිධාරීන් ව්‍යාපාර ක්ෂේත්‍රයට සම්බන්ධ කරගැනීමේ අරමුණෙන් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විශ්ව විද්‍යාල හා එක්ව ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා "උපාධිධාරී ව්‍යවසායකත්ව උද්‍යානය" වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබේ.

- 2025 වර්ෂයේදී කැලණිය, රුහුණු, ශ්‍රී ජයවර්ධනපුර, කොළඹ සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලය යන විශ්ව විද්‍යාලවල විද්‍යාර්ථයින් 404 දෙනෙකු සඳහා ව්‍යවසායකත්ව පුහුණුව ලබාදී ඇත.

**තරුණ ව්‍යවසායකයින් 1000 ක් සංවර්ධනය කිරීමේ ජාතික වැඩසටහන (4 i ව්‍යාපෘතිය )**

- දිස්ත්‍රික්ක 17 ආවරණය කරමින් ව්‍යාපෘති සඳහා වන නිර්ණායක යටතේ ව්‍යවසායකයින් තෝරා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වන ලද අතර සම්මුඛ පරීක්ෂණයෙන් ව්‍යවසායකයින් 713 ක් තෝරා ගන්නා ලදී. දිස්ත්‍රික් ලේකම් කාර්යාල මඟින් සිදු කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාවෙන් පසු මෙම වැඩසටහන සඳහා සුදුසු ව්‍යවසායකයින් 504 ක් තෝරා ගන්නා ලදී.

- මෙම තෝරා ගන්නා ලද ව්‍යවසායකයින් සඳහා සමාරම්භක උත්සවය කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ ගරු. අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් සහ අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ සහ මෙම ව්‍යාපෘතියේ අදියර 1 සඳහා තෝරා ගන්නා ලද ව්‍යවසකයින්ගේද සහභාගීත්වයෙන් වෝටර්ස් එජ් ආයතනේදී පැවැත්වීමට සැලසුම් කර ඇත. ඒ අනුව මෙම තරුණ ව්‍යවසායකයින් සංවර්ධනය කර අපනයන වෙළඳපොළ දක්වා ව්‍යාපාර කටයුතු පුළුල් කිරීමට අවශ්‍ය කටයුතු අමාත්‍යාංශය මඟින් සිදු කිරීමට අපේක්ෂිතය.

## 2.4 ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සඳහා මූල්‍ය සහය

- කුඩා හා සුළු පරිමාණ කර්මාන්තයන්හි නායකත්ව සහ ව්‍යවසායකයින් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය III- (චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය) යටතේ 2025 වර්ෂය සඳහා රු. මි. 4000 ක් වෙන් කරමින් සහභාගිත්ව ණය දෙන ආයතන (බැංකු) 10 ක් හරහා ව්‍යාපෘතින් 201ක් සඳහා රු. මි1306ක ණය මුදල් ලබා දී ඇත.

- පරිසර හිතකාමී චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය II (E –Friend) යටතේ 2025 වර්ෂය සඳහා රු. මි. 1500 ක් වෙන් කරමින් සහභාගිත්ව ණය දෙන ආයතන (බැංකු) 11 ක් හරහා ව්‍යාපෘතින් 44 ක් සඳහා රු. මි. 396 ක ණය මුදල් ලබා දී ඇත.

## 2.5 මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්ත සංවර්ධනය

**මැණික් අපනයන ආදායම ඉහල නැංවීම**

- 2025 සැප්තැම්බර් මස 30 දින වන විට මැණික්, ස්වර්ණාභරණ හා දියමන්ති නිෂ්පාදන අපනයනය කිරීම තුළින් උපයාගෙන ඇති අපනයන වටිනාකම ඇමරිකන් ඩොලර් මිලියන **284** ක් වේ.

- 2025 වර්ෂයේදී **"Gem Sri Lanka – 2025"** ජාත්‍යන්තර මැණික් හා ස්වර්ණාභරණ ප්‍රදර්ශනය සාර්ථක ලෙස පවත්වන ලද අතර, දේශීය හා විදේශීය ප්‍රදර්ශන කුටි 103 ක් සංවිධානය කර තිබු අතර දෙස් විදෙස් ගැනුම්කරුවන් විශාල පිරිසක් එක්විය.

**ශ්‍රී ලංකාවේ නව මැණික් නිධි ගවේෂණය හා තක්සේරුව**

- ශ්‍රී ලංකාවේ භූමි ප්‍රමාණයෙන් තුනෙන් දෙකකට වඩා වැඩි ප්‍රමාණයක් එනම් 70% ක් පමණ මැණික් නිධි පවතින බව ඇස්තමේන්තු කර ඇති අතර, මෙම සම්පත් වලින් මේ වන විට 20% ක් පමණක් මේ දක්වා ගවේෂණය කර ඇත. මෙම තත්ත්වය යටතේ නව මැණික් නිධි ගවේෂණය ප්‍රමුඛ කාර්යයක් සේ හඳුනා ගෙන ඇති අතර, මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය විසින් නව තාක්ෂණය භාවිතා කරමින් නව මැණික් නිධි ගවේෂණය කිරීමට කටයුතු කරමින් පවතී. 2025 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය යටතේ ඉංගිරිය, දෙහිඕවිට, අයගම හා පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල මූලික මැණික් විභව සිතියම් ගත කිරීමේ කටයුතු අවසන් කර ඇත.

## 2.6 සාම්ප්‍රදායික කලා හා අත්කම් නිර්මාණ කර්මාන්ත සංවර්ධනය

- ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් දේශීය හස්ත කර්මාන්ත, සංචාරක කර්මාන්තය තුළ ප්‍රචලිත කිරීමේ හා ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව ලාක්ෂා නිර්මාණ ප්‍රමුඛ කොට නව නිර්මාණ ප්‍රදර්ශණයක් නොවැම්බර් මාසයේදී මහනුවරදී පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත.මෙහි මුලපිරීමක් ලෙස, පළමු අදියර මහනුවර කැන්ඩි සිටි සෙන්ටර් හි පැවැත්විණි. මෙම අවස්ථාවට නව නිර්මාණ 50 ක් ප්‍රදර්ශනය කරන ලද අතර දේශීය හා සංචාරකයින් ඇතුළු නරඹන්නන් 950 ක් පමණ ආකර්ෂණය විය.

- ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් සංචාරකයින්ට සහ දේශීය උනන්දුවක් දක්වන්නන්ට සාම්ප්‍රදායික අත්කම් අත්දැකීම් ලබා දීම අරමුණු කරගත් 'හැඩවැඩ සටහන' යන නව සංකල්පය යටතේ වැඩසටහන 03ක් ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන් සඳහා දේශීය හා විදේශීය ප්‍රතිලාභීන් 198 දෙනෙකු සහභාගී විය.

- ජාතික ශිල්ප සභාව මඟින් දිවයින පුරා විසිරී ඇති ශිල්පීය පුහුණු මධ්‍යස්ථාන 62 ක් හරහා හස්ත කර්මාන්ත ආශ්‍රිත පූර්ණ කාලීන පුහුණු වැඩසටහන්, සය මාසික ගුරු ශිල්පී පුහුණු වැඩසටහන සහ කෙටි කාලීන පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන අතර මේ දක්වා වැඩසටහන් 97ක් මඟින් 1272 දෙනෙකු සඳහා පුහුණු පහසුකම් ලබා දී ඇත.

## 2.7 ඛනිජ සම්පත් ආශ්‍රිත අංශ සංවර්ධනය

- ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් ආයතනය මඟින් 2025 සැප්තැම්බර් දක්වා ඉල්මනයිට්, රූටයිල්, සර්කෝන් ඇතුළු ඛනිජ මෙ.ටො.10,573 ක් පමණ නිෂ්පාදනය කර ඇත.

- අගය එකතු කිරීමකින් තොරව සිදුකෙරෙන ෆොස්පේට්, මිනිරන් හා අනෙකුත් ඛනිජ ද්‍රව්‍ය අපනයනයන් වෙනුවට කර්මාන්ත ක්ෂේත්‍රයේ දැවැන්ත පරිවර්තනයක් සිදු කරමින් අගය එකතු කිරීමේ කටයුතු සිදු කරන රාජ්‍ය පෞද්ගලික සහභාගීත්වය සහිත ආයෝජන පිළිබඳව අවධානය යොමු කර ඇත.

- ජාතික ඛනිජ ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා මූලික පියවර වශයෙන් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය සමඟ සාකච්ඡා පවත්වා ඇත.

## 3. ඵලදායිතාව වැඩිදියුණු කිරීම

### ජාතික ඵලදායිතා තරඟාවලිය හා සම්මාන ප්‍රදානෝත්සවය

Clean Sri Lanka ජාතික වැඩසටහන හා සමගාමීව, ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය මඟින් මානව සම්පත හා ආයතනික ඵලදායිතාව සංවර්ධනය කිරීම අරමුණු කරගනිමින් ජාතික ඵලදායිතා තරඟාවලිය හා සම්මාන ප්‍රදානෝත්සවය සංවිධානය කර ඇත. මෙහි සමාරම්භක උත්සවය 2025 මැයි 15 දින පවත්වන ලද අතර, රාජ්‍ය අංශය, පාසැල් අංශය සහ සේවා හා නිෂ්පාදන අංශය යන අංශයන්ට අයත් ආයතන, 5252ක් මේ වනවිට තරඟාවලිය සඳහා ලියාපදිංචි වී ඇත. ජයග්‍රාහී ආයතන සඳහා සම්මාන ප්‍රදානෝත්සවය 2026 වසර තුළදී පවත්වනු ලැබේ.

### ප්‍රජා ඵලදායිතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

“පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්” යන රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයට සමගාමීව, රටෙහි වෙසෙන ජනතාව ගෘහස්ථ ඵලදායීතාවයෙන් සවිබල ගැන්වීම තුළින්, ඉහළ වටිනාකමකින් යුත් ජීවිතයක් ළඟා කර දීමේ අරමුණින් මෙම වැඩසටහන Clean Sri Lanka වැඩසටහන යටතේ ක්‍රියාත්මක කෙරේ. සියළු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ කේන්ද්‍ර කර ගනිමින් 2025 - 2027 කාල පරාසය තුළ මෙම වැඩසටහන ක්‍රියාත්මක වීමට නියමිතය. අධ්‍යාපන, ආර්ථික, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව, ගෘහස්ථ කළමනාකරණය හා සමාජ යහපැවැත්ම, සංස්කෘතික හා අධ්‍යාත්මික සංවර්ධනය සහ පරිසර සංරක්ෂණය යන සංරචකයන් පාදක කර ගනිමින් දැනුම, කුසලතා සහ ආකල්පවලින් පරිපූර්ණ ජනතාවක් සහ ඵලදායිතා ආදර්ශ ගම්මාන බිහිකිරීම මෙම ව්‍යාපෘතිය මගින් සිදුවනු ඇත.

### ඵලදායිතාවය පිළිබඳ ශාස්ත්‍රීය සම්මන්ත්‍රණය පැවැත්වීම

මෙම වැඩසටහන 2024 වසර තුලදී ආරම්භ කරන ලද අතර, 2025 සහ 2026 වසරේදීද ක්‍රියාත්මක වනු ඇත. ඉදිරිපත් වන පර්යේෂණ පත්‍රිකාවන් විශේෂඥ දැනුමින් හෙබි සම්පත් දායක මඩුල්ලක් මගින් ඇගයීමට ලක්කරන අතර, ශාස්ත්‍රීය සම්මන්ත්‍රණය හරහා පර්යේෂණ පත්‍රිකා ප්‍රකාශයට පත් කෙරෙනු ඇත.

### ආසියානු ඵලදායිතා සංවිධානයේ දායකත්වය මත සිදුකෙරෙන සහතිකකරණ වැඩසටහන (NPS Certification Body)

ආසියානු ඵලදායීතා සංවිධානයේ සම්මතයන්ට අනුව ඵලදායීතා විෂය ක්ෂේත්‍රයේ නියුතු වෘත්තිකයන් ප්‍රතීණනය කිරීම සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක වනු ඇත. මෙමගින් ශ්‍රී ලංකාවේ ඵලදායීතා වෘත්තිකයන්ට ජාත්‍යන්තර අගය දාමයට පිවිසීමේ අවස්ථාවන් හිමිවනු ඇත.

### Citizen Mirror - ප්‍රාදේශීය ඵලදායිතා දර්ශකය - 1.0

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛත ම රාජ්‍ය සේවා සැපයුම් ආයතන වර්ගය වන ප්‍රාදේශීය ලේකම් කායීලයන්හි ඵලදායීතාවය පදනම්ව ආයතන ඇගයීම මේ තුලින් සිදුවනු ඇත. 2024 වසර තුලදී මෙහි මූලික කටයුතු ආරම්භ කරන ලද අතර, ගුණාත්මක දර්ශක ක්‍රියාත්මක කිරීම 2025 - 2026 වසර තුලදී සිදුවනු ඇත.

## 4. අපනයන ඉහල නැංවීම සහ ප්‍රවර්ධනය

### වාර්තාගත අපනයන ආදායමක් ලබා ගැනීම

- අපනයන භාණ්ඩ හා සේවා විවිධාංගිකරණය ප්‍රවර්ධනය කිරීම හා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම කටයුතු 2025 වසරේදීද මේ දක්වා සිදු කරමින් පවතී.
- තවද, අපනයන මූල්‍ය පහසුකම්, සහතික කිරීම්, භාණ්ඩවල ඉල්ලුම් ප්‍රවණතා, නව වෙළඳපොළ සොයා ගැනීමට සහයවීම්, නිෂ්පාදන සහ ගෝලීය වටිනාකම් දාමයන් පිළිබඳව තොරතුරු සැපයීම වැනි සේවාවන් අපනයනකරුවන්ට සැපයීම සිදු කරමින් පවතී.
- 2025 සැප්තැම්බර් වනවිට ශ්‍රී ලංකාවේ සමස්ත අපනයන ආදායම ඇමරිකානු ඩොලර් බිලියන 12.96ක් වාර්තා වී ඇති අතර මෙය 2024 වර්ෂය හා සැසඳීමේදී 7% කට ආසන්න වර්ධනයක් පෙන්වයි.

### අපනයන සංවර්ධන අමාත්‍ය කමිටුව

- අවුරුදු 28කට පසු පළමු වතාවට ගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් අපනයන සංවර්ධන අමාත්‍ය කමිටුව (Committee of Ministers for Export Development) රැස් වූ අතර මෙම මැදිහත්වීමෙන් අපනයනකරුවන් මුහුණ පා ඇති ගැටලුවලට තිරසාර විසඳුම් ලබා දීමත්, අපනයනකරුවන් දිරිමත් කිරීමට අවශ්‍ය පහසුකම් සැපයීම යටතේ අවශ්‍ය පුහුණුව, වෙළඳපොළ අවස්ථා සපයා දීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලදී.

### විදේශ තානාපති සේවය මගින් අපනයනකරුවන්ට අවස්ථා සැලසීම

- ශ්‍රී ලංකාවේ පළමු වතාවට තානාපති සේවය මගින් අපනයනකරුවන්ට ඇති අවස්ථා සොයා බැලීමට හා විදේශ වෙළඳපොළ සොයා ගැනීමට අපනයන සංවර්ධන මණ්ඩලය සහ විදේශ කටයුතු අමාත්‍යාංශය ඒකාබද්ධව වැඩපිළිවෙලක් ආරම්භ කර ඇත.

### ජාතික අපනයන සංවර්ධන සැලැස්ම 2025–2029

- ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය, කර්මාන්ත හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති-මූලික ණය වැඩසටහන යටතේ ආසියානු සංවර්ධන බැංකුව (ADB) සමඟ එක්ව ජාතික අපනයන සංවර්ධන සැලැස්ම (NEDP) 2025–2029 ආරම්භ කර ඇත. NES 2018–2022 මත පදනම්ව, NEDP ශ්‍රී ලංකාවේ අපනයන අංශය ශක්තිමත් කිරීම සඳහා දත්ත මූලික සැලැස්මක් සපයයි. මෙහිදී ඩිජිටල්කරණය, තිරසාරභාවය, වෙළඳ පහසුකම් සැපයීම, ගෝලීය තරඟකාරීත්වය, යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ තාක්ෂණ නව්‍යකරණය මූලික කර ඇත.

### අපනයන ප්‍රවර්ධනය සඳහා අපනයනකරුවන්ට ප්‍රදර්ශන සඳහා සහභාගී වීමේ අවස්ථාවන් සැලසීම

- 2025 වර්ෂයේදී, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) ජාත්‍යන්තර ප්‍රදර්ශනවල ශ්‍රී ලංකා සමාගම් 142කට (කුඩා සහ මධ්‍යම ව්‍යවසාය 66ක් ඇතුළුව) සහභාගී වීමට පහසුකම් සලසා දුන් අතර, ඒ අතර Gulfood, Biofach, IFE (UK), Hong Kong Gift & Lifestyle Fair, Natural & Organic Product UK, Foodex Saudi 2025, Seafood Expo Global, SIAL Canada, Japan IT Week, Thaifex Anuga Asia, සහ Middle East Rubber & Tyre Expo වැනි ප්‍රමුඛ ජාත්‍යන්තර ප්‍රදර්ශන ඇතුළත් වේ. මෙම ප්‍රදර්ශන ශ්‍රී ලංකා අපනයනකරුවන්ට වෙළඳපොළ ප්‍රවේශය පුළුල් කිරීමේ සහ ගෝලීය දෘශ්‍යමානතාව ශක්තිමත් කිරීමේ අවස්ථා සපයයි.

## 5. ප්‍රතිව්‍යුහගත කිරීම සහ රාජ්‍ය ව්‍යවසාය සංවර්ධනය

- “රජයට අයත් වාණිජමය නොවන ආයතන පිළිබඳ සමාලෝචනය කිරීම” යන මැයෙන් අතිගරු ජනාධිපතිතුමා විසින් 2024.12.13 දිනැතිව ඉදිරිපත් කරන ලද අංක 24/2198/801/008 දරණ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ලද අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව පත් කරන ලද නිලධාරී කමිටුව විසින් එකම හෝ සමාන කාර්යයන් ඉටු කරනු ලබන ආයතන හඳුනා ගැනීමෙන් අනතුරුව එම ආයතන ඒකාබද්ධ කිරීම, ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කර ඇත.මීට අමතරව රජයට වැය බරක් වූ / භාණ්ඩාගාරය මත යැපෙන ආයතන සම්බන්ධයෙන් ද එම නිලධාරී කමිටුව නිර්දේශ ඉදිරිපත් කර ඇති අතර එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය 2025.03.17 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී ලැබී ඇත.

- ඒ අනුව කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය යටතේ වන පහත සඳහන් ආයතනවලට අදාලව පහත පරිදි ගෙන ඇති අමාත්‍ය මණ්ඩල තීරණ අනුව අමාත්‍යාංශය යටතේ වන ආයතන ප්‍රතිව්‍යුහගත කිරීමට අදාල ඉදිරි කටයුතු මේ වන විට සිදුවෙමින් පවතී.

    - ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය, ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය සහ කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන කුඩා ව්‍යවසාය සංවර්ධන අංශය මෙරට කර්මාන්ත ක්ෂේත්‍රයේ අභිවෘද්ධියට මෙන්ම කර්මාන්තකරුවන් නගා සිටුවීම සහ දේශිය හා විදේශ වෙළඳපොළ අවස්ථා සලසා දීමට අවශ්‍ය පහසුකම් සැලසීමේ පොදු අරමුණින් ක්‍රියාත්මක වන බැවින්, මෙම ආයතන 02හි සහ අමාත්‍යාංශයේ කුඩා ව්‍යවසාය සංවර්ධන අංශයෙහි විෂය පථය සහ ඉටු කෙරෙන කාර්යයන් සම්බන්ධයෙන් විස්තරාත්මක අධ්‍යයනයක් සිදුකර ඒවා ඒකාබද්ධ කර වඩාත් බලාත්මක තනි ආයතනයක් වශයෙන් ස්ථාපනය කිරීම.

    - ජාතික ශිල්ප සභාව, ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල) සහ ජාතික මෝස්තර මධ්‍යස්ථානය යන ආයතන මගින් සිදු කරනු ලබන කාර්යයන් එකම අරමුණක් කෙරෙහි ඉලක්කගතව ඇති බැවින් එම සියළුම කාර්යයන් වඩාත් කාර්යක්ෂම හා රට තුල හා ජාත්‍යන්තර පරිසරය තුල ක්‍රියාත්මක වන ප්‍රවණතාවයන්ට ගැලපෙන අයුරින සිදු කිරීමට සමත් එක් ආයතනයක් බවට පත් කිරීම.

    - මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය, ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ පර්යේෂණ අංශය වශයෙන් ස්ථාපනය කිරීමට අවශ්‍ය ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණය සිදු කිරීම.

# ප්‍රධාන අංශ

# 01

# ප්‍රතිපත්ති සංවර්ධන අංශය

## 1.1 හැඳින්වීම

රටක ආර්ථික ප්‍රගමණය සඳහා කර්මාන්ත අංශය සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරන අතර තිරසාර සංවර්ධනයේ ප්‍රධාන පාර්ශවයක් ලෙස ක්‍රියා කරයි. නිෂ්පාදන, ඉදිකිරීම් සහ පතල් කැණීම් වැනි ප්‍රධාන ක්ෂේත්‍ර ආවරණය වන කර්මාන්ත අංශය, දළ දේශීය නිෂ්පාදිතයට (GDP) සැලකිය යුතු ලෙස දායක වන අතර නවෝත්පාදනය, තාක්ෂණික දියුණුව සහ අගය එකතු කිරීම සඳහා උත්ප්‍රේරකයක් ද වේ. ශක්තිමත් කර්මාන්ත පදනමක් ඵලදායිතාව සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කරනවා පමණක් නොව, රැකියා අවස්ථා උත්පාදනය කිරීම, ව්‍යවසායකත්වය පෝෂණය කිරීම සහ කෘෂිකර්මාන්තය හා සේවා සමඟ සම්බන්ධතා ශක්තිමත් කිරීම වැනි ආර්ථිකයේ අනෙකුත් අංශ කෙරෙහිද බලපායි.

රටේ කර්මාන්ත වර්ධනය ව්‍යුහාත්මක හා තිරසාර ආකාරයකින් මෙහෙයවීම සඳහා ශක්තිමත් සහ ඵලදායී ලෙස ක්‍රියාත්මක කරන ලද කර්මාන්ත ප්‍රතිපත්තියක් අත්‍යවශ්‍ය වේ. එවැනි ප්‍රතිපත්තියක් ප්‍රමුඛතා නිර්වචනය කරන, පැහැදිලි අරමුණු සකස් කරන සහ ආයෝජන, නවෝත්පාදන සහ තාක්ෂණ හුවමාරුව සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කරන උපායමාර්ගික සැලැස්මක් ලෙස ක්‍රියා කරයි. ප්‍රමාණවත් යටිතල පහසුකම් නොමැතිකම, මූල්‍ය සඳහා සීමිත ප්‍රවේශය සහ තාක්ෂණික හා කළමනාකරණ කුසලතා හිඟය ඇතුළු කර්මාන්ත අංශය මුහුණ දෙන ප්‍රධාන අභියෝගවලට මුහුණ දීමේදී ද එය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි.

අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති සංවර්ධන අංශය, ශ්‍රී ලංකාවේ කර්මාන්ත වර්ධනයේ දිශානතිය සහ පියවර සැකසීමට සම්බන්ධ වේ. ප්‍රතිපත්ති සම්පාදනය, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය සඳහා වගකිව යුතු අංශය ලෙස, කර්මාන්ත සංවර්ධනය රටේ ජාතික ආර්ථික අරමුණු සහ දිගුකාලීන දැක්ම සමඟ උපායමාර්ගිකව පෙළගැසී ඇති බව සහතික කරයි. ප්‍රතිපත්ති සංවර්ධන අංශයේ කාර්යයන් සඳහා කර්මාන්ත අංශය තුළ නැගී එන අවස්ථා සහ අභියෝග හඳුනා ගැනීම, සාක්ෂි මත පදනම් වූ ප්‍රතිපත්ති සංවර්ධනය කිරීම සහ තිරසාර කාර්මිකකරණය ප්‍රවර්ධනය කරන විශ්වාසදායක රාමුවක් නිර්මාණය කිරීම ඇතුළත් වේ.

### කර්මාන්ත සංවර්ධනය සඳහා ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

දේශීය නිෂ්පාදන කර්මාන්ත අංශයෙහි අභිවෘද්ධිය සඳහා සුදුසු උපායමාර්ගික දිශානතියක් නොමැති වීම සැලකිල්ලට ගෙන අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති සංවර්ධන අංශය විසින් පුළුල් අදහස් විමසීමක් මත පදනම්වී කර්මාන්ත සංවර්ධනය සඳහා වන ජාතික ප්‍රතිපත්තිය 2022 වර්ෂයේදී සකස් කරන ලදී.

මෙම කර්මාන්ත සංවර්ධනය සඳහා වන ජාතික ප්‍රතිපත්තිය, වෙළඳ, ඉඩම්, පරිසර ආදී අනෙකුත් ප්‍රතිපත්තීන් සමඟ ගැටුමක් ඇති නොවන පරිදි රාජ්‍ය ආයතනයන් සම්බන්ධීකරණය කිරීම තුළින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

### ශ්‍රී ලංකාවේ මෝටර් රථ නිෂ්පාදන / එකලස් කිරීමේ කර්මාන්තය සහ මෝටර් රථ කොටස් නිෂ්පාදන කර්මාන්තය සඳහා සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටිය (SOP)

ප්‍රතිපත්ති සංවර්ධන අංශයේ ප්‍රධාන කාර්යයන්ගෙන් එකක් වන්නේ නිෂ්පාදන බදු සහන නිර්දේශ කිරීම සහ ශ්‍රී ලංකාවේ මෝටර් රථ කර්මාන්තයේ වර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය පියවර ක්‍රියාත්මක කිරීමයි. මේ සඳහා කාර්යක්ෂමව සහ විනිවිදභාවයෙන් කටයුතු කිරීම සඳහා අමාත්‍යාංශය විසින් මෝටර් රථ නිෂ්පාදනය/ එකලස් කිරීම හා මෝටර් රථ උපාංග කොටස් නිෂ්පාදනයට අදාල මාර්ගෝපදේශ සහ රෙගුලාසි ඇතුලත් සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටියක් (SOP) හඳුන්වා දී ඇත.

මෙම සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටිය (SOP) මඟින් දේශීය මෝටර් රථ උපාංග කොටස් නිෂ්පාදනය හා එම දේශීය උපාංග කොටස් භාවිතා කර දේශීයව වාහන නිෂ්පාදනය හා එකලස් කිරීම දිරිමත් කරයි. මෙම දේශීය අගය එකතු කිරීමේ ක්‍රියාවලිය තුළින් රැකියා අවස්ථා නිර්මාණය වීම, තාක්ෂණික කුසලතා වර්ධනය වීම, තාක්ෂණික හැකියාවන් වැඩි දියුණු වීම තුළින් ජාතික සැපයුම් දාමය ශක්තිමත් කිරීම සඳහා උපකාරී වන අතර එමඟින් දේශීය මෝටර් රථ අංශයේ සමස්ත වර්ධනයට මෙන්ම තරඟකාරී පරිසරයක් ද නිර්මාණය වී ඇත.

### මෝටර් රථ එකලස් කිරීමේ කර්මාන්තය සඳහා ජාතික ප්‍රතිපත්ති සැකසීම

තිරසාර කර්මාන්ත සංවර්ධනය සඳහා සහාය දැක්වීම සහ තරඟකාරී පරිසරයක් පෝෂණය කිරීම මඟින් දේශීය මෝටර් රථ අංශයේ වර්ධනය වේගවත් කිරීම මෝටර් රථ එකලස් කිරීමේ කර්මාන්තය සඳහා වන ජාතික ප්‍රතිපත්තියේ අරමුණයි. එය දේශීය හා විදේශීය ආයෝජන ආකර්ෂණය කර ගැනීම, නවෝත්පාදනයන් දිරිමත් කිරීම සහ දේශීය මෝටර් රථ කර්මාන්තය සුරක්ෂිතභාවය සහ ගුණාත්මක ප්‍රමිතීන් පවත්වා ගැනීම අරමුණු කරයි. එසේම, හරිත තිරසාර අනාගතයක් සුරක්ෂිත කිරීම සඳහා ශ්‍රී ලංකාව ගුණාත්මක ප්‍රමිතියෙන් යුත් විදුලි මෝටර් රථ එකලස් කිරීම තුළින් පාරිසරික සංරක්ෂණය සඳහා වන ජාත්‍යන්තර කැපවීම සමඟ ඉදිරියට ගෙනයාම කෙරෙහි මෙම ප්‍රතිපත්තියේ දැඩි අවධානයක් යොමු කර ඇත. තවද, ශ්‍රී ලංකාවේ පරිණාමය වෙමින් පවතින මෝටර් රථ කර්මාන්තය තුළ කාර්යක්ෂමතාව, තරඟකාරිත්වය සහ අනුවර්තනය වීමේ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා කුසලතා

සංවර්ධනයේ වැදගත්කම සහ ඩිජිටල් තා ක්ෂණයන් භාවිතා කිරීමේ වැදගත්කම එය ඉස්මතු කරයි.

### විදුලි හා ඉලෙක්ට්‍රොනික අයිතම දේශීය එකලස් කිරීම / නිෂ්පාදනය කිරීම

දේශීය අගය එකතු කිරීම මඟින් විදුලි හා ඉලෙක්ට්‍රොනික උපාංග දේශීයව එකලස් කිරීම සහ නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීමේ කාර්යයන් ද ප්‍රතිපත්ති සංවර්ධන අංශය සිදු කරනු ලබයි. ඒ සඳහා HS කේත 84 සහ 85 යටතේ වර්ගීකරණය කර ඇති දේශීයව එකලස් කරන ලද හෝ නිෂ්පාදනය කරන ලද උපාංග සඳහා නිෂ්පාදන බදු නිදහස් කිරීමේ නිර්දේශ ලබාදීමේ කාර්යය ප්‍රතිපත්ති අංශය නිරතුරුව සිදු කරනු ලබයි.

මෙම දේශීය නිෂ්පාදනය දිරිමත් කිරීම මඟින් දේශීයව නිපදවන විදුලි උපකරණවල තරඟකාරිත්වය වැඩි දියුණු ක්‍රියාවලිය යටතේ දේශීය නිෂ්පාදකයින් දිරිගැන්වීම හා වෙළඳපළ තුළ තරඟකාරීත්වය වර්ධනය කිරීම සිදුවන අතර එමගින් ආනයන මත යැපීම අඩු කරයි. විදුලි හා ඉලෙක්ට්‍රොනික නිෂ්පාදන අංශයේ ස්ථාවර වර්ධනය මෙරට තුළ කර්මාන්ත හැකියාවන් වර්ධනයේ පිළිබිඹුවක්වන අතර එය ගුණාත්මකභාවය, නවෝත්පාදනය සහ තාක්‍ෂණයේ දියුණුව මගින් සනිටුහන් වේ. මෙම අංශයෙහි ප්‍රගතිය සැලකිය යුතු ලෙස වෙළඳපළ ආයෝජන ආකර්ෂණය ඇති කිරීම, නිෂ්පාදන ධාරිතාව පුළුල් කිරීම හා නව රැකියා අවස්ථා සංඛ්‍යාවක් ජනනය කිරීමට ඉවහල් වේ.

### කර්මාන්ත අංශයේ ජාතිකව නිර්ණය කළ දායකත්වයන් (NDC) ක්‍රියාත්මක කිරීම

පැරිස් ගිවිසුමේ පාර්ශවකරුවෙකු ලෙස ශ්‍රී ලංකාව දේශගුණික ක්‍රියාමාර්ග සඳහා රටේ ප්‍රගතිශීලී කැපවීම පිළිබිඹු කරමින්, එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස පිළිබඳ රාමු සම්මුතියට (UNFCCC) එහි යාවත්කාලීන කරන ලද ජාතික වශයෙන් තීරණය කරන ලද දායකත්වයන් (NDCs) ඉදිරිපත් කර ඇත. එහි අඩු කාබන් පියසටහන තිබියදීත්, අවම කිරීමේ සහ අනුවර්තන උපාය මාර්ග සහ ක්‍රියාත්මකකිරීමේ යාන්ත්‍රණයන් ගෙනහැර දක්වන විවිධ අංශ පදනම් කරගත් ඉලක්ක හරහා හරිතාගාර වායු (GHG) විමෝචනය අඩු කිරීමට ශ්‍රී ලංකාව සහතික වී ඇත. මෙම කැපවීම් යටතේ ශ්‍රී ලංකාව 2021-2030 කාලය සඳහා ජාතිකව නිර්ණය කළ දායකත්වයන් (NDCs) හතක සහාය ඇතිව කර්මාන්ත අංශයේ විමෝචනය අඩු කිරීමේ ඉලක්ක සකසා ඇත.

කර්මාන්ත අමාත්‍යාංශය විසින් පුනර්ජනනීය බලශක්තිය සහ සම්පත්-කාර්යක්ෂම තාක්ෂණයන් ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් ප්‍රතිපත්ති සහ නියාමන, තාක්ෂණික සහ මූල්‍ය පියවර හරහා කර්මාන්ත අංශයේ NDC ක්‍රියාත්මක කරයි.

## 1.2 ප්‍රගතිය 2025 සැප්තැම්බර් මස අවසානයට

### කර්මාන්ත සංවර්ධනය සඳහා ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

ඉඩම් කළමනාකරණය කර්මාන්ත සංවර්ධනය සඳහා බලපාන ප්‍රධාන කාරණයක් බව ලෝකයේ සිදුකර ඇති අධ්‍යයන තුළින් අනාවරණය වී ඇති බවත්, ඒ පිළිබඳව දැනට සකස් කර ඇති ප්‍රතිපත්ති ලේඛනය තුළ ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොමැති බවත් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මෙම ප්‍රතිපත්තිය පිළිබඳව ඔවුන්ගේ නිරීක්ෂණයන් තුළ සඳහන් කර ඇත. එසේම මෙම ප්‍රතිපත්ති ලේඛනය වත්මන් රජයේ ප්‍රතිපත්ති සමඟ ඒකාත්මික කිරීමේ අවශ්‍යතාවයද ඔවුන්ගේ නිරීක්ෂණ තුළ සඳහන් කර තිබුණි.

මේ සම්බන්ධයෙන් නියෝජ්‍ය ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රතිපත්ති ලේඛනය සකස් කළ ආයතනය වන කර්මාන්ත සේවා කාර්යාංශය-(ISB ආයතනය), විද්වත් කමිටුව සහ සියලුම පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වයෙන් 2025.01.29 වන දින රැස්වීමක් පවත්වන ලදී. එහිදී ඉදිරිපත්වූ කරුණු අනුව නැවත සකස් කරන ලද ප්‍රතිපත්ති ලේඛනය

කර්මාන්ත සේවා කාර්යාංශය විසින් 2025 අප්‍රේල් මස අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී.

මෙම ලේඛනය සම්බන්ධයෙන් අමාත්‍යාංශ නිළධාරීන් සහ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනවල නිලධාරීන් දැනුවත් කිරීම සඳහා වැඩමුළු කිහිපයක් පවත්වා ඇත.

### ශ්‍රී ලංකාවේ මෝටර් රථ නිෂ්පාදන / එකලස් කිරීමේ කර්මාන්තය සහ මෝටර් රථ කොටස් නිෂ්පාදන කර්මාන්තය සඳහා සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටිය (SOP)

2021 දී මෝටර් රථ නිෂ්පාදනය සහ එකලස් කිරීමේ කර්මාන්තය මෙන්ම මෝටර් රථ කොටස් නිෂ්පාදන කර්මාන්තය සඳහා සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටිය (SOP) හඳුන්වා දීමෙන් පසු, පසුගිය වසර හතර තුළ මෙම අංශය සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගෙන ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස මේ දක්වා වාහන 167,094 ක් එකලස් කර ඇත. 2025 ජනවාරි සිට සැප්තැම්බර් 30 වන දින දක්වා සිව්රෝද රථ 1,838 ක්, විදුලි ත්‍රිරෝද රථ 60ක් සහ ද්වි රෝද රථ 68,894 ක් ඇතුළුව වාහන 70,792 ක් එකලස් කරන ලද අතර එය දේශීය මෝටර් රථ එකලස් කිරීමේ සැලකිය යුතු සන්ධිස්ථානයක් සනිටුහන් කරයි.

මෝටර් රථ නිෂ්පාදනය සහ එකලස් කිරීමේ කර්මාන්තය රැකියා උත්පාදනය සහ සමාජ-ආර්ථික සංවර්ධනය සඳහා ද දායක වී ඇත. වර්තමානයේ වාහන එකලස් කිරීමේ ක්ෂේත්‍රය තුළ සෘජු රැකියා 1,139 ක් නිර්මාණය වී ඇති අතර මෝටර් රථ උපාංග නිෂ්පාදන අංශයේ ද සෘජු රැකියා 1,629ක් උත්පාදනය වී තිබේ. ඊට අමතරව සැපයුම්, බෙදා හැරීම, නඩත්තු කිරීම, පර්යේෂණ සහ සංවර්ධන, අලෙවි නියෝජිතයන් සහ පාරිභෝගික සේවා වැනි ආධාරක ක්ෂේත්‍ර හරහා වක්‍ර රැකියා අවස්ථා රාශියක් බිහි වී තිබේ.

### මෝටර් රථ එකලස් කිරීමේ කර්මාන්තය සඳහා ජාතික ප්‍රතිපත්ති සැකසීම

මෝටර් රථ එකලස් කිරීමේ කර්මාන්තය සඳහා වන ජාතික ප්‍රතිපත්තියේ අවසන් කෙටුම්පත අවසන් කර ඇති අතර එය ක්‍රියාත්මක කිරීමට මඟ පෙන්වීම සඳහා සවිස්තරාත්මක උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමේ කටයුතු දැන් සිදුවෙමින් පවතී. මෙම උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්ම මඟින් මෝටර් රථ එකලස් කිරීමේ කර්මාන්තයේ සංවර්ධනය හා පරිවර්තනය මෙහෙයවීම සඳහා මැනිය හැකි අරමුණු, නිශ්චිත ක්‍රියාමාර්ග සහ නිශ්චිත කාලරාමු සහිත පැහැදිලි රාමුවක් සපයනු ඇත.

### විදුලි හා ඉලෙක්ට්‍රොනික අයිතම දේශීය එකලස් කිරීම / නිෂ්පාදනය කිරීම

2025 දී ශීතකරණ, රෙදි සෝදන යන්ත්‍ර සහ අධිශීතකරණ වැනි විදුලි හා ඉලෙක්ට්‍රොනික උපකරණ දේශීයව එකලස් කිරීම සහ නිෂ්පාදනය කිරීම කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කළේය. දේශීය එකලස් කිරීම සඳහා උපකරණ ආකෘති 69 ක් අනුමත කර ඇති අතර ශීතකරණ ආකෘති 35 ක්, රෙදි සෝදන යන්ත්‍ර ආකෘති 26 ක් සහ අධිශීතකරණ ආකෘති 8 ක් ඇතුළත් වේ. මෙම වසර තුළ දේශීය නිෂ්පාදකයින්ගේ වර්ධන ධාරිතාව සහ තරඟකාරිත්වය පිළිබිඹු කරමින් දේශීය වෙළඳපොළට නව විදුලි උපකරණ මාදිලි 18 ක් හඳුන්වා දීමෙන් මෙම අංශය නවෝත්පාදනය සහ ව්‍යාප්තිය පෙන්නුම් කර ඇත.

වර්තමානය වනවිට දේශීය නිෂ්පාදකයින් උපකරණ සඳහා සැලකිය යුතු දේශීය අගය එකතු කිරීමක් සිදු කරන අතර දේශීය වෙළඳපොළෙන් 75% ක් පමණ ආවරණය කර ඇති අතර එමඟින් ආනයන යැපීම සැලකිය යුතු ලෙස අඩු වේ. මෙම ප්‍රගතිය දේශීය සැපයුම් දාම ශක්තිමත් කර ඇති අතර තාක්ෂණික කුසලතා වැඩි දියුණු කර නව රැකියා අවස්ථා උත්පාදනය කරමින් ශ්‍රී ලංකාවේ උපකරණ නිෂ්පාදන අංශයේ සැලකියයුතු වර්ධනයක් සිදුවී ඇත.

**කර්මාන්ත අංශයේ ජාතිකව නිර්ණය කළ දායකත්වයන් (NDC) ක්‍රියාත්මක කිරීම**

NDC හතට අදාළ කර්මාන්තයේ යම් යම් උප ක්‍රියාකාරකම් 2023 සිට 2025 වසර දක්වා ක්‍රියාත්මක කර ඇත. 2025 දී ක්‍රියාත්මක කළ වැදගත් උප ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

1. සම්පත් කාර්යක්ෂම පිවිතුරු නිෂ්පාදන (RECP) සහ බලශක්ති විගණන පැවැත්වීම
2. වැඩි දියුණු කළ සම්පත් කාර්යක්ෂමතාව සඳහා අඩු කාබන් තාක්ෂණයන් සහ ක්‍රියාවලීන් අනුගමනය කිරීම
3. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI) කලාප කිහිපයක හරිත සංකල්ප පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ජල භාවිතය වැඩි දියුණු කිරීම තෝරාගත් කර්මාන්ත අංශවල කාර්යක්ෂමතාව ඉහළ දැමීම
4. චක්‍රීය ආර්ථික සංකල්පය අනුගමනය කිරීම සඳහා කර්මාන්ත ධාරිතාව ගොඩනැගීම
5. අදාළ ISO ප්‍රමිතීන් අනුගමනය කිරීමට තෝරාගත් අංශවල කර්මාන්ත සඳහා පහසුකම් සැලසීම
6. පරිසර හිතකාමී ණය යෝජනා ක්‍රමය හරහා (E – Friends - II) පරිසර හිතකාමී ආයෝජන සඳහා මූල්‍ය පහසුකම් සැපයීම
7. දැනට පවතින ජාතිකව නිර්ණය කල දායකත්වයන් NDC 3.0 ලෙස යාවත්කාලීන (2026-2035) කිරීමේදී කර්මාන්ත අංශය සඳහා වන කොටස පාර්ශවකාර ආයතනවල සහභාගිත්වයෙන් යුරෝපා සංගමයේ අරමුදල් යටතේ UNIDO මගින් ක්‍රියාත්මක කරන AICRSL ව්‍යාපෘතිය සමග එක්ව පිළියෙළ කර පරිසර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම.
8. කර්මාන්ත අංශය අදාල ජාතිකව නිර්ණය කල දායකත්වයන් සඳහා අධීක්ෂණ වාර්තාකරණ සහ සත්‍යාපන රාමුවක් (MRV Framework) AICRSL ව්‍යාපෘතිය සමඟ සහයෝගයෙන් සකස් කරන ලදී.
9. පැරිස් සම්මුතියේ පාර්ශවකාර රාජ්‍යයක් ලෙස වසර 2කට වරක් භාර දිය යුතු ද්විවාර්ෂික විනිවිද භාවය පිළිබඳ (Bi Annual Transparency Report) පළමු වර්තාව සකස් කිරීම සඳහා පාර්ශවකර ආයතන සමග කර්මාන්ත අංශයට අදාළ කොටස සකස් කිරීම සඳහා කටුයුතු කිරීම.
10. පාරිසරික කර්මාන්ත උද්‍යාන පිහිටුවීම යටතේ තෝරාගත් පවතින කර්මාන්තපුර 16ක් පාරිසරික කර්මාන්ත උද්‍යාන බවට පත්කිරීම සඳහා වන කටයුතු යුරෝපා සංගමයේ අරමුදල් යටතේ ක්‍රියාත්මකවන හරිත ප්‍රතිසාධන පහසුකම (EU Green Recovery Facility) මගින් ආරම්භ කරන ලදී.

## 1.3 අනාගත සැලැසුම් - 2026

**කර්මාන්ත සංවර්ධනය සඳහා ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම**

කර්මාන්ත සඳහා වන ජාතික ප්‍රතිපත්තියේ පස් අවුරුදු උපායමාර්ගික සැලැස්ම වත්මන් රජයේ ප්‍රතිපත්ති වලට අනුව අවශ්‍ය වෙනස්කම් කිරීමට අපේක්ෂා කෙරේ. කර්මාන්ත සංවර්ධනය සඳහා වන ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතන සහ අනෙකුත් සියලුම පාර්ශ්වකරුවන් සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කිරීමට බලාපොරොත්තු වේ.

### ශ්‍රී ලංකාවේ මෝටර් රථ නිෂ්පාදන/ එකලස් කිරීමේ කර්මාන්තය සහ මෝටර් රථ සංරචක නිෂ්පාදන කර්මාන්තය සඳහා සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටිය (SOP)

සම්මත මෙහෙයුම් ක්‍රියාපටිපාටිය (SOP) අනුවාදය 01 සමාලෝචනය දැනට සිදුවෙමින් පවතින අතර පසුගිය වසර හතර තුළ දේශීය මෝටර් රථ එකලස් කිරීමේ කර්මාන්තය තුළ නිරීක්ෂණය වූ අභියෝග සහ ප්‍රායෝගික අත්දැකීම් කෙරෙහි අවධානය යොමු කරයි. මෙම පුළුල් සමාලෝචනයේ අරමුණ වන්නේ පවතින SOP හි කාර්යක්ෂමතාව ඇගයීම එහි පැහැදිලි බව සහ ක්‍රියාත්මක කිරීම සීමා කළ හැකි හිඩැස් හෝ අපැහැදිලිතා හඳුනා ගැනීම සහ එහි අදාළත්වය තහවුරු කිරීම සඳහා අවශ්‍ය වැඩිදියුණු කිරීම් යෝජනා කිරීමයි.

සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටිය (SOP) 2025 අවසානය වන විට සමාලෝචන ක්‍රියාවලිය අවසන් කිරීමට සැලසුම් කර ඇති අතර එමඟින් 2026 දී සංශෝධිත සහ යාවත්කාලීන කරන ලද සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටිය (SOP) අනුවාදය 02 හඳුන්වාදීමට මග පාදයි. නව අනුවාදය උගත් පාඩම් ඇතුළත් කරමින් කර්මාන්ත ප්‍රතිපෝෂණ කරමින් සහ මෝටර් රථ එකලස් කිරීමේ අංශයේ වර්ධනයට සහ නියාමනයට තවදුරටත් සහාය වීම සඳහා පැහැදිලි වඩාත් ප්‍රායෝගික සහ ඉදිරි දැක්මක් සහිත මාර්ගෝපදේශ සපයනු ඇත.

### මෝටර් රථ එකලස් කිරීමේ කර්මාන්තය සඳහා ජාතික ප්‍රතිපත්ති සැකසීම

මෝටර් රථ එකලස් කිරීමේ කර්මාන්තය සඳහා වන ජාතික ප්‍රතිපත්තිය, උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්ම අවසන් කිරීමෙන් පසු 2026 දී කැබිනට් අනුමැතිය සඳහා විධිමත් ලෙස ඉදිරිපත් කෙරේ. අනුමත වූ පසු දේශීය මෝටර් රථ කර්මාන්තය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්මේ රාමුව මගින් මෙහෙයවනු ලබන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ අදියර කරා ගමන් කරනු ඇත.

### දේශීය එකලස් කිරීම / විදුලි හා ඉලෙක්ට්‍රොනික අයිතම නිෂ්පාදනය

විදුලි හා ඉලෙක්ට්‍රොනික උපකරණ දේශීය එකලස් කිරීම සහ නිෂ්පාදනය කිරීමේ අනාගත මූලපිරීම් නිෂ්පාදන ධාරිතාව පුළුල් කිරීම, තාක්ෂණික හැකියාවන් ශක්තිමත් කිරීම සහ අංශයේ සමස්ත තරඟකාරිත්වය වැඩි දියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කරනු ඇත. දේශීය හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වන උසස්, බලශක්ති කාර්යක්ෂම ආකෘති හඳුන්වා දීමට නිෂ්පාදකයින් දිරිමත් කිරීමෙන් වඩාත් නව්‍ය හා තිරසාර කර්මාන්ත පරිසරයක් පෝෂණය කිරීම අමාත්‍යාංශයේ අරමුණයි. මෙම උත්සාහයන් දේශීය අගය එකතු කිරීම තවතවත් වැඩි කිරීම සහ ආනයන මත යැපීම අවම කිරීම මඟින් දේශීය සැපයුම් දාම ශක්තිමත් කිරීම සහ දේශීය විදුලි හා ඉලෙක්ට්‍රොනික උපකරණ එකලස් කිරීම සහ නිෂ්පාදනය කිරීමේ තාක්ෂණික ස්වයංපෝෂිතභාවය ප්‍රවර්ධනය කිරීම සඳහා ද ප්‍රමුඛත්වය දෙනු ඇත.

### කර්මාන්ත අංශයේ ජාතිකව නිර්ණය කළ දායකත්වය (NDC) ක්‍රියාත්මක කිරීම

ජාතික වශයෙන් තීරණය කරන ලද දායකත්වයන් (NDCs) යටතේ දක්වා ඇති උප ක්‍රියාකාරකම් බොහොමයක් 2030 දක්වා ක්‍රියාත්මක කෙරෙන අතර, දිගුකාලීන තිරසාර ඉලක්ක සපුරා ගැනීම සහ මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම කෙරෙහි අවධානය යොමු කරනු ඇත. පාරිසරික කර්මාන්ත උද්‍යාන පිහිටුවීම වැනි ප්‍රධාන ක්‍රියාකාරකම් ආරම්භ කර ඇති අතර, යුරෝපීය සංගමය විසින් අරමුදල් සපයනු ලබන හරිත ප්‍රතිසාධන පහසුකම හරහා මෙම උත්සාහයන් ඉදිරි වසරවලදී ඉදිරියට ගෙන යනු ඇත. මීට අමතරව, පසුගිය වසර දෙක තුළ ආරම්භ නොකළ උප ක්‍රියාකාරකම් අදාළ නියෝජිතායතනවල සහයෝගය සහ සහභාගීත්වය ඇතිව 2026 දී දියත් කරනු ලැබේ.

# 02

# කර්මාන්ත සංවර්ධන අංශය

## 2.1 හැඳින්වීම

### ප්‍රධාන අරමුණු / පරමාර්ථ

සංවර්ධිත ප්‍රදේශවල පමණක් විසිරී ඇති කාර්මික අංශය, ප්‍රාදේශීය මට්ටමින් සංවර්ධනය කර ජාතික ආදායමට කාර්මික අංශයේ දායකත්වය ඉහළ නැංවීම කර්මාන්ත සංවර්ධන අංශයේ කාර්ය භාරය වේ. නව කර්මාන්තපුර පිහිටුවීමෙන් සහ පවතින කර්මාන්තපුර සංවර්ධනය කිරීම තුළින් ප්‍රාදේශීය මට්ටමින් නව රැකියා අවස්ථා ඇති කිරීමෙන් මෙය සාක්ෂාත් කරගත හැකිය. ප්‍රාදේශීය මට්ටමින් කාර්මික අංශයේ ආයෝජන අවස්ථා සඳහා උනන්දු කිරීම, නව ආයෝජන අවස්ථා නිර්මාණය කිරීම, යටිතල පහසුකම් සැපයීම, ආයෝජකයන් සඳහා තාක්ෂණික සහාය සහ උපදේශන වැනි සේවා සැපයීම තුළින් කර්මාන්ත සංවර්ධන අංශය විසින් කාර්මික අංශයේ ප්‍රවර්ධනය සඳහා සිය ප්‍රයත්නය දරමින් සිටී.

### නව කර්මාන්තපුර පිහිටුවීම සහ පවතින කර්මාන්තපුරවල යටිතල පහසුකම් සංවර්ධනය

කර්මාන්ත සංවර්ධන අංශය මගින් ඉහත විස්තර කර ඇති කර්මාන්තපුරවල සංවර්ධන කටයුතු සිදු කරමින් ආයෝජකයන්ට ආයෝජන අවස්ථා ලබා දීම, රැකියා උත්පාදනය, අපනයන අගය එකතු කිරීම සහ ආනයන ආදේශන ප්‍රවර්ධනය කිරීම සිදු කරයි. යටිතල පහසුකම් ක්‍රියාකාරකම් සංවර්ධනය හා වැඩිදියුණු කිරීම සඳහා

2025 ජනවාරි සිට 2025 දෙසැම්බර් දක්වා කාලය සඳහා රුපියල් මිලියන2000 ක මුදලක් වෙන් කර ඇත.

2025 වර්ෂය තුළ යටිතල පහසුකම් සංවර්ධන/වැඩිදියුණු කිරීමේ කටයුතු ඇතුළු කාර්යන්15ක් සඳහා අනුමැතිය ලැබී ඇති අතර ඉන් සංවර්ධන කටයුතු තුනක් (03) සම්පූර්ණ කර ඇති අතර 12ක් සක්‍රියව සිදුවෙමින් පවතින අතර මේවා 2025 වසර තුළ අවසන් කිරීමට අපේක්ෂා කෙරේ. නව කර්මාන්තපුර 10 ක් ස්ථාපිත කිරීමට සැලසුම් කර ඇති අතර, ඉන් 3 ක මූලික කටයුතු ආරම්භ කර ඇත. දැනට සංවර්ධනය වෙමින් පවතින කර්මාන්තපුර 2 ක් (සූරියවැව සහ අළුතපොළ) 2025 අවසන් වන විට නිම කිරීමට අපේක්ෂා කෙරේ. තවත් කර්මාන්තපුර 5 ක් (රයිගම, දඹුල්ල, සඳමල්ගම, වාලච්චේන සහ පරන්තන්) 2026 අවසන් වන විටත්, ඉතිරි ඒවා 2027 සහ 2028 වන විටත් නිම කිරීමට අපේක්ෂා කෙරේ.

## 2.2 ප්‍රගතිය 2025 සැප්තැම්බර් මස අවසානයට

අක්කර 1073.8 කින් සමන්විත කර්මාන්තපුර 34 ක විදුලිය, ජලය සහ ප්‍රවේශ මාර්ග වැනි යටිතල පහසුකම් කර්මාන්තසහව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය විසින් සංවර්ධනය කර ඇත. කර්මාන්තපුර 34 ක මෙම සංවර්ධන කටයුතු සඳහා රජය රු. මි. 5,764.29 කට ආසන්න මුදලක් ආයෝජනය කර ඇත.

මීට අමතරව, පුද්ගලික අංශය විසින් කර්මාන්තපුරවල තම කර්මාන්ත ඒකක පිහිටුවීම සඳහා රු. මි. 76,090ක් පමණ ආයෝජනය කර ඇත.

**සමස්ත සාරාංශය - කර්මාන්තපුර**

**(අ) පවතින කර්මාන්තපුර**

| 2025 සැප්තැම්බර් 30වැනි දිනට සමුච්චිත ප්‍රගතිය | |
|---|---|
| කර්මාන්තපුර සංඛ්‍යාව | 34 |
| සංවර්ධිත භූමි ප්‍රමාණය (අක්කර) (එනම් විදුලිය, ජලය සහ මාර්ග පද්ධතිය) | 1073.8 |
| මුළු ආයෝජනය (ආසන්න වශයෙන්) (රු.මි.) | 81,345 |
| රජයේ ආයෝජනය(ආසන්න වශයෙන්) (රු.මි.) | 5,764. 29 |
| පුද්ගලික ආයෝජනය(ආසන්න වශයෙන්) (රු.මි.) | 76,090 |
| වාණිජ නිෂ්පාදන කර්මාන්ත සංඛ්‍යාව | 434 |
| ඉදි කිරීම් අවස්ථාවේ ඇති කර්මාන්ත සංඛ්‍යාව | 24 |
| රැකියා අවස්ථා | 24,376 |

*මූලාශ්‍රය: කර්මාන්ත සංවර්ධන අංශය*

**(ආ) දැනට ක්‍රියාත්මක වන නව කර්මාන්තපුර**

| 2025 සැප්තැම්බර් 30 වැනි දිනට සමුච්චිත ප්‍රගතිය | |
|---|---|
| කර්මාන්තපුර සංඛ්‍යාව | 9 |
| සංවර්ධනය වෙමින් පවතින භූමි ප්‍රමාණය (අක්කර) | 667.15 |
| රජයේ ආයෝජන (ආසන්න වශයෙන්) (රු.මි.) | 505.88 |

*මූලාශ්‍රය: කර්මාන්ත සංවර්ධන අංශය*

**කර්මාන්ත සංවර්ධන වැඩසටහන**

**(1) නව කර්මාන්ත සඳහා ඉඩම් වෙන් කිරීම**

| | |
|---|---|
| ප්‍රාදේශීය කර්මාන්ත සේවා කමිටුව විසින් අනුමත කර ඇති නව ව්‍යාපෘති යෝජනා ගණන | 29 |
| අමාත්‍යාංශ ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කරන ලද නව ව්‍යාපෘති යෝජනා ගණන | 23 |
| නම වෙනස් කර ඇති කර්මාන්ත ගණන | 3 |
| නිෂ්පාදන වෙනස් කර ඇති කර්මාන්ත ගණන. | 2 |

*මූලාශ්‍රය: කර්මාන්ත සංවර්ධන අංශය*

### (2) 2025 වර්ෂය සඳහා නව ව්‍යාපෘති/ යටිතල පහසුකම් ක්‍රියාකාරකම් සඳහා නිකුත් කරන ලද මුදල්

2025 වර්ෂය තුළ කර්මාන්ත සංවර්ධන අංශයවිසින් නව ව්‍යාපෘති සඳහා යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සාර්ථකව සිදු කර ඇති අතර පහත සඳහන් කර්මාන්තපුරවල කර්මාන්තකරුවන්සඳහා ආයෝජන අවස්ථා වැඩි දියුණු කිරීමට අවකාශ සලසා ඇත. 2025 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ මේ වෙනුවෙන් රු.මි. 243.97 ක මුදලක් වෙන් කර ඇත.

### (අ) පවතින කර්මාන්තපුර සඳහා ආයෝජන

| කර්මාන්තපුරය | සංවර්ධනය කාර්යය | ඇස්තමේන්තු ගත මුදල (රු.මි.) |
|---|---|---|
| නාලන්දාව | අභ්‍යන්තර ජල සැපයුම් පද්ධතියක් ස්ථාපිත කිරීම | 17.2 |
| පුත්තලම | ජල සැපයුම | 3.2 |
| කළුතර | ගිනි නිවන ජල සැපයුම් පද්ධතියක් ස්ථාපිත කිරීම | 1.10 |
| උලපනේ | ප්‍රේම් ටෙක් ලිමිටඩ් මගින් පොදු ජල ටැංකිය දක්වා ජලාපවහන පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම | 2.61 |
| කරන්දෙණිය | නල ළිදක් ඉදිකිරීම සඳහා භූ විද්‍යාත්මක විමර්ශනය | 0.07 |
| කොළොන්නාව | මායිම් බැම්ම මැනීම | 0.06 |
| කරන්දෙණිය | නළ ළිදෙහි ධාරිතාව පරීක්ෂා කිරීම | 0.26 |
| දංකොටුව | වැසි ජල පෙරහන් පද්ධතියක් ඉදිකිරීම | 1.0 |
| කළුතර | ගේට්ටු ඉදිකිරීම | 1.60 |
| සියලුම කර්මාන්තපුර | කර්මාන්ත සඳහා සේවා පහසුකම් සැපයීම | 0.27 |
| කොළොන්නාව | මායිම් සමීක්ෂණය | 0.04 |
| උඩුකාව | වැට ඉදිකිරීම | 1.07 |

*මූලාශ්‍රය: කර්මාන්ත සංවර්ධන අංශය*

### *කළුතර කර්මාන්තපුරය*

ගිනි නිවන ජල සැපයුම් පද්ධතිය ස්ථාපනය කිරීම නිම කරන ලද අතර ඒ සඳහා රු.මි. 1.102 ක් වැය කර ඇත.

***ගිනි නිවන ජල සැපයුම් පද්ධතිය - කළුතර කර්මාන්තපුරය***



### *නාලන්දා කර්මාන්තපුරය*

රු. මි.**17,061** ක වියදමින් අභ්‍යන්තර ජල සැපයුම් පද්ධතිය ස්ථාපිත කිරීම සිදු කර ඇත.

### *කරන්දෙණිය කර්මාන්තපුරය*

රු. මි**.** 0.257 ක වියදමින් නළ ළිදෙහි ධාරිතා පරීක්ෂණය අවසන් කර ඇත.

### (ආ) දැනට ඉදිවන නව කර්මාන්තපුර

### *සූරියවැව කර්මාන්තපුරය*

සූරියවැව කර්මාන්තපුරයෙහි ජල හා විදුලි සැපයුමට අදාල කටයුතු අවසන්ව ඇති අතර පිවිසුම් මාර්ගයේ සහ අභ්‍යන්තර මාර්ග ඉදිකිරීමේ කටයුතු නිමවෙමින් පවතී. කර්මාන්තපුරයේ පිවිසුම් ගේට්ටුවේ මෙන්ම කර්මාන්තපුරය වටා ආරක්ෂිත වැට ද නිමවා ඇත. දැනට මෙම කර්මාන්තපුරය වෙනුවෙන් වැය කර ඇති මුදල රු. මි. 271.77 ක් වන අතර ආයෝජකයින් වෙත කර්මාන්ත ආරම්භ කිරීමට ලබාදීමට හැක.

**මාර්ග සංවර්ධනය - සූරියවැව කර්මාන්තපුරය**



### *රයිගම - මිල්ලනිය කර්මාන්තපුරය*

අභ්‍යන්තර මාර්ග, මූලික යටිතල පහසුකම්, පිවිසුම්, වැසිකිළි, වැටවල්, ගේට්ටු සහ භූමි අලංකරණය ඇතුළු සංවර්ධන කටයුතු සිදුවෙමින් පවතින අතර 2026 වර්ෂයේදී අවසන් කිරීමට අපේක්ෂා කෙරේ.

**අභ්‍යන්තර මාර්ග සංවර්ධනය රයිගම - මිල්ලනිය කර්මාන්තපුරය**



### *අළුතපොළ කර්මාන්තපුරය*

මාර්ග ඉදිකිරීම් ඇතුළු කර්මාන්තපුරයේ සංවර්ධන කටයුතු සිදුකරමින් පවතින අතර 2026 දී ආයෝජකයින් සඳහා ඉඩම් වෙන්කරදීමට අවකාශ සැලසේ. මේ වෙනුවෙන් දරා ඇති මුළු පිරිවැය රු. මි. 147.84 කි.

## 2.3 අනාගත සැලැසුම් - 2026

**නව කර්මාන්තපුර සංවර්ධනය**

- රයිගම, අළුතපොළ, දඹුල්ල සහ සඳමල්ගම යන කර්මාන්තපුරවල ඉදිකිරීම් 2026 අවසන් වන විට නිම කිරීමට ඉලක්ක කර ඇති අතර, කටුනායක කර්මාන්තපුරය 2027 වන විට නිම කිරීමට අපේක්ෂා කෙරේ. මීට අමතරව, කළුතර (ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය) හි අක්කර 350 ක සහ මඩකලපුව (වාලච්චේන) හි අක්කර 50 ක නව කර්මාන්තපුර 2 ක් 2027 දී නිම කිරීමට සැලසුම් කර ඇත.

- කාර්මික අංශයේ උපරිම ඵලදායිතාවයක් ලබා ගැනීම සඳහා ඉදිරි වසර තුළ අවම වශයෙන් ආයෝජකයින් 50 දෙනෙකු සඳහා කර්මාන්තපුරවල ඉඩම් කට්ටි වෙන් කිරීමට අපේක්ෂා කෙරේ.

## පවතින කර්මාන්තපුරයන්හි සංවර්ධන තොරතුරු 2025 සැප්තැම්බර් මස 30 දක්වා (සමුච්චිත)

| කර්මාන්තපුරයේ නම | ඉඩම් ප්‍රමාණය | 2025 ජුලි 31 වන දිනට ව්‍යවසාය ගණන | මුළු සේවක සංඛ්‍යාව | මුළු පිරිවැටුම (රු. මිලියන) | රජයේ සමුච්චිත ආයෝජනය (රු. මිලියන) | පුද්ගලික සමුච්චිත ආයෝජනය (රු. මිලියන) |
|---|---|---|---|---|---|---|
| කළුතර | 55 | 33 | 1226 | 4951.08 | 127.142 | 4459.8 |
| කොලොන්නාව | 7 | 14 | 435 | 2532.48 | 36.2698 | 630.3 |
| මහර | 3 | 7 | 131 | 6729.6 | 14.05 | 342 |
| මතුගම | 50 | 11 | 556 | 12902.88 | 174.698 | 6351.88 |
| මිල්ලෑව | 11 | 13 | 541 | 8009.76 | 97.054 | 604.38 |
| මිනුවන්ගොඩ | 15 | 13 | 628 | 4369.824 | 44.12 | 2926.738 |
| රත්මලාන | 17 | 18 | 1,481 | 8527.62 | 89.78 | 4598.14 |
| ටෙම්පල්බර්ග් | 48 | 38 | 1,904 | 9057 | 180.58 | 5137.2 |
| මිල්ලනිය | 24 | 0 | - | 0 | 929.1312 | 0 |
| බුත්තල | 18.35 | 18 | 903 | 2580 | 118.76 | 1575 |
| ඌව පරණගම | 3.3 | 2 | 16 | 44.4 | 0.81 | 20 |
| බට ආතා | 105 | 20 | 472 | 2258.52 | 327.636 | 3618.97 |
| කරන්දෙණිය | 40 | 23 | 203 | 497.268 | 154.7275 | 1197.25 |
| උඩුකාව | 21.138 | 3 | 1,305 | 6380.028 | 50.93 | 861.8 |
| ඇඹිලිපිටිය | 22.86 | 4 | 210 | 963.12 | 98.98 | 238 |
| ගලිගමුව | 23.57 | 8 | 342 | 1972.8 | 184.69 | 812 |
| නාලන්ද එල්ලාවල -1 | 36.38 | 22 | 361 | 825.36 | 80.345 | 1602.35 |
| නාලන්ද එල්ලාවල -2 | 45 | 29 | 467 | 1097.4 | 126.017 | 1109.85 |
| දංකොටුව | 52.07 | 33 | 1,748 | 18914.76 | 138.798 | 4879.6 |
| දඹදෙණිය | 10.15 | 3 | 807 | 4360.8 | 38.36 | 2032.07 |
| මාකදුර නැගෙනහිර | 27.19 | 2 | 686 | 12840 | 35.79 | 10630 |
| මාකදුර බටහිර | 84.23 | 17 | 1,099 | 21948.36 | 143.58 | 5465.71 |
| නිකවැරටිය | 2.56 | 1 | 935 | 1134 | 6.12 | 1029.07 |
| නුරානි | 15.84 | 7 | 558 | 2538.84 | 12.579 | 881 |
| පුත්තලම | 40 | 15 | 180 | 409.2 | 249.585 | 786 |
| ලක්ෂ උයන | 70.94 | 17 | 984 | 10689 | 176.04 | 3612.5 |
| නාලන්දා (මාතලේ) | 25 | 17 | 1,318 | 6530.4 | 98.321 | 2495.89 |
| උලපනේ | 25 | 20 | 845 | 4168.2 | 139.882 | 4503 |
| ත්‍රිකුණාමලය | 50 | 10 | 1,921 | 1609.2 | 511.07 | 1892.3 |
| අම්පාර (නවගම්පුර) | 20 | 12 | 35 | 80.4 | 48.48 | 216.5 |
| මඩකලපුව | 24.03 | 0 | - | 0 | 241 | 0 |
| මන්නාරම | 24 | 1 | 1,184 | 19991.64 | 351.775 | 1056.08 |
| වැලිඔය | 40 | 3 | 895 | 3267.6 | 206.41 | 491.81 |
| මහව (රිදිබැදිඇල්ල) | 17.21 | 0 | 0 | 0 | 21.54 | 32.5 |
| **එකතුව** | **1,073.82** | **434** | **24,376** | **182,181.54** | **5,255.05** | **76,089.69** |

***මූලාශ්‍රය: කර්මාන්ත සංවර්ධන අංශය***

## නව කර්මාන්තපුරයන්හි තොරතුරු 2025 සැප්තැම්බර් මස 30 දක්වා (සමුච්චිත)

| කර්මාන්තපුර | ඉඩම් ප්‍රමාණය (අක්කර) | මුළු රාජ්‍ය ආයෝජනය (රු. මිලියන) |
|---|---|---|
| අලුත්පොල | 7.899 | 147.84 |
| දඹුල්ල | 64 | 46.325 |
| සූරියවැව | 20 | 271.77 |
| කටුනායක | 100 | 7.276 |
| වැල්ලවාය | 9.25 | 8.383 |
| නොච්චියාගම | 50 | 0.477 |
| සඳමල්ගම | 16 | 21.587 |
| ඉංගිරිය | 350 | 2.138 |
| වාලච්චේනයි | 50 | 0 |

*මූලාශ්‍රය: කර්මාන්ත සංවර්ධන අංශය*

# 03

# ආංශික සංවර්ධන අංශය

# සංවර්ධන අංශ 01

## 3.1 හැඳින්වීම

අමාත්‍යාංශය යටතේ සේවා පහසුකම් සපයන ප්‍රධාන නිෂ්පාදන අංශ 21 අතරින් කෘෂිකාර්මික කර්මාන්ත සංවර්ධන කටයුතු සංවර්ධන අංශ 1 යටතේ පවතී. මෙම අංශය යටතේ සැකසූ ආහාර, තේ, කුළුබඩු, කොහු ආශ්‍රිත නිෂ්පාදන, ඇසුරුම් කර්මාන්ත, කිරි හා කිරි ආශ්‍රිත කර්මාන්ත, මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත ක්ෂේත්‍රයන්ට අදාල සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ.

### ප්‍රධාන අරමුණු

1. ජාත්‍යන්තර වෙළඳපොලේ තරඟකාරිත්වයට මුහුණදිය හැකි ගුණාත්මක තත්වයෙන් යුත් භාණ්ඩ නිෂ්පාදනය සඳහා දේශිය කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම.
2. දේශිය වෙළඳපොලෙහි අවශ්‍යතා හඳුනාගෙන එම අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා අවශ්‍ය කර්මාන්ත අංශයන් සංවර්ධනය කිරීම.

### ක්‍රියාකාරකම්

- ඉදිරි වර්ෂයන් සඳහා සැලසුම්කර ඇති සමාජ ආර්ථික සංවර්ධන වැඩසටහන යටතේ දැක්වෙන අදාල ක්ෂේත්‍රයන් සඳහා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- පෞද්ගලික අංශයේ කර්මාන්තකරුවන්, අපනයනකරුවන් සහ විද්වත් මණ්ඩල වලින් සැදුම්ලත් උපදේශක කමිටුවල උපදේශකත්වයෙන් සංවර්ධන සැලසුම් හා උපාය මාර්ග පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීම.

- අදාළ අංශයන්හි නිෂ්පාදන හා අලෙවිය ආශ්‍රිත ගෝලීය ප්‍රවණතා අධ්‍යයනය කිරීම සහ ඒවායෙහි උපයෝගීත්වයෙන් සංවර්ධන උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම.
- කර්මාන්තකරුවන් මුහුණ දෙන ගැටළු පිළිබඳ සාකච්ඡා කර එම ගැටළු විසඳා ගැනීම සඳහා උපදේශක කමිටු හා අදාල ආයතනවල උපදේශකත්වය ලබා ගැනීම.
- රේඛීය අමාත්‍යාංශ, මහා භාණ්ඩාගාරය, වෙළඳ මණ්ඩල, අනෙකුත් රාජ්‍ය සහ පෞද්ගලික ආයතන අතර සම්බන්ධීකරණය සිදුකිරීම හා එමගින් කර්මාන්ත සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කිරීම.
- දේශීය සහ විදේශීය කාර්මික ආයතන මගින් කර්මාන්ත සඳහා අවශ්‍ය නවීන තාක්ෂණ පුහුණුව සහ පර්යේෂණ කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් ලබාදීමට කටයුතු කිරීම.
- කර්මාන්තකරුවන් හා විශ්ව විද්‍යාල / පර්යේෂණ ආයතන සමඟ සම්බන්ධීකරණය තුළින් නව තාක්ෂණික දැනුම හුවමාරු කිරීම සහ ඒ තුළින් භාණ්ඩ විවිධාංගීකරණය සඳහා පහසුකම් සැලසීම.
- දේශීය හා ජාත්‍යන්තර ප්‍රදර්ශන සංවිධානය කිරීම තුළින් දේශීය කර්මාන්ත සඳහා අවශ්‍ය නව තාක්ෂණය හඳුන්වාදීම සහ එම කර්මාන්ත සඳහා දේශීය හා විදේශීය වෙළඳපොළ සකස්කර ගැනීමට සහය වීම.
- භාණ්ඩ අපනයනය දිරිමත් කිරීමේ අරමුණින් අපනයන භාණ්ඩ නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය තීරුබදු රහිතව ආනයනය කිරීම සඳහා පහසුකම් සැපයීම.
- ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව භාණ්ඩ නිෂ්පාදනයට අවශ්‍ය තත්ත්ව සහතික, කර්මාන්ත සඳහා හඳුන්වාදීම හා ඒවා ලබාගැනීමට උපකාර කිරීම.

## 3.2 ප්‍රගතිය 2025 සැප්තැම්බර් මස අවසානයට

### ක්‍රියාත්මක කරනු ලබන වැඩ සටහන්

- තීරුබදු රහිතව අමුද්‍රව්‍ය ආනයනය කිරීමට පහසුකම් සැලසීම (අපනයන පිරිසැකසුම් සඳහා තාවකාලික ආනයන යෝජනා ක්‍රමය (TIEP) මගින් කර්මාන්තවල අපනයන දිරිගන්වනු ලැබේ. මේ වන විට ඇසුරුම් අංශය, සැකසූ ආහාර, කුළුබඩු අංශය, කොහු ආශ්‍රිත නිෂ්පාදන අංශය, තේ අංශය, මැණික් හා ස්වර්ණාභරණ අංශය හා  කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන අංශය වැනි නිෂ්පාදන වල අගය එකතු කිරීමේ නියුක්ත වෙමින් ඍජු හා වක්‍ර වශයෙන් 2025 සැප්තැම්බර් දක්වා අපනයනයට සම්බන්ධ කර්මාන්ත 263 ක් සඳහා TIEP පහසුකම් ලබා දී ඇති අතර ලිපි 456  සඳහා නිර්දේශ ලබා දී ඇත.
- ඒ අනුව කර්මාන්ත අංශයේ අගය එකතු කිරීම ඉහළ නැංවීම පිණිස භාවිතා කරනු ලබන අමුද්‍රව්‍ය ආනයනය කිරීමේදී තීරුබදු සහන සැපයීම සඳහා අමාත්‍යාංශය සහය ලබාදෙනු ලැබේ. මෙමගින් අපනයනය කරනු ලබන නිෂ්පාදන සඳහා ජාත්‍යන්තර වෙළෙඳපොල තුළ තරඟකාරීත්වය වැඩි කිරීම මෙයින් සිදු කරයි.

### තත්ත්වය/ ගුණත්වය ඉහල නැංවීමේ වැඩසටහන්

- කර්මාන්ත සඳහා තත්ත්ව සහතික, සුරක්ෂිතතා සහ ක්‍රමවේද සම්බන්ධව සහතික  ලබා ගැනීම සඳහා (ISO 9001, ISO 14001, ISO 22000, ISO 50001) අමාත්‍යාංශය විසින් තත්ත්ව හා ඵලදායිතාවය ඉහළ නැංවීමේ වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන සාර්ථකව  නිම කරන කර්මාන්ත වෙනුවෙන් අදාල සහතික පත්‍ර සහ ගෙවීම් බිල්පත් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලැබීමෙන් අනතුරුව රු.300,000/- (උපදේශන ගාස්තු ද ඇතුළුව) උපරිමයකට යටත්ව අදාල සහතික පත්‍ර ගාස්තු ප්‍රතිපූර්ණය කරනු ලබයි.  මෙම වැඩසටහන සැකසූ ආහාර කර්මාන්ත අංශය සඳහා සහ

ඇසුරුම්කරණ කර්මාන්ත, අගය එකතු කළ තේ කර්මාන්ත, අගය එකතුකළ කුළුබඩු සහ කොහු කර්මාන්ත යන අනෙකුත් කර්මාන්ත අංශ නියෝජනය වන පරිදි 2025 වර්ෂය සඳහා කර්මාන්ත 58 ක් වෙනුවෙන් පහසුකම් ලබා දීමට තෝරාගෙන ඇත.

- ISO සහතිකකරණය ක්‍රියාවලිය සාර්ථකව නිමකරන කර්මාන්ත සඳහා මූල්‍යමය පහසුකම් සැපයීම සිදු කරනු ලැබේ.

**තත්ත්ව හා ඵලදායිතාවය ඉහළ නැංවීමේ වැඩසටහන**



- අමාත්‍යාංශය විසින් ආහාර නිෂ්පාදනයේ යෙදී සිටින සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා යහපත් නිපැයුම් පරිචයන් (GMP) පිළිබඳ සහතිකපත් ලබා ගැනීමේ දී මූල්‍ය සහන වැඩසටහන ක්‍රියාවට නංවා ඇත. තෝරාගත් කර්මාන්ත සඳහා GMP සහතිකයන් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI), හෝ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ GMP සඳහා ප්‍රතීතනය ලබා ඇති ආයතනයකින් සහතිකය ලබා ගත යුතුය. 2025 වර්ෂයේදී මෙම වැඩසටහන සඳහා කර්මාන්ත 27 ක් තෝරා ගන්නා ලදී. ඒ අතුරින් සහතිකකරණ ක්‍රියාවලිය සාර්ථකව සම්පූර්ණ කරනු ලබන කර්මාන්ත සඳහා උපරිමය රු. 100,000ක් දක්වා වූ මූල්‍ය පහසුකම් ලබා දේ.

**අලෙවි ප්‍රවර්ධන වැඩසටහන්**

- දේශීය හා විදේශීය ප්‍රදර්ශකයින් විශාල පිරිසකගේ සහභාගීත්වයෙන් අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා ආහාර සැකසුම්කරුවන්ගේ සංගමය සමග ඒකාබද්ධව Profoods/ Propack ප්‍රදර්ශනය 2025 අගෝස්තු මස 22, 23 සහ 24 යන දිනයන් වල දී බණ්ඩාරණායක සම්මන්ත්‍රණ ශාලාවේදී සාර්ථකව පවත්වන ලදී.

  මෙම ප්‍රදර්ශනයේ දී තෝරා ගනු ලැබූ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත වෙනුවෙන් සහන ගාස්තු මත විශේෂ ප්‍රදර්ශන මණ්ඩපයක් මගින් ප්‍රදර්ශන ඇතුළුව ප්‍රදර්ශන කුටි 380 ක් සඳහා දේශීය හා විදේශීය කර්මාන්ත 250 ක් පමණ සම්බන්ධ විය.

**Profoods/ Propack ප්‍රදර්ශනය**




- ඇසුරුම් නිෂ්පාදනය කරන දේශීය කර්මාන්ත වලට විදේශීය වෙළඳපොළ අවස්ථා වැඩිකර ගැනීමට "ලංකා පැක් -2025" ප්‍රදර්ශනය 2025 ඔක්තෝබර් මාසයේ 23, 24 හා 25 යන දිනයන්හි දී බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලවේදී පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත. මෙම ප්‍රදර්ශනය සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ඇසුරුම් නිෂ්පාදන කර්මාන්ත විශාල ප්‍රමාණයක් සහභාගී වන අතර ඒ තුළින් ඔවුන්ගේ නිර්මාණශීලී නිෂ්පාදනයන් සඳහා නව වෙළඳ සබඳතා ඇති කර ගැනීමට අවශ්‍ය මූලික පසුබිම සැකසීම සහ නිෂ්පාදන ඇනවුම් වැඩිකර ගැනීමට හැකියාව සැලසෙනු ඇත.



- දේශීය කර්මාන්තකරුවන්ට ඇසුරුම්කරණය පිළිබඳ නව තාක්ෂණික දැනුම, අත්දැකීම් ලබාගැනීමේ අවස්ථා ඇති කිරීමත්, ශ්‍රී ලංකාවේ ඇසුරුම් නිෂ්පාදන කර්මාන්තය වැඩිදියුණු කිරීමේ අරමුණ ඇතිව මෙම ප්‍රදර්ශනය පැවැත්වේ. ප්‍රදර්ශනය **ශ්‍රී ලංකා ඇසුරුම් ආයතනයේ (SLIP)** සහයෝගය ඇතිව අමාත්‍යාංශය විසින් සංවිධානය කරනු ලබයි. මේ හා සමගාමීව ඇසුරුම් සම්මේලනය පැවැත්වීමට ද කටයුතු සූදානම් කර ඇත.

## 3.3 අනාගත සැලසුම් - 2026

- කර්මාන්ත අංශවල උපදේශක කමිටු යෝජනා හා අදහස් පදනම් කරගනිමින් ඒ ඒ අංශ සඳහා සංවර්ධන සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- සැකසූ ආහාර නිෂ්පාදන කර්මාන්තයේ සහ ඇසුරුම් නිෂ්පාදන කර්මාන්ත ක්ෂේත්‍රයේ නියැලී සිටින නිෂ්පාදකයින්ගේ නිෂ්පාදන ප්‍රවර්ධනය සඳහා අලෙවි ප්‍රදර්ශන වැඩසටහන් සහ ජාත්‍යන්තර වෙළෙඳ ප්‍රදර්ශන වලට සහය සැපයීම.
- සැකසූ ආහාර අංශය, ඇසුරුම් කර්මාන්ත අංශය, තේ, කොහු, කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන හා කුළුබඩු කර්මාන්ත අංශයේ තත්ත්ව සහතික ලබා ගැනීම ඵලදායීතාවය සහ වෙළෙඳපොළ තරඟකාරිත්වය වැඩිදියුණු කිරීමේ (ISO 9001, ISO 14001, ISO 22000, ISO 50001) වැඩසටහන් ක්‍රියාවට නැංවීම.
- සුළු පරිමාණ කර්මාන්තවල ආහාර සුරක්ෂිතතාවය ප්‍රවර්ධනය කිරීම සඳහා යහපත් නිෂ්පාදන පුරුදු (GMP) වැඩසටහන ක්‍රියාවට නැංවීම.
- අගය එකතු කරන ලද නිෂ්පාදන වල අපනයන වර්ධනය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් වැඩි දියුණු කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
- සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා නූතන තාක්ෂණික ක්‍රම අත්පත්කර ගැනීම පිළිබඳව සහ ඔවුන්ගේ කුසලතා වර්ධනය කිරීම සඳහා වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ආහාර නිෂ්පාදනයේ යෙදී සිටින සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ගේ ඇසුරුම් තාක්ෂණය ඉහළ නංවා ගැනීම සඳහා පහසුකම් සැපයීමේ ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීම.
- කර්මාන්ත අංශයේ මානව සම්පත් සංවර්ධනය සඳහා සේවකයින්ගේ කුසලතා සහ පරතරය හඳුනාගැනීම ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
- මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ නිරත වන ශිල්පීන්ගේ තාක්ෂණික දැනුම වර්ධනය කිරීම හරහා ජාත්‍යන්තර වෙළඳපොල තත්ත්වයන්ට අනුකූලව දේශීය නිෂ්පාදන ගෙන ඒමට අවශ්‍ය පුහුණු වැඩසටහන් ක්‍රියාවට නැංවීම.
- විශ්ව විද්‍යාලවල අවසන් වසර සිසුන් සඳහා කර්මාන්ත වල පර්යේෂණ සහ අන්තර්කාලීන පුහුණු අවස්ථා නිර්මාණය සඳහා පහසුකම් සැලසීම.
- කර්මාන්තවලට බලපාන බදු සම්බන්ධ ගැටළු අදාල විසඳුම් සඳහා ජාතික තීරුබදු සමාලෝචන කමිටුව සඳහා නිර්දේශ ලබාදීම.

# 04

# සංවර්ධන අංශ 02

## 4.1 හැඳින්වීම

### ප්‍රධාන අරමුණ

දේශීය කර්මාන්ත උප අංශයන් ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීමත්, එමගින් උසස් නිමැවුමෙන් හා ගුණාත්මක භාවයෙන් යුක්ත වූ භාණ්ඩ බිහිකරමින් ජාත්‍යන්තර වෙළෙඳපොල ජය ගැනීමට හැකි තත්ත්වයක් නිර්මාණය කිරීම මෙම අංශයේ ප්‍රධාන අරමුණ වේ.

### අංශයේ වගකීම් යටතේ පවත්නා කර්මාන්ත අංශ

- රබර් හා ප්ලාස්ටික් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත
- සෙරමික්, ටයිල්, ග්‍රැනයිට්, උළු නිෂ්පාදන කර්මාන්ත
- බෝට්ටු හා උපාංග නිෂ්පාදන කර්මාන්ත
- වාහන එකලස් කිරීම් හා වාහන උපාංග නිෂ්පාදන කර්මාන්ත
- දැව හා දැව ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත
- විදුලි හා විද්‍යුත් භාණ්ඩ නිෂ්පාදන කර්මාන්ත
- තීන්ත, මුද්‍රණ ද්‍රව්‍ය හා රසායන ද්‍රව්‍ය නිෂ්පාදන කර්මාන්ත
- ඛණිජ ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත

### කාර්යයභාරය

- කර්මාන්ත උප අංශ සංවර්ධනයට අවශ්‍ය සැලසුම් සකස් කිරීමේදී රාජ්‍ය අංශය, අධ්‍යාපනඥයින් සහ කර්මාන්තකරුවන් සමඟ ඒකාබද්ධව කටයුතු කිරීම.

- තාක්ෂණික කළමනාකරණ හා නිෂ්පාදනයට අදාල ගැටළු අවබෝධ කර ගැනිම සඳහා අවශ්‍ය උපදෙස් හා පහසුකම් සැපයීම.
- දේශිය කර්මාන්ත අංශයන් සංවර්ධනය කිරීමේදී දේශිය හා විදේශිය වාණිජ මණ්ඩල, රාජ්‍ය අංශයට අයත් ආයතන, සමාගම් හා කර්මාන්ත සංවර්ධනයට ආධාර ලබාදෙන වෙනත් ආයතන සමග සම්බන්ධීකරණය.
- ඵලදායිතාවය ඉහල නැංවීම හා එකතු කල අගය වැඩි කිරීම සඳහා උසස් තාක්ෂණික ක්‍රමෝපායයන් හඳුන්වා දීම සඳහා අවශ්‍ය වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- නිෂ්පාදන කර්මාන්ත ක්ෂේත්‍රයේ ඵලදායිතාවය වැඩි කිරිම සඳහා සේවා නියුක්තව සිටින ශ්‍රමිකයන්ගේ හැකියාවන් සහ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා දේශිය හා විදේශිය පුහුණුව ලබාදීමට අවශ්‍ය වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- අපනයන කර්මාන්ත ප්‍රවර්ධනය කිරිම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම.
- කර්මාන්ත අංශ සඳහා බලපාන බදු හා බදු නොවන ගැටළු වලට අවශ්‍ය විසඳුම් ලබා දීමට අදාල නිර්දේශයන්, මුදල් අමාත්‍යාංශයට හා අදාල අනෙකුත් රාජ්‍ය ආයතන වෙත ලබා දීම.
- විදේශ ශ්‍රමිකයන් සඳහා වීසා නිර්දේශ ලබා දීම, අමු ද්‍රව්‍ය ආනයනය කර දේශීය වටිනාකමක් එකතු කර නැවත අපනයනය කිරීම (TIEP) සඳහා අවශ්‍ය නිර්දේශ ලබා දීම, තාවකාලිකව ආනයනය සීමා කර ඇති, කර්මාන්ත වලට අවශ්‍ය අමුද්‍රව්‍ය ආනයනය සඳහා නිර්දේශ ලබා දීම හා කර්මාන්ත වලට අවශ්‍ය අමුද්‍රව්‍ය ආනයනයේදී බදු සහන හා බදු නිදහස් කිරීම් සඳහා අවශ්‍ය නිර්දේශයන් ලබා දීම වැනි කාර්යයන් හරහා කර්මාන්ත කරුවන්ට තම කර්මාන්තයන් පවත්වාගෙන යාම සඳහා පහසුකම් සැපයීම.
- මේ යටතේ 2025 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාල පරිච්ඡේදය තුල TIEP නිර්දේශ 166 ක් ද, විදේශීය පුද්ගලයින් 125 දෙනෙක් සඳහා වීසා නිර්දේශයන්ද, බදු සහන හා බදු නිදහස් කිරීම් සඳහා අවශ්‍ය නිර්දේශයන් 108 ක් ද ලබා දී ඇත.

## 4.2 ප්‍රගතිය 2025 සැප්තැම්බර් මස අවසානයට

### බෝට්ටු හා බෝට්ටු උපාංග නිෂ්පාදන කර්මාන්ත අංශය

- **බෝට්ටු නිෂ්පාදන කර්මාන්ත සඳහා බේරුවල බෝට්ටු දියත් මගක් පිහිටුවීමේ ව්‍යාපෘතිය**

  අළුතින් නිෂ්පාදනය කරනු ලබන බෝට්ටු දියත් කිරීමට අවශ්‍ය පහසුකම් සහිත බෝට්ටු දියත් මගක් බේරුවල ධීවර වරාය ආශ්‍රිත භූමියෙහි පිහිටු වීම සඳහා වන ව්‍යාපෘතියෙහි ප්‍රසම්පාදන කටයුතු අවසන් කර, ඉදිකිරීම් කටයුතු සඳහා කොන්ත්‍රාත් කරුවකු තෝරා ගෙන ඇති අතර, 2026 වසර තුල මෙහි ඉදිකිරීම් කටයුතු නිම කිරීමට බලාපොරොත්තු වේ. මෙහි අපේක්ෂිත වියදම වන රු. මිලියන 76 ක මුදල අමාත්‍යාංශය විසින් දැරීමට සැලසුම් කර ඇත.

  මෙම ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිලාභ වශයෙන්, බෝට්ටු නිෂ්පාදන අංශයේ අපනයන ආදායම ඉහල යාම, රැකියා අවස්ථා ඉහල යාම හා සංචාරක කර්මාන්තයේ වර්ධනයට මෙය ඉවහල් වීම දැක්විය හැකිය.

**බෝට්ටු දියත් මගක් පිහිටුවීමේ ව්‍යාපෘතිය**



### දැව හා දැව ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත අංශය

- **මොරටුව දැව ආශ්‍රිත නිෂ්පාදන ශිල්පීන්ගේ තාක්ෂණික කුසලතා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය**

මොරටුව ප්‍රදේශයේ සිටින දැව ආශ්‍රිත නිෂ්පාදන ශිල්පීන්ගේ, දැව සැකසුම් සම්බන්ධ අත්‍යවශ්‍ය තාක්ෂණික දැනුම වැඩි දියුණු කිරීම හා දැව සැකසුම් යන්ත්‍ර ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රායෝගික කුසලතා වැඩි දියුණු කිරීම අරමුණු කරගනිමින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සිදු වේ.

මොරටුව ප්‍රදේශයේ සිටින දැව ආශ්‍රිත නිෂ්පාදන ශිල්පීන් 40 දෙනෙක් සඳහා මෙම ව්‍යාපෘතිය යටතේ 2025 වසර තුල පුහුණුව ලබා දීමට අපේක්ෂා කරන අතර, ඒ සඳහා අපේක්ෂිත වියදම වන රු. මිලියන 02 ක මුදල අමාත්‍යාංශය විසින් දැරීමට සැලසුම් කර ඇත.

**දැව හා දැව ආශ්‍රිත නිෂ්පාදන**



## 4.3 අනාගත සැලසුම් - 2026

- කර්මාන්තයන්හි ද්‍රව්‍ය අපතේ යාම්, බලශක්ති අපතේ යාම් හා ජලය අපතේ යාම් අවම කරගනිමින් සම්පත් උපරිම කාර්යක්ෂමතාවකින් යුතුව ව්‍යාපාර කටයුතු සඳහා යොදා ගැනීමට අවශ්‍ය සහාය ලබා දීම සඳහා ජාතික පිවිතුරු නිෂ්පාදන මධ්‍යස්ථානය (NCPC) හා එක්ව වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම

- බේරුවල ධීවර වරාය ආශ්‍රිත භූමියෙහි පිහිටු වීමට යෝජිත, අළුතින් නිෂ්පාදනය කරනු ලබන බෝට්ටු දියත් කිරීමට අවශ්‍ය පහසුකම් සහිත බෝට්ටු දියත් මගෙහි ඉදිරි කටයුතු සිදු කිරීම.
- ජාත්‍යන්තර වෙළෙඳපොළට ප්‍රවේශ වන නව කර්මාන්ත සංඛ්‍යාව ඉහල නැංවීම, නව තාක්ෂණය ලබා ගන්නා කර්මාන්ත සංඛ්‍යාව ඉහල නැංවීම හා අපනයන සහ නාවික සංචාරක ව්‍යාපාරයෙන් විදේශ විනිමය ඉපැයීම් වැඩිදියුණු කිරීම අරමුණු කරගනිමින් බෝට්ටු නිෂ්පාදන කර්මාන්ත අංශය සඳහා වූ ජාත්‍යන්තර වෙළෙඳ ප්‍රදර්ශනයක් පැවැත්වීම සඳහා මූල්‍ය අනුග්‍රහය ලබා දීම.
- ප්‍රතිපත්ති තීරණ සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා, ශ්‍රී ලංකාව තුළ අපනයනය සඳහා මෝටර් රථ ඉලෙක්ට්‍රොනික උපකරණ සහ චිප් නිෂ්පාදනයේ විභවයන් හඳුනා ගැනීමට අදාල වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.

# 05

# සංවර්ධන අංශ 03

## 5.1 හැඳින්වීම

### මූලික අරමුණු

ජාත්‍යන්තර වෙළඳපොල තරගකාරීත්වයට මුහුණ දිය හැකි ගුණාත්මක තත්වයෙන් උසස් භාණ්ඩ නිෂ්පාදන සඳහා පහත සඳහන් කර්මාන්ත, උප අංශ ප්‍රවර්ධනය කිරීම සහ පහසුකම් සැලසීම.

- පාවහන්, සම් හා සම් නිෂ්පාදන ආශ්‍රිත කර්මාන්ත
- ඖෂධ කර්මාන්තය
- රූපලාවන්‍ය කර්මාන්තය
- ලෝහ ආශ්‍රිත කර්මාන්තය
- ඇඟළුම් ආශ්‍රිත කර්මාන්ත

### ප්‍රධාන කාර්යයන්

- අමාත්‍යාංශ උපදේශක සභා රැස්වීම් කැඳවීම, සංවර්ධන උපාය මාර්ග සාකච්ඡා කිරීම හා ඒවාට අවශ්‍ය උපදෙස් ලබාදීම හා ක්‍රියාත්මක කිරීම.

- කර්මාන්ත උපඅංශ සඳහා සංවර්ධන සැලසුම් සහ ව්‍යාපෘති සැකසීම සහ ක්‍රියාත්මක කිරීම.

- රේඛීය අමාත්‍යාංශ, වෙළඳ සංගම්, සම්මේලන හා විශ්වවිද්‍යාල සම්බන්ධීකරණය කරමින් කර්මාන්ත ක්ෂේත්‍රවල උන්නතියට කටයුතු කිරීම.

- තෝරාගනු ලැබූ කර්මාන්ත අංශයන්හි කුසලතා සංවර්ධනය සඳහා පහසුකම් සැලසීම.

- නිදහස් වෙළඳ ගිවිසුම් තුළින් තම වෙළඳපොල කොටස ඉහල නංවා ගැනීමට කර්මන්තකරුවන් දැණුවත් කිරීම හා පහසුකම් සැකසීම.

- ආයෝජන ප්‍රවර්ධන හා අලෙවිකරණ කටයුතු සඳහා පහසුකම් සැපයීම.

- අපනයන දිරිගැන්වීම සඳහා තාවකාලික ආනයන, අපනයන ක්‍රියාවලිය (TIEP) මගින් පහසුකම් සැලසීම හා කර්මාන්ත සඳහා අවශ්‍ය විදේශිය විශේෂඥයින් වෙනුවෙන් වීසා නිර්දේශ කිරීම.

- උක්ත කර්මාන්ත උප අංශවල කර්මාන්තකරුවන් සඳහා අවශ්‍ය විදේශිය ශ්‍රමිකයන් සඳහා වීසා නිර්දේශ ලබා දීම.

- දේශිය කර්මාන්ත සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ආනයනයේදී බදු සහන ලබා දීම සඳහා අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම.

- ජාත්‍යන්තර වෙළෙඳපොල තරගකාරීත්වයට මුහුණ දීම සඳහා දේශිය නිෂ්පාදන කර්මාන්ත වලට අවශ්‍ය ජාත්‍යන්තර ප්‍රමිති සහතික ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් සැලසීම.

- නීතිමය ලෙස අවසර ලබා දී ඇති අබලි ලෝහ අපනයනය සඳහා නිර්දේශ ලබාදීම.

- ලෝහ ආශ්‍රිත කර්මාන්තකරුවන් හට අවශ්‍ය අමුද්‍රව්‍ය ලබා ගැනීම සඳහා ප්‍රතිපත්තිමය සහයෝගය ලබා දීම.

## 5.2 ප්‍රගතිය 2025 සැප්තැම්බර් මස අවසානයට

- 2007 සිට වාර්ෂිකව පවත්වනු ලබන පාවහන් සහ සම්භාණ්ඩ අලෙවි ප්‍රදර්ශනය 2025 වර්ෂයේ පෙබරවාරි මස 6, 7,8 සහ 9 යන දිනයන්හි දී බණ්ඩාරණායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී සාර්ථකව පවත්වන ලදී. මේ සඳහා දේශිය පාවහන් හා පාවහන් ආශ්‍රිත නිෂ්පාදකයින්ගේ වෙළඳකුටි 262ක් සංවිධානය කෙරිණි.

**පාවහන් සහ සම්භාණ්ඩ අලෙවි ප්‍රදර්ශනය**







- නිෂ්පාදන කර්මාන්ත සඳහා වන අවදානම් කළමනාකරණ සැලැස්මක් සැකසීම සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩසටහනක් 2025.07.25 දින කර්මාන්තකරුවන් 40 පමණ සහභාගීත්වයෙන් පශ්චාත් උපාධි කළමනාකරණ මධ්‍යස්ථානයේ දී පවත්වන ලදී.

- ලංකා ජාතික වාණිජ මණ්ඩලය කර්මාන්ත අමාත්‍යාංශය හා එක්ව පවත්වනු ලබන CNCI Achievers Award -2025 2025.10.23 දින පැවැත්වීමට කටයුතු යොදා ඇත.

- කොළඹ විශ්වවිද්‍යාලයේ රූපලාවන්‍ය නිෂ්පාදන සඳහා human repeat patch පරීක්ෂණ පැවැත්වීමේ රසායනාගාර පහසුකම් ස්ථාපිත කිරීම සඳහා මූල්‍ය පහසුකම් සැපයීම සිදු කරන අතර 2025 වර්ෂය තුලදී එම අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම සහ රසායනාගාරය ස්ථාපිත කිරීමේ කටයුතු කිරීමට නියමිතය.

- මෙයට අමතරව සංවර්ධන අංශ 3 මගින් කර්මාන්තකරුවන් වෙත තම නිෂ්පාදන කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ලබාදුන් නිර්දේශ, පවත්වන ලද කමිටු පිළිබඳ ප්‍රමාණාත්මක දත්ත පහත ඉදිරිපත් කර ඇත.

| විස්තරය | උප අංශය | ප්‍රමාණය |
|---|---|---|
| 1.Raw Hide නිර්දේශ | පාවහන් අංශය | 13 |
| 2. බදු සහන නිර්දේශ | රූපලාවණ්‍ය අංශය හා පාවහන් අංශය | 161 |
| 3. මිල කමිටු | ලෝහ අංශය | 06 |
| 4. උපදේශන කමිටු | සියලුම අංශ | 18 |
| 5. VISA කමිටු | සියලුම අංශ | 27 |
| 6. ඇගලුම් අපනයන නිර්දේශ | ඇගලුම් අංශය | 805 |

*මූලාශ්‍රය : සංවර්ධන අංශ 03*

## 5.3 අනාගත සැලසුම් - 2026

- 2007 සිට වාර්ෂිකව පවත්වනු ලබන පාවහන් සහ සම්භාණ්ඩ අලෙවි ප්‍රදර්ශනය 2026 වර්ෂයේ ද පැවැත්වීම සඳහා කර්මාන්ත අමාත්‍යාංශය අනුග්‍රහය දැක්වීමට අපේක්ෂිතය.

- වාර්ෂිකව පවත්වනු ලබන CNCI Achievers Award සඳහා 2026 වර්ෂයේ අනුග්‍රහය දැක්වීමට නියමිතය.

- ව්‍යාපාර අඛණ්ඩ කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන (ආපදා කළමනාකරණ වැඩසටහන) කර්මාන්තකරුවන් වෙනුවෙන් පැවැත්වීමට නියමිතය.

- කොළඹ විශ්වවිද්‍යාලයේ රූපලාවන්‍ය නිෂ්පාදන සඳහා human repeat patch පරීක්ෂණ පැවැත්වීමේ රසායනාගාර පහසුකම ස්ථාපිත කිරීම වර්ෂ 3කින් අවසන් කිරීමට නියමිත බැවින් රහි අනෙකුත් කටයුතු 2026 වර්ෂයේ ද ක්‍රියාත්මක කිරීමට නියමිතය.

# 06

# කර්මාන්ත ලියාපදිංචි අංශය

## 6.1 හැඳින්වීම

කර්මාන්ත ලියාපදිංචි කිරීමේ අංශයේ මූලික අරමුණ වන්නේ 1990 අංක 46 දරන කර්මාන්ත ප්‍රවර්ධන පනතේ විධිවිධාන යටතේ සියලුම නිෂ්පාදන කර්මාන්ත ලියාපදිංචි කිරීමයි. ඒ අනුව, නිෂ්පාදන කර්මාන්ත ව්‍යවසායක නියැලී සිටින සෑම පුද්ගලයෙකුම තම කර්මාන්ත ශාලාව කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ ලියාපදිංචි කළ යුතුය. ඇගයීමකින් පසු, අමාත්‍යාංශය ලියාපදිංචි සහතිකයක් නිකුත් කරන අතර, එමඟින් කර්මාන්තකරුවන්ට විවිධ කාර්මික සංවර්ධන මුලපිරීම් හරහා පිරිනමනු ලබන පුළුල් පරාසයක ප්‍රතිලාභ ලබා ගැනීමට හැකි වේ.

ලියාපදිංචි කර්මාන්ත පහත සඳහන් ප්‍රධාන කාණ්ඩ 09 යටතේ වර්ගීකරණය කර ඇත.

- 31-ආහාර පාන සහ දුම්කොළ නිෂ්පාදන
- 32-රෙදිපිළි, ඇඟලුම් සහ සම් නිෂ්පාදන
- 33-දැව සහ දැවමය නිෂ්පාදන
- 34-කඩදාසි නිෂ්පාදන, ප්‍රකාශන සහ මුද්‍රණය කටයුතු
- 35-රසායනික ද්‍රව්‍ය, ඛණිජ තෙල්, ගල් අඟුරු රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන
- 36-ලෝහමය නොවන ඛනිජ නිෂ්පාදන
- 37-මූලික ලෝහ නිෂ්පාදන
- 38-පිරිසැකසුම් කරන ලද ලෝහ නිෂ්පාදන, යන්ත්‍රෝපකරණ සහ ප්‍රවාහන උපකරණ
- 39-අනෙකුත් නිෂ්පාදන

## 6.2 ප්‍රගතිය 2025 සැප්තැම්බර් මස අවසානයට

- 2025 සැප්තැම්බර් 30 වන දින දක්වා කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය යටතේ නිෂ්පාදන කර්මාන්ත 4,078 ක් ලියාපදිංචි කර ඇත. දිස්ත්‍රික්ක අනුව බෙදා හැරීම පහත පරිදි වේ

| දිස්ත්‍රිකය | ලියාපදිංචි කර්මාන්ත සංඛ්‍යාව |
|---|---|
| කොළඹ | 1880 |
| ගම්පහ | 873 |
| කළුතර | 278 |
| නුවර | 131 |
| මාතලේ | 46 |
| නුවර එළිය | 9 |
| ගාල්ල | 103 |
| මාතර | 96 |
| හම්බන්තොට | 46 |
| යාපනය | 20 |
| කිලිනොච්චි | 2 |
| මන්නාරම | 4 |
| වව්නියා | 9 |
| මුලතිව් | 2 |
| මඩකලපුව | 27 |
| අම්පාර | 26 |
| ත්‍රිකුණාමලය | 13 |
| කුරුණෑගල | 175 |
| පුත්තලම | 114 |
| අනුරාධපුර | 20 |
| පොළොන්නරුව | 19 |
| බදුල්ල | 14 |
| මොණරාගල | 7 |
| රත්නපුර | 97 |
| කෑගල්ල | 67 |
| **මුළු එකතුව** | **4078** |

*මූලාශ්‍රය : කර්මාන්ත ලියාපදිංචි අංශය*

### අංශ අනුව ලියාපදිංචිය (ජනවාරි–සැප්තැම්බර් 2025)

2025 ජනවාරි 1 වන දින සිට 2025 සැප්තැම්බර් 30 වන දින දක්වා කාලය තුළ, අමාත්‍යාංශයට කර්මාන්ත ලියාපදිංචිය සඳහා අයදුම්පත් 118 ක් ලැබී ඇත. මෙයින් කර්මාන්ත 89 ක් අංශ 09 යටතේ ලියාපදිංචි කර ඇත.

| Sector | Number |
|---|---|
| 31-ආහාර පාන සහ දුම්කොළ නිෂ්පාදන | 28 |
| 32-රෙදිපිළි, ඇඟලුම් සහ සම් නිෂ්පාදන | 9 |
| 33-දැව සහ දැවමය නිෂ්පාදන | 4 |
| 34-කඩදාසි නිෂ්පාදන, ප්‍රකාශන සහ මුද්‍රණය කටයුතු | 6 |
| 35-රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන | 18 |
| 36-ලෝහමය නොවන ඛනිජ නිෂ්පාදන | 4 |
| 37-මූලික ලෝහ නිෂ්පාදන | 1 |
| 38-පිරිසැකසුම් කරන ලද ලෝහ නිෂ්පාදන, යන්ත්‍රෝපකරණ සහ ප්‍රවාහන උපකරණ | 9 |
| 39-අනෙකුත් නිෂ්පාදන | 7 |
| **එකතුව** | **89** |

*මූලාශ්‍රය : කර්මාන්ත ලියාපදිංචි අංශය*

| මාසය | ලද අයදුම්පත් | නිකුත් කල සහතිකපත් |
|---|---|---|
| ජනවාරි | 20 | 2 |
| පෙබරවාරි | 16 | 15 |
| මාර්තු | 18 | 11 |
| අප්‍රේල් | 12 | 15 |
| මැයි | 8 | 9 |
| ජූනි | 10 | 13 |
| ජූලි | 11 | 8 |
| අගෝස්තු | 8 | 16 |
| සැත්තැම්බර් | 15 | 0 |
| **මුළු එකතුව** | **118** | **89** |

*මූලාශ්‍රය : කර්මාන්ත ලියාපදිංචි අංශය*

ලියාපදිංචි කර්මාන්ත සංඛ්‍යාව ක්‍රමයෙන් වැඩි වීමක් පෙන්නුම් කර ඇතත්, 2024 වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සසඳන විට 2025 සැප්තැම්බර් 30 වන දින දක්වා ලියාපදිංචි කිරීම් වල අඩුවීමක් දක්නට ලැබුණි. මෙම අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ අයදුම්පත් සමඟ ඉදිරිපත් කරන ලද අසම්පූර්ණ ලියකියවිලි වන අතර එහි ප්‍රතිඵලයක් ලෙස සහතික නිකුත් කිරීම ප්‍රමාද වේ. මීට අමතරව,මාසයන් තුල ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව සහ නිකුත් කරන ලද සහතික අතර විෂමතා ඇති වන්නේ පෙර මාසවල අයදුම්පත් බොහෝ විට පසු කාල පරිච්ඡේදවල සකසන බැවිනි.

**පද්ධති නවීකරණය**

අමාත්‍යාංශය අතින් ලියාපදිංචි කිරීමේ පද්ධතියකින් මාර්ගගත ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදයක් වෙත සාර්ථකව සංක්‍රමණය වී ඇති අතර, එමඟින් කර්මාන්තකරුවන් සඳහා කාර්යක්ෂමතාව ප්‍රවේශය සැලකිය යුතු ලෙස වැඩිදියුණු වී ඇත.

## 6.3 අනාගත සැලසුම් - 2026

- මාර්ගගත කර්මාන්ත ලියාපදිංචි කිරීමේ පද්ධතියේ කාර්යක්ෂමතාව සහ පරිශීලක අත්දැකීම් වැඩි දියුණු කිරීම.
- ප්‍රාදේශීය සහ මධ්‍යම කාර්යාල අතර වඩා හොඳ සම්බන්ධීකරණයක් හරහා සැකසීමේ සහ අනුමත කිරීමේ ප්‍රමාදයන් අවම කිරීම.
- වැඩිදියුණු කළ තීරණ ගැනීම සඳහා දත්ත කළමනාකරණය සහ අධීක්ෂණය ශක්තිමත් කිරීම.
- ලියාපදිංචි අවශ්‍යතා සමඟ අනුකූල වීම වැඩි දියුණු කිරීම සඳහා පාර්ශවකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

# 07

# ව්‍යාපෘති කළමනාකරණ ඒකකය

## 7.1 හැඳින්වීම

කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ඇති ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් කුඩාහා සුළු පරිමාණ කර්මාන්තයන්හි නායකත්ව සහ ව්‍යවසායකත්වය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය III- චක්‍රීය අරමුදල් සහ පරිසර හිතකාමී II- චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය නමින් ණය යෝජනා ක්‍රම දෙකක් දිවයින පුරා ක්‍රියාත්මක කරනු ලබයි.

### 1. කුඩා හා සුළු පරිමාණ කර්මාන්තයන්හි නායකත්ව සහ ව්‍යවසායකයින් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය III - චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය

SMILE III චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය මඟින් නව ව්‍යාපාර ආරම්භ කිරීම හෝ පවතින ව්‍යාපාර වල ඵලදායිතාවය වර්ධනය කිරීම හෝ එකී ආයතනවල ක්‍රියාකාරිත්වය සහ නිෂ්පාදනවල ගුණාත්මකභාවය වර්ධනය කිරීම සඳහා අඩු පොලී අනුපාතයක් යටතේ ණය පහසුකම් සපයනු ලැබේ. එසේම, සුළු හා කුඩා පරිමාණ ව්‍යාපාරවල ආයතන ධාරිතාවය සහ නිෂ්පාදනවල වර්ධනයක් ඇති කිරීමටත් මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබාදෙනු ලැබේ.

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ එකඟතාවය මත 2012 මැයි මස 01 වන දින සිට කර්මාන්ත අමාත්‍යාංශය විසින් මෙම ණය යෝජනා ක්‍රමය පහත සඳහන් අරමුණු යටතේ ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත.

**අරමුණු**

- කුඩා හා සුළු පරිමාණ ව්‍යාපාරවල මූල්‍ය කටයුතුවලට සහයෝගය දක්වමින් නව ව්‍යාපාර ආරම්භ කිරීමට හෝ පවතින ව්‍යාපාර ව්‍යාප්ත කිරීමෙන් එකී ව්‍යාපාර ආර්ථිකමය හා මූල්‍යමය වශයෙන් ශක්තිමත් ව්‍යාපෘතීන් බවට පත් කිරීම.
- කුඩා හා සුළු පරිමාණ ව්‍යාපාරවල කළමනාකරණ හැකියාවන්, ගිණුම්කරණ සහ තාක්ෂණික හැකියාවන් වර්ධනය කිරීම.
- අන්තර් මූල්‍ය ආයතනවල මූල්‍ය හැකියාවන් ශක්තිමත් කිරීම.

මෙම ව්‍යාපෘතිය යටතේ සහභාගිත්ව ණය දෙන ආයතන 10 ක් හරහා ණය ලබා දෙනු ලැබේ. එනම් ලංකා බැංකුව, මහජන බැංකුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, කොමර්ෂල් බැංකුව, හැටන් නැෂනල් බැංකුව, සෙලාන් බැංකුව, ජාතික සංවර්ධන බැංකුව, සම්පත් බැංකුව, සණස සංවර්ධන බැංකුව සහ ඩී එෆ් සි සී බැංකුව.

## 2. පරිසර හිතකාමී චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය II

කාර්මික නිෂ්පාදන ක්‍රියාවලිය තුලින් සිදුවන පරිසර දූෂණය සහ අපද්‍රව්‍ය අවම කිරීම ,සම්පත් ප්‍රතිසාධනය සහ සුරැකීම ,පරිසර දූෂණය පාලනය සහ අවම කිරීම වැනි කටයුතු සඳහා මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ව්‍යවසායකයින්ට සහන පොළී අනුපාතයක් යටතේ ණය මුදල් නිකුත් කරනු ලැබේ ,එමෙන්ම ජාතික පරිසර පනතේ දැක්වෙන ප්‍රමිතීන්ට අනුකූලවීම සඳහා අවශ්‍ය මූලික ක්‍රමෝපායයයන් ආරම්භ කිරීම සඳහා ද මෙම ණය යෝජනා ක්‍රමය මඟින් මූල්‍ය සහාය ලබා දෙනු ලැබේ .

මෙම ව්‍යාපෘතිය සහභාගිත්ව ණය දෙන ආයතන 11 ක් හරහා ක්‍රියාත්මක කරනු ලැබේ .එනම් ලංකා බැංකුව, මහජන බැංකුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, කොමර්ෂල් බැංකුව, හැටන් නැෂනල් බැංකුව, සෙලාන් බැංකුව, ජාතික සංවර්ධන බැංකුව, සම්පත් බැංකුව, ඩී එෆ් සි සී බැංකුව ,ලංකා ඔරික්ස් ලීසිං සමාගම සහ පීපල්ස් ලීසි සමාගම වේ .මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ එකඟතාවය මත 2018 වර්ෂයේ සිට මෙම ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලැබේ.

## 7.2 ප්‍රගතිය 2025 සැප්තැම්බර් මස අවසානයට

### (1) කුඩා හා සුළු පරිමාණ කර්මාන්තයන්හි නායකත්ව සහ ව්‍යවසායකත්වය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය III (චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය)

2025 වර්ෂය සඳහා රුපියල් මිලියන 4000 ක් වෙන් කර ඇත. සමාලෝචනයට භාජනය වන කාලසීමාවේ දී උප ව්‍යාපෘතීන් 201 ක් සඳහා රුපියල් මිලියන 1306 ක් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් නිදහස් කර ඇති අතර මුළු ප්‍රතිපාදන වටිනාකමට මුදල් වෙන් කිරීම සිදු කර ඇත.

### පරිසර හිතකාමී චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය II

මෙම වර්ෂය සඳහා රුපියල් මිලියන 1500 ක් වෙන් කර දී ඇති අතර, සමාලෝචනයට භාජනය වන කාලසීමාවේ දී උප ව්‍යාපෘතීන් 44 ක් සඳහා රුපියල් මිලියන 396 ක් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් නිදහස් කර ඇති අතර ඉතිරි මුදල් මෙම වසර තුළ දී නිදහස් කිරීමට අපේක්ෂිතයි.

## 7.3 අනාගත සැලසුම් - 2026

### (1) කුඩා හා සුළු පරිමාණ කර්මාන්තයන්හි නායකත්ව සහ ව්‍යවසායකත්වය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය III (චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය)

2026 වර්ෂය සඳහා රු. මි. 4250 ක ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කර ඇති අතර මෙම මුදල දළ වශයෙන් උප ව්‍යාපෘතීන් 375 ක් සඳහා ලබා දීමටත් එමගින් නව රැකියා අවස්ථා 2,500 ක් පමණ ජනිත කිරීමටත් අපේක්ෂා කරයි.

### (2) පරිසර හිතකාමී චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය II

2026 වර්ෂය සඳහා රු. මි. 1750 ක ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කර ඇති අතර මෙම මුදල දළ වශයෙන් ව්‍යාපෘති 110 ක් සඳහා ලබා දීමට බලාපොරොත්තු වේ. එමඟින් සම්පත් ඉතිරි කිරීම, සම්පත් ප්‍රතිසාධනය, වෙනත් කර්මාන්ත සඳහා අපද්‍රව්‍ය නැවත භාවිතා කිරීම, අප ජලය පිරිපහදු කිරීම, ප්‍රතිචක්‍රීකරණය කිරීම සහ බලශක්ති ඉතිරි කිරීම වැනි කටයුතු සඳහා මෙම ණය යෝජනා ක්‍රමය මඟින් මුල්‍ය සහාය ලබා දීම තුලින් පරිසර හිතකාමී කාර්මික පරිසරයක් නිර්මාණය කිරීම අපේක්ෂා කෙරේ.

# 08

# පොදු ව්‍යාපාර හා ප්‍රතිව්‍යුහගතකරණ අංශය

## පොදු ව්‍යාපාර හා ප්‍රතිව්‍යුහගතකරණ අංශය

අමාත්‍යාංශයේ පොදු ව්‍යාපාර හා ප්‍රතිව්‍යුහගතකරණ අංශය යටතේ පහත රාජ්‍ය ව්‍යවසායන් ක්‍රියාත්මකව පවතින අතර එම ව්‍යවසායන් සාර්ථක හා තිරසාර ව්‍යවසායන් ලෙස කටයුතු කිරීමට අවශ්‍ය සහයෝගය මෙම අංශය මඟින් ලබා දේ.

## අංශය යටතේ ක්‍රියාත්මක රජය සතු ව්‍යවසායන්

- සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගම
- ගල්ඔය වැවිලි (පුද්) සමාගම
- උක් පර්යේෂණ ආයතනය
- ලංකා පොස්පේට් සමාගම
- ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය
- ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
- ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලය
- සී/ස BCC ලංකා සමාගම

## අරමුණු

- ලාභ ලැබීමට ශක්‍යතාවක් ඇති නමුත් දැනට කාර්යක්ෂම නොවන රාජ්‍ය ව්‍යවසායන් නඟා සිටුවීම හා ප්‍රතිව්‍යුහගතකරණය කිරීම.
- රාජ්‍ය ව්‍යවසායන්ගේ නිෂ්පාදන කටයුතු සඳහා නව තාක්ෂණය හඳුන්වා දීම මඟින්ද, නිෂ්පාදන ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම මඟින්ද, අගය එකතු කිරීම හරහා නිෂ්පාදනයන්ගේ ප්‍රමාණය සහ ගුණාත්මකබව වැඩි කිරීම මගින් ද ලාභ උපරිම කර ගැනීම.

- රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව (PPP) ක්‍රමවේදය යටතේ, රාජ්‍ය ව්‍යවසායන් සඳහා දේශීය හා විදේශීය පෞද්ගලික ආයෝජකයින්ගේ දායකත්වය ලබා ගැනීම.

- දළ දේශීය නිෂ්පාදිතයට ලැබෙන දායකත්වය වැඩිකිරීමට රාජ්‍ය ව්‍යවසායන් හැසිරවීම.

- රාජ්‍ය ව්‍යවසායන්ගේ භෞතික හා මානව සම්පත් කාර්යක්ෂමව කළමණාකරණය කරගැනීමට මාර්ගෝපදේශ සැපයීම.

- දැනට පාඩු ලබන හා ලාභ ලැබීමට හැකියාවක් නොමැති බවට හඳුනාගන්නා රාජ්‍ය ආයතන වසා දැමීමට පියවර ගැනීම.

**ප්‍රධාන කාර්යයන්**

- අංශය යටතේ ඇති ව්‍යවසායන් සම්බන්ධ පරිපාලන සහ සංවර්ධන ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම සහ මෙහෙයවීම.
- රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරීත්ව ක්‍රමය යටතේ සිදු කළ හැකි සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- මහා භාණ්ඩාගාරය මගින් පනවන ලද විධිවිධාන වලට යටත්ව ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘතීන්ට අදාළ කටයුතු ක්‍රියාත්මක කිරීම.

## 8.2 ප්‍රගතිය 2025 සැප්තැම්බර් මස අවසානයට

**ලංකා පොස්පේට් සමාගම:** ලංකා පොස්පේට් සමාගම විසින් කැණීම් කරනු ලබන රොක් පොස්පේට් සඳහා අගය එකතු කිරීමේ ව්‍යාපෘතිය රාජ්‍ය, පෞද්ගලික හවුල්කාරීත්ව ක්‍රමය යටතේ ක්‍රියාත්මක කිරීමට අදාලව ලද අමාත්‍ය මණ්ඩල තීරණ අනුව සුදුසු ආයෝජකයෙකු තෝරා ගැනීම සඳහා අභිලාෂ කැඳවා ඉදිරි කටයුතු මේ වන විට සිදු කරමින් පවති.

**සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගම:** 2025 ජනවාරි සිට 2025 සැප්තැම්බර් 30 දක්වා කාල සීමාව තුළ ලංකා සීනි (පුද්ගලික) සමාගම සීනි මෙට්‍රික් ටොන් 25,000ක් සහ එතනෝල් (ENA) ලීටර් 5,330,977ක් නිෂ්පාදනය කර ඇත.

සී/ස ලංකා සීනි(පුද්ගලික) සමාගම විසින් වර්තමානයේ මුහුණ දී ඇති මූල්‍ය අපහසුතා මඟ හරවා ගැනීමට රුපියල් බිලියනයක මූල්‍ය සහයක් ලබා දීමට අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයකට අනුව 2025 සැප්තැම්බර් මාසය වන විට රුපියල් මිලියන 200ක් මහා භාණ්ඩාගාරය විසින් ලංකා සීනි (පුද්ගලික) සමාගම වෙත ලබා දී ඇත.

සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගමෙහි පැල්වත්ත සහ සෙවනගල සීනි කර්මාන්තශාලා පරිශ්‍ර තුළ, තෝරාගත් ස්ථාන සංචාරක ආකර්ශනය ඇති කිරීමේ අරමුණින් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය රාජ්‍ය, පෞද්ගලික හවුල්කාරීත්ව ක්‍රමය යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.

තවද, සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගමේ සෙවනගල කර්මාන්තශාලාවේ ගින්නෙන් හානි වූ වගා සඳහා උක් ගොවීන්ට වන්දි ලබා දීම සඳහා, ලද අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, වගා හානි සඳහා හිමිකම් ලබන්නන් හඳුනා ගැනීමට කමිටුවක් පත් කර ඇති අතර එයට අදාල ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.

**ගල්ඔය වැවිලි (පුද්) සමාගම:** 2025 ජනවාරි සිට 2025 සැප්තැම්බර් දක්වා කාල සීමාව තුළ සමාගම සීනි මෙ.ටො. 13,000ක් සහ එතනෝල් (ENA) ලීටර් 3,206,427ක් නිෂ්පාදනය කර ඇත. තවද, භාණ්ඩාගාර ලේකම්ගේ 2025.02.20 දිනැති ලිපියක් මඟින් සමාගමට මත්පැන් බෝතල් සැකසුම් කර්මාන්ත ශාලා බලපත්‍රය (Liquor Bottling Plant license) ලබා දීමට අනුමැතිය දී ඇති අතර ඒ අනුව අදාල ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.

**උක් පර්යේෂණ ආයතනය :** පර්යේෂණ හා සංවර්ධන ක්ෂේත්‍රයට අදාල ආයතන 14ක් ඒකාබද්ධ කර ජාතික මට්ටමේ පර්යේෂණ ආයතනයක් පිහිටුවීම සඳහා ගෙන ඇති අමාත්‍ය මණ්ඩල තීරණ අනුව ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.

**ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලය :** ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලය 1957 අංක 49 දරන, රාජ්‍ය කර්මාන්ත සංස්ථා පනත යටතේ පිහිටුවන ලදී.

1990හි ජනවාරි මස, සංස්ථාවේ පිඟන් මැටි අංශය පෞද්ගලීකරණය කරන ලද අතර, සංස්ථාවේ උළු සහ ගඩොල් ඒකකය 'ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලය' නමින් ඉදිරියට පවත්වාගෙන යයි.

**වත්මන් තත්ත්වය**

ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලයේ ලංකාව පුරා කර්මාන්තශාලා 09ක් ඇති අතර, එරගම, මහියංගණය කර්මාන්තශාලා 02 ක් පමණක් මේවන විට නිෂ්පාදන කටයුතු සිදු කරන අතර, මෙම කර්මාන්තශාලා ප්‍රධාන වශයෙන් දේශීය වෙළඳපොල සඳහා උළු සහ ගඩොල් නිෂ්පාදනය කරයි.

රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරීත්වය (PPP) යටතේ එරගම, මහියංගනය, උස්වැව සහ ඔඩ්ඩුසුඩාන් කර්මාන්තශාලා අමප 25/0809/810/028/5/26 අංක සහ 2025/05/26 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබාදී ඇත.

මෙම කර්මාන්තශාලා රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරීත්වය (PPP) යටතේ පවත්වාගෙන යාම සඳහා කර්මාන්තශාලා අයත් භූමියේ පිහිටි මැටි නිධි පිළිබඳව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙන් වාර්තාවක් කැඳවීමට කටයුතු කරමින් පවතී. එමෙන්ම 2024.08.13 වන දින කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ පැවති ප්‍රගති සමාලෝචන රැස්වීමේදී වැ-උඩ, යටියන, බිංගිරිය, ඇලයාපත්තුව හා බංගදෙනිය පරිශ්‍රයන්හි කර්මාන්තපුර පිහිටුවීමට ද තීරණය කර ඇත.

**බී.සී.සී. ලංකා ලිමිටඞ් :** 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනත යටතේ 1988/10/21 බී සී සී ලංකා ලිමිටඞ් යන නමින් සංස්ථාපනය කර ඇත.

බී.සී.සී. ලංකා සමාගම, පිරිපහදු කළ පොල්තෙල්, සුදු පොල්තෙල්, සුවඳ සබන්, පිරිසිදුකාරක සබන්, සේදුම් කුඩු, බඳුන් සේදුම්, විෂබීජ නාශක, වාතාශ්‍රය සුවඳ කරවන ද්‍රව්‍ය (Air fresheners) හා අත් සේදුම්කාරක දියර නිෂ්පාදනය කර දේශීය වෙළඳපොල වෙත අලෙවිය කිරීමේ කටයුතු සිදු කරනු ලබයි. ඊට අමතරව, රාජ්‍ය හා පෞද්ගලික ක්ෂේත්‍ර සඳහා කාර්යාල පහසුකම් සහ ගබඩා පහසුකම් සැපයීම තුළින් ද සැළකිය යුතු ආදායමක් මෙම සමාගම විසින් උපයා ගනු ලැබේ.

- පවතින ගොඩනැගිලි පරිශ්‍ර පරිවර්තනයකරමින් පරිසරහිතකාමී කාර්මික පරිසරයක් ඇති කිරීම තුළින් නවීන ව්‍යාපෘති සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.
- දැනට පිටතින් මිලදී ගෙන විකුණනු ලබන නිෂ්පාදන, සමාගම තුළ නිෂ්පාදනය කර විකිණීමට අවශ්‍ය කටයුතු සූදානම් කිරීම.
- BCC නිෂ්පාදන පිළිබඳ මහජන අවධානය යොමු කිරීම සඳහා මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය හරහා දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සහ BCC නිෂ්පාදන ජනතාවට ඉතා පහසුවෙන් ලබාගත හැකි වන පරිදි ලබා දීම.
- විකුණුම් හැකියාව වැඩි කිරීමට සහ විකුණුම් ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය පියවර ගැනීම සඳහා නව සුපිරි වෙළෙඳසැල් ජාල සමඟ වෙළෙඳ ගිවිසුම්වලට එළැඹීම.
- BCC ආයතනය, පරිශ්‍රය තුළ වර්ග අඩි 85,000 කට ආසන්න සිවිලිම් / වහල අවකාශ භාවිතා කරමින් සූර්ය පැනල් පද්ධතියක් ස්ථාපනය කිරීමට සැලසුම් කරන අතර තිරසර සංවර්ධන අභිමතාර්ථ සපුරාලීම සඳහා රජයට සෘජුවම දායක වීමට සැලසුම් කිරීම.

**අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) :** ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය 1979 අංක 40 දරණ පනත යටතේ අපනයන ප්‍රවර්ධනය සහ සංවර්ධනය සඳහා රාජ්‍ය ආයතනයක් ලෙස පිහිටුවන ලදි. 2030 වන විට අපනයන ආදායම ඇමෙරිකානු ඩොලර් බිලියන 36 ක් දක්වා වැඩි කිරීමට සැලසුම් කර ඇති අතර, එයින් ඇමෙරිකානු ඩොලර් බිලියන 28 ක් භාණ්ඩ අපනයනෙන් උපයාගනු ඇති බව අපේක්ෂා කරයි. 2030 වන විට ඇමෙරිකානු ඩොලර් බිලියන 28 ක ඉලක්කය ලබා ගැනීමට, උපායමාර්ගික සැලසුම ක්‍රියාත්මක කිරීම සහ EDB හි අභ්‍යන්තර කාර්යයන් නැවත ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳව සාකච්ඡා කරන ලදි.

**EDB කාර්ය සාධනය සහ ප්‍රගතිය (ජනවාරි - ජූනි 2025)**

- සංවර්ධන අයවැය 2025 - රු. මිලියන 300
- මූල්‍ය ඉලක්කය (ජනවාරි - ජූනි 2025) - රු. මිලියන 110.68
- වියදම් (ජනවාරි - ජූනි 2025) - රු. මිලියන 67.24
- භෞතික ඉලක්කය (ජනවාරි - ජූනි 2025) - 59%
- භෞතික ප්‍රගතිය (ජනවාරි - ජූනි 2025) - වාර්ෂික ඉලක්කයෙන් 38%

**අමාත්‍යාංශය යටතේ පවතින ආයතන ප්‍රතිව්‍යුහගතකරණය කිරීම :** රජයට අයත් වාණිජමය නොවන ආයතන පිළිබඳ සමාලෝචනය කිරීම" යන මැයෙන් අතිගරු ජනාධිපතිතුමා විසින් 2024.12.13 දිනැතිව ඉදිරිපත් කරන ලද අංක 24/2198/801/008 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ලද අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව පත් කරන ලද නිලධාරී කමිටුව විසින් එකම හෝ සමාන කාර්යයන් ඉටු කරනු ලබන ආයතන හඳුනා ගැනීමෙන් අනතුරුව එම ආයතන ඒකාබද්ධ කිරීම, ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කර ඇත.මීට අමතරව රජයට වැය බරක් වූ / භාණ්ඩාගාරය මත යැපෙන ආයතන සම්බන්ධයෙන් ද එම නිලධාරී කමිටුව නිර්දේශ ඉදිරිපත් කර ඇති අතර එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය 2025.03.17 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී ලැබී ඇත. ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.

**තරුණ ව්‍යවසායකයින් 1000 ක් සංවර්ධනය කිරීමේ ජාතික වැඩසටහන (4 i ව්‍යාපෘතිය )**

- තරුණ ව්‍යවසායකයින් 1000 ක් සංවර්ධනය කිරීමේ ජාතික වැඩසටහනෙහි මූලික අරමුණ වශයෙන් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව අංශයේ තරුණ ව්‍යවසායකයින් ගෝලීය වෙළඳ පොළට සාර්ථකව ප්‍රවේශ වීම සඳහා ඔවුන්ගේ දැනුම කුසලතාව ආකල්ප සහ තරඟකාරීත්වය වැඩි දියුණු කිරීම මඟින් ඔවුන් සවිබල ගැන්වීම සහ අපනයන වෙළඳපොළට සංක්‍රමණය වීමට අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා ඔවුන් මුහුණ දෙන බාධක සහ අභියෝග හඳුනාගෙන ඒවාට විසඳුම් ලබා දීම , කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට නව කළමනාකරණ කුසලතා ඵලදායිතා මෙවලම් සහ ව්‍යාපාර වර්ධනය සඳහා ශිල්පීය ක්‍රම මඟින් සහය වීම සිදු කරනු ලබයි.
- ඒ අනුව , දිස්ත්‍රික්ක 17 ආවරණය කරමින් ව්‍යාපෘති සඳහා වන නිර්ණායක යටතේ ව්‍යවසායකයින් තෝරා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වන ලද අතර සම්මුඛ පරීක්ෂණයෙන් ව්‍යවසායකයින් 713 ක් තෝරා ගන්නා ලදී. දිස්ත්‍රික් ලේකම් කාර්යාල මඟින් සිදු කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාවෙන් පසු මෙම වැඩසටහන සඳහා සුදුසු ව්‍යවසායකයින් 504 ක් තෝරා ගන්නා ලදී.
- මෙම තෝරා ගන්නා ලද ව්‍යවසායකයින් සඳහා සමාරම්භක උත්සවය 2025.10.22 දින කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ ගරු. අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් සහ අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ සහ මෙම ව්‍යාපෘතියේ අදියර 1 සඳහා තෝරා ගන්නා ලද ව්‍යවසකයින්ගේද සහභාගීත්වයෙන් වෝටර්ස් එජ් ආයතනේදී පවත්වන ලදී. ඒ අනුව මෙම තරුණ ව්‍යවසායකයින් සංවර්ධනය කර අපනයන වෙළඳපොළ දක්වා ව්‍යාපාර කටයුතු පුළුල් කිරීමට අවශ්‍ය කටයුතු අමාත්‍යාංශය මඟින් සිදු කිරීමට අපේක්ෂිතය.

## 8.3 අනාගත සැලසුම් - 2026

- එප්පාවල රොක් ෆොස්ෆේට් සඳහා අගය එකතු කිරීමේ ව්‍යාපෘතිය රාජ්‍ය-පෞද්ගලික හවුල්කාර ක්‍රමය යටතේ ක්‍රියාත්මක කිරීම.

- අමාත්‍යාංශය යටතේ පවතින ආයතන 11 ක් ප්‍රතිව්‍යුහගතකරණය කිරීමට අදාල කටයුතු.

- ලංකා පිඟන් සංස්ථාවේ එරගම, මහියංගනය, උස්වැව සහ ඔඩ්ඩුසුඩාන් කර්මාන්තශාලා, රාජ්‍ය-පෞද්ගලික හවුල්කරණ (PPP) ආකෘතිය යටතේ ක්‍රියාත්මක කිරීමට අදාල කටයුතු.

- දේශීය අපනයන කාර්ය සාධනයට විවිධ ප්‍රදේශවලින් ලැබෙන දායකත්වය ශක්තිමත් කිරීම සඳහා එම ප්‍රදේශවල අපනයන වටිනාකම සහ පරිමාව වැඩි දියුණු කිරීමට අවධානය යොමු කිරීම.

- සියලුම දිස්ත්‍රික්කවල අපනයන ක්‍රියාකාරකම්වල නිරත වීමට සහ සමස්ත අපනයන පුළුල් කිරීමට, නවත් ව්‍යාපාර සඳහා අනුබල දීම හා සහය දීම.

- ග්‍රාමීය නිෂ්පාදකයින් සහ සැපයුම්කරුවන්, අපනයනකරුවන් සමඟ සම්බන්ධ කරන කාර්යක්ෂම සැපයුම් ජාල නිර්මාණය කරමින්, සම්බන්ධිත වර්ධනය (inclusive growth) සහ අපනයනය සඳහා ගුණාත්මක භාණ්ඩවල ස්ථාවර ගලා යාම පිළිබඳ තහවුරු කිරීම.

# 09

# සාම්ප්‍රදායික කර්මාන්ත, මැණික් හා ස්වර්ණාභරණ අංශය

## 9.1 සාම්ප්‍රදායික කර්මාන්ත

### 9.1.1 හැඳින්වීම

බතික් හා අත්යන්ත්‍ර රෙදිපිළි කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම හා සාම්ප්‍රදායික හා ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම අරමුණු කර ගනිමින් මෙම අංශය ක්‍රියාත්මක වේ. මෙම අංශයට 2025 වසරේ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් පහත පරිදි ප්‍රතිපාදන වෙන්වී ඇත .

- සාම්ප්‍රදායික හා ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන වැඩසටහනර .මි.100
- අත්යන්ත්‍ර හා රෙදිපිළි කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන (රු .මි.20)

### 9.1.2 ප්‍රගතිය 2025 සැප්තැම්බර් මස අවසානයට

**සාම්ප්‍රදායික හා ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන වැඩසටහන (රු.මි. 100)**

- **දැව මෝස්තර හා නිර්මාණ නවෝත්පාදන මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම**

දැව ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ක්ෂේත්‍රයට අදාළ ප්‍රමිතිගත ශිල්පීන් බිහිකිරීම හා ක්ෂේත්‍රයට අවශ්‍ය තාක්ෂණය, නව මෝස්තර, පර්යේෂණ හා නවෝත්පාදන යන අංශවල වැඩිදියුණුව අරමුණු කර ගනිමින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ.
එහි දී ජාතික ශිල්ප සභාව මගින් පවත්වාගෙන යනු ලබන කටුබැද්ද යාන්ත්‍රික වඩු කර්මාන්ත මධ්‍යස්ථානයේ

පුහුණුව සඳහා අත්‍යවශ්‍ය ගොඩනැගිලි නවීකරණය කිරීම, සනීපාරක්ෂක පහසුකම සංවර්ධනය කිරීම, යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම හා එහි ඇති යන්ත්‍ර සූත්‍ර අළුත්වැඩියා කොට භාවිතයට ගැනීමට කටයුතු කිරීම ව්‍යාපෘතිය යටතේ සිදු කෙරෙමින් පවතී.

මෙම පුහුණු මධ්‍යස්ථානය ට 2026 වසර සඳහා නවක සිසුන් බඳවා ගැනීම මෙම වසරේ සැප්තැම්බර් මාසයේදී සිදු කෙරේ.

## ❖ ග්‍රාමීය හා සාම්ප්‍රදායික කර්මාන්ත නිෂ්පාදන සඳහා දේශීය හා විදේශීය අළෙවි ප්‍රවර්ධන වැඩසටහන

**දේශීය වෙළඳපොල ප්‍රවර්ධන වැඩසටහන් :**

පළාත් හා දිස්ත්‍රික් මට්ටමින් රාජ්‍ය ආයතන සමඟ ඒකාබද්ධව හස්ත කර්මාන්ත නිෂ්පාදන අළෙවිපොල වැඩසටහන් 09 ක් පවත්වා අවසන් කර ඇති අතර මෙමගින් ප්‍රාදේශීයව විසිරි සිටින හස්ත කර්මාන්ත ශිල්පීන්ගේ නිෂ්පාදන අළෙවි කරගැනීම සඳහා අවස්ථාව උදාකර දී තිබේ. මේ වන විට කුලියාපිටිය,කොළඹ ,රත්නපුර,බදුල්ල,යාපනය,මහනුවර,මඩකලපුව,අනුරාධ පුර හා පොලොන්නරුව යන දිස්ත්‍රික්කයන්හි අළෙවිපොල වැඩසටහන් පවත්වා ඇත.

ප්‍රතිලාභ ලද ශිල්පීන් සංඛ්‍යාව 253 කි.

ජාතික ශිල්ප සභාවට අයත් ගාල්ල සිප්නාරා හා පල්ලෙකැලේ ශිල්ප නිෂ්පාදන අළෙවිසැල් සංවර්ධනය කිරීමේ කටයුතු ද මෙම ව්‍යාපෘතිය මගින් සිදුකර ඇති අතර මේ වන විට එමගින් සැලසුම් කරන ලද සියලු කාර්යයන් සම්පූර්ණ කර ඇත.
( වියදම රු.මි 5.503)

## ❖ අත්යන්ත්‍ර හා රෙදිපිළි කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන (රු.මි. 20)

- **බතික් සහ රෙදිපිළි කර්මාන්ත සඳහා පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

මෙම අංශයේ ප්‍රතිපාදන මත ජාතික මෝස්තර මධ්‍යස්ථානය හා ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය ඒකාබද්ධව සිදුකරන ලද පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාදාමය මගින් හඳුනාගත් ස්වභාවික වර්ණක ශාක) අවශේෂ භාවිතයෙන් හඳුනාගත් බතික් හා රෙදිපිළි ( නිෂ්පාදන කර්මාන්තය සඳහා උපයෝගී කරගැනීම ප්‍රචලිත කිරීම හා ඒවා වාණිජකරණය කිරීම පිළිබඳව කටයුතු කිරීම මෙම ව්‍යාපෘතිය මගින් සිදු කෙරේ.
ඊට අදාළ දැනුවත් කිරීමේ වැඩසටහන් හා ප්‍රවර්ධන වැඩසටහන් 2025 නොවැම්බර් මස මහනුවර දී පැවැත්වීමට කටයුතු සංවිධානය කරමින් පවතී.

- **බතික්, අත්යන්ත්‍ර රෙදිපිළි සහ ඇඟලුම් නිෂ්පාදන ප්‍රවර්ධන හා අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

මේ යටතේ නව නිපැයුම් බිහිකිරීම ,නිෂ්පාදන විවිධාංගිකරණය සහ සැපයුම්දාමය ශක්තිමත් කිරීම යන ක්ෂේත්‍රයන් ඔස්සේ පළාත් මට්ටමින් විසිරි සිටින පේෂකර්මාන්තයේ නිරත ශිල්පීන් ,ව්‍යවසායකයින් හා අදාළ රාජ්‍ය අංශයේ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩමුළු පහත පරිදි පවත්වන ලදී.
දකුණු පළාත ජූනි 20 සහ 21 ගාල්ල කඩවත්සතර ප්‍රදේශීය ලේකම් කාර්යාලය ප්‍රතිලාභීන් සංඛ්‍යාව) 100)
බස්නාහිර පළාත ජූනි -26 සහ 27 මීගමුව ඒත්තුකාල, ක්‍රාෆ්ට් ලංකා ආයතනය ප්‍රතිලාභීන් සංඛ්‍යාව)80)
මධ්‍යම පළාත අගෝස්තු -22 සහ 23 කටුගස්තොට නවයාලතැන්න මධ්‍යම පළාත් පුහුණු මධ්‍යස්ථානය ප්‍රතිලාභීන් සංඛ්‍යාව)100 )
වියදම) රු1.827.මි.)

දකුණු පළාත් වැඩමුළුව -ගාල්ල කඩවත්සතර ප්‍රදේශීය ලේකම් කාර්යාලය



- **"ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික මෝස්තර වල උරුමය නැවත ප්‍රතිපෝෂණය කිරීම" ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම**

ශ්‍රී ලංකාවේ ඓතිහාසික හා සංස්කෘතික උරුමය ඇතුළත් මෝස්තර සහ කලාත්මක නිර්මාණ ඩිජිටල් අවකාශය තුළ සංරක්ෂණය කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වන අතර ව්‍යාපෘතිය ජාතික මෝස්තර මධ්‍යස්ථානය මගින් ක්‍රියාත්මක කෙරේ .
.මි.වියදම රු)2.00)

- **අපනයන- නැඹුරු නිෂ්පාදන දිරිමත් කිරීම සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

මෙම ව්‍යාපෘතිය මගින් ශ්‍රී ලංකාවේ විසිර සිටින ටේලර්වරුන්ගේ කුසලතා වැඩිදියුණු කිරීම තුළින් ඔවුන් අපනයන වෙළඳපල සඳහා භාණ්ඩ නිෂ්පාදනය කරන පිරිසක් ලෙස අනාගත වෙළඳපොල සඳහා සූදානම් කරවීමට කටයුතු කෙරේ එහිදී ඔවුන් සතු වෘත්තීය දැනුම. පෙර ඇගැයීම් පරීක්ෂණය මගින් හඳුනාගෙන පුහුණු අවශ්‍යතා සපුරාලමින් අනතුරුව පසු ඇගැයීම සිදු කර ජාතික වෘත්තීය සුදුසුකම් ලබාදීම සිදුකෙරේ මෙම. ව්‍යාපෘතිය ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇගළුම් ආයතනය මේ වන විට ප්‍රතිලාභීන් .මගින් ක්‍රියාත්මක කෙරේ287 දෙනෙකු ඇගැයීමට ලක්කර ඔවුන් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් ලබාදීමට පියවර ගෙන ඇත.

## 9.1.3 අනාගත සැලැසුම් - 2026

**I. ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික මෝස්තර වල උරුමය නැවත ප්‍රතිපෝෂණය කිරීම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම**

ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුමය ඇතුළත් මෝස්තර සහ කලාත්මක නිර්මාණ ඩිජිටල් අවකාශය තුළ සංරක්ෂණය කිරීම, ඓතිහාසික නිර්මාණ ඇසුරෙන් නව නිර්මාණ හා නව මෝස්තර එළිදැක්වීමට අවශ්‍ය පසුබිම සකස් කිරීම,සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීම සහ කලාත්මක අනන්‍යතාවය ප්‍රවර්ධනය කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි.

**II. අත්යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදන කර්මාන්තය සඳහා භාවිතා කරන අත්යන්ත්‍ර හා අනෙකුත් උපකරණ අළුත්වැඩියාව හා නඩත්තු කටයුතු සිදු කිරීම සඳහා නිදහස් කාර්මික ශිල්පී එකතුවක් බිහි කිරීම**

මෙරට අත්යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදන කර්මාන්තය ක්ෂුද්‍ර හා කුඩා පරිමාණ කර්මාන්තයක් ලෙස ක්‍රියාත්මක වන අතර ඉහළ ගුණාත්මකභාවයෙන් යුතු මෝස්තර හා ආවේණික රටා වලින් යුතු නිෂ්පාදන මෙම කර්මාන්තය හරහා වෙළඳපොලට ඉදිරිපත් කෙරේ.ඒ සඳහා වෙළඳපොල තුළ ඉහළ මිලක් හා හොඳ ඉල්ලුමක් ද පවතී.

මෙම කර්මාන්තය සඳහා භාවිතා කරන අත්යන්ත්‍ර හා අනෙකුත් උපකරණ අළුත්වැඩියාව හා නඩත්තු කටයුතු කිරීම සඳහා හැකියාව ඇති නිපුණ කාර්මික ශිල්පීන්ගේ එකතුවක අවශ්‍යතාව ක්ෂේත්‍රය තුළ පවතී.
එම අවශ්‍යතාව සපුරාගැනීම සඳහා මෙම ව්‍යාපෘතිය 2026 වසරේ දී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

**III. අත්‍යන්ත්‍ර රෙදිපිළි, බතික් නිෂ්පාදන ඇතුළු දේශීය ඇඟළුම් හා සබැඳි කර්මාන්ත පිළිබඳ වෙළඳපොළ පර්යේෂණයක් සිදු කිරීම**

ශ්‍රී ලංකාවේ අත්‍යන්ත්‍ර රෙදිපිළි ,බතික් නිෂ්පාදන ඇතුළු දේශීය ඇඟලුම් හා සබැදි කර්මාන්ත වසර ගණනාවක සිට මෙරට ජාතික ආර්ථිකයට හා සේවා නියුක්තියට දායකත්වය දරමින් පාරම්පරික උරුමයටද වටිනාකමක් ලබා දෙන කර්මාන්ත අංශයක් ලෙස හඳුනාගෙන ඇතත්, මෙම කර්මාන්ත ක්ෂේත්‍රය කාලීන වෙළඳපොළ රටාවන් හා නවීන පාරිභෝගික අවශ්‍යතා හඳුනාගෙන කොතරම් දුරට යාවත්කාලීන වී ඇතිද යන්න පිළිබඳව මෙතෙක් වෙළඳපොල පර්යේෂණයක් සිදුකර නොමැත .

මෙම අංශය තුළ නිරත කර්මාන්තකරුවන් , නිෂ්පාදකයින් හා ව්‍යාපාරිකයින්ගේ වෙළඳපොල අවබෝධය වර්ධනය කිරීමට නිවැරදි තොරතුරු ලබා දීම අවශ්‍ය වේ.

ඒ අනුව දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොල විශ්ලේෂණය කිරීම, පාරිභෝගික ආකර්ෂණය සහ ඉල්ලුම් රටා අනාවරණය කිරීම, ව්‍යාපාරිකයන්ගේ නිෂ්පාදකයින්ගේ හා අපනයනකරුවන්ගේ තොරතුරු එක්රැස් කිරීම, වෙළඳපොල ශක්තිමත් කිරීම සඳහා ව්‍යාපාරික උපායමාර්ග සංවර්ධනය කිරීම ආදී කරුණු විමර්ශනය කිරීම සඳහා වෙළඳපොල සමීක්ෂණයක් පැවැත්වීමට සැලසුම් කර ඇත.

**IV. බතික් අත්‍යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදන ක්ෂේත්‍රය සඳහා අමුද්‍රව්‍ය කළමණාකරණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.**

අත්‍යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදන කර්මාන්තයේ හා බතික්නිෂ්පාදන කර්මාන්තයේ පවතින අමුද්‍රව්‍යහිඟය අඩු කිරීම, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට සහනදායී අනුපාතයකට අමුද්‍රව්‍ය සැපයීම ආදී අරමුණු මූලික කර ගනිමින් 2026 වසරේ දී මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

## 9.2 මැණික් හා ස්වර්ණාභරණ

- **මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ ආර්ථික දායකත්වය**

2025 සැප්තැම්බර් මස 30 දින වන විට මැණික්, ස්වර්ණාභරණ හා දියමන්ති නිශ්පාදන අපනයනය කිරීම තුළින් උපයාගෙන ඇති අපනයන වටිනාකම ඇමරිකන් ඩොලර් මිලියන 284.86 ක් වන අතර, එය 2024 වර්ෂයේ දෙසැම්බර් මස 31 වන විට උපයා ගෙන ඇති අපනයන වටිනාකම වන ඇමරිකන් ඩොලර් මිලියන 355 කට සාපේක්ෂව පසුබෑමක් පෙන්නුම් කරයි. එයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ බදු ප්‍රතිශතයන් ඉහළ යාම වන අතර, මෙම අපගමනය අවම කර ගැනීමේ අරමුණින් බදු සහනයක් ලබා ගැනීම සම්බන්ධයෙන් අදාල අංශ සමඟ සාකච්ඡා කරමින් පවතී.

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ දත්ත

| අපනයන වටිනාකම - 2025 සැප්. 30 දිනට | | |
|---|---|---|
| අපනයන නිෂ්පාදනය | අපනයන වටිනාකම (ඇ.ඩො. මිලියන) | % |
| මැණික් | 152.61 | 53.57 |
| ස්වර්ණාභරණ | 13.46 | 4.73 |
| දියමන්ති | 118.78 | 41.70 |
| මුළු වටිනාකම | 284.86 | 100 |

- **ශ්‍රී ලංකාවේ නව මැණික් නිධි ගවේෂණය හා තක්සේරුව**

ශ්‍රී ලංකාවේ භූමි ප්‍රමාණයෙන් තුනෙන් දෙකකට වඩා වැඩි ප්‍රමාණයක් එනම් 70% ක් පමණ මැණික් නිධි පවතින බව ඇස්තමේන්තු කර ඇති අතර, මෙම සම්පත් වලින් මේ වන විට 20% ක් පමණක් මේ දක්වා ගවේෂණය කර ඇත.

මෙම තත්ත්වය යටතේ නව මැණික් නිධි ගවේෂණය ප්‍රමුඛ කාර්යයක් සේ හඳුනා ගෙන ඇති අතර, මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය විසින් නව තාක්ෂණය භාවිතා කරමින් නව මැණික් නිධි ගවේෂණය කිරීමට කටයුතු කරමින් පවතී.

2025 වර්ෂයේ දී මෙම ව්‍යාපෘතිය යටතේ ඉංගිරිය, දෙහිඕවිට, අයගම හා පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල මූලික මැණික් විභව සිතියම් ගත කිරීමේ

කටයුතු අවසන් කර ඇති අතර, ඊට අදාල වාර්තා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නියමිතව ඇත. ශ්‍රී ලංකාව මුහුණ පා ඇති ආර්ථික අර්බුදයට විසඳුම් සෙවීම සඳහා ශ්‍රී ලංකාවේ මැණික් සම්පත කාර්යක්ෂමව භාවිතා කිරීමේ ඉහළ විභවතාවයක් පවතින බැවින්, මෙතෙක් ප්‍රයෝජනයට නොගත් දිවයින පුරා පැතිර පවතින මැණික් සම්පත ප්‍රයෝජනවත් ලෙස වෙළඳපොළට එක් කිරීම සඳහා ගත හැකි ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව, ආර්ථික අර්බුදයේ බලපෑම සටහන් කිරීම පිළිබඳ පාර්ලිමේන්තු ආංශික අධීක්ෂණ කාරක සභාවේ අවධානය යොමු කරන ලදුව, දැනට රටතුළ පවතින වියළි කාලගුණික තත්ත්වය හේතුවෙන් සිදී ඇති වැව් ආශ්‍රිතව පවතින මැණික් සම්පත පරිසර හිතකාමී, ආරක්ෂිත ක්‍රමවේදයන් අනුගමනය කරමින්, විද්‍යාත්මක ක්‍රමවේදයන් යටතේ නෙළා ගැනීමේ ඇති හැකියාව පිළිබඳව අවධානය යොමු කර ඇත. එහි පළමු අදියර යටතේ රත්නපුර දිස්ත්‍රික්කයේ ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි සමනළ වැව ජලාශය ආශ්‍රිත ප්‍රදේශයේ හා නුවරඑළිය දිස්ත්‍රික්කයේ අඹගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි මාඋස්සා කැළේ හා කාසල්රී ජලාශ ආශ්‍රිත ප්‍රදේශයේ මැණික් සම්පත නෙළා ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් කමිටු පත් කොට ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.

- **මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ වෘත්තීය නිපුනතාවය ඉහළ නැංවීම**

2025 වර්ෂය සඳහා ඉලක්ක ගත සිසුන් සංඛ්‍යාව 1528ක් වූ අතර, 2025 සැප්තැම්බර් මස 30 වන විට සිසුන් 1077 දෙනෙකු බඳවා ගෙන ඇත. මෙම වර්ෂයේදී පාඨමාලා නිම කළ සිසුන් ප්‍රමාණය 412 ක් වන අතර සිසුන් 665 දෙනෙකු තවදුරටත් පාඨමාලාව හදාරමින් සිටී.

දිවයින පුරා පිහිටි පුහුණු මධ්‍යස්ථාන 15 කදී මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ විවිධ පුහුණු පාඨමාලා 20 ක් පමණ පවත්වමින් කර්මාන්තයට අවශ්‍ය නිපුණ ශ්‍රමය සැපයීමට කටයුතු කරමින් සිටී.

- **මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තකරුවන් මුහුණ දී ඇති ගැටලු සාකච්ඡා කර විසඳුම් ලබා දීම සඳහා පියවර ගැනීම.**

මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තකරුවන් මුහුණ දී සිටින ගැටලු හා ඔවුන්ගේ යෝජනා සඳහා විසඳුම් ලබා දීම සඳහා නිරන්තරයෙන් ඔවුන් සමඟ සාකච්ඡා කිරීමට පියවර ගෙන ඇත.

- **ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ පනත සංශෝධනය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.**

අදාල පාර්ශවකරුවන්ගේ අදහස් හා යෝජනා ඇතුලත් කරමින් සංශෝධිත පනත් කෙටුම්පත් සකස් කර ඇති අතර, එය තවදුරටත් අධ්‍යනය කර, අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමින් පවතී.

- **මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තයට අදාල මහජන පැමිණිලි විමර්ශනය කිරීම.**

මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්ත ක්ෂේත්‍රයට අදාලව 2025 වර්ෂයේ ලැබුණු පැමිණිලි 49 න් 06ක් සඳහා පිලිතුරු සපයා ඇති අතර ඉතිරි පැමිණිලි සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සිදු කරමින් පවතී. මහජන පැමිණිලි විමර්ශනය වඩා කාර්යක්ෂම කිරීම සඳහා නව ක්‍රමවේදයක් සකස් කරමින් පවතී.

- 2025 වර්ෂයේදී මේ වන විට මැණික් කැණීම් සම්බන්ධයෙන් අභියාචනා 09 ක් ලැබී ඇති අතර, ඉන් 02 ක් විභාග කර අවසන් කර ඇත. ඉතිරි අභියාචනා සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.
- 2024 ජනවාරි මස ශ්‍රී ලංකාවේදී ජාත්‍යන්තර මැණික් හා ස්වර්ණාභරණ වෙළඳ ප්‍රදර්ශනයක් පැවැත්වීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය හා පහසුකම් සැලසීමට කටයුතු කරන ලද අතර, විදේශීය රටවල පැවැත්වෙන වෙළඳ ප්‍රදර්ශන හා සම්මන්ත්‍රණ මණ්ඩප සඳහා ශ්‍රී ලාංකික ව්‍යාපාරිකයින් යොමු කිරීමට පියවර ගෙන ඇත.

- මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ පර්යේෂණ හා පුහුණු අංශය වශයෙන් ස්ථාපනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර, එකී ඒකාබද්ධ කිරීමේ කටයුතු කෙසේ සිදු විය යුතුද යන්න පිළිබඳව අධ්‍යයනය කර වාර්තා කිරීම සඳහා කමිටුවක් පත් කර ඇත. මේ වන විට එකී කමිටුව විසින් අදාළ වාර්තාව සකස් කරමින් පවතී.

## 9.2.3 අනාගත සැලසුම් - 2026

- මැණික් හා ස්වර්ණාභරණ අපනයන ආදායම් 2025 වර්ෂයට සාපේක්ෂව දෙගුණයකින් වර්ධනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම.
- ජාත්‍යන්තර මට්ටමේ මැණික් හා ස්වර්ණාභරණ ප්‍රදර්ශනයක් ශ්‍රී ලංකාවේදී පැවැත්වීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය සිදු කිරීම.
- ශ්‍රී ලංකාවේ නව මැණික් නිධි ගවේෂණය හා තක්සේරු කිරීමේ ඒකාබද්ධ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පසුබිම නිර්මාණය කිරීම.
- ශ්‍රී ලංකාව කලාපීය මැණික් මධ්‍යස්ථානයක් බවට පත් කිරීම සඳහා ලංකාවේ හමු නොවන මැණික් වර්ගද සමඟින් මැණික් සංචිතය ඉහළ නැංවීමට අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- මැණික් තාපකරණය, අගය වැඩි කිරීම හා රසායනාගාර පහසුකම් ආශ්‍රිත පර්යේෂණ සිදු කිරීම සඳහා පසුබිම සකස් කිරීම.
- මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ ව්‍යවසායකයින් බිහි කිරීම සඳහා අවශ්‍ය පරිසරය නිර්මාණය කිරීම.
- මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ ප්‍රවණතාවයන්ට සරිලන පරිදි වෘත්තීය පුහුණු පාඨමාලා සංවර්ධනය කිරීම හා බඳවාගන්නා පුහුණුලාභීන් ප්‍රමාණය වැඩි කිරීමට කටයුතු කිරීම හා අවශ්‍යතාවය පරිදි නව පුහුණු මධ්‍යස්ථාන ස්ථාපනය කිරීමට කටයුතු කිරීම.
- මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ නිරත පුද්ගලික හා රාජ්‍ය ආයතන සමග විධිමත් සම්බන්ධීකරණ යාන්ත්‍රනයක් ඇති කිරීම.
- අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ආයතනයන්හි අණ පනත් හා ගැසට්, කාලීන අවශ්‍යතාවය පරිදි සංශෝධනය කිරීම.
- කර්මාන්තය නියාමනය හා සංවර්ධනය කිරීම සඳහා සුදුසු සංශෝධන සිදු කිරීම.

# 10

# ව්‍යවසායකත්ව සංවර්ධන අංශය

## 10.1 හැඳින්වීම

ශ්‍රී ලංකාව පුරා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්හි වර්ධනය හා තිරසරභාවය ඇති කිරීම ව්‍යවසායකත්ව සංවර්ධන අංශයේ මූලික වගකීම වේ. "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" නිර්මාණය කිරීමේ ජාතික දැක්ම තුළ මෙම අංශය, ව්‍යවසායකයන් හඳුනා ගැනීම, ඔවුන් සංවර්ධනය කරමින් ගෝලීය වෙළඳපොළවලට ප්‍රවිශ්ය කිරීම දක්වා හා ඉන් ඔබ්බට පැතිරුණු සේවාවන් රැසක් ලබා දීම සඳහා නිර්මාණය කර ඇති කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සංවර්ධන උපාය මාර්ගික රාමුවක් තුළ ක්‍රියාත්මක වේ.

ශ්‍රී ලාංකික ව්‍යවසායකයින් මුහුණ දෙන පද්ධතිමය අභියෝගවලට මුහුණ දීමට විසඳුම් ලබා දීම සඳහා වන අංශ 11ක් ඔස්සේ ක්‍රියාත්මක වන මෙම උපායමාර්ගික සැලැස්ම කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් තරඟකාරී, වර්ධනයට නැඹුරු සහ අපනයනයට සූදානම් ව්‍යවසායන් බවට පත්වීමට බලගන්වන සක්‍රීය පරිසර පද්ධතියකට පහසුකම් සපයයි. මෙම උපායමාර්ගික අංශ අතරට කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය දත්ත පද්ධතියක්, ජීවන චක්‍ර ආධාරක ව්‍යුහයන්, ජාතික ව්‍යාපාර සංවර්ධන මධ්‍යස්ථාන ආකෘතිය, වෙළඳපල ප්‍රවේශය සඳහා වන යාන්ත්‍රණ, කර්මාන්ත සහ වෙළඳපල පර්යේෂණ, ඇගැයීමේ වැඩසටහන්, සම්බන්ධතා කළමනාකරණ වැඩසටහන්, ප්‍රාග්ධනයට ප්‍රවේශය, ව්‍යවසායක අධ්‍යාපනය සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය උපදේශක කමිටුව ඇතුළත් වේ.

ව්‍යවසායකත්ව සංවර්ධන අංශය, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවර්ධනය වැඩි දියුණු කිරීම සඳහා ජාතික සහ ජාත්‍යන්තර හවුල්කරුවන් සමඟ ක්‍රියාකාරීව සහයෝගයෙන් කටයුතු කරයි. ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය ධාරිතා සංවර්ධනය, වෙළඳපල පර්යේෂණ සහ ඇගැයීමේ වැඩසටහන් සඳහා සහාය වන අතර, ආසියානු සංවර්ධන බැංකුව සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානය වැනි ආයතන ප්‍රතිපත්ති සම්පාදනය, නියාමන ප්‍රතිසංස්කරණ සහ ආයතනික පෙළගැස්ම පිළිබඳ තාක්ෂණික මග පෙන්වීම සපයනු ලැබේ. ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය සහ පෞද්ගලික අංශය සමඟ සහයෝගීතාවය, ඩිජිටල්කරණය කිරීම සහ ක්‍රියාවලි වැඩිදියුණු කිරීම් තවදුරටත් ශක්තිමත් කොට ඇත. ඒකාබද්ධ ප්‍රතිපත්ති සංවර්ධනය සහ ක්‍රියාත්මක කිරීම සඳහා, ජාතික, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය මට්ටම්වල අන්තර් ආයතනික සම්බන්ධීකරණ කමිටු පිහිටුවීම සිදු කොට ඇති අතර, මෙම කමිටු ප්‍රධාන අමාත්‍යාංශ හරහා සහයෝගී සම්බන්ධතාවයක් ඇති කිරීම, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්හි තීරණාත්මක ගැටළු විසඳීම සහ පුළුල් ලෙස සහාය ලබා දීම සිදු කරයි. මීට අමතරව, දත්ත මත පදනම් වූ පර්යේෂණ, ජාත්‍යන්තර හොඳම භාවිතයන් සහ පාර්ශවකරුවන්ගේ උපදේශනය මගින් මෙහෙයවනු ලබන නව ජාතික කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ප්‍රතිපත්තියක් සංවර්ධනය කිරීම සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන අංශය කටයුතු කරනු ලබයි.

කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB), ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA) සහ අමාත්‍යාංශයේ කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය (SEDD) ඒකාබද්ධ කිරීම, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහාය සඳහා යාන්ත්‍රණයන් විධිමත් කිරීම, ව්‍යාපාර නියාමනය සරල කිරීම, ව්‍යවසායකයින්ට තම ව්‍යාපාර ස්ථාපිත කිරීමට සහ වර්ධනය කිරීමට වේගවත්, සරල සහ වඩාත් විනිවිද භාවයෙන් යුතු ප්‍රවේශයන් සක්‍රීය කිරීම සඳහා අංශය කටයුතු කරයි. ඉහත සියළුම වැඩසටහන් මගින් උපායමාර්ගික සම්බන්ධීකරණය, ප්‍රතිපත්ති මඟ පෙන්වීම සහ හවුල්කාරිත්වය මත පදනම් වූ ප්‍රවේශයන් හරහා, ශ්‍රී ලංකාව තුළ ගෝලීය වශයෙන් තරඟකාරී කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර පරිසර පද්ධතියක් සංවර්ධනය කිරීම සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන අංශය නායකත්වය ලබා දී ඇත.

| ප්‍රධාන ක්ෂේත්‍රයන් | ප්‍රතිදානය | ප්‍රතිඵලය | ප්‍රධාන කාර්ය සාධන දර්ශක | 30/9/2025 දිනට ප්‍රගතිය |
|---|---|---|---|---|
| **කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සේවා සඳහා ඩිජිටල් වේදිකාවක් නිර්මාණය කිරීම.** | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ඩිජිටල් වේදිකාවක් නිර්මාණය අවසන් කිරීම හා ක්‍රියාත්මක කිරීම | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා සහාය සේවා කාර්යක්ෂමව සැපයීම | සම්පූර්ණ කරන ලද ප්‍රතිශතය | 10% |
| **කාර්යක්ෂමතාව වැඩි කිරීමට හා කටයුතු ද්වීකරණය වැළැක්වීම සඳහා IDB, NEDA සහ SEDD ඒකාබද්ධ කරමින් ඒකාබද්ධ ආයතනයක් නිර්මාණය කිරීම.** | ඒකාබද්ධ ආයතනයක් නිර්මාණය කිරීමට අදාළ කටයුතු අවසන් කර ඇත. | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වැඩිදියුණු කළ සේවා සැපයීම | සම්පූර්ණ කරන ලද ප්‍රතිශතය | 30% |

## 10.2 ප්‍රගතිය 2025 සැප්තැම්බර් මස අවසානයට

| ප්‍රධාන ක්ෂේත්‍රයන් | ප්‍රතිදානය | ප්‍රතිඵලය | ප්‍රධාන කාර්ය සාධන දර්ශක | 30/9/2025 දිනට ප්‍රගතිය |
|---|---|---|---|---|
| **බිම් මට්ටමේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්හි ගැටළු හඳුනාගෙන විසඳුම් ලබා දීම සඳහා යාන්ත්‍රණයක් සංවර්ධනය කිරීම.** | දිස්ත්‍රික් කමිටු ස්ථාපිත කිරීම. අන්තර් ආයතනික සම්බන්ධීකරණ කමිටු ස්ථාපිත කිරීම. | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අභියෝග හඳුනා ගැනීම සහ විසඳීමට අදාළ සහය ලබාදීම. | පිහිටුවා ඇති දිස්ත්‍රික් කමිටු සංඛ්‍යාව | 6 |
| **බාධක ඉවත් කර නවෝත්පාදනයට සහාය වීම සඳහා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය සමඟ සහයොර්ගයෙන් ව්‍යාපාර සංවර්ධන (ඉන්කියුබේටර්) ආකෘතියක් සංවර්ධනය කිරීම.** | ජාතික ව්‍යාපාර සංවර්ධන (ඉන්කියුබේටර්) ජාලය ස්ථාපිත කර ඇත | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නවෝත්පාදනයන් සඳහා ඇති බාධක ඉවත් කර වැඩිදියුණු කළ අවස්ථා ඇති කිරීම. | සම්පූර්ණ කරන ලද ප්‍රතිශතය | 10% |
| **දේශීය වෙළඳපොළවල් වලින් ජාත්‍යන්තරය වෙත සංක්‍රමණය වීමට කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට සහාය වීම.** | ව්‍යුහගත වෙළඳපොළ ප්‍රවේශ matrix සංවර්ධනය කර ක්‍රියාත්මක කර ඇත. | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වැඩිදියුණු කළ වෙළඳපල ප්‍රවේශය | සම්පූර්ණ කරන ලද ප්‍රතිශතය | 10% |
| **සංවර්ධන නිලධාරීන් සම්බන්ධතා නිලධාරීන් සහ සන්නාම විශ්ලේෂකයින් බවට පරිවර්තනය කිරීම.** | සහතික කළ සම්බන්ධතා නිලධාරී වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. සහතික කළ වෙළඳ නාම විශ්ලේෂක වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී | නිලධාරීන්ගේ වැඩිදියුණු කළ ධාරිතාව තුළින් වැඩිදියුණු කළ සහ ඉලක්කගත සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් හට සහය දීම. | පුහුණුව ලැබූ නිලධාරීන් සංඛ්‍යාව | 120 |

| ප්‍රධාන ක්ෂේත්‍රයන් | ප්‍රතිදානය | ප්‍රතිඵලය | ප්‍රධාන කාර්ය සාධන දර්ශක | 30/9/2025 දිනට ප්‍රගතිය |
|---|---|---|---|---|
| **කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා අවශ්‍ය මූල්‍ය සේවා සඳහා ප්‍රවේශ වීමට සහය ලබා දීම.** | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල ණය සුදුසුකම් වැඩි දියුණු කිරීම සඳහා නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය | මූල්‍ය සඳහා ප්‍රවේශය වැඩිදියුණු කිරීම | පුහුණුව ලැබූ නිලධාරීන් සංඛ්‍යාව | ඉදිරියේදී සිදුකරනු ඇත |
| **කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය උපදේශක කමිටුවක් පිහිටුවා රැස්වීම් කැඳවීම.** | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර උපදේශක කමිටුවක් පත් කිරීම | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවර්ධනය සඳහා ප්‍රතිපත්ති මාර්ගෝපදේශ සහ උපායමාර්ගික දිශාව ශක්තිමත් කිරීම. | රැස්වීම් ගණන | 4 |
| **උපායමාර්ගික කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන රාමුව සංවර්ධනය කිරීම** | උපායමාර්ගික කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවර්ධන රාමුව සම්පූර්ණ කිරීම. | දිගුකාලීන අංශ සංවර්ධනය සඳහා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ආයතනික සම්බන්ධීකරණය මෙහෙයවීම. | සම්පූර්ණ කරන ලද ප්‍රතිශතය | 100% |
| **කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ප්‍රතිපත්තියක් සකස් කිරීම** | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ප්‍රතිපත්තිය සකස් කර අනුමත කිරීම | පැහැදිලි දිශාව, නියාමන පෙළගැස්ම සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වර්ධනය සඳහා සක්‍රීය පරිසරයක් ඇති කිරීම. | සම්පූර්ණ කරන ලද ප්‍රතිශතය | 10% |
| **ව්‍යාපාර නාම ලියාපදිංචිය සරල කිරීම** | ව්‍යාපාර නාම ලියාපදිංචිය සඳහා ඒකාබද්ධ මාර්ගෝපදේශයක් සකස් කිරීම | පරිපාලන ප්‍රමාදයන් අඩු කිරීම, ව්‍යාපාර කිරීමේ පහසුව සහ ව්‍යාපාර විධිමත් කිරීම වැඩිදියුණු කිරීම | සම්පූර්ණ කරන ලද ප්‍රතිශතය | 30% |

## 10.3 අනාගත සැලසුම් - 2026

රාජ්‍ය හා පෞද්ගලික අංශ දෙකෙහිම ව්‍යවසායකත්වය සහ ව්‍යවසාය සංවර්ධන ප්‍රවර්ධනය කිරීමේදී ඒකාබද්ධ හා සුසංයෝගී ප්‍රවේශයක් සහතික කිරීම සඳහා, ජාතික කර්මාන්ත ප්‍රතිපත්ති රාමුවට අනුකූලව, ජාතික කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවර්ධන ප්‍රතිපත්තිය සකස් කිරීම සඳහා අමාත්‍යාංශය නායකත්වය දෙනු ඇත. කාර්මික හා ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා ඒකාබද්ධ ජාතික ආයතනයක් පිහිටුවීම හා එමගින් ප්‍රතිපත්තිමය මඟ පෙන්වීම, මූල්‍ය ප්‍රවේශය, ධාරිතා ගොඩනැගීම සහ වෙළඳපල පහසුකම් සැපයීම සඳහා තනි සම්බන්ධීකරණ වේදිකාවක් නිර්මාණය කරන පරිවර්තනයක් සිදු කිරීම, නිලධාරීන් ව්‍යාපාර උපදේශකයින් සන්නාම විශ්ලේෂකයින් සහ ණය විශේෂඥයින් බවට පත් කිරීමෙන් සහ ඉහළ වර්ධන අපනයන විභව කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් ගෝලීය වශයෙන් තරඟ කිරීමට සන්නද්ධ කිරීම අමාත්‍යාංශය සහතික කරනු ඇත. ශක්තිමත් කරන ලද නවෝත්පාදනයන්, නියාමන සහ මෙහෙයුම් බාධක අඩු කිරීම සහ පරිසර පද්ධති හවුල්කරුවන් හඳුනා ගැනීම තුළින් අපනයන රැකියා සහ තිරසාර ජාතික වර්ධනය සඳහා අත්‍යවශ්‍ය දායකයෙකු ලෙස කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් අමාත්‍යාංශය තුල සංවර්ධනය කරනු ඇත.

# 11

# සැලසුම් අංශය

## 11.1 හැඳින්වීම

කර්මාන්ත ක්ෂේත්‍රයේ ප්‍රගමණය සඳහා ඉවහල් වන සංවර්ධන ව්‍යාපෘතීන් සැලසුම් කිරීම සඳහා අවශ්‍ය මඟ පෙන්වීම, ප්‍රගති සමාලෝචනය සහ සුපරීක්ෂණය මඟින් ඵලදායී ලෙස ව්‍යාපෘති හඳුනා ගැනීමට හා ක්‍රියාත්මක කිරීමට සහය ලබා දීම සැලසුම් අංශයේ ප්‍රමුඛතම කාර්යභාරය වේ .

වාර්ෂිකව අනුමත අයවැය ප්‍රතිපාදනවලට අනුකූලව ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම හා ඒ අනුව අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩසටහන් පිළිබඳ ප්‍රගතිය සමාලෝචනය, අදාළ ප්‍රගති වාර්තා සකස් කිරීම සහ ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීමත්, අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු, සංස්ථා සහ රාජ්‍ය ව්‍යවසායයන්හි ප්‍රගතිය හා සම්බන්ධ සියලුම සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීමත් සැලසුම් අංශය මඟින් සිදු කරනු ලැබේ.

## 11.2 ප්‍රගතිය 2025 සැප්තැම්බර් මස අවසානයට

- 2025 වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කරන ලදී.
- ප්‍රගති සමාලෝචන/ නියාමන සැලැස්ම 2025 සකස් කරන ලදී.
- අමාත්‍යාංශයේ ප්‍රාග්ධන අයවැය 2026 සකස් කිරීම සිදු කර ඇත.
- උපායමාර්ගික ක්‍රියාත්මක කිරීමේ ගමන් මඟ (Strategic Implementation Road Map 2026-2030) සකස් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු

කෙරෙමින් පවතී (මාර්ගෝපදේශ, ආකෘතිපත්‍ර සකස් කිරීම ආදිය).

- අමාත්‍යාංශය යටතේ පවතින සියළුම අංශ සහ ආයතනවලට කාර්යසාධන දර්ශක (KPI) ඇතුළත් කාර්යසාධන ගිවිසුම් සකස් කිරීමට මඟ පෙන්වීම හා එම ගිවිසුම් ප්‍රකාරව කටයුතු කිරීම වෙනුවෙන් ලේකම්තුමිය සමඟින් අදාළ අංශ/ ආයතන ප්‍රධානීන් ගිවිසුම්ගත කිරීමට කටයුතු කර ඇත. එම ගිවිසුම්වලට අනුකූලව කටයුතු ක්‍රියාත්මක වීමේ ප්‍රගතිය සමාලෝචනය සිදු කෙරෙනු ඇත.

- තිරසර සංවර්ධන අරමුණු (SDG) අංක 9 සඳහා රාජ්‍ය අංශයේ කේන්ද්‍රීය ආයතනය වශයෙන් තිරසාර සංවර්ධන සභාව මඟින් ඉල්ලුම් කරන තොරතුරු ඉදිරිපත් කිරීම සිදු කර ඇත.

- ප්‍රගති සමාලෝචන රැස්වීම පැවැත්වීම

  ව්‍යාපෘති මෙහෙයුම් හා කළමනාකරණ දෙපාර්තමේන්තුවේ මූලිකත්වයෙන් කාර්තු පාදක ඒකාබද්ධ ප්‍රගති සමාලෝචන රැස්වීම් 2ක් පැවැත්වීම සිදු කර ඇත. එමගින් සංවර්ධන අංශ, සංස්ථා, දෙපාර්තමේන්තු හා රාජ්‍ය ව්‍යවසායන් මඟින් 2025 වර්ෂය සඳහා ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්/ ව්‍යාපෘතිවල ප්‍රගතිය සමාලෝචනය සිදු කර ඇත.

  අමාත්‍යාංශයේ අධීක්ෂණ අංශ මගින් සමීප අධීක්ෂණය වන ආයතනවල ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා එම අංශවල ප්‍රධානත්වයෙන් හා සැලසුම් අංශයේ ද දායකත්වය සහිතව ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීමට අවශ්‍ය මගපෙන්වීම සිදු කර ඇත.

- කර්මාන්ත ක්ෂේත්‍රයේ තීරණ ගැනීමට අවශ්‍ය දත්ත නොමැතිවීමේ ගැටළුවට විසඳුමක් ලෙස වාර්ෂිකව පිළියෙළ කරන කර්මාන්ත දත්ත පොත - 2023 පිළියෙළ කර ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කර ඇත. මෙම කර්මාන්ත දත්ත පොත සඳහා අමාත්‍යාංශයේ කර්මාන්ත වර්ගීකරණය අනුව උප අංශ 20 පදනම් කර ගනිමින් දත්ත ඒකරාශී කිරීම සිදු කර ඇත. ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව වැනි ආයතන මූලාශ්‍ර කරගනිමින් හඳුනා ගනු ලබන දත්ත වර්ෂ කිහිපයක දත්ත සමඟ සංසන්දනාත්මකව ගැලපීම සිදු කරමින් අදාළ තොරතුරු ඉදිරිපත් කිරීම සිදු කර ඇත.

- රාජ්‍ය ව්‍යවසායයන්ගේ කාර්යය සමාලෝචන විශ්ලේෂණ වාර්තා අමාත්‍යාංශයේ වෙබ් පිටුවේ පළ කර ඇත.

- 2024 වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.

- 2025 වර්ෂය සඳහා වූ ප්‍රගති වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමේ සියලු කටයුතු අවසන් අදියරේ පවතී. (අයවැය කාරක සභා අවස්ථාව සඳහා)

- ජාතික අයවැය දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව, ජනාධිපති කාර්යාලය, ව්‍යාපෘති කළමනාකරණ හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව ආදී විවිධ ආයතන මඟින් වරින් වර සිදු කරනු ලබන තොරතුරු ඉල්ලීම් සඳහා අදාළ වාර්තා නිසි කලට ඉදිරිපත් කිරීම සිදු කර ඇත.

- අමාත්‍යාංශ ප්‍රතිඵල රාමු (Ministrial Result Framework) සකස් කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව මඟින් සිදු කරන ලද මඟපෙන්වීම අනුව මෙම අමාත්‍යාංශය සඳහා ප්‍රතිඵල රාමුව සකස් කර, ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සිදු කර ඇත.

- "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඇතුළත් කැපවීම් (Commitments) ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය සඳහා ජනාධිපති කාර්යාලය මඟින් ක්‍රියාත්මක කරන ලද Ministry Performance Monitoring System (MPMS) මාර්ගගත පද්ධතිය සඳහා මෙම අමාත්‍යාංශයට අදාළ කැපවීම් 80 වෙනුවෙන් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩසටහන්/ ව්‍යාපෘති/ ක්‍රියාකාරකම් 190 කට ආසන්න ප්‍රමාණයක් ඇතුළත් කිරීම සිදු කර ඇත.

  ඉන් වැඩසටහන්/ ව්‍යාපෘති/ ක්‍රියාකාරකම් 40කට ආසන්න ප්‍රමාණයක දෙවන කාර්තුව දක්වා ප්‍රගතිය ඇතුළත් කිරීම ද සිදු කර ඇත.

- අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩසටහන්/ ව්‍යාපෘති ඇගයීමේ (Evaluation) අවශ්‍යතාවය මත, ව්‍යාපෘති කළමනාකරණ හා මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ 2025 වසර සඳහා තෝරාගත් කර්මාන්තපුර සංවර්ධන වැඩසටහන් ඇගයීමට කටයුතු කරමින් පවතී. ඒ සඳහා මෙහෙයුම් කමිටු ස්ථාපිත කිරීම, ප්‍රසම්පාදන කටයුතු සඳහා අවශ්‍ය ලේඛන (Terms of Reference) සකස් කිරීම සිදු කර ඇත.

## 11.3 අනාගත සැලැසුම් 2026

- උපායමාර්ගික ක්‍රියාත්මක කිරීමේ ගමන් මඟ (Strategic Implementation Road Map) 2026-2030ට අනුකූලව අමාත්‍යාංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම - 2026 සකස් කිරීම.

- ප්‍රගති සමාලෝචන/ නියාමන සැලැස්ම වඩාත් විධිමත්ව හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම.

- 2026 වසරට අදාළව අමාත්‍යාංශ ලේකම්තුමිය හා අංශ/ ආයතන ප්‍රධානීන් අතර කාර්යසාධන ගිවිසුම්වලට එළඹීම හා එම ක්‍රමවේදය අදාළ අංශ/ ආයතන තුළ සෙසු නිලධාරීන් දක්වා ක්‍රියාත්මක කිරීමට මඟපෙන්වීම.

- රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ ඇතුළත් කැපවීම් (Commitments) වෙනුවෙන් 2026 වර්ෂය සඳහා අමාත්‍යාංශය හා ඒ යටතේ පවත්නා ආයතන ක්‍රියාත්මක කරනු ලැබූ වැඩසටහන්/ ව්‍යාපෘති/ ක්‍රියාකාරකම්වල සැලසුම් ජනාධිපති කාර්යාලය මඟින් ක්‍රියාත්මක කර ඇති MPMS මාර්ගගත පද්ධතිය වෙත ඇතුළත් කිරීම හා අදාළ ප්‍රගතීන් කාලානුරූපීව ඉදිරිපත් කිරීම.

# 12

# පාලන අංශය

## 12.1 හැඳින්වීම

අමාත්‍යාංශයේ ප්‍රධානතම අංශයක් ලෙස ක්‍රියාත්මක වන පාලන අංශය සෑම වර්ෂයක් ආරම්භයේදීම අමාත්‍යාංශයේ සමස්ත අරමුණු හා පරමාර්ථවලට අනුරූපීව පාලන අංශය සඳහා සකස් කරගන්නා ලද අරමුණු හා පරමාර්ථ අනුව වර්ෂයේ ක්‍රියාත්මක සැලැස්ම පිළියෙල කරයි. ඒ අනුව මෙම වර්ෂය තුළදී පාලන අංශය විසින් ප්‍රමුඛතාවය ලබාදිය යුතු විශේෂිත වූ අංශ කිහිපයක් හඳුනාගන්නා ලදී. ඒ අනුව ඉටුකරනු ලබන කාර්යයන් පහත පරිදි වේ.

1. නිසි පුහුණු අවශ්‍යතා සපුරාලීම තුළින් කාර්ය මණ්ඩලය බලගැන්වීම හා නීතිමය ක්‍රියාවලිය කාර්යක්ෂමව පවත්වාගෙන යාම තුළින් අවශ්‍ය අවස්ථාවලදී අමාත්‍යාංශයට හා ආයතනවලට අවශ්‍ය නීතිමය උපදෙස් ලබා දීම

2. ප්‍රවාහන අංශයේ ක්‍රියාවලිය මනා ලෙස පවත්වාගෙන යාම තුළින් අමාත්‍යාංශයේ සමස්ත කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා සහායවීම

3. කාර්ය මණ්ඩලයේ මානසික හා චිත්තවේගී යහපැවැත්ම වැඩි දියුණු කිරීම උදෙසා වැඩසටහන් සංවිධානය කිරීම

4. දෛනික තැපැල බෙදාහැරීම විධිමත්ව කළමනාකරණය කිරීම තුළින් රාජකාරි කටයුතු ඵලදායී කිරීම

5. නවීන හා බලශක්තිය ඉතිරි කරන භෞතික පහසුකම් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම් සහ ඒවාට අනුගත වීම

6. අමාත්‍යාංශයේ විදුලිය, ජලය වැනි වියදම් අඩුකර ගැනීමට පියවර ගැනීම

7. අමාත්‍යාංශයේ අදාළ අංශ සම්බන්ධීකරණය කරගනිමින් අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කිරීම, පාර්ලිමේන්තු ප්‍රශ්නවලට පිළිතුරු යැවීම, ආංශික අධීක්ෂණ කාරක සභා හා උපදේශක කාරක සභා සම්බන්ධීකරණය ආදී පාර්ලිමේන්තු කටයුතු වඩාත් විධිමත්ව කාර්යක්ෂමව සිදු කිරීම.

8. ක්‍රියාවලි විශ්ලේෂණය තුළින් හා මානව ප්‍රාග්ධනය ඉහළ නැංවීම තුළින් සමස්ථ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම.

## 12.2 ප්‍රගතිය 2025 සැප්තැම්බර් මස අවසානයට

පාලන අංශය මගින් සිදුවන ප්‍රධාන කාර්යයක් ලෙස කාර්යමණ්ඩල පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම හා ඒ අනුව කාර්යමණ්ඩලය සඳහා පුහුණු අවශ්‍යතා සලසා දීම ගෙනහැර දැක්විය හැකිය.එමෙන්ම විදේශ පුහුණු වැඩසටහන් සඳහා නම් කෙරුණු හා තේරී පත් වූ නිලධාරීන් වෙනුවෙන්ද පාලන අංශය මගින් අවශ්‍ය පහසුකම් හා මගපෙන්වීම ලබා දෙන ලදී. තවද අමාත්‍යාංශයේ ආයතනික හා පරිපාලන ක්‍රමවේද වඩාත් කාර්යක්ෂම කිරීම සඳහා එම විෂයන්වල ගැටලු සහගත තැන් හඳුනාගෙන ඒවා නිවැරදි කර ඵලදායිතාව ඉහළ නැංවීමට අදාළ කළමනාකරණ හා සම්බන්ධීකරණ කාර්යයන් සිදුකිරීමට හැකි විය.

## 12.3 අනාගත සැලැසුම් - 2026

2014 11.25 දිනැති අංක 2412/ 08 දරන අති විශේෂ ගැසට් පත්‍රය අනුව මෙම අමාත්‍යාංශයේ විෂය පථය හා අමාත්‍යාංශයේ කාර්ය හා කර්තව්‍යයන් අනුව සමස්ත රාජකාරි කටයුතු වඩාත් ඵලදායීව ඉටුකිරීම සඳහා පාලන අංශයෙන් ඉටුවිය යුතු රාජකාරි කටයුතු ඉටු කිරීමට 2026 වර්ෂයේදී ද සැලසුම් කර ඇත.අමාත්‍යාංශයේ ප්‍රධාන ඉලක්ක හා අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා භෞතික සහ මානව සම්පත් ප්‍රමාණාත්මක ව හා ගුණාත්මකව ඵලදායි ලෙස උපයෝජනය කර ගැනීම පාලන අංශයේ මූලික පරමාර්ථය වේ. ඒ අනුව 2026 වර්ෂය සඳහා, අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලන ක්‍රම කිහිපයක් සුදුසු පරිදි ඩිජිටල් පද්ධතියකට පරිවර්තනය කිරීම ද අරමුණු කර ඇත.

# 13

# ගිණුම් හා ප්‍රසම්පාදන අංශය

## 13.1 හැඳින්වීම

තාක්ෂණය, දැනුම සහ නවෝත්පාදන චින්තනය මත පදනම්වූ හිතකර පරිසරයක් නිර්මාණය තුලින් විවිධාංගීකරණය වූ, ඉහළ අගය එකතු කළ, නව්‍ය කාර්මික නිෂ්පාදන, පරිසර හිතකාමී සුපිළිපන් ක්‍රමවේදයන් භාවිතය දිරිගැන්වීම, ඉහල වෙළෙඳපළ ප්‍රවේශ අවස්ථා සහ සැමට ප්‍රතිලාබ ලැබෙන කාර්මික සංවර්ධනයක් තහවුරු කර ගැනීම යන අමාත්‍යාංශයේ මෙහෙවර ලගා කර ගැනීමට අදාලව අවශ්‍ය මූල්‍යමය සහයෝගය මුදල් අමාත්‍යාංශය හා අනෙකුතක් ආයතන හා සම්බන්ධවී අඛණ්ඩව ලබා දීම අරමුණු කරගත් මූල්‍ය අංශයේ කාර්ය මණ්ඩල සැකැස්ම හා ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ.

### ප්‍රධාන කාර්යයන්

- අමාත්‍යාංශයට ලැබෙන සියලුම පුනරාවර්තන හා ප්‍රාග්ධන වවුචර් පත් ITMIS පරිගණක පද්ධතියට ඇතුලත් කර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් මුදල් ලබා ගැනීමට කටයුතු කිරීම හා එම වවුචර්පත් සඳහා මුදල් රෙගුලාසි හා ආයතන සංග්‍රහය, චක්‍රලේඛ වලට අනුව ගෙවීම් කිරීම.
- GPS පරිගණක පද්ධතිය මඟින් අමාත්‍යාංහයේ නිළධාරීන්ගේ වැටුප් හා දීමනා ගෙවීමට කටයුතු කිරීම හා රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම යටතේ නිළධාරීන්ට ආපදා ණය, විශේෂ අත්තිකාරම් හා උත්සව අත්තිකාරම් ලබා දීමට කටයුතු කිරීම

- මු.රෙ 135 ප්‍රකාරව මූල්‍ය පාලනය පිළිබඳ වාර්ෂිකව බලතල පැවරීම සකස් කිරීම.
- අමාත්‍යාංශයට ලැබෙන සියලුම විගණන විමසුම් හා වාර්තා විගණන විමසුම් ලේඛණයට ඇතුලත් කර අදාල තොරතුරු විගණකාධිපතිට හා පාර්ලිමේන්තුව වෙත වාර්තා කිරීම.
- අමාත්‍යාංශයේ සියලුම පුනරාවර්තන වියදම් හා ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම සහ වත්කම් මිලදි ගැනීම වැය විෂයන්ට අදාල වාර්ෂික අයවැය සකස් කිරීම.
- ප්‍රාදේශිය කර්මාන්ත සේවා මධ්‍යස්ථාන වල සියලුම මූල්‍ය පාලන කටයුතු සිදු කිරීම.
- දෛනික ලැබීම් හා ගෙවීම් CIGAS පරිගණක පද්ධතියෙහි යාවත්කාලීන කිරීමට කටයුතු කිරීම හා මාසික ගිණුම් සාරාංශය ඇතුළු සියලුම වාර්ෂික මූල්‍ය ප්‍රකාශන භාණ්ඩාගාරයට හා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.
- CIGAS පරිගණක පද්ධතිය හරහා ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යෑම.
- අමාත්‍යාංශයේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට කටයුතු කිරීම.
- වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කිරීම හා ඒ සම්බන්ධ වාර්තා විගණකාධිපති වෙත යැවීම.
- ප්‍රසම්පාදනයට අදාළ පහත කාර්යන් ඉටු කිරීම
- E-Promise පද්ධතිය හරහා වෙළෙඳපළ මිල සැඳහුම් ක්‍රමය යටතේ ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම.
- අමාත්‍යාංශයට අවශ්‍ය සියළුම කාර්යාල ලිපි ද්‍රව්‍ය, කාර්යාල උපකරණ මිලදී ගැනීම සම්බන්ධ කටයුතු සිදු කිරීම.
- දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කටයුතු අධීක්ෂණය කිරීම.
- ජාතික ප්‍රසම්පාදන කොමිෂමට අවශ්‍ය වාර්තා නිසි පරිදි සකස් කර යැවීම
- අමාත්‍යාංශ ප්‍රසම්පාදන සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම
- ප්‍රාදේශීය කර්මාන්ත සේවා මධ්‍යස්ථානයන්හි ප්‍රසම්පාදන කටයුතු අධීක්ෂණය කිරීම.

## 13.2 ප්‍රගතිය 2025 සැප්තැම්බර් මස අවසානයට

අමාත්‍යාංශයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කිරීම තීරු කේත කියවනය (Barcode Reader) මඟින් සිදු කිරීමට අදාළව ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. එහිදී මූලික අධියර ලෙස අමාත්‍යාංශ පරිශ්‍රයේ තිබෙන වත්කම් සඳහා barcode අංකයක් ලබා දී එම දේපල සත්‍යාපනය barcode reader මඟින් ඉතා ඉක්මනින් හා නිවැරදිව සිදු කර ගැනීමට හැකිවනු ඇත. ඒ තුළින් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු කාර්යක්ෂමව, නිවැරදිව හා අඩු කාලයකින් ඉටු කර ගැනීමට හැකිවනු ඇත.

මීට අමතරව මුදල් අමාත්‍යාංශයේ උපදෙස් පරිදි අමාත්‍යාංශය විසින් වෙළෙඳපොළ මිල සැඳහුම් ක්‍රමය යටතේ සිදු කරනු ලබන ප්‍රසම්පාදනයන්ගෙන් 85% ක් පමණ මෙ වන විට e-promise හරහා සිදු කරනු ලැබේ.

# දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා

# 14

# පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව (DTI)

## 14.1 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ අත්‍යන්ත්‍ර පේෂකර්මාන්ත ක්ෂේත්‍රය සඳහා අවශ්‍ය දැනුම හා නිපුණතාවයෙන් යුතු මානව සම්පත බිහිකිරීම ඇතුළුව එම ක්ෂේත්‍රයෙහි කටයුතු විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම සහ සම්බන්ධීකරණය සිදු කිරීම පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත.

දෙපාර්තමේන්තුව යටතේ පිහිටුවා ඇති පේෂ කර්මාන්ත පුහුණු ආයතන සහ මෝස්තර පුහුණු ආයතන මඟින් ඉහත අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම් පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලැබේ.

01. අත්‍යන්ත්‍ර පේෂකර්මාන්තය සංවර්ධනය සඳහා අදාළ ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා තොරතුරු සම්බන්ධීකරණය ඇතුළුව දායකත්වය ලබා දීම.

02. අත්‍යන්ත්‍ර පේෂකර්මාන්ත ක්ෂේත්‍රයෙහි සංවර්ධනයට අවශ්‍ය මානව සම්පත පුහුණු කිරීම.
    - රාජ්‍ය අංශය (පළාත් සභා)
    - සමුපකාර අංශය
    - පෞද්ගලික අංශය

03. නිෂ්පාදන සංවර්ධනය අරමුණු කරගත් වැඩසටහන් සකස් කිරීම.
    - අගය එකතු කල නිෂ්පාදන
    - නිෂ්පාදන විවිධාංගීකරණය

04. අලෙවි ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

05. අත්යන්ත්‍ර පේෂකර්මාන්තය ව්‍යාප්ත කිරීම හා ප්‍රවර්ධනය අරමුණු කරගත් ව්‍යාපෘති, ස්වයං රැකියා වැඩසටහන් සහ උපකාරක සේවා වැඩසටහන් සංවිධානය කිරීම.
    - ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන්
    - මෝස්තර සම්පාදන වැඩසටහන්
    - පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන්
    - පේෂ කර්මාන්ත විවීම් විෂය ක්ෂේත්‍රය ආශ්‍රිත පුහුණු කිරීමේ වැඩසටහන්
    - පේෂ කර්මාන්ත පුහුණු ආයතන වල පුහුණුලාභීන් ඉලක්ක කරගත් ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන්
    - ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතික ලබාදීමේ වැඩසටහන්

06. අත්යන්ත්‍ර පේෂකර්මාන්තයේ නව ප්‍රවණතා සහ ගුණාත්මක නිෂ්පාදන සංවර්ධනය අරමුණු කරගත් ප්‍රදර්ශන පැවැත්වීම.

07. ජාතික අත්යන්ත්‍ර පේෂකර්මාන්ත තරඟාවලිය පැවැත්වීම තුළින් ක්ෂේත්‍රයේ නිර්මාණ ශිල්පීන් ඇගයීම.

08. අත්යන්ත්‍ර පේෂකර්මාන්ත සංවර්ධනය සඳහා අවශ්‍ය පර්යේෂණ හා සංවර්ධන කටයුතු.

09. ක්ෂේත්‍රයට අදාල සංරක්ෂණ කටයුතු

උක්ත අරමුණු ඉටුකරගැනීම සඳහා පහත සඳහන් ආයතන මෙම දෙපාර්තමේන්තුව යටතේ දැනට ක්‍රියාත්මක වේ.

- පර්යේෂණ, පුහුණු, මෝස්තර හා සේවා ආයතනය - කටුබැද්ද
- පේෂකර්මාන්ත කෞතුකාගාරය - කටුබැද්ද
- පේෂ කර්මාන්ත පුහුණු ආයතන
- ග්‍රාමීය අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත ව්‍යාපෘති

සියළු පරිපාලන කටයුතු පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය මඟින් සිදුවන අතර එය පාලන අංශය, ගිණුම් අංශය හා පුහුණු හා සංවර්ධන අංශය වශයෙන් අංශ 03කින් සමන්විතය.

## 14.2 ප්‍රගතිය 2025 සැප්තැම්බර් මස අවසානයට

**භෞතික ප්‍රගතිය**

දෙපාර්තමේන්තුව යටතේ සිදු කරනු ලබන සමස්ත සංවර්ධන වැඩසටහන්වල භෞතික ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස 75%කි.

- ජාතික අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත සහතික පත්‍ර එක් අවුරුදු පූර්ණ කාලීන පාඨමාලාවෙහි 2025/2026 අධ්‍යයන වර්ෂය සඳහා පුහුණුලාභීන් 59ක් බඳවා ගන්නා ලද අතර මේ වන විට අධ්‍යයන කටයුතු ආරම්භ කර ඇත. 2024/2025 අධ්‍යයන වර්ෂයේ එම පාඨමාලාව හැදෑරූ සිසුන් 80ක් පමණ මේ වන විට ක්ෂේත්‍රයෙහි රැඳී සිටියි.

- සේවාස්ථ පුහුණු පාඨමාලා යටතේ අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත මෝස්තර පුහුණු වැඩමුළු 07ක් පවත්වා ඇත. එමඟින් ක්ෂේත්‍රයේ නිරත ශිල්පීන් සහ උපදේශකවරුන් 77ක් පුහුණු කර ඇත.

- අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයේ නිෂ්පාදන සඳහා අගය එකතු කිරීමේ පුහුණු වැඩ සටහන් 02ක් පවත්වා පුහුණුලාභීන් 39ක් පුහුණු කර ඇත.

- ග්‍රාමීය ප්‍රදේශ වල අත්යන්ත්‍ර පේෂ කර්මාන්තයේ නියැලෙන්නන් ඉලක්ක කර ගනිමින් පුහුණු පාඨමාලා 14ක් පවත්වා පුහුණුලාභීන් 238ක් පුහුණු කර ඇත.

- ග්‍රාමීය අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ස්වයං රැකියා ව්‍යාපෘති 8 ක් මගින් ප්‍රතිලාභින් 71 ක් පුහුණුව ලබයි. මාස 6ක පූර්ණකාලීන පාඨමාලාවක් ඇතුළත් වන මෙම ව්‍යාපෘති වැඩසටහන්, කලල්පිටිය, එල්ලක්කළ, පැලපිටියාගොඩ, සූරිය වැව, කිතුලම්පිටිය, කඹුරුපිටිය, මාතලේ, කුරුවිට, වදේමඩ යන ප්‍රදේශ කේන්ද්‍ර කර ගනිමින් පැවැත්වේ. ග්‍රාමීය කාන්තා සවිබලගැන්වීම අරමුණු කරගත් මෙම ව්‍යාපෘති සඳහා කාන්තා සහභාගිත්වය 90%කට වැඩි අතර පුහුණුවෙන් පසු ස්වයං රැකියා ව්‍යාපෘති ආරම්භ කිරීමට සහයෝගය ලබා දේ.

- ග්‍රාමීය මට්ටමේ පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයේ නියැලෙන්නන්ගේ කුසලතා සංවර්ධනය සඳහා සම්පත්දායක පුහුණු සංචිතයක් පිහිටුවන ලදී. ඒ යටතේ නැගෙනහිර පළාත, දකුණු පළාත, උතුරුමැද පළාත්වල පුහුණු වැඩසටහන් 14ක් පවත්වා ඇත.

- අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයට ආවේණික වූ විවීම් ක්‍රමවේද සහ මෝස්තර සංරක්ෂණය කිරීම සහ ප්‍රචලිත කිරීම අරමුණු කර ගනිමින් විවීම් මෝස්තර ඇතුළත් ග්‍රන්ථයක් නිර්මාණය කිරීමට අවශ්‍ය සාම්පල නිර්මාණය කර ඇත.

- ජාතික අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ප්‍රදර්ශනයට සමගාමීව පවත්වනු ලබන පළාත් අත්යන්ත්‍ර රෙදිපිළි තරඟය පවත්වා අවසන් කර ඇත. ජාතික තරඟයේ විනිශ්චය කටයුතුද 2025-10-24 දින පවැත්වීමට නියමිත ය. ජාතික අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත ප්‍රදර්ශනය, සම්මාන ප්‍රදානෝත්සවය සහ අලෙවි සල්පිල 2025 දෙසැම්බර් මාසයේදී 12/13/14 යන දින වලදී පවත්වීමට නියමිත ය.

- නව පර්යේෂණ යටතේ විවිධ අමුද්‍රව්‍ය යොදා ගනිමින් පාරිභෝගිකයින් සඳහා දැරිය හැකි මිලකට මිලදී ගත හැකි අත්යන්ත්‍ර නිෂ්පාදන සාම්පල් සකස් කර ඇත.

- බෝයගනේ පේෂකර්මාන්ත පුහුණු ආයතනයේ වහලේ සිවිලිමේ අළුත්වැඩියා කටයුතු නිමකර ඇත. කටුබැද්ද පේෂ කර්මාන්ත පුහුණු ආයතනයේ වහලය හා සිවිළිම අළුත්වැඩියාව කොටසක් නිම කර ඇත.

**මූල්‍ය ප්‍රගතිය**

2025 වර්ෂයේ අයවැය ප්‍රතිපාදන මඟින් වෙන් කරන ලද පුනරාවර්තන වියදම් රු.මි. 343.3ක් වන අතර 2025 සැප්තැම්බර් 30 දිනට වියදම රු.මි. 219.2 කි. එය සමස්ත වියදමේ ප්‍රතිශතයක් ලෙස 64% කි. තව ද, වෙන් කරන ලද ප්‍රාග්ධන වියදම් රු.මි. 68.95 වන අතර 2025 සැප්තැම්බර් 30 දිනට වියදම රු.මි. 30.0 කි. එය සමස්ත ප්‍රාග්ධන වියදමේ ප්‍රතිශතයක් ලෙස 44%කි.

## 14.3 අනාගත සැලැසුම් - 2026

**අත්යන්ත්‍ර පේෂකර්මාන්ත සංවර්ධන වැඩසටහන් සහ ව්‍යාපෘති**

01. ග්‍රාමීය මට්ටමෙන් අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත ස්වයං රැකියා ව්‍යාපෘති 10ක් ආරම්භ කිරීම.
02. උක්ත ව්‍යාපෘති මඟින් පේෂ කර්මාන්තයේ සක්‍රියව නියැලී සිටින ශිල්පීන් 150ක් බිහිකිරීම.
03. අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් ලබා ගැනීම සඳහා ශිල්පීන් යොමු කිරීමේ වැඩසටහන්.

**අත්‍යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා පුහුණු හා කුසලතා සංවර්ධන වැඩසටහන්.**

01. පේෂකර්මාන්ත පුහුණු ආයතන මගින් පේෂකර්මාන්තයේ සක්‍රියව නියැලී සිටින ශිල්පීන් 100 ක් පුහුණු කිරීම.

02. පේෂ කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා තාක්ෂණික නවෝත්පාදන හඳුන්වාදීම සහ විලාසිතා ප්‍රමුඛ කරගත් නව වෙළඳපල අත්කර ගැනීම තුළ, වෙළඳපොළ අවස්ථා පුළුල් කිරීම.

03. නව පාඨමාලා හඳුන්වා දීම.

04. පේෂකර්මාන්ත පුහුණු ආයතනවල විෂය මාලා ජාතික වෘත්තීය සුදුසුකම් තත්වයන්ට සමපාත වන ලෙස සංවර්ධනය කිරීම.

05. පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

06. සේවාස්ථ පුහුණු වැඩසටහන් හා මෝස්තර පාඨමාලා 25ක් පැවැත්වීම මගින් පේෂකාර්මිකයින් 400ක් පුහුණු කිරීම.

07. නිෂ්පාදන විවිධාංගීකරණ පාඨමාලා හඳුන්වාදීම.

08. අත්‍යන්ත්‍ර නිෂ්පාදන සඳහා අගය එකතුකළ නිෂ්පාදන පාඨමාලා හඳුන්වා දීම.

09. අත්‍යන්ත්‍ර පේෂකර්මාන්ත ක්ෂේත්‍රය සඳහා නව ව්‍යවසායකයින් ලෙස 20 දෙනෙකු සංවර්ධනය කිරීම.

10. පේෂ කර්මාන්ත පුහුණු ආයතන සහ මෝස්තර පුහුණු ආයතනවල සිසුන් සඳහා ආකල්ප සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.

11. අත්‍යන්ත්‍ර මෝස්තර සඳහා පාදක වන මෝස්තර ග්‍රන්ථය සම්පාදනය කිරීම.

12. ග්‍රාමීය ප්‍රදේශවල අත්‍යන්ත්‍ර කර්මාන්තයේ නියුතුවූවන් සඳහා මෝස්තර වැඩමුළු පැවැත්වීම.

13. පළාත් රාජ්‍ය, සමූපකාර හා පෞද්ගලික අංශයේ පේෂකර්මාන්ත ක්ෂේත්‍රයේ නියුතු උපදේශකවරුන් හා නිෂ්පාදකයන් සඳහා අවශ්‍ය වන කෙටිකාලීන පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ, වැඩමුළු පැවැත්වීම.

**පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන්**

01. අත්‍යන්ත්‍ර පේෂකර්මාන්ත උපකරණ සහ උපාංග වැඩිදියුණු කිරීම.
02. ස්වාභාවික වර්ණ උපයෝගී කරගත් අත්‍යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදන හඳුන්වාදීම සඳහා වැඩසටහන් පුළුල් කිරීම.
03. විවිධ අමුද්‍රව්‍ය භාවිතයෙන් වන රෙදි නිෂ්පාදන පාඨමාලා දියත් කිරීම.

**අත්‍යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා ප්‍රවර්ධන වැඩසටහන්.**

01. ජාතික අත්‍යන්ත්‍ර පේෂ කර්මාන්ත ප්‍රදර්ශනය සහ සම්මාන ප්‍රදානෝත්සවය පැවැත්වීම.

02. අත්‍යන්ත්‍ර පේෂ කර්මාන්ත නිෂ්පාදන ප්‍රවර්ධනය සඳහා අලෙවි සල්පිල් දෙකක් වර්ෂය තුළ පැවැත්වීම.

**පේෂකර්මාන්ත ගොඩනැගිලි සංවර්ධනය**

පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවට අයත් පුහුණු මධ්‍යස්ථානවල හඳුනාගත් අළුත්වැඩියාවන් සිදු කිරීම.

01. කිරම, බෝයගනේ, බණ්ඩාරවෙල, නල්ලූර් යන පේෂකර්මාන්ත පුහුණු ආයතන වල අළුත්වැඩියා කටයුතු.

ග්‍රාමීය කන්තාවන් ඉලක්ක කරගත් ස්වයං රැකියා ව්‍යාපෘති





පල්ලු වියමන් සම්බන්ධ ක්ෂේත්‍ර පුහුණුව

ගම්පහ එල්ලක්කල





ගම්පහ කලල්පිටිය

මාතර කඹුරුපිටිය





ස්වාභාවික වර්ණ උපයෝගි කරගනිමින් අත්යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදන හඳුන්වාදීම සඳහා කහ වගාකිරීම

මෝස්තර නිර්මාණ සම්බන්ධව මෝස්තර ග්‍රන්ථයක් නිර්මාණය කිරීම





# 15

# ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB)

## 15.1 හැඳින්වීම

ශ්‍රී ලංකාව පුරා සිටින සිය කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට වඩාත් කාර්යක්ෂම හා ඵලදායී සේවාවන් ලබා දීමට ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය සහතික වේ. ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය 1969 අංක 36 දරණ කර්මාන්ත සංවර්ධන පනත යටතේ සංස්ථාගත කරන ලදී. මෙම පනත ප්‍රකාරව කාර්මික සංවර්ධන මණ්ඩලයට ශ්‍රී ලංකාවේ කර්මාන්ත අංශය සංවර්ධනය කිරීමේ වගකීම පැවරී තිබේ.

### මණ්ඩලයේ අරමුණු

1969 අංක 36 දරණ කර්මාන්ත සංවර්ධන පනත මගින් නියම කර ඇති පරිදි කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි අරමුණු පහත සඳහන් පරිදි වේ.

- ශ්‍රී ලංකාවේ කර්මාන්ත දිරිමත් කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා සහාය වීම.
- මෙරට ආර්ථිකයෙහි පෞද්ගලික සහ රාජ්‍ය අංශයන්ට අයත් සියලුම කාර්මික ව්‍යාපාරයන්හි නිසි සම්බන්ධීකරණය සහ එකිනෙකට සබැඳි වර්ධනය සඳහා සහායවීම.

- ශ්‍රී ලංකාවේ ස්වාභාවික සම්පත් උපයෝජනය කිරීම, කර්මාන්තවලදී භාවිතා කරනු ලබන තාක්ෂණික ක්‍රියාවලීන් සහ ක්‍රමවේද වැඩිදියුණු කිරීම සහ දේශීය කර්මාන්ත සඳහා යෝග්‍ය තාක්ෂණයන් සහ උපකරණ සංවර්ධනය කිරීම සහ නිෂ්පාදන අපද්‍රව්‍ය වඩා යහපත් ලෙස උපයෝජනය කිරීම සඳහා ක්‍රියාවලින් සහ ක්‍රමවේදයන් සකස් කිරීම යන අරමුණු ඇතිව කර්මාන්ත පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම.
- දේශීය කර්මාන්ත නිෂ්පාදන විදේශීය වෙළඳපොළට අපනයනය කිරීම ප්‍රවර්ධනය කිරීම.
- කර්මාන්ත සංවර්ධනයට අවශ්‍ය වන හෝ හිතකර වන පරිදි අන්තර්ජාතික වෙළඳාම සහ කලාපීය සහයෝගීතාවය යන ක්ෂේත්‍රවලදී ගනු ලබන ක්‍රියාමාර්ග සඳහා සහාය දීම.
- ප්‍රාග්ධන, ණය, අලෙවිකරණ, කළමනාකරණ, සහ තාක්ෂණික පහසුකම් සහ නීති උපදෙස් සපයා දීම ද ඇතුළුව ශ්‍රී ලංකාවේ ඇති ඕනෑම කාර්මික ව්‍යාපාරයක් හෝ කාර්මික ආයතනකට හෝ ඒ අදාළව අවශ්‍ය කරන සෑම ආකාරයකම පහසුකම් සහ සේවා සැපයීම.

### ආයතනයේ ප්‍රධාන ක්‍රියාකාරකම් හා කාර්යයන්

- කළමනාකරණ තාක්ෂණික සහ ඉංජිනේරු කාර්යයන් පිළිබඳ පුහුණු වැඩසටහන් සහ උපදේශන සේවා සැපයීම.
- ඉංජිනේරු සේවා වැඩහල් පහසුකම් වාත්තු සේවා සහ අනෙකුත් ඉංජිනේරු සහායයන් ලබාදීම.
- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් හට නව ව්‍යාපාර ක්ෂේත්‍ර පිළිබඳව දැනුවත් කිරීම.
- කර්මාන්තකරුවන්, සේවාදායකයින් සහ කාර්යය මණ්ඩලය සඳහා කාර්මික තොරතුරු බෙදාහැරීම.
- කර්මාන්ත ප්‍රවර්ධනය හා සංවර්ධනය සඳහා අලෙවිකරණ සහාය සහ උපදේශන සේවා සැපයීම.
- තාක්ෂණික සේවා සැපයීම හා දේශීය ලෝහ කර්මාන්තකරුවන් වෙත අවශ්‍ය පහසුකම් සැලසීම.

## 15.2 ප්‍රගතිය 2025 සැප්තැම්බර් මස අවසානයට

### වාර්ෂික පාවහන් සහ සම්භාණ්ඩ ප්‍රදර්ශනය

මෙරට සම්භාණ්ඩ ආශ්‍රිත කර්මාන්ත ක්ෂේත්‍රයට දේශීයව හා ජාත්‍යන්තර වශයෙන් පිළිගැනීමක් ලබාදීමේ අරමුණින් පාවහන් සහ සම්භාණ්ඩ ප්‍රදර්ශනය පහළොස් වැනි වරටත් මෙවර සංවිධානය කරනු ලැබීය. ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය සහ අපනයන සංවර්ධන මණ්ඩලය ඇතුළුව කර්මාන්ත අමාත්‍යාංශය සහ අනෙකුත් පාර්ශවකරුවන් එක්ව මෙම ප්‍රදර්ශනය සංවිධානය කරනු ලැබීය.

**පාවහන් සහ සම්භාණ්ඩ ප්‍රදර්ශනය**



### ජාතික කර්මාන්ත සන්නාම විශිෂ්ටතා සම්මාන

මෙම සම්මාන උළෙල සංවිධානය කිරීමේ ප්‍රධාන අරමුණ වන්නේ, මෙරට පවතින විවිධ කර්මාන්ත හරහා ජාතියේ ආර්ථික හා කාර්මික වර්ධනයට සැලකිය යුතු දායකත්වයක් සපයන කැපී පෙනෙන සන්නාම හඳුනා ගැනීමයි. ඊට අමතරව, ශ්‍රී ලාංකික ව්‍යාපාරික ක්ෂේත්‍රය තුළ තවදුරටත් නවෝත්පාදනයන් සහ ව්‍යාප්තිය දිරිගැන්වීම මෙම උත්සවයේ තවත් ප්‍රධාන අරමුණකි

**ජාතික කර්මාන්ත සන්නාම විශිෂ්ටතා සම්මාන උළෙල**



## කර්මාන්ත ප්‍රදර්ශනය 2025

කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය, ශ්‍රී ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය සමඟ එක්ව, කර්මාන්ත ප්‍රදර්ශනය 2025 සංවිධානය කරන ලදී. මෙම වැඩසටහනේ අරමුණ වූයේ කර්මාන්ත සංවර්ධනයේ පවතින අභියෝගයන්ට පිළියම් සොයාගැනීමත්, ජාතික නිෂ්පාදනය සඳහා ප්‍රධාන කොටස්කරුවන් කළ දායකත්වය හා ආර්ථිකය ශක්තිමත් කිරීමට ඔවුන් කළ භූමිකාව අගය කිරීමත් ය.

**කර්මාන්ත ප්‍රදර්ශනය 2025**




## ශ්‍රී ලංකාවේ පාසල් ව්‍යවසායකයින් සැමරීම උදෙසා පවත්වන ජාතික පදක්කම් ප්‍රදානෝත්සවය

ජාතික පාසල් - කර්මාන්ත ව්‍යවසායකත්ව කව වැඩසටහනේ ප්‍රමුඛතම අවස්ථාව වන ජාතික පදක්කම් ප්‍රදානෝත්සවය, කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය, ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය සහ අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ එක්ව සාර්ථකව පවත්වන ලදී. මෙම පරිවර්තනීය මුලපිරීම පාසල් දරුවන් අතර ව්‍යවසායක චින්තනය පෝෂණය කිරීමට ඉවහල් වන අතර, කුඩා කල සිටම නවෝත්පාදනය, ඵලදායිතාව සහ කාර්මික වර්ධනයට දායක වීමට ඔවුන් බලගන්වයි.

**ජාතික පදක්කම් ප්‍රදානෝත්සවය**




## භෞතික ප්‍රගතිය

| ප්‍රතිදාන පිළිබඳ විස්තරය | ප්‍රධාන කාර්ය සාධන දර්ශක ප්‍රතිදාන KPI | වාර්ෂික ඉලක්ක | සමුච්චිත භෞතික ප්‍රගතිය සැප්තැම්බර් 30 දක්වා | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| 1.සහායදායක පරිසර සහාය (පහසුකම් හා උපයෝගිතා සම්බන්ධීකරණය/ Tariff) | සහාය ලබාදුන් ව්‍යවසායකයින් සංඛ්‍යාව | 2000 | 237 | 20% |
| 2.අලෙවිකරණ සහාය (වෙළඳ ප්‍රදර්ශනය/ ප්‍රදර්ශන / ගැනුම්කරු විකුණුම්කරුවන්ගේ රැස්වීම / ඉදිරි විකුණුම් ගිවිසුම) | ආධාර ලබා දුන් කර්මාන්තකරුවන් ගණන | 2250 | 823 | 20% |
| 3.තාක්ෂණ සහාය / බලශක්ති කාර්යක්ෂම විසඳුම්, බලශක්ති පරිභෝජනයන් සඳහා අනුගත වීම / නිෂ්පාදන / පද්ධති ප්‍රමිති සහතික ලබා ගැනීමට සහාය වීම. | සහාය සපයන ලද කර්මාන්තකරුවන් ගණන | 2850 | 1806 | 63.36% |
| 4. කළමනාකරණ සහාය (පිරිවැයකරණය / පොත් තැබීම / ගබඩා තබා ගැනීම / සැලසුම් කිරීම / ඵලදායිතා සංවර්ධනය / කම්කරු නීති / බදු උපදේශනය / කළමනාකරණ උපදේශනය ආදිය සඳහා) | සහාය සපයන ලද කර්මාන්තකරුවන් ගණන | 2250 | 715 | 31.77% |
| 5. මූල්‍ය ආධාර සැපයීම (ණය / ප්‍රදාන සහ ඒ ආශ්‍රිත) ව්‍යාපෘති වාර්තා සකස් කිරීම (තක්සේරු කිරීම / තාක්ෂණික / ශක්‍යතා වාර්තා / අලෙවිකරණය / ව්‍යාපාර සැලැස්ම) | ලබා ගත් පහසුකම් ගණන | 1500 | 317 | 19.73% |
| 6.ඉඩම් ලබා ගැනීමට සහාය වීම. | සහාය සපයන ලද කර්මාන්තකරුවන් ගණන | 20 | 3 | 15% |
| **IDB මුළු ප්‍රතිදානය (භෞතික) ප්‍රගතිය % ප්‍රතිශතය** | | **10870** | **3901** | **35.8%** |

*මූලාශ්‍රය - ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය*




*මූලාශ්‍රය - ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය*

### මූල්‍ය ප්‍රගති සාරාංශය (ජනවාරි - සැප්තැම්බර් 2025)

| ව්‍යාපෘතිය | වෙන් කිරීම 2025 | 30/09/2025 දිනට සැබෑ වියදම් (රු.මි.) |
|---|---|---|
| ප්‍රධාන සහ කුඩා කාර්මික ජනපද වැඩිදියුණු කිරීම සහ නවීකරණය කිරීම | 100 | 87.2 |
| සංවර්ධන කටයුතු සඳහා වන වියදම් | 37.365 | 4.0 |
| ප්‍රාග්ධන වත්කම් ප්‍රතිස්ථාපනය කිරීම සහ වැඩිදියුණු කිරීම | 38.155 | 0.192 |
| ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම | 24.480 | 25.994 |
| **එකතුව** | **200.00** | **117.39** |

*මූලාශ්‍රය - ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය*

## 15.3 අනාගත සැලසුම් - 2026

- ශ්‍රී ලංකාවේ පළාත් 09 ආවරණය වනසේ කර්මාන්ත පෝෂක මධ්‍යස්ථාන (Industry Incubators) 9 ක් පිහිටුවීමේ ව්‍යාපෘතිය.

  වෙළඳපොල වෙත ළඟාවීමට Startup තෝරාගැනීමට සහායවීම සඳහා Startup Incubators වැඩසටහන ස්ථාපිත කිරීම.

- සියළුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි අලෙවි මධ්‍යස්ථාන 25ක් ස්ථාපිත කිරීම.

  සම්පත් සුලභතාවය සහ ලබාගත හැකි බව වෙළඳපොල අවස්ථා සහ වර්ධනය වීමේ හැකියාව මත පදනම්ව ඒ ඒ දිස්ත්‍රික්ක සංවර්ධන සැලැස්ම යටතේ දිස්ත්‍රික්කයට / ප්‍රදේශයට ආවේණික නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම.

- දිවයිනේ සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ආවරණය වන පරිදි නව ප්‍රතිඵංජිනේරු ව්‍යාපාර 331ක් ස්ථාපිත කිරීම.

  එක් එක් කර්මාන්තවල ජාතික වැදගත්කම මත ඒවා දියුණු කිරීම සඳහා සෘජු මැදිහත්වීම තිරසාරත්වය හා නියාමනය සඳහා පහසුකම් සැලසීම.

- නව හා පවතින කර්මාන්ත සංවර්ධන වැඩසටහන්. තාක්ෂණික, කළමනාකරණ හා වෙළඳපොල සහායක සේවා සැපයීම.

  (ජාතික ප්‍රතිපත්ති රාමුවක් මගින් කර්මාන්ත සංවර්ධනයට අවශ්‍ය ආයතනික, ප්‍රාග්ධන, තාක්ෂණ සහ වෙළඳපොල සහයෝගය සැපයීමේ ප්‍රවේශය)

- හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඉදිකිරීමට නියමිත කාර්මික නගර ව්‍යාපෘතිය.

  නව දේශීය හා විදේශීය ආයෝජන හා ව්‍යවසායකත්ව ප්‍රවර්ධනය

- කාර්මික ජනපද නවීකරණය කිරීම හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය -IDB (ඇල්පිටිය, දොඩන්ගොඩ, වීරකැටිය, කඹුරුපිටිය)

  කර්මාන්තපුර සහ යටිතල පහසුකම් ලබාදීමේ වැඩසටහන යටතේ ක්‍රියාත්මක (මෙමගින් උපයෝගී කර නොගත් සම්පත් ප්‍රයෝජනයට ගනිමින් පවතින කර්මාන්තපුර සංවර්ධනය කෙරේ.)

## 2025 සැප්තැම්බර් 30 වන දිනට කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි කාර්මික ජනපද වල සාරාංශය

| අංකය | කාර්මික ජනපදය | දිස්ත්‍රික්කය | මුළු බිම් කොටස් ගණන | යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ආයෝජනය (රු. මි.) | මෙහෙයුම් කර්මාන්ත | පුද්ගලික ආයෝජන (රු. මි.) | වාර්ෂික පිරිවැටුම (රු. මි.) | රැකියා ගණන |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | ඒකල | ගම්පහ | 92 | 118.7 | 58 | 37195.5 | 26294.5 | 2558 |
| 2 | පල්ලෙකැලේ | මහනුවර | 111 | 108.33 | 57 | 14620.53 | 17500 | 1287 |
| 3 | පානළුව | කොළඹ | 38 | 69.91 | 23 | 1091.65 | 1965.4 | 361 |
| 4 | හොරණ | කළුතර | 66 | 17.71 | 14 | 998.51 | 4295.8 | 1547 |
| 5 | වවුලුගල | කළුතර | 14 | 19.9 | 13 | 261.1 | 459 | 181 |
| 6 | පුස්සැල්ල | රත්නපුරය | 29 | 15.21 | 9 | 202 | 185 | 59 |
| 7 | ගලිගමුව | කෑගල්ල | 12 | 15.33 | 8 | 214 | 250 | 84 |
| 8 | බුත්තල | මොනරාගල | 22 | 20.1 | 11 | 300 | 1345 | 450 |
| 9 | කොටගල | නුවරඑළිය | 60 | 9.79 | 9 | 287.66 | 605.69 | 152 |
| 10 | කළුදේවල | මාතලේ | 43 | 53.8 | 13 | 583 | 542 | 221 |
| 11 | මිහින්තලේ | අනුරාධපුර | 42 | 5.04 | 7 | 33 | 43.54 | 20 |
| 12 | නාගම්පහ | අනුරාධපුර | 44 | 24 | 1 | 10 | 4 | 3 |
| 13 | පන්නල - පළමු අදියර | කුරුණෑගල | 34 | 84.75 | 17 | 801 | 1314 | 212 |
| | පන්නල - 2 වන අදියර | | 11 | | 1 | 333 | 20 | 10 |
| 14 | ලුණුවිල | පුත්තලම | 17 | 4.9 | 12 | 83.9 | 175 | 304 |
| 15 | පුන්තෝඩම් | වවුනියාව | 64 | 30.57 | 14 | 147.5 | 146.66 | 114 |
| 16 | අච්චුවේලි - 1 වන අදියර | යාපනය | 23 | 192 | 6 | 417.4 | 275 | 247 |
| | අච්චුවේලි - 2 වන අදියර | | 25 | 41.57 | 2 | 120 | 96 | 95 |
| සමස්ත එකතුව | | | **747** | **831.61** | **275** | **57699.75** | **55516.9** | **7905** |
| 17 | ඇල්පිටිය නව කාර්මික ජනපදය - අදියර B | ගාල්ල | 13 | 37.28 | 11(Allocated) | 0 | 0 | 0 |
| | ඇල්පිටිය නව කාර්මික ජනපදය - අදියර A & C | ගාල්ල | 43 | 75.68 | 09(Allocated) | 0 | 0 | 0 |
| එකතුව | | | 56 | 112.93 | 20 | 0 | 0 | 0 |

*මූලාශ්‍රය - ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය*

# 16

# ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA)

## 16.1 හැඳින්වීම

මෙරට ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (MSME) අංශයට විශේෂ අවධානයක් යොමු කරමින්, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA) ශ්‍රී ලංකාව තුළ ව්‍යවසාය සංවර්ධනය සඳහා ප්‍රවර්ධනය, දිරිගැන්වීම සහ පහසුකම් සැලසීම සිදු කරයි. එමගින් ව්‍යවසායකයින්ට සහ ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන්ට ව්‍යවසායකත්ව සංවර්ධනය, මූල්‍ය පහසුකම් සැපයීම, අලෙවිකරණ සම්බන්ධතා, පර්යේෂණ සහ සංවර්ධන සහ යටිතල පහසුකම් සංවර්ධනය වැනි සේවාවන් සපයනු ලබයි. තව ද, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් ව්‍යවසායකයින්ට ව්‍යවසායකත්වය, අලෙවිකරණය, ව්‍යාපාර සැලසුම්කරණය, ගිණුම්කරණය, වාර්තා තබා ගැනීම සහ ඵලදායිතාව වැඩිදියුණු කිරීම යනාදී ධාරිතා සංවර්ධන පුහුණු අවස්ථාද ලබාදෙයි.

**ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරී පනතට අනුකූල වන්නා වූ අරමුණු :**

- ශ්‍රී ලංකාව තුළ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය දිරිමත් කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ පහසුකම් සැලසීම මගින් ශ්‍රී ලංකා ආර්ථිකයේ උන්නතිය, ව්‍යාප්තිය සහ සංවර්ධනය උත්තේජනය කිරීම.
- ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරී පනතේ අරමුණු ඉටු කර ගැනීම උදෙසා විදේශීය වෙළඳපොළ ජයගැනීමේ හැකියාව ඇති දේශීය ව්‍යවසායයන් ජාත්‍යන්තරකරණය කිරීම සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත ස්ථාපිත කිරීම සහ ක්‍රියාත්මක කිරීම උත්තේජනය කිරීම සහ දිරිගැන්වීම.

- ප්‍රතිපත්ති, සැලසුම්, උසස් කිරීම් දිරිගැන්වීම නිසි ලෙස සැලසුම් කිරීම සහ ඵලදායී ලෙස කර්මාන්ත සහ කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රයේ අළෙවිය සහ සංවර්ධනය සඳහා සහාය වීම සහ ප්‍රවර්ධනය කිරීම.
- ව්‍යවසාය සංවර්ධනයේ අනිවාර්ය අංගයක් ලෙස තාක්ෂණික කුසලතාවයෙන් යුත් මානව ප්‍රාග්ධන සම්පතක් වශයෙන් පුද්ගලයින් සවිබල ගැන්වීම.
- සංවර්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
- ව්‍යවසාය සංවර්ධනය සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සඳහා ප්‍රවේශයට ව්‍යවසායකයින් වෙත පහසුකම් සැළසීම.
- නිෂ්පාදන සංවර්ධනය, තාක්ෂණික ප්‍රවර්ධනය සහ වාණිජමය බලපත්‍ර සම්බන්ධයෙන් වන පර්යේෂණ ප්‍රවර්ධනය හා සංවර්ධනය උදෙසා තාක්ෂණික සංවර්ධන අරමුදලක් ස්ථාපිත කිරීම.
- ප්‍රාදේශීය ආර්ථික සංවර්ධනයට පහසුකම් සැළසීම.

## 16.2 ප්‍රගතිය 2025 සැප්තැම්බර් මස අවසානයට

| ව්‍යාපෘතියේ නම | 2025 වසර සඳහා වෙන් කිරීම (රු. මිලියන) | සැබෑ වියදම් (සමුච්චිත) (රු. මිලියන) | කාර්ය සාධන දර්ශකය | වාර්ෂික ඉලක්කය | භෞතික ප්‍රගතිය අගෝස්තු දක්වා |
|---|---|---|---|---|---|
| "උපාධිධාරී ව්‍යවසායක උදානය" වැඩසටහන | 9.0 | 0.12 | ව්‍යවසායකත්වය සහ ව්‍යාපාර සැලසුම් පිළිබඳ පුහුණුව ලැබූ උපාධිධාරීන් සංඛ්‍යාව | 200 | 404 |
| | | | ව්‍යවසායකයින් ලෙස වර්ධනය වූ උපාධිධාරීන් ප්‍රමාණය | 30 | 00 |
| වෘත්තීය පුහුණු ආයතන සමග සිදු කරන තරුණ ව්‍යවසායකත්ව නිපුණතා සංවර්ධන වැඩසටහන | 3.0 | 00 | ව්‍යවසායකත්වය සහ ව්‍යාපාර සැලසුම් පිළිබඳ පුහුණුව ලත් වෘත්තීය පුහුණුවන්නන් සංඛ්‍යාව | 200 | 84 |
| | | | ව්‍යවසායකයින් ලෙස වර්ධනය වූ වෘත්තීය අභ්‍යාසලාභීන් සංඛ්‍යාව. | 20 | 0 |
| ව්‍යාපාර පර්ෂද/ ක්ෂේත්‍ර සංවර්ධන වැඩසටහන | 2.0 | 00 | ස්ථාපිත පර්ෂද/ ක්ෂේත්‍ර ගණන | 15 | 24 |
| | | | ව්‍යාපාර පර්ෂද හරහා ස්ථාපිත නව ව්‍යාපාර සංඛ්‍යාව. | 30 | 44 |
| | | | පවතින ව්‍යාපාර පුළුල් කිරීමේ සංඛ්‍යාව | 75 | 41 |
| "මේඩ් ඉන් ශ්‍රී ලංකා" වෙළඳ ප්‍රදර්ශන | 9.5 | 0.83 | පවත්වන ලද "මේඩ් ඉන් ශ්‍රී ලංකා" වෙළඳ ප්‍රදර්ශන සංඛ්‍යාව | 3 | 6 |
| | | | වෙළඳ ප්‍රදර්ශනය මගින් පහසුකම් සපයන ලද ක්ෂුද්‍ර, සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සංඛ්‍යාව | 180 | 250 |

| ව්‍යාපෘතියේ නම | **2025** වසර සඳහා වෙන් කිරීම (රු. මිලියන) | සැබෑ වියදම් (සමුච්චිත) (රු. මිලියන) | කාර්ය සාධන දර්ශකය | වාර්ෂික ඉලක්කය | භෞතික ප්‍රගතිය අගෝස්තු දක්වා |
|---|---|---|---|---|---|
| ප්‍රාදේශීය ව්‍යවසායක සම්මාන උළෙල ක්‍රියාත්මක කිරීම | 8.0 | 0.86 | පවත්වනු ලැබූ සම්මාන උළෙලවල් ගණන | 5 | 00 |
| | | | ව්‍යවසායකයින්ට සඳහා ලබා දුන් සම්මාන ප්‍රමාණය | 125 | 00 |
| කලාපීය ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන | 8.0 | 4.3 | පුහුණු වූ නව ව්‍යවසායකයින් සංඛ්‍යාව | 25000 | 13254 |
| | | | ආරම්භ කල නව ව්‍යාපාර සංඛ්‍යාව | 750 | 211 |
| | | | වැඩිදියුණු කරන ලද දැනට ආරම්භ කර ඇති ව්‍යාපාර | 1000 | 350 |
| "මේඩ් ඉන් ශ්‍රී ලංකා" ලාංඡනය පිරිනැමීම සහ ප්‍රවර්ධනය | 0.5 | 00 | "මේඩ් ඉන් ශ්‍රී ලංකා" ලාංඡනය ලබා ගත් ව්‍යවසායකයින් සංඛ්‍යාව | 40 | 20 |
| | | | "මේඩ් ඉන් ශ්‍රී ලංකා" ලාංඡනය ලබා ගත් නිෂ්පාදන සංඛ්‍යාව | 50 | 64 |
| ප්‍රාදේශීය ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන | 0.4 | 00 | පවත්වන ලද දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ව්‍යවසාය සංසද සංඛ්‍යාව | 400 | 86 |
| | | | ව්‍යාපාරික ගැටළු විසඳී ඇති සංඛ්‍යාව (දිස්ත්‍රික්/කොට්ඨාශ මට්ටමේ පොදු ව්‍යාපාරික ගැටළු) | 500 | 145 |
| ඉන්කියුබේෂන් ( Incubation) මධ්‍යස්ථානය පිහිටුවීම, ප්‍රතිසංස්කරණය කිරීම සහ පුනර්ජීවනය කිරීම | 1.0 | 0.44 | පවත්වන ලද දැනුම බෙදාගැනීමේ වැඩමුළු සංඛ්‍යාව | 3 | 12 |
| | | | පහසුකම් සැපයූ ව්‍යවසායයන් සංඛ්‍යාව | 10 | 20 |
| B500 ව්‍යාපෘතිය – සන්නාම සංවර්ධන වැඩසටහන | 2.6 | 1.81 | ව්‍යවසායකයින් සඳහා පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | 10 | 6 |
| | | | පුහුණු කරන ලද ව්‍යවසායකයින් සංඛ්‍යාව | 250 | 540 |
| | | | ඩිජිටල් අලෙවිකරණය කරා ළඟා වූ ව්‍යවසායකයින් සංඛ්‍යාව | 50 | 180 |
| ග්‍රාමීය ව්‍යවසායකයින් සඳහා මාර්ගගත අලෙවිකරණය | 1.0 | 0.45 | NEDA/වෙනත් වෙළඳ ද්වාරය සඳහා ලියාපදිංචි වී ඇති සැපයුම්කරුවන් සංඛ්‍යාව | 100 | 3 |
| | | | ඩිජිටල් භාවිතයේ නිරත වන සංඛ්‍යාව | 400 | 186 |

| ව්‍යාපෘතියේ නම | **2025 වසර සඳහා වෙන් කිරීම (රු. මිලියන)** | **සැබෑ වියදම් (සමුච්චිත) (රු. මිලියන)** | **කාර්ය සාධන දර්ශකය** | **වාර්ෂික ඉලක්කය** | **භෞතික ප්‍රගතිය අගෝස්තු දක්වා** |
|---|---|---|---|---|---|
| ශ්‍රී ලාංකික ව්‍යවසායකයින් සඳහා ජාත්‍යන්තර ව්‍යාපාර සම්බන්ධතා ඇති කිරීම | 1.0 | 00 | ඇති කර ගත් ව්‍යාපාර සබඳතා සංඛ්‍යාව | 02 | 00 |
| | | | ව්‍යාපාර සබඳතා සඳහා සහභාගී වූ ව්‍යවසායකයින් සංඛ්‍යාව | 30 | 00 |
| කාර්යමණ්ඩල පුහුණුව | 1.5 | 0.066 | | | |
| ස්ථාවර වත්කම් | 2.5 | 1.498 | | | |
| **මුළු වියදම** | **50** | **10.374** | | | |

## 16.3 අනාගත සැලසුම් - 2026

- නවීන ගොවිතැන් ශිල්පීය ක්‍රම, දේශගුණික-සුහුරු පිළිවෙත් සහ පරිසර හිතකාමී මූලපිරීම් අනුගමනය කිරීම තුළින් කෘෂිකර්මාන්තය නවීකරණය සහ පාරිසරික තිරසාරභාවය කෙරෙහි අවධානය යොමු කිරීම.

- ශක්තිමත් නිෂ්පාදන අනන්‍යතා වර්ධනය කිරීමෙන් සහ දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොළ වෙත ප්‍රවේශය වැඩි දියුණු කිරීමෙන් වෙළඳ නාමකරණය සහ වෙළඳපොළ සම්බන්ධතාවය ශක්තිමත් කිරීම.

- බහුවිධ අංශ හරහා ව්‍යවසායකත්වය, නවෝත්පාදනය සහ ව්‍යාපාර වර්ධනයට සහාය වීම සඳහා ජාතික පූර්ව ලියාපදිංචි කිරීමේ ආකෘතියක් ක්‍රියාත්මක කිරීම.

- ව්‍යවසායකයින් සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වඩාත් සහයෝගී පරිසරයක් නිර්මාණය කිරීම සඳහා මූල්‍ය, බදුකරණ පද්ධති සහ ව්‍යාපාර කිරීමේ පහසුව සඳහා ප්‍රවේශය වැඩිදියුණු කිරීම.

- නැගී එන ආර්ථික ධාවකයන් ලෙස නවෝත්පාදන, සංස්කෘතික කර්මාන්ත සහ නිර්මාණාත්මක ව්‍යවසායකත්වය දිරිමත් කිරීමෙන් නිර්මාණාත්මක ආර්ථිකය ප්‍රවර්ධනය කිරීම.

# 17

# කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් (KGLL)

## 17.1 හැඳින්වීම

### කහටගහ මිනිරන් පතල

කහටගහ මිනිරන් පතල වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දොඩම්ගස්ලන්ද ප්‍රදේශයේ මඳුරාගොඩ පිහිටා ඇති අතර එය කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් මඟින් කළමනාකරණය කරනු ලැබේ. එය 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ පිහිටුවන ලද පොදු සීමිත සමාගමක් වන අතර එහි හිමිකාරිත්වය සම්පූර්ණයෙන්ම රජය සතුවේ.

කහටගහ පතල සතු භූමි ප්‍රමාණය ආසන්න වශයෙන් අක්කර 102 කි.

### කහටගහ අනන්‍ය වූ නිෂ්පාදන

ඉහල කාබන් ප්‍රතිශතයක් සහිත ස්ඵටිකරූපී ඉල්ලම් මිනිරන් වාණිජ මට්ටමෙන් සපයන ලෝකයේ එකම රට ශ්‍රී ලංකාව වන අතර විශේෂයෙන්ම කහටගහ පතල සම්පූර්ණ ස්ඵටික වශයෙන් පවතින 99%කට වඩා වැඩි කාබන් ප්‍රතිශතයක් සහිත ඉතා පිරිසිදු ස්වභාවික ඉල්ලම් මිනිරන් සැපයීමට සමත්ය. එම මිනිරන් කුරු, කැට, පොකුරු සහ පතුරු ආදී වශයෙන් කැණීම් කරනු ලැබේ. ඉහල කාබන් ප්‍රතිශයක් සහ අඩු හෂ්ම ප්‍රතිශතයක් ඇති ඉල්ලම් මිනිරන් සඳහා ලෝක වෙළඳපොලේ සුවිශේෂී පිළිගැනීමක් පවතී.

### මිනිරන් අපනයනය

කහටගහ ග්‍රැෆයිට් ලංකා සමාගම යනු අපනයන ඉලක්ක කරගත් සමාගමක් වන අතර වර්ෂ 2024/25 දී එහි ප්‍රධාන අපනයන රට වූයේ ජපානයයි.

### අරමුණු

"මිනිරන් කැණීම, ශුද්ධ කිරීම, නිර්යාත කිරීම, මිනිරන් කර්මාන්ත ආශ්‍රිත නිෂ්පාදන ඇතුළු මිනිරන් කර්මාන්තය වැඩි දියුණු කිරීම හා එහි උපරිම අගය වැඩි කිරීම."

## 17.2 ප්‍රගතිය 2025 සැප්තැම්බර් මස අවසානයට

**නිෂ්පාදනය ( අමු මිනිරන්)**




*මූලාශ්‍රය: කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්*

2025/26, මූල්‍ය වර්ෂය අප්‍රේල් 1 සිට 2025 සැප්තැම්බර් 30 දක්වා මුළු ග්‍රැෆයිට් (කැණීම් කළ ප්‍රමාණය) නිෂ්පාදනය මෙ.ටොන් 278 වේ. එසේම, 2025 ජනවාරි 1 සිට සැප්තැම්බර් 30 දක්වා, මුළු මිනිරන් නිෂ්පාදනය මෙ.ටොන් 451 වේ.

- නිෂ්පාදනය: මෙට්‍රික් ටොන් 157 (අප්‍රේල්–සැප්තැම්බර් 2024) සිට මෙට්‍රික් ටොන් 278 (අප්‍රේල්–සැප්තැම්බර් 2025) (+77%) දක්වා වැඩි විය.

මූල්‍ය වර්ෂය සඳහා සාමාන්‍ය නිෂ්පාදන ඉලක්කය මසකට මෙ.ටොන් 50- 60 විය. ඉලක්කය රඳා පවතින්නේ එම අවස්ථාවේ විවෘතව පවතින ඉල්ලම් වල සරුබව, ඒවා පිහිටා ඇති මට්ටම් (ගැඹුර), මිහිතුළ කම්කරුවන්ගේ සංඛ්‍යාව, පතල තුළ භාවිතා කරන යන්ත්‍ර සූත්‍ර වල කාර්යක්ෂමතාව සහ පතලේ අනෙකුත් සංවර්ධන කටයුතු යන කරුණු මතය.

### අලෙවිය




*මූලාශ්‍රය: කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්*

KGLL විසින් 2025/26 මූල්‍ය වර්ෂය 2025 අප්‍රේල් 1 සිට සැප්තැම්බර් 30 දක්වා මෙ.ටොන් 181 අපනයනය කරන ලදී. එසේම, 2025 ජනවාරි 1 සිට සැප්තැම්බර් 30 දක්වා මෙ. ටොන් 326.41 අපනයනය කරන ලදී.

- විකුණුම්: මෙට්‍රික් ටොන් 163 (අප්‍රේල්–සැප්තැම්බර් 2024) සිට මෙට්‍රික් ටොන් 181 (අප්‍රේල්–සැප්තැම්බර් 2025) දක්වා (+11%) වැඩි විය.

චීනය වර්තමානයේ ගෝලීය මිනිරන් සැපයුම් දාමයේ ආධිපත්‍යය දරන අතර, ස්වාභාවික සහ කෘතිම මිනිරන් නිෂ්පාදනයේ සැලකිය යුතු කොටසක් හිමි කර ගනී. අඩු මිලට සැපයීමේ සහ ඉහළ නිෂ්පාදන ධාරිතාවක් පවත්වා ගැනීමේ හැකියාව ඇතිව, චීනය ජාත්‍යන්තර වෙළඳපොලේ සිය ස්ථානය ශක්තිමත් කර ගෙන ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, ශ්‍රී ලංකාව වැනි රටවලින් ස්වාභාවික මිනිරන් සඳහා ඇති ඉල්ලුම තරමක් අඩු වී ඇති අතර, නිෂ්පාදන පිරිවැය ඉහළ යාම සහ නිෂ්පාදන ධාරිතාව අඩුවීම හේතුවෙන් සාපේක්ෂව ඉහළ විකිණුම් මිලක් සහිත වීම මෙයට ප්‍රධාන හේතුව ලෙස දැක්විය හැක.

### ආදායම




*මූලාශ්‍රය: කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්*

KGLL විසින් 2025/ 26 මූල්‍ය වර්ෂය සඳහා 2025 අප්‍රේල් 1 සිට සැප්තැම්බර් 30 දක්වා මිනිරන් අලෙවි කිරීමෙන් රු. මිලියන 83 ක අදායමක් ලබාගෙන තිබේ. එසේම, 2025 ජනවාරි 1 සිට සැප්තැම්බර් 30 දක්වා මිනිරන් අලවියෙන් රු.මිලියන 152 ක අදායමක් ලබාගෙන ඇත.

- ආදායම: රු. මිලියන 62.42 (අප්‍රේල්–සැප්තැම්බර් 2024) සිට රු. මිලියන 83 (අප්‍රේල්–සැප්තැම්බර් 2025) දක්වා (+33%) වැඩි විය.

### ලාභය




*මූලාශ්‍රය: කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්*

2025/26 වත්මන් මූල්‍ය වර්ෂය තුළ, 2025 අප්‍රේල් 1 වන දින සිට සැප්තැම්බර් 30 දක්වා, සමාගම බදු වලට පෙර රුපියල් මිලියන 27.3 ක ශුද්ධ ලාභයක් වාර්තා කළේය.

එසේම, 2025 ජනවාරි 1 වන දින සිට සැප්තැම්බර් 30 දක්වා බදු වලට පෙර රුපියල් මිලියන 40.9 ක ශුද්ධ ලාභයක් වාර්තා කළේය.

- ලාභය: රු. මිලියන 16.72 (අප්‍රේල්–සැප්තැම්බර් 2024) සිට රු. මිලියන 27.3 (අප්‍රේල්–සැප්තැම්බර් 2025) (+63%) දක්වා වැඩි විය.

### තොගය

මුදල් සහ බැංකු ශේෂය හැරුණු විට, 2025 අගෝස්තු 31 වන දිනට දැනට පවතින තොග මෙ.ටොන් 1340.30 ට අදාළව වෙළඳපල කොටස්වල වටිනාකම රුපියල් මිලියන 706.62 කි.

### ශ්‍රම බලකාය

පුහුණු පතල් කම්කරුවන් 49ක්, යාන්ත්‍රික නඩත්තු ශිල්පීන් 14ක්, සැකසුම් සේවකයන් 9ක්, වතු අංශයේ සේවකයන් 6ක්, රියදුරන් 4ක්, විධායක නිලධාරීන් 4ක් සහ සෙසු කාර්යාල කාර්යමණ්ඩල නිලධාරීන් 14ක් ඇතුළුව මුළු ශ්‍රම බලකාය 100 ක් වේ.

**පතල් සිතියම්ගත කිරීම සහ පවතින මිනිරන් සංචිත ඇස්තමේන්තු කිරීම**

- කහටගහ සහ කොලොන්ගහ මිනිරන් නිධිවල සම්පූර්ණ පතල් සිතියම්ගත කිරීමක් GSMB සහ කර්මාන්ත අමාත්‍යාංශය සමඟ සහයෝගයෙන් සම්පූර්ණ කරන ලදී.
- මෙය නිවැරදි මිනිරන් සංචිත ගණනය කිරීම, දිගුකාලීන සැලසුම් කිරීම, තිරසාර නිෂ්පාදනය සහ ආයෝජන ආකර්ෂණය සඳහා පදනම සපයයි.

**ආයෝජක ආකර්ෂණය සහ අගය එකතු කිරීම**

- කහටගහ පතල ආශ්‍රිත ව මිනිරන් ගවේෂණය, පතල් කැණීම සහ අගය එකතු කිරීම සඳහා කැමැත්ත ප්‍රකාශ කිරීම (EOI) කැඳවීමට කැබිනට් අනුමැතිය ලබා දී ඇත.
- මූලික ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත.

## 17.3 අනාගත සැලැසුම් - 2026

- කොලොන්ගහ පතල සංචාරක කේන්ද්‍රස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම
- මූල්‍ය ප්‍රතිලාභ උපරිම කිරීම සහ ගෝලීය මිනිරන් කර්මාන්තය තුළ ශ්‍රී ලංකාවේ තත්ත්වය වැඩිදියුණු කිරීම අරමුණු කරගත් ග්‍රැෆීන් සහ ග්‍රැෆීන් පදනම් කරගත් නිෂ්පාදන වෙත ගමන් කිරීම
- වර්තමාන සාමාන්‍ය මාසික නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 50-55 ක් පමණ අගයක් අතර විචල්‍ය වේ. එය මසකට ටොන් 75-80 දක්වා ගෙන ඒමට තවදුරටත් සැලසුම් කර ඇත.
- මේ වන විට ගෝලීය වෙළෙඳපොළේ ස්වභාවික මිනිරන් සඳහා ඇති ඉල්ලුම අඩු වී ඇත. ඒ නිසා මිනිරන් අලෙවිය විශාල ලෙස අඩු වී ඇත. නව ගැනුම්කරුවන් සොයා බලා අපේක්ෂිත ආදායම වැඩිකර ගැනීමට කටයුතු කිරීමට අපේක්ෂා කෙරේ

# 18

# ජාතික කඩදාසි සමාගම (NPC)

## 18.1 හැඳින්වීම

ආරම්භයේ දී පැවති ජාතික කඩදාසි සංස්ථාව පසුව 1982 අංක: 17 දරණ සමාගම් පනතේ විධිවිධාන අනුව සී/ස ජාතික කඩදාසි සමාගම වශයෙන් සංස්ථාපනය වී ඇති අතර, මේ වන විට 2007 අංක 07 දරණ සමාගම් පනතේ විධිවිධාන අනුව පූර්ණ වශයෙන් රජය සතු සමාගමක් ලෙස ක්‍රියාත්මක වේ.

වාලච්චේන කඩදාසි කම්හල හා ඇඹිලිපිටිය කඩදාසි කම්හල සී/ස ජාතික කඩදාසි සමාගම යටතේ පවතී.

### කාර්ය සාධනය

- 2014 දෙසැම්බර් මස සිට නවතා තිබූ වාලච්චේන කඩදාසි කම්හලෙහි නිෂ්පාදන කටයුතු අංක: අමප/20/0561/224/015 හා 2020.03.18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් ලබා දී ඇති අනුමැතිය පරිදි 2020 ජූලි මස සිට සී/ස ජාතික කඩදාසි සමාගම විසින් නැවත ආරම්භ කර ඇත.

- ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු ඇඹිලිපිටිය කඩදාසි කම්හල පිහිටි ඉඩම (අක්කර 111 රූඩ් 02 පර්චස් 33ක) දීර්ඝ කාලීන බදු පදනම මත වසර 30ක කාල සීමාවක් සඳහා සී/ස ජාතික කඩදාසි සමාගම වෙත ලබා දීමට අංක:

  අමප/21/1015/320/032 සහ 2021.07.12 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව 2021.10.13 දින සිට වසර 30ක කාල සීමාවක් සඳහා ඇඹිලිපිටිය කඩදාසි කම්හල පිහිටි ඉඩම් කොටසට අදාළව දීර්ඝ කාලීන බදු ඔප්පු සකස්කර සී/ස ජාතික කඩදාසි සමාගම වෙත ලබා දී ඇත.

- 2012 වර්ෂයේ සිට නවතා දමා තිබූ ඇඹිලිපිටිය කඩදාසි කම්හලෙහි නිෂ්පාදන කටයුතු රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරීත්ව ක්‍රමවේදය යටතේ නැවත ආරම්භ කිරීම සඳහා අංක: අමප/22/0254/320/010 හා 2022.02.28 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව සී/ස ජාතික කඩදාසි සමාගම හා ආයෝජක සමාගම වන KSPA Embilipitiya Paper Mills (Pvt) Ltd අතර ඉහත ව්‍යාපෘතිය වෙනුවෙන් වසර 30ක කාල සීමාවකට අදාළ ගිවිසුම 2022.03.09 දින අත්සන් කර ඇත. කම්හලෙහි විසන්ධි කර ඇති විදුලි සැපයුම නැවත ලබා දීමෙන් පසුව නිෂ්පාදන කටයුතු ආරම්භ කර ඇත.
- 2024 දෙසැම්බර් මාසය වන විට යන්ත්‍ර සූත්‍ර වල බිඳ වැටීම් අනුව නිෂ්පාදන කටයුතු නතර වී තිබූ නමුත් අවශ්‍ය අමතර කොටස් යොදවා කඩිනමින් අවශ්‍ය අළුත්වැඩියාවන් සිදු කොට 2025 ජනවාරි 12 දා සිට නැවත කර්මාන්තශාලාව පන ගන්වන ලදි. පසුව, යන්ත්‍ර සූත්‍ර වල අඩුපාඩු නිවැරදි කරමින්, වැඩි දියුණු කිරීම් සිදු කරමින් කාර්යක්ෂමතාව වැඩි කර නිෂ්පාදන ධාරිතාව වැඩි කරගෙන යමින් තිබේ.
- 2025 අප්‍රේල් වන විට Break Even Point පසු කර 2025 ජූලි මාසයේ සිට මෙහෙයුම් ලාභයක් සහිතව නිෂ්පාදන ධාරිතාවය වැඩි කර ගනිමින් ක්‍රියාත්මක වේ.
- වර්තමානයේ සී/ස ජාතික කඩදාසි සමාගම Meal Wrapping Papers, Manila Papers, Cover Paper,White Printing,Colour Paper සහ Writing Paper නිෂ්පාදනය කරමින් වඩා හොඳ කාර්ය සාධනයක් සිදු කරයි. තවද ඇසුරුම් කර්මාන්ත සඳහා මුද්‍රණ කඩදාසි සහ එතීමේ කඩදාසි (52gsm - 120gsm) නිෂ්පාදනය කරනු ලබයි.

**පහත නිෂ්පාදන අලුතින් හඳුන්වා දෙන ලදී.**

- අභ්‍යාසපොත්
- CR පොත්
- Foolscap
- Ruled Sheets
- පිරිකර

## 18.2 ප්‍රගතිය 2025 සැප්තැම්බර් මස අවසානයට

**වාලච්චේන කඩදාසි කම්හලෙහි කඩදාසි නිෂ්පාදනය හා උපයන ලද ආදායම**

| මාසය | නිෂ්පාදනය (මෙ.ටො.) | ආදායම (රු.මි.) |
|---|---|---|
| ජනවාරි | 83.9 | 11.90 |
| පෙබරවාරි | 200.5 | 26.44 |
| මාර්තු | 169.1 | 25.61 |
| අප්‍රේල් | 244.1 | 24.99 |
| මැයි | 267.3 | 40.75 |
| ජූනි | 162.4 | 46.64 |
| ජූලි | 312.6 | 54.97 |
| අගෝස්තු | 281.2 | 45.21 |
| සැප්තැම්බර් | 344.5 | 40.35 |
| **එකතුව** | **2065.6** | **316.86** |

*මූලාශ්‍රය : ජාතික කඩදාසි සමාගම*

## 18.3 අනාගත සැලැසුම් - 2026

- ඉදිරි මාස දෙකක කාලය තුල මසකට ටොන් 500 ක ඉලක්කයක් සපුරා ගැනීමට හැකි වන අයුරින් අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතින අතර කඩදාසි නිෂ්පාදන යන්ත්‍රය (Board Machine) අළුත්වැඩියා කර මාසික කඩදාසි නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 1000 දක්වා වැඩි කිරීමට අපේක්ෂිතය.

- වාලච්චේන කඩදාසි කර්මාන්තශාලාව සතු අක්කර 300 ක භූමියෙන් අක්කර 50 ක් කඩදාසි ආශ්‍රිත අත්කම් කර්මාන්ත නිෂ්පාදන සඳහා මධ්‍ය පරිමාන කර්මාන්ත කරුවන්ට ලබා දීමට යෝජිතය.
  අක්කර 50 ක ප්‍රමාණයක් වන වගාවක් සඳහාද සහ තවත් අක්කර 50 දැනට අභාවයට ගොස් ඇති 150 ක් පමන වන සේවක නිවාස ප්‍රතිසංස්කරණය කොට භාවිතයට ගැනීමටත් Camping Site එකක් බවට පත් කරමින් දේශීය සහ විදේශීය සංචාරකයින් වෙනුවෙන් සේවා සැපයීමටත්, 1951 වැනි පැරණි කාලයක ඉදිකර ඇති වාෂ්ප එන්ජින් මඟින් ක්‍රියාත්මක වූ විදුලි බලාගාරය කෞතුකාගාරයක් බවට පත් කිරීමටත් යෝජිතය.

- ප්‍රධාන කාර්යාලයේ සහ වාලච්චේන කඩදාසි කම්හලේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට යෝජිතය.

- ණයගැතියන් සහ වගකීම් නිරවුල් කිරීමට කටයුතු කිරීම.

# 19

# ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් (LMSL)

## 19.1 හැඳින්වීම

ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් ආයතනය 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික ආඥාපනත යටතේ ස්ථාපිත කර ඇති අතර 1992 වර්ෂයේ දී පූර්ණ රජය සතු සමාගමක් බවට පත්කර ඇත. 2007 අංක07 දරන නව සමාගම් පනත අනුව අංක. පී.බී.587 යටතේ 2008.09.16 වන දින පූර්ණ රජය සතු සමාගමක් ලෙස නැවත ලියාපදිංචිකර ඇත. ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් ආයතනයේ ප්‍රධාන කාර්යාලය රාජගිරිය ප්‍රදේශයේ පිහිටා ඇති අතර, නිෂ්පාදන කර්මාන්තශාලාව ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පුල්මුඩේ ප්‍රදේශයේ ස්ථාපිතකර ඇත.

### කාර්යභාරය

- දළ වැලි කැණීම, පිරිසැකසීම සහ භෞතික ගුණත්වයන් අනුව ඉල්මනයිට් රූටයිල්, සර්කෝන්, ගානට්, මොනසයිට්, හයි ටයි ඉල්මනයිට් යනාදී වශයෙන් බර ඛනිජ වැලි වෙන් කිරිම.
- ජාත්‍යන්තර ටෙන්ඩර් කැඳවීම් මඟින් බර ඛනිජ වැලි අපනයනය කිරීම.
- නව බර ඛනිජ වැලි නිධි හඳුනා ගැනීම සහ ගවේෂණය කිරීම.

- ➢ එම නිධි වල පවතින බර ඛනිජ වැලි ඉවත්කර ගැනීම සඳහා වන මූලික පාරිසරික අධ්‍යයනයන් හෝ පාරිසරික බලපෑම අධ්‍යයනයක් සිදු කිරීම.
- ➢ එසේ හඳුනාගන්නා බර ඛනිජ වැලි නිධි වල ආර්ථිකමය ශක්‍යතාවය අධ්‍යයනය කිරීම.
- ➢ ආයතනය සතු බර ඛනිජ වැලි නිධි ප්‍රමාණය පුලුල් කරගැනීමට කටයුතු කිරීම.

## 19.2 ප්‍රගතිය 2025 සැප්තැම්බර් මස අවසානයට

### අලෙවිය

2025 සැප්තැම්බර් 30 දිනට අලෙවිය

| | නිෂ්පාදනය | මෙ.ටො. | ආදායම (රු.) |
|---|---|---|---|
| 1 | ILMENITE | 30 | 2,024,176.23 |
| 2 | RUTILE | 0 | - |
| 3 | ZIRCON | 1 | 481,179.25 |
| 4 | HITI ILMENITE | 0 | - |
| 5 | CRUDE MONAZITE | 500 | 313,425,000.00 |
| 6 | CURDE RUTILE OVERSIZE | 15.1 | 1,646,659.06 |
| 7 | ZIRCON CONCENTRATE | 10,025 | 869,713,813.79 |
| 8 | MAGNATITE | 1.2 | 60,397.92 |
| | **එකතුව** | **10,572.30** | **1,187,351,226.25** |

*මූලාශ්‍රය: ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්*

### නිෂ්පාදනය

**2025 සැප්තැම්බර් 30 දිනට නිෂ්පාදිත තොග**

| නිෂ්පාදනය | ගබඩා සහ විවෘතව රැස්කර ඇති තොග (මෙ.ටො.) |
|---|---|
| Ilmenite (Pulmuddai warehouse) | 87,645.96 |
| Ilmenite(Trincomalee Port-owned warehouse) | 15,000.00 |
| Wet Ilmenite | 6,854.00 |
| Magnetite | 2,958.48 |
| Rutile | 2,184.43 |
| Hi.Ti.Ilmenite(lot 01) | 3,000.00 |
| Hi.Ti.Ilmenite(lot 02) | 5,599.79 |
| Zircon | 1,003.36 |
| Crude Moazite | 339.89 |
| Crude Rutile Oversize | 6,993.70 |
| Low Grade Zircon Crude | 9,930.65 |
| Hydrosizer Fines | 4,560.75 |
| Final Tailings-Lot 01 | 1,518.60 |
| Final Tailings-Lot 02/Zircon Concentrate | 23,538.96 |
| New Wet Table Tailings(Stock as of 2025.09.01) | 19,902.53 |

*මූලාශ්‍රය: ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්*

## 19.3 අනාගත සැලැසුම් - 2026

- ආයතන පරිශ්‍රයේ දැනට පවතින ඉල්මනයිට් මෙට්‍රික් ටොන් 100,000 ක ප්‍රමාණය අලෙවි කිරීම.
- 2026 වන විට ඇමරිකානු ඩොලර් මිලියන 100 ක වර්ධිත ආදායම් වැඩිවීමක් අත්කර ගැනීමේ ඉලක්කය ඇතිව, අපනයන වැඩි කිරීම සඳහා නව ජාත්‍යන්තර වෙළඳපොළවල් ගවේෂණය කිරීමට සහ වෙළඳ ගිවිසුම්වලට එළඹීමට ආයතනය සැලසුම් කිරීම.
- ඵලදායී අධීක්ෂණයක් සහිතව තිරසාර ඛණිජ වැලි කැණීම් ප්‍රතිපත්ති අනුගමනය කිරීම මගින් පොඩොවකට්ටු, කෝකිලායි සහ තෙවික්කලු ප්‍රදේශවල ඛණිජ වැලි කැණීම් කටයුතු පුළුල් කිරීම.
- ඉල්මනයිට්, හයිටයිටේනියම් ඉල්මනයිට්, සර්කෝන්, රූටයිල් සහ මොනසයිට් වල වාර්ෂික නිෂ්පාදනය වැඩි කිරීම හරහා ආයතනයේ නිෂ්පාදන ධාරිතාව සහ නිමැවුම් ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම.
- සර්කෝනියා නිස්සාරණ ව්‍යාපෘතිය සහ සර්කෝන් පවුඩර් නිෂ්පාදන ව්‍යාපෘතිය වැනි වටිනාකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති සංවර්ධනය, ඒකාබද්ධ ව්‍යාපාර නිර්මාණය කිරීම තුලින්, ඵලදායීව නිෂ්පාදන මෙහෙයුම් සාක්ෂාත් කර ගැනීම හා නව විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීම.
- ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ අඩු ආදායම්ලාභීන් සහ සමෘද්ධි ප්‍රතිලාභීන් සඳහා ආසන්න වශයෙන් රැකියා අවස්ථා 1,000ක් නිර්මාණය කිරීම.
- ග්‍රාමීය මාර්ග සංවර්ධනය, අධ්‍යාපනයට සහය වීමේ ව්‍යාපෘති සහ ජල පිරිපහදු යන්ත්‍රය (RO Plant) ස්ථාපනය කිරීමේ වැඩසටහන් සඳහා සහාය වීමෙන් ආයතනික සමාජ වගකීම් මුලපිරීම් ශක්තිමත් කිරීම.
- යන්ත්‍රාගාරයේ කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය වැඩිකිරීම සඳහා කලින් සැළසුම් කරන ලද යන්ත්‍රාගාර බිඳවැටීම් වැළැක්වීමේ නඩත්තු වැඩසටහන් (Preventive Maintenance Programme) හඳුන්වා දීම.

# 20

# ලංකා පිඟන් සංස්ථාව (CCC)

## 20.1. හැඳින්වීම

ජාතික කුඩා කර්මාන්ත සංස්ථාව ගඩොල් සහ ටයිල් ඒකකය 1957 අංක 49 දරන රාජ්‍ය කර්මාන්ත සංස්ථා පනත යටතේ ස්ථාපිත කරන ලදී.

රාජ්‍ය කාර්මික සංස්ථාවේ ගඩොල් සහ ටයිල් ඒකකය 1972 දී ලංකා පිඟන් සංස්ථාවට ස්ථාපිත විය.

1990 ජනවාරි මාසයේ දී සංස්ථාවේ පිඟන් භාණ්ඩ අංශය පෞද්ගලීකරණය කරන ලද අතර සංස්ථාවේ ගඩොල් සහ උළු ඒකකය ''ලංකා පිඟන් සංස්ථාව'' නමින් දිගටම පවත්වාගෙන ගියේය.

එරගම කර්මාන්ත ශාලාව ලාභදායිත්වය මත පවත්වාගෙන යන අතර, මහියංගන කම්හල 2023 වසරේ සිට පටන් ගන්නා ලදී. මේ වන විට ඔඩ්ඩුසුඩාන් කම්හලද නිෂ්පාදන කටයුතු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් පවත්වාගෙන යනු ලබයි. මෙහි ප්‍රධාන වශයෙන් පැතලි උළු, මුදුන් උළු,සෙවන විශේෂ,මිලිමීටර් ගඩොල්,3x9x16 ගඩොල් නිෂ්පාදනය කරනු ලබයි.

## ගඩොල් හා උළු කර්මන්තශාලාවන්හි පිහිටීම් හා ධාරිතාවය

| කර්මාන්තශාලාව | දිස්ත්‍රික්කය | ස්ථාපිත ධාරිතාවය (ඒකක) | ස්ථාපිත වර්ෂය | භූමි ප්‍රමාණය (අක්කර) |
|---|---|---|---|---|
| එරගම | අම්පාර | මිලියන 1.8 | 1958 | 232.02 |
| ඇලයපත්තුව | අනුරාධපුරය | | 1964 | 33.2 |
| යටියන | මාතර | මිලියන 3.7 | 1964 | 6.115 |
| මහියංගනය | බදුල්ල | මිලියන 1.2 | 1965 | 94.26 |
| බිංගිරිය | කුරුණෑගල | මිලියන 1.2 | 1976 | 3.265 |
| උස්වැව | රත්නපුර | මිලියන 4.6 | 1981 | 16.3 |
| ඔඩ්ඩුසුඩාන් | මුලතිව් | | 1964 | 11.5 |

*මූලාශ්‍රය: ලංකා පිඟන් සංස්ථාව*

## 20.2 ප්‍රගතිය 2025 සැප්තැම්බර් මස අවසානයට

### නිෂ්පාදනය

2023 ජනවාරි මාසයේ සිට නිෂ්පාදන කටයුතු ක්‍රියාත්මක වන්නේ මහියංගනය සහ එරගම කර්මාන්තශාලා පමණි.

<u>එරගම කම්හල</u>

| මාසය | නිෂ්පාදන ඉලක්කය | මුළු නිෂ්පාදනය | ඉලක්කයට සාපේක්ෂ % |
|---|---|---|---|
| ජනවාරි | 100,000 | 99,673 | 99.7 |
| පෙබරවාරි | 90,000 | 57,102 | 63.4 |
| මාර්තු | 100,000 | 69,671 | 69.7 |
| අප්‍රේල් | 80,000 | 20,205 | 25.3 |
| මැයි | 80,000 | 25,070 | 31.3 |
| ජූනි | 80,000 | 77,647 | 97.1 |
| ජූලි | 100,000 | 119,039 | 119.0 |
| අගෝස්තු | 110,000 | 120,302 | 109.4 |
| සැප්තැම්බර් | 115,000 | 115,849 | 100.7 |

***මූලාශ්‍රය:** ලංකා පිඟන් සංස්ථාව*

<u>මහියංගන කම්හල</u>

| මාසය | නිෂ්පාදන ඉලක්කය | මුළු නිෂ්පාදනය | ඉලක්කයට සාපේක්ෂ % |
|---|---|---|---|
| පෙබරවාරි | 7,000 | 2,030 | 29% |
| මාර්තු | 10,000 | 7,630 | 76% |
| අප්‍රේල් | 15,000 | 8,230 | 55% |
| මැයි | නැත | | |
| ජූනි | 5,000 | 1,300 | 26% |
| ජූලි | 15,000 | 6,080 | 41% |
| අගෝස්තු | 5,000 | 6,080 | 50% |
| සැප්තැම්බර් | 20,000 | 3,725 | 19% |

***මූලාශ්‍රය:** ලංකා පිඟන් සංස්ථාව*

### එරගම,මහියංගනය,උස්වැව,යටියන,වැළඩ කර්මාන්තශාලාවල විකුණුම් වටිනාකම (රු.මිලි)

| | මුළු විකුණුම් | එරගම විකුණුම් | මහියංගනය විකුණුම් | උස්වැව විකුණුම් | යටියන විකණුම් | වැළඩ විකුණුම් |
|---|---|---|---|---|---|---|
| ජනවාරි | 3.35 | 2.83 | 0.36 | 0.1 | 0.052 | 0.012 |
| පෙබරවාරි | 5.05 | 4.72 | 0.04 | 0.26 | 0.023 | 0.01 |
| මාර්තු | 4.41 | 4.18 | 0.14 | 0.00025 | 0.084 | 0 |
| අප්‍රේල් | 4.24 | 3.92 | 0.13 | 0.093 | 0.096 | 0 |
| මැයි | 8.40 | 8.25 | 0.08 | 0.013 | 0.022 | 0.034 |
| ජූනි | 11.55 | 5.54 | 0.1 | 0.0012 | 0.195 | 5.71 |
| ජූලි | 16.54 | 14.84 | 1.34 | 0.016 | 0.12 | 0.22 |
| අගෝස්තු | 13.74 | 13.19 | 0.55 | 0.001 | 0.002 | |
| සැප්තැම්බර් | 14.82 | 13.5 | 1.23 | 0.074 | 0.015 | |

***මූලාශ්‍රය:** ලංකා පිඟන් සංස්ථාව*

**මූල්‍ය තත්ත්වය**

| | මුළු විකුණුම් | මුළු වියදම | ලාභය |
|---|---|---|---|
| ජනවාරි | 3.35 | 4.66 | -1.31 |
| පෙබරවාරි | 5.05 | 7.15 | -2.1 |
| මාර්තු | 4.41 | 6.11 | -1.7 |
| අප්‍රේල් | 4.24 | 8.50 | -4.26 |
| මැයි | 8.4 | 8.37 | 0.03 |
| ජූනි | 11.55 | 8.15 | 3.40 |
| ජූලි | 16.54 | 11.85 | 4.69 |
| අගෝස්තු | 16.96 | 10.46 | 6.50 |
| සැප්තැම්බර් | 14.82 | 13.47 | 1.35 |

*මූලාශ්‍රය: ලංකා පිඟන් සංස්ථාව*

## 20.3 අනාගත සැලසුම් - 2026

- මේ වනවිට නිෂ්පාදන කටයුතු සිදු නොකරන බිංගිරිය උළු සහ ගඩොල් කම්හලේ ගඩොල් නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ.
- මැටි කැණීම් කටයුතු සිදුකර දංකොටුව ටයිල් කම්හල වෙත ලබාදීම.
- ඔඩ්ඩුසුඩාන් කම්හලේ සිදුරු ගඩොල් නිෂ්පාදනය සිදු කිරීම.
- මහියංගනය කම්හලේ නර්ඩ් ආයතනය හා කාර්මික සංවර්ධන මණ්ඩලය සමග එක්ව ඉන්ටර්ලොක් ගඩොල් නිෂ්පාදනය කිරීමට අපේක්ෂා කෙරේ.

# 21

# ශ්‍රී/ස ලංකා පොස්පේට් සමාගම (LPL)

## 21.1 හැඳින්වීම

එප්පාවල පොස්පේට් නිධිය ප්‍රශස්ථ ලෙස භාවිතා කරමින් ජාතික පොස්පේට් අවශ්‍යතාවය සපුරාලන අතර තුර අපනයනය සඳහා යොමු වෙමින් විදේශ විනිමය උපයාගැනීමට ලංකා පොස්පේට් සමාගම ක්‍රියාකරනු ලැබේ.

### මූලික ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය:

බහු වාර්ෂික කෘෂිකාර්මික බෝග සඳහා පොහොර ලෙස භාවිතා කිරීම සඳහා රොක් පොස්පේට්, කැණීම් කිරීම, සැකසීම සහ විකිණීමේ ක්‍රියාවලිය සිදුකිරීම ආයතනයේ ප්‍රධාන ක්‍රියාකාරකම වේ.

## 21.2 ප්‍රගතිය 2025 සැප්තැම්බර් මස අවසානයට

| | සත්‍ය අගය | අයවැය ගත අගය | විචලනය | % |
|---|---|---|---|---|
| අලෙවිය (මෙ.ටො) | 40,436 | 51,620 | (11,184) | 78.3% |
| නිෂ්පාදනය (මෙ.ටො.) | 40,145 | 56,170 | (16,025) | 71.5% |
| මෙහෙයුම් ලාභය (රු. මිලියන) | 268.90 | 323.60 | (54.7) | 83.0% |
| බදු පෙර ලාභය (රු. මිලියන) | 339.90 | 323.60 | (34.60) | 90.76% |

*මූලාශ්‍රය: ලංකා පොස්පේට් සමාගම*




*මූලාශ්‍රය: ලංකා පොස්පේට් සමාගම*

### 2025.09.30 දින වන විට ආයතනය සතු වත්කම් සහ වගකීම්

| | රු. මිලියන |
|---|---|
| ජංගම වත්කම් | 1,506.0 |
| මුළු වත්කම් | 1,739.5 |
| මුළු වගකීම් | 283.5 |
| ශුද්ධ වත්කම් (කොටස් හිමියන්ගේ අරමුදල ) | 1,456.0 |

**නිමි නිෂ්පාදන ගබඩාව**





**යන්ත්‍රෝපකරණ හා වාහන**





## 21.3 අනාගත සැලසුම් - 2026

- අගය එකතු කළ පොල් පොහොර වසරකට මෙ.ටො. 3,500 නිෂ්පාදනය කර අලෙවි කිරීමට අවශ්‍ය ශක්‍යතා ඇගයීම් සිදු කරමින් පවතී.
- සේවකයින් සඳහා නේවාසිකාගාර පහසුකම් සහ සනීපාරක්ෂක පහසුකම් පුළුල් කිරීම සඳහා රු. මිලියන 30 ක පමණ ආයෝජනය කිරීමට අපේක්ෂිතය.
- නිෂ්පාදන කටයුතු වලට අවශ්‍ය වන සෘජු යන්ත්‍රෝපකරණ හා වාහන මිලදී ගැනීමට යෝජනා වී ඇති අතර ඒ සඳහා රු. මිලියන 120 ක් පමණ ආයෝජනය කිරීමට අපේක්ෂා කෙරේ.
- ගබඩා පහසුකම් පුළුල් කිරීම සඳහා නිමි නිෂ්පාදන ගබඩාව ඉදි කිරීම සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කටයුතු අවසන් කර ඉදිකිරීම් කටයුතු මේ වන විට ආරම්භ කර රු. මිලියන 15 ක් ගෙවා ඇති අතර ඇස්තමේන්තු වියදම බදු සහිතව රු . මිලියන 90 ක් වේ.

# 22

# සී/ස බී.සී.සී. ලංකා සමාගම (BCC)

## 22.1 හැඳින්වීම

සීමාසහිත බීසීසී ලංකා ලිමිටඩ් 1988 වර්ෂයේදී මහා භාණ්ඩාගාරය සතු කොටස් 10,000,000 ක කොටස් ප්‍රාග්ධනයක් සහිත සීමිත වගකීම් සහිත පොදු සමාගමක් ලෙස සංස්ථාගත කරන ලද අතර එය 1987 අංක 23 දරන පොදු පනත යටතේ රාජ්‍ය සංස්ථාවක් සහ රජය සතු ව්‍යවසායක් බවට පරිවර්තනය කරන ලදී.

බීසීසී ලංකා යනු රජය මගින් පාලනය වන පාරිභෝගික නිෂ්පාදන සැපයුම්කරුවෙකි. සමාගමේ ප්‍රධාන ව්‍යාපාරය වන්නේ දේශීයව නිෂ්පාදනය කරන ලද ආහාරයට ගත හැකි පොල්තෙල් සහ සබන්, සේදුම්කාරක, විෂබීජ නාශක නිෂ්පාදනය, විකිණීම සහ බෙදා හැරීමයි.

**සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම්**

- පොල්තෙල් පිරිපහදු කිරීම
- ඇඟ ගල්වන සබන් සහ , පිරිසිදු කිරීමේ සබන් නිෂ්පාදනය
- විෂබීජ නාශක සහ සේදුම්කාරක නිෂ්පාදනය
- සමාගම විසින් පත් කරන ලද නියෝජිතයින් හරහා " බීසීසී " නමින් නිෂ්පාදන දේශීය වෙළඳපොළට බෙදා හැරීම
- ගිවිසුම් සහ තරඟකාරී ලංසු තැබීමේ ක්‍රියා පටිපාටි මගින් නවීන වෙළඳ ව්‍යාපාර වෙත ඍජු විකුණුම්
- බීසීසී ලංකා ලිමිටඩ් සතු කාර්යාල සහ ගබඩා ඉඩකඩ කුලියට දීම.

## 22.2 ප්‍රගතිය 2025 සැප්තැම්බර් මස අවසානයට

### මූල්‍ය සහ භෞතික ඉලක්ක ඉටුකිරීම

| විස්තරය | භෞතික ප්‍රගතිය (මෙ.ටො.) | | | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | | | සටහන් |
|---|---|---|---|---|---|---|---|
| | ඉලක්කය | සත්‍ය | ප්‍රගතිය | ඉලක්කය | සත්‍ය | ප්‍රගතිය | |
| සබන් සහ වෙනත් | 392 | 98 | **25%** | 166 | 55 | **33 %** | සබන් අමුද්‍රව්‍ය හිඟකම සහ ඉහළ මිල නිසා සබන් නිෂ්පාදනය සාක්ෂාත් කර ගැනීම සාපේක්ෂව අඩුවී ඇත. |
| පොල් තෙල් | 1005 | 582 | **58%** | 920 | 733.38 | **80 %** | |

*මූලාශ්‍රය: සීමාසහිත බී.සී.සී. ලංකා සමාගම*

### භෞතික ප්‍රගතිය




*මූලාශ්‍රය: සීමාසහිත බී.සී.සී. ලංකා සමාගම*

### මූල්‍ය ප්‍රගතිය




*මූලාශ්‍රය: සීමාසහිත බී.සී.සී. ලංකා සමාගම*

### මූල්‍ය කාර්යසාධන සැසඳුම

| | 2024 ජනවාරි - සැප්තැම්බර් (රු.මිලි) | 2025 ජනවාරි - සැප්තැම්බර් (රු.මිලි) | 2025 ජනවාරි - සැප්තැම්බර් ප්‍රගතිය 2024 ට සාපේක්ෂව ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| ශුද්ධ විකුණුම් | 574.21 | 789.5 | 37.41% |
| කුලී සහ වෙනත් ආදායම් | 80.27 | 97.42 | 21.36% |
| අමුද්‍රව්‍යවල පිරිවැය | 470.96 | 703.52 | 49.38% |
| දළ ලාභ ආන්තිකය | **183.52** | **182.95** | **-0.31%** |
| මුළු වියදම * (ක්ෂය පිරිවැය හැර) ක්ෂය වීම | 123.26 | 122.92 | -0.003% |
| ක්ෂය වීම | 5.25 | 2.95 | -43.80% |
| ශුද්ධ ලාභය | **55.01** | **57.08** | **-3.76%** |

*මූලාශ්‍රය: සීමාසහිත බී.සී.සී. ලංකා සමාගම*




*මූලාශ්‍රය: සීමාසහිත බී.සී.සී. ලංකා සමාගම*

**විකුණුම් සහ නිෂ්පාදන විස්තර - 2025 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා**

| | විකුණුම් වටිනාකම (රු. මිලියන) | | නිෂ්පාදනය ප්‍රමාණය (මෙ.ටො.) | |
|---|---|---|---|---|
| | පිරිපහදු | සබන් | පිරිපහදු | සබන් |
| ජනවාරි | *69.55* | *8.69* | 57.65 | 21.27 . |
| පෙබරවාරි | *92.27 .* | *10.47* | 69.70 | 21.58 |
| මාර්තු | *97.35* | *7.08* | 80.30 | 7.59 |
| අප්‍රේල් | *65.70* | *3.56* | 58.02**.** | 3.27 |
| මැයි | *64.04* | *4.83* | 42.80 | 9.24 |
| ජුනි | *78.49* | *7.50* | 52.00 | 13.00 |
| ජූලි | *80.89* | *3.75* | 64.10 | 6.48 |
| අගෝස්තු | *100.73* | *5.31* | 63.15 | 6.44 |
| සැප්තැම්බර් | *84.35 .* | *4.48* | 71 | 9.96 |
| මුළු | **733.38** | **55.67** | **558.72** | **98.83** |

***මූලාශ්‍රය: සීමාසහිත බී.සී.සී. ලංකා සමාගම***

## 22.3 අනාගත සැලැසුම් - 2026

**1. පොල්තෙල් නිෂ්පාදන සහ සබන් නිෂ්පාදන නිෂ්පාදනය**

2025/26 මූල්‍ය වර්ෂය තුළ උසස් තත්ත්වයේ පොල්තෙල් මෙට්‍රික් ටොන් 1525ක් සහ සබන් සහ සබන් ආශ්‍රිත නිෂ්පාදන මෙට්‍රික් ටොන් 653 ක් නිෂ්පාදනය කිරීමට ඉලක්ක කර ඇත.

**2. නවීන තාක්ෂණයෙන් යුත් නව සබන් කර්මාන්ත ශාලාවක් ඉදිකිරීම**

දැනට පවතින සබන් සහ ඩිටර්ජන්ට් නිෂ්පාදන යන්ත්‍රෝපකරණ වෙනුවට නවීනතම ස්වයංක්‍රීය යන්ත්‍ර සූත්‍ර සමඟින් ආකර්ෂණීය නිෂ්පාදන වෙළඳපොළට හඳුන්වා දීමට සමාගම සැලසුම් කර ඇත.

**3. පවතින ගබඩා ප්‍රතිසංස්කරණය කිරීම සහ කුලියට ගත් ඉඩ ප්‍රමාණය අගය වැඩිවන ලෙස වැඩිදියුණු කිරීම**

**4. දැනට භාවිතා නොකරන ගොඩනැගිලි නවීකරණය කර Super Market එකක් Food Court එකක් සහ ගබඩාවන් ඉදිකිරීම සඳහා සැලසුම් කර ඇත**

# 23

# සී/ස පරන්තන් කෙමිකල්ස් සමාගම (PCCL)

## 23.1 හැඳින්වීම

සී/ස පරන්තන් කෙමිකල්ස් සමාගම කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ලාභ ලබන රාජ්‍ය සමාගමකි.

රසායනික ද්‍රව්‍ය නිෂ්පාදනය, ආනයනය සහ බෙදා හැරීම සම්බන්ධ වෘත්තීයමය වශයෙන් සුදුසුකම් ලත් ව්‍යවසායයක් ලෙස, ජලය පිරිසිදු කිරීම සහ දේශීය නිෂ්පාදන කර්මාන්ත සඳහා අවශ්‍ය රසායනික ද්‍රව්‍ය ලබා ගැනීමේදී සමාගම වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. සමාගමේ ප්‍රධාන අරමුණු වන්නේ ආරක්ෂිත සහ සෞඛ්‍ය සම්පන්න ජාතියක පැවැත්ම සහතික කිරිම සඳහා ප්‍රාථමික රසායනික අංශයේ රසායනික කර්මාන්තවල රසායනික ද්‍රව්‍ය හැසිරවීමේ හොඳම භාවිතයන් හඳුනා ගැනීමට රාජ්‍ය අංශයේ සක්‍රීය දායකත්වය ලබාදීමයි.

වර්තමානයේ පරන්තන් කෙමිකල් සමාගම දියර ක්ලෝරීන් වෙළඳපොළේ ප්‍රධාන සැපයුම්කරු වන අතර දියර ක්ලෝරීන්වල වෙළඳපල කොටසෙන් 95% ක් සහ අනෙකුත් රසායනික ද්‍රව්‍යවල සැලකිය යුතු කොටසක් ද අත්පත් කරගෙන ඇත. දේශීය ලුණු සඳහා අගය එකතුකිරීමක් සිදුකර නිෂ්පාදනය කරන කෝස්ටික් සෝඩා පතුරු, දියර ක්ලෝරීන් සහ ඒ ආශ්‍රිත වෙනත් රසායන ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමේ ඉතිහාසයක් ඇති සමාගමක් ලෙස ඉදිරි වසර තුන ඇතුළත කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පරන්තන් ප්‍රදේශයේ පරන්තන් කර්මාන්ත ශාලාව නැවත ස්ථාපිත කිරීමට පරන්තන් කෙමිකල්ස් සමාගම අපේක්ෂා කරයි.

සමාගම ලාභ සහිතව ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යන අතර වැටුප් සහ අනෙකුත් දීමනා ඇතුළු සියලු වියදම් ආයතනික අරමුදල්වලින් ගෙවන බව සඳහන් කිරීම සතුටට කරුණකි. වාර්ෂික ලාභාංශ ද මහා භාණ්ඩාගාරයට ගෙවනු ලැබේ.

### සමාගමේ ක්‍රියාකාරකම්

සී/ස පරන්තන් රසායන සමාගමෙහි ප්‍රධාන නිෂ්පාදන කම්හල 1956 සිට 1985 දක්වා කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පරන්තන් හි පිහිටා තිබූ අතර 1956 සිට 1985 දක්වා එහි නිෂ්පාදන ව්‍යාපාර කටයුතු සාර්ථකව ක්‍රියාත්මක විය. 1985 වර්ෂයේ පැවති යුධමය වාතාවරණය හේතුවෙන් මෙම කර්මාන්තශාලාව සම්පූර්ණයෙන්ම විනාශ වූ අතර, මේ වන විට එම කර්මාන්තශාලාව නැවත පරන්තන්හිදී ස්ථාපිත කිරීමේ ක්‍රියාවලියක සමාගම නිරතව සිටී. සමාගම විසින් කෝස්ටික් සෝඩා /ක්ලෝරීන් කර්මාන්තශාලාව නැවත ඉදි කිරීම සඳහා මූලික ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර ඇති අතර සී/ස පරන්තන් රසායන සමාගම විසින් දේශීය වෙළෙඳපොළෙහි ඉල්ලුමට සරිලන පරිදි නිෂ්පාදනයක් ලෙස පොලි ඇලුමිනියම් ක්ලෝරයිඩ් (Poly Aluminum Chloride (PAC)) සහ හයිඩ්‍රොක්ලෝරික් අම්ලය (Hydrochloric Acid (HCl) නිෂ්පාදන පහසුකම් එම ස්ථානයේ ස්ථාපනය කිරීමට ඉදිරි කටයුතු සැලසුම් කර ඇත.





## 23.2 ප්‍රගතිය 2025 සැප්තැම්බර් මස අවසානයට

**මූල්‍ය කාර්යසාධනය**

| විස්තරය | 2024 රු.'000 | 2025.09.30 දිනට රු.'000 |
|---|---|---|
| **ආදායම** | **758,436** | **542,725** |
| විකුණුම් පිරිවැය | (320,000) | (230,107) |
| දළ ලාභය | 438,436 | 312,618 |
| වෙනත් මෙහෙයුම් ආදායම් | **63,500** | **53,938** |
| **මුළු ආදායම** | **501,936** | **366,556** |
| මුළු වියදම | (148,692) | (113,246) |
| මෙහෙයුම් කටයුතුවලින් ලද ලාභය | 291,726 | 253,310 |
| අඩුකළා- මූල්‍ය පිරිවැය | - | - |
| බදු පෙර ලාභය (ආසන්න වශයෙන්) | **163,129** | **253,310** |

*මූලාශ්‍රය: සී/ස පරන්තන් කෙමිකල්ස් සමාගම*

## අනෙකුත් අංශවල කාර්යසාධනය

| විෂය | ක්‍රියාකාරකම් | ප්‍රගතිය | ප්‍රගතිය (%) |
|---|---|---|---|
| **ක්ලෝරීන් කෝස්ටික් සෝඩා කර්මාන්තශාලාව ස්ථාපිත කිරීම.** | ශක්‍යතා අධ්‍යයන වාර්තාව අවසන් කර ඇත.<br>සමෝච්ඡ සමීක්ෂණය (contour survey)සහ ජල විද්‍යා සමීක්ෂණය (Hydrology survey) අරමුදල් සම්පාදනය සඳහා මහා භාණ්ඩාගාරයෙන් සහ රේඛීය අමාත්‍යාංශයෙන් උපදෙස් අපේක්ෂා කරයි. | පරන්තන් ප්‍රදේශයේ අක්කර 30ක භූමි භාගයක් කෝස්ටික් සෝඩා හා ක්ලෝරීන් ව්‍යාපෘතිය සඳහා වෙන් කර ඇත. එම භූමිය දිගු කාලීන බදු පදනමින් ලබා ගැනීමේ ක්‍රියාවලිය දැනට ක්‍රියාත්මක අදියරේ පවතී.<br><br>කිලිනොච්චි දිස්ත්‍රික් මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් මෙම භූමියේ මැනීමේ කටයුතු සිදු කර පූර්ව රූප සැලැස්මක් පරන්තන් කෙමිකල්ස් සමාගමට ලබා දී ඇත.<br><br>උක්ත ව්‍යාපෘතියට අදාළව අභිලාශය පල කිරිමේ යෝජනා කැඳවීමට කැබිනට් අනුමැතිය හිමි වූ අතර,ඒ සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත.<br><br>මෙම ස්ථානයේ යටිතල පහසුකම සංවර්ධනය සඳහා රුපියල් මිලියන 500ක් වෙන් කිරීමට කැබිනට් අනුමැතිය හිමිව ඇති අතර, එම කාර්යයන් ක්‍රියාත්මක තත්වයේ පවතී. | 40% |
| **පාරිභෝගික වෙළඳපල සඳහා නව භාණ්ඩ හඳුන්වාදීම** | දේශීය පාරිභෝගිකයන් ඉලක්ක කර ගනිමින් නව නිෂ්පාදන වෙළඳපලට නිකුත් කිරීම | ගෘහස්ත පාරිභෝගිකයන් ඉලක්ක කරගත් පහත සඳහන් නව නිෂ්පාදන හතර වෙළඳපලට නිකුත් කිරීමට කටයුතු කර ඇත.<br><br>1.ඩ්‍රේන් ක්ලීනර් ( Drain Cleaner) - (කාණු පද්ධති පිරිසිදු කිරීම)<br><br>2.ස්ටේයින් රිමූවර් (Stain Remover) - (ටයිල් හා ග්‍රවුට් මත ඇති පැල්ලම් ඉවත් කිරීම)<br><br>3.ලොන්ඩ්‍රි බ්ලීච් (Laundry Bleach) - (සුදු රෙදි පිරිසිදු කිරීමට)<br><br>4.පෙස්ට් වයිප් අවුට් (Pest Wipe Out) - (ගෘහාශ්‍රිත හානිකර කෘමීන් පලවා හැරීම)<br><br>බ්ලීචින් දියර සහ කෝස්ටික් දියර සැපයීමේ කර්තව්‍යයෙහිද නියැලී සිටී | 80 |

| විෂය | ක්‍රියාකාරකම් | ප්‍රගතිය | ප්‍රගතිය (%) |
|---|---|---|---|
| **දැනට පවතින ද්‍රව ක්ලෝරීන් ගබඩාව සහ දියර ක්ලෝරීන් නැවත පිරවීමේ ක්‍රියාවලිය ජාත්‍යන්තර ප්‍රමිතියෙන් යුත් ආරක්ෂිත පියවරයන් සමඟ පුළුල් කිරීම** | 1.ඉදිකිරීමට අදාළ දෙවන අදියරේ කොන්ත්‍රාත්තුව පිරිනමන ලදි.<br>2.සිලින්ඩර නඩත්තු කටයුතු පුළුල් කිරීම<br>3. භූමියේ යටිතල පහසුකම් සංවර්ධන කටයුතු | ගබඩා පහසුකම් සහ පුහුණු පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා ඉදිකිරීම් කටයුතුවල II අදියර ආරම්භ කර අවසන් අදියරේ පවතී | 95 |

## 23.3 අනාගත සැලැසුම් - 2026

| **අරමුණ** | **කාර්යසාධන දර්ශක** | **2026 දී අපේක්ෂිත ඉලක්ක** |
|---|---|---|
| වැඩි ඉල්ලුමක් ඇති රසායනික නිෂ්පාදන ඉහළ ගුණාත්මක භාවයකින් සහ වැඩි ධාරිතාවකින් නිෂ්පාදනය කිරීම | පරන්තන්හි රසායනික නිෂ්පාදන කර්මාන්තශලාව නැවත ස්ථාපිත කිරීම | **40%** |
| වෙළඳ නාමය වර්ධනය කිරීම | අලෙවි ආදායම වර්ධනය කිරීම | **20%** |
| E ප්‍රසම්පාදන ක්‍රමවේදය හඳුන්වාදීම | E ප්‍රසම්පාදන ක්‍රමවේදය ඔස්සේ භාණ්ඩ අණවුම් කිරීම ආරම්භ කිරීම | 50% |
| තිරසාර බලශක්ති භාවිතයන් හඳුන්වා දීම, පරිසර සංරක්ෂණය ප්‍රවර්ධනය කිරීම සහ කාබන් ප්‍රතිශතය අඩු කිරීම. | වගවත්ත ඒකකයේ වහලය මත සූර්ය බලශක්තිය නිෂ්පාදනය කිරීම (වර්ග අඩි 4500) | 30% |
| Cloud based කළමනාකරණ දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීම | දත්ත පද්ධතිය ස්ථාපිත කිරීම | 50% |
| ISO 9001/14001 ප්‍රමිති සහතික | ලබාගත් තත්ව සහතික ප්‍රමාණය | 25% |

# 24

# ජාතික ලුණු සමාගම (NSL)

## 24.1 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ලුණු නිෂ්පාදනය සම්බන්ධයෙන් දීර්ඝ ඉතිහාසයක් ජාතික ලුණු සමාගම සතුව ඇත. එම ආයතනය සාමාන්‍ය ලුණු, අයඩින් මිශ්‍ර ලුණු, කැට ලුණු සහ කාර්මික ලුණු නිෂ්පාදනය කරනු ලබයි. එහි ප්‍රධාන නිෂ්පාදන බිම් මන්නාරම සහ අලිමංකඩ (කිලිනොච්චි දිස්ත්‍රික්කය) යන ප්‍රදේශවල පිහිටා ඇති අතර, එහි පරිපාලන කාර්යාලය කොළඹ පිහිටා ඇත.

ලුණු දෙපාර්තමේන්තුව 1938 වර්ෂයේ දී ආරම්භ කර ඇති අතර, විවිධ වූ පරිපාලන අධිකාරීන් යටතේ පැවති එය අවසානයේ දී 2001 වර්ෂයේ සිට මාන්තායි සෝල්ට් ලිමිටඩ් ලෙස නම් කරන ලදී. 2021 වර්ෂයේ ජුනි මාසයේ දී මෙම ආයතනය, ජාතික ලුණු සමාගම ලෙස නැවත නම් කරන ලද අතර, වර්තමානයේ එය කර්මාන්ත අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ක්‍රියාත්මක වේ. මෙම සමාගම විසින් නිෂ්පාදනය කරනු ලබන ලුණු දිවයිනේ අනෙකුත් ප්‍රදේශවලින් නෙලාගන්නා ලුණු හා සැසඳීමේ දී ගුණාත්මක බවින් ඉතාම ඉහල අගයක ඇති බව පිළිගැනේ. ( එහි 96% ක් සෝඩියම් ක්ලෝරයිඩ් වේ) . දැනට මන්නාරම ලුණු ලේවාය මඟින් වසරකට සකස් නොකළ ලුණු මෙට්‍රික් ටොන් 6,000 ක් ද, එලිෆන්ට්පාස් හී ලුණු මෙට්‍රික් ටොන් 22,000ක් ද නිෂ්පාදනය කිරීමට හැකියාව ඇත.

ජාතික ලුණු සමාගම ස්වාභාවික සම්පත් උපයෝගීතා මධ්‍යස්ථානයක් ලෙස පමණක් නොව, මන්නාරම සහ කිලිනොච්චි දිස්ත්‍රික්කයන් හි අවදානමට ලක් වූ (පීඩිත) ජනතාවන්ට රැකියා අවස්ථාවන් ද ලබා දෙන මධ්‍යස්ථානයක් ලෙස ද ක්‍රියාත්මක වේ. අද වන විට 63 දෙනෙකුගෙන් සමන්විත වන ස්ථිර කාර්ය මණ්ඩලයක් ද 7 දෙනෙකුගෙන් සමන්විත කොන්ත්‍රාත් / අනියම් සේවක පිරිසක් ද සිටින අතර, දළ වශයෙන් පුද්ගලයින් 242 දෙනෙකුගෙන් සමන්විත වන තාවකාලික කාර්ය මණ්ඩලයක් ආයතනය විසින් සේවයේ යොදවා ඇත.

ජාතික ලුණු සමාගම, මහා භාණ්ඩාගාරයේ සහ අනෙකුත් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතනවල සාමාජිකයින්ගෙන් සැදුම්ලත් මණ්ඩලය විසින් පාලනය වන අතර, එය කර්මාන්ත අමාත්‍යාංශයේ විෂය පථය යටතට අයත් වේ. සමාගමේ නෛතික සහ වගකිවයුතු කාර්යයන් සම්බන්ධ අධීක්ෂණ කටයුතු සහ පහසුකම් සැපයීමේ කටයුතු අමාත්‍යාංශයේ සංස්ථාපිත අංශය විසින් සිදු කරනු ලබයි. එය රාජ්‍ය ව්‍යාපාරයක් වන බැවින් 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සීමාසහිත සමාගමක් ලෙස සමාගම් නීති රීති වලට අනුකූලව ලියාපදිංචි කර ඇත. මේ අතර සමාගමේ නිෂ්පාදනයන් හී ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා මෙම ආයතනය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් සහතික කරනු ලැබේ. එසේම සමාගම ජාතික විගණන කාර්යාලය විසින් විගණනය කරනු ලැබේ.

## 24.2 ප්‍රගතිය 2025 සැප්තැම්බර් මස අවසානයට

**නිෂ්පාදනය**

| | ලුණු තැන්පත් කරන ස්ථානය | නිෂ්පාදිත ප්‍රමාණය (මෙ.ටො.) |
|---|---|---|
| 01 | මන්නාරම ලුණු ලේවාය | 4,000 |
| 02 | එලිපන්ට්පාස් ලුණු ලේවාය | 8,000 |
| | මුළු එකතුව | 12,000 |

*මූලාශ්‍රය: ජාතික ලුණු සමාගම*

* අලිමංකඩ ලුණු ලේවායේ මේස ලුණු කර්මාන්තශාලා ව්‍යාපෘතිය 95%කින් අවසන් කර ඇත.

**මේස ලුණු කම්හල් ගොඩනැගිල්ල**



**මේස ලුණු බලාගාරය ඉදිකිරීම**



* ලුණු ලේවාය සංවර්ධනය 90%කින් අවසන් කර ඇත.

**මූල්‍ය ප්‍රගතිය**

| # | කාණ්ඩය | මුදල (රු. මි.) |
|---|---|---|
| 01 | විකුණුම් ආදායම | 251.20 |
| 02 | දළ ලාභය | 149.50 |
| 03 | ශුද්ධ ලාභය | 136.20 |

*මූලාශ්‍රය: ජාතික ලුණු සමාගම*

**වියදම් විස්තර**

| # | කාණ්ඩය | වියදම (රු. මි.) | වියදම (රු. මි.) |
|---|---|---|---|
| 01 | පුනරාවර්තන | 219.00 | 43% |
| 02 | ප්‍රාග්ධනය | 56.00 | 32% |

*මූලාශ්‍රය: ජාතික ලුණු සමාගම*

## 24.3 අනාගත සැලසුම් - 2026

- අලිමංකඩ ලුණු ලේවායේ ලුණු නිෂ්පාදනය වැඩි කිරීම සඳහා අතහැර දැමූ ප්‍රදේශය ප්‍රතිසංස්කරණය කිරීම (අක්කර 50ක් ප්‍රතිසංස්කරණය කෙරේ).

- 2027 වර්ෂයේ සිට වසරකට ලුණු මෙට්‍රික් ටොන් 25,000ක් නිෂ්පාදනය කිරීම සඳහා කුරිංචතිව් ලුණු ලේවාය නැවත ක්‍රියාත්මක කිරීමට මූලික ක්‍රියාමාර්ග ගනු ලැබේ.

- මේස ලුණු නිෂ්පාදනය සමඟ දිවයින පුරා විකුණුම් සහ බෙදා හැරීම පුළුල් කිරීම

# 25

# ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව (SLCC)

## 25.1 හැඳින්වීම

1950 වර්ෂයේදී කර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක කරන ලද කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්ත ශාලාව 1955 අංක 19 දරණ රාජ්‍ය අනුග්‍රහය ලත් සංස්ථා පනතේ විධිවිධාන යටතේ 1956 වර්ෂයේදී රාජ්‍ය සංස්ථාවක් බවට පරිවර්තනය කරන ලදුව කන්කසන්තුරේ සිමෙන්ති කම්හල නමින් ප්‍රතිෂ්ඨාපනය කරන ලදි.

ඉන්පසුව 1957 අංක 49 දරණ කාර්මික සංස්ථා පනත යටතේ 1959 ජනවාරි 01වන දා සිට ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලය නමින් ප්‍රතිෂ්ඨාපනය කෙරිණි.

1980 වර්ෂයේදී අතිවිශේෂ ගැසට්පත්‍රයෙහි පළ කරන ලද නිවේදනයක් මගින් එහි නම ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව වශයෙන් සංශෝධනය කරන ලදි. අමාත්‍යාංශ කිහිපයක් යටතේ ක්‍රියාත්මක වූ මෙම සංස්ථාව මේ වන විට කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය යටතේ කටයුතු කරනු ලැබේ.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සතුව සිමෙන්ති කර්මාන්ත ශාලා තුනක් පැවති අතර 1993 වර්ෂයේදී එම කර්මාන්ත ශාලා ජනතාකරණයට භාජනය වීමත් සමග පුත්තලම සිමෙන්ති කර්මාන්තශාලාවේ සහ රුහුණු සිමෙන්ති කර්මාන්ත ශාලාවේ අයිතිය අහිමි විය.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සතුව පවතිනුයේ කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්ත ශාලාව පමණක් වන අතර එය 1990 ජුනි මාසයේ සිට ආරක්ෂක හේතුන් සහ සිමෙන්ති කර්මාන්තශාලාවේ යන්ත්‍ර සූත්‍ර හා උපකරණ විනාශ වීම යනාදී හේතූන් මත අක්‍රියව පවතී.

## කාර්යයන්

1956.11.02 දිනැති ගැසට් පත්‍රය සහ 1964.05.11 දිනැති ගැසට් පත්‍රය මගින් පහත සඳහන් ක්‍රියාකාරකම් සංස්ථාවට පවරා ඇත.

- සිමෙන්ති නිෂ්පාදනය හා විකිණීම
- සිමෙන්තියෙන් හෝ කොන්ක්‍රීට් වලින් නිෂ්පාදනය කරනු ලබන දුරකථන සහ විදුලි පණිවුඩ හුවමාරු කණු, දුරකථන කුටි, ජලය ගෙන යන උපකරණ, හියුම් නල සහ ටයිල් නිෂ්පාදනය ආදීය නිපදවීම හා අලෙවි කිරීම.
- ඕනෑම පුද්ගලයෙකුට විදුලි බලය තොග වශයෙන් සැපයීම
- සිමෙන්ති නිෂ්පාදනය, ආනයනය කිරීම හා විකිණීම

2016.07.31 දින ක්‍රියාත්මක වූ ස්වේච්ඡා විශ්‍රාම වන්දි යෝජනා ක්‍රමයෙන් පසු ඉදිරි කටයුතු සිදු කල යුතු ආකාරය පිළිබඳව උපදෙස් අංක MIN/R/07/06/07 හා 2016.10.27 දිනැති කර්මාන්ත අමාත්‍යාංශය විසින් සකස් කර තිබෙන ලිපියේ සඳහන් කර ඇත.එහිදී රටේ ක්ලින්කර් නිධියේ භාරකාරීත්වය සතු වන බැවින් ඊට සුදුසු ආයෝජකයින් සොයා බදු අදායම් එකතු කර මෙහෙයවීම් කටයුතු සිදු කර ඉතිරිය භාණ්ඩාගාරයට සම්ප්‍රේෂණය කිරිමට උපදෙස් ලබා දී ඇත.

2017 අප්‍රේල් මාසයෙන් පසු සිමෙන්ති ආනයනය කර නොමැත. සංස්ථාව සතු ඉඩම් වලට අදාල කුලී ආදායමෙන් නැවතත් සංස්ථාව ස්ථාවර තත්වයට නගා සිටුවීමට බලාපොරොත්තු වේ. 2016.07.31 දින ක්‍රියාත්මක වූ ස්වේච්ජා වන්දි යෝජනා ක්‍රමයෙන් පසු ස්ථිර සේවකයින් 14 දෙනෙකු ඉතිරි වූ අතර මේ වන විට ඉන් සේවකයින් 08 දෙනෙකු සේවයේ නියුතු වේ.

## 25.2 ප්‍රගතිය 2025 සැප්තැම්බර් මස අවසානයට

| ප්‍රධාන ක්‍රියාකාරකම් | මූල්‍ය ප්‍රගතිය - 2025.01.01 සිට 2024.09.30 | |
|---|---|---|
| | පිරිවැටුම (රු.මි) | වියදම් (රු.මි.) |
| ඉඩම් කල්බදු දීම් හා කුලියට දීම මගින් ලැබෙන ආදායම් | 107.39 | 31.45 |

*මූලාශ්‍රය: ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව*

## 25.3 අනාගත සැලසුම් - 2026

- **සිමෙන්ති නිෂ්පාදනය සඳහා අවශ්‍ය වන මූලික අමුද්‍රව්‍යක් වන ක්ලින්කර් නිෂ්පාදනය**

මේ වන විට සිමෙන්ති නිෂ්පාදනය සඳහා අවශ්‍ය වන මූලික අමුද්‍රව්‍යක් වන ක්ලින්කර් ඇඹරුම්හලක් ස්ථාපිත කිරිම සම්බන්ධයෙන් නිෂ්පාදන කටයුතු ආරම්භ කිරිම සඳහා භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශයේ උපදෙස් මත ඉඩමක් පවරාගැනිමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ. මේ සඳහා භූවිද්‍යා හා පතල් කැණීම් කාර්යාංශයෙන් පිරිවැය ගණනය සඳහා අවශ්‍ය අනුමැතිය අධ්‍යක්ෂ මණ්ඩලය මගින් ලබා දී ඇත. භූවිද්‍යා හා පතල් කැණීම් කාර්යංශයෙහි උපදෙස් පරිදි තෝරාගත් ඉඩම් කොටසේ අයිතිය තහවුරු කර ගත යුතුව ඇත.

- **කන්කසන්තුරෙ කර්මාන්තශාලා පරිශ්‍රයේ ඇති යකඩ සහ අනෙකුත් ලෝහ කැබලි කඩා ඉවත් කිරීම සහ පිරිසිදු කිරීම.**

අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව කන්කසන්තුරෙ කර්මාන්තශාලා පරිශ්‍රයේ ඇති යකඩ සහ අනෙකුත් ලෝහ කැබලි කඩා ඉවත් කිරීම සහ පිරිසිදු කිරීම සම්බන්ධටෙන්ඩර් ක්‍රියාපටිපාටි අනුගමනය කරමින් සුදුසුකම් සම්පූර්ණ කල කොන්ත්‍රාත්කරු වෙත පරිශ්‍රය භාරදීමෙන් පසු 2024.12.19 වන දින ව්‍යාපෘතිය අවසන් කර ඇත.මේ වන විට එක් රැස් කරන ලද ලෝහ කොටස් රාජ්‍ය ආයතනයක් වන කර්මාන්ත සංවර්ධන මණ්ඩලය වෙත විකිණීම සදහා සදහා අවශ්‍ය කැබිනට් අනුමැතිය ලැබී ඇත.ඒ සදහා පත් කරන ලද මිල කමිටුව විසින් මෙම ලෝහ නිරික්ෂණය කර ඇති අතර විකුණුම් මිලද තීරණය කර ඇත. කර්මාන්ත සංවර්ධන මණ්ඩලය විසින් ටෙන්ඩර් ක්‍රියාපටිපාටිය ක්‍රියාත්මක කල යුතු වේ.

- **සිමෙන්ති නිෂ්පාදනයට නොගෙන ඉවත් කරන හුනුගල් සහිත පස් ස්ථරයෙන් අඩු වියදම් වර්ණවත් ගඩොල් නිෂ්පාදනය**

අඩු වියදම් වර්ණවත් ගඩොල් නිෂ්පාදනය සඳහා ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනාව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමුකර ඇත.එය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම සිදු කර ඇත.එමෙන්ම මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් රජයේ අනුමත ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කිරීමට බලාපොරොත්තු වේ.

- **KKS හි පිහිටි නිවාඩු බංගලාව ප්‍රතිසංස්කරණය කිරීම**

මෙම ගොඩනැගිල්ල ශ්‍රී ලංකා යුධ හමුදාව විසින් අප වෙත නිදහස් කර දි ඇති අතර අළුත් වැඩියා කිරීමේ සැලැස්ම නිම කර ඇති අතර ඊට අදාළ ඇස්තමේන්තු සකස් කර ඇත.ශ්‍රම දායකත්වය ශ්‍රී ලංකා නාවක හමුදාවෙන් ලබා දීම සඳහා එකගතාවය පල කර සිටියද මේවන විට ඔවුන් විසින් ආරක්ෂක අමාත්‍යාංශ අනුමැතිය ලබා ගන්නා මෙන් දැනුවත් කර ඇත. රේඛීය අමාත්‍යාංශය හරහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනිමට කටයුතු කරනු ලැබේ.

- **අරුවක්කාලු හුණුගල් නිධිය පිහිටි ඉඩම ඛණිජවැලි වෙන් කර ගැනීමේ ව්‍යාපෘතිය**

අරුවක්කාලු හුණුගල් නිධියේ සිමෙන්ති නිෂ්පාදනයට අවශ්‍ය හුණුගල් කැණීම් කිරීමෙදී ඉවත් කරනු ලබන මතුපිට පස් තට්ටුවෙහි ඇති බර ඛණිජ ලෝහ වෙන් කර ගැනිම සදහා ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවට වාසිදායක ව්‍යාපෘතියක නියලීම.

- **කොල්ලුපිටියේ ඉඩම**

දැනට තාවකාලික රථගාලක් පවත්වාගෙන යනු ලබයි.සංස්ථාව වැඩි ප්‍රතිලාභ ලැබෙන මිශ්‍ර ව්‍යාපෘතියක් සඳහා යෝජනාවක් සකස් කර රේඛීය අමාත්‍යාංශයේ ඇමතිතුමා,නියෝජ්‍ය ඇමතිතුමා,සහ ලේකම් වෙත ඉදිරිපත් කර ඇත

# 26

# ලංකා ලේලන්ඩ් සමාගම (LLL)

## 26.1 හැඳින්වීම

ලංකා ලේලන්ඩ් (පුද්ගලික) ලිමිටඩ් (සමාගම) යනු 1938 අංක 51 දරන සමාගම් ආඥාපනත යටතේ සංස්ථාපිත කර 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කරන ලද සම්පූර්ණයෙන්ම රජය සතු සීමිත වගකීම් සමාගමකි.

ලංකා අශෝක් ලේලන්ඩ් සමාගමේ කොටස් ප්‍රාග්ධනයෙන් 41.77%ක් ලංකා ලේලන්ඩ් සමාගම සතු වන අතර, ලාංකීය මහජනතාව සතුව 30.38%ක ප්‍රමාණයක් ද ඉතිරි 27.85%ක කොටස් අයිතිය බද්ධ ව්‍යාපාරයේ ප්‍රධාන කාර්මික හවුල්කරුවා වන ඉන්දියානු අශෝක් ලේලන්ඩ් සමාගම සතුව ද පවතී.

ලංකා ලේලන්ඩ් (පුද්ගලික) සමාගම හි ප්‍රධාන පරමාර්ථය වන්නේ අවශ්‍ය උපාංග නිෂ්පාදනය කිරීමයි. එමෙන්ම ලංකා ලේලන්ඩ් පුද්ගලික සමාගම විසින් ශ්‍රී ලංකාව තුල තාක්ෂණික හුවමාරුව දිරිගැන්විය යුතුයි.

**ලංකා ලේලන්ඩ් (පුද්ගලික) සමාගම හි ප්‍රධාන ක්‍රියාකාරකම්**

- ලංකා අශෝක් ලේලන්ඩ් සමාගමෙහි වාහන එකලස් කිරීම සඳහා දේශීය උපාංග නිෂ්පාදනය අධීක්ෂණය කිරීම සහ පෙළඹවීම.
- භාණ්ඩාගාර බිල්පත් සහ ස්ථාවර තැන්පතු වල ආයෝජනය.

# 27

# ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය (SLITA)

## 27.1 හැඳින්වීම

ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය (SLITA) යනු කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ප්‍රමුඛතම ජාතික ආයතනයක් වන අතර එය ශ්‍රී ලංකාවේ විශාලතම කාර්මික අපනයනකරු වන පේෂකර්ම සහ ඇඟලුම් අංශයේ සංවර්ධනය හා වර්ධනයට සහාය වීම සඳහා ස්ථාපිත කර ඇත. ජාත්‍යන්තරව තරඟකාරී කුසලතා පදනමක් සහ සේවා හැකියාවක් සහතික කරමින්, වෘත්තීය අධ්‍යාපනය සහ උපාධි වැඩසටහන්, තාක්ෂණික පුහුණුවීම්, පරීක්ෂණ සහ සහතික කිරීමේ සේවා, තාක්ෂණ හුවමාරුව සහ කර්මාන්ත පාදක පර්යේෂණ සහ නවෝත්පාදන සැපයීම මගින් ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය ජාතික ආර්ථික දියුණුවට දායක වේ.

## 27.2 ප්‍රගතිය 2025 සැප්තැම්බර් මස අවසානයට

**කාර්මික තරඟකාරිත්වය ශක්තිමත් කිරීම**

පේෂකර්ම සහ ඇඟලුම් කර්මාන්තයේ තරඟකාරිත්වය ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය සැලකිය යුතු ප්‍රගතියක් අත්පත්කර ගත්තේය. උසස් නිෂ්පාදන තාක්ෂණයන් සඳහා අනාගතයට සූදානම් කුසලතා ඇති ශ්‍රම බලකායක් සහතික කරමින්, කර්මාන්ත 4.0 අවශ්‍යතාවලට අනුකූලව නව උපාධි වැඩසටහන් දියත් කරන ලදී. පේෂකර්ම හා ඇඟලුම් නිෂ්පාදන වල සෞඛ්‍යාරක්ෂක බව සහ ආරක්ෂිතභාවය සහතික කරන ක්‍රමයක් ස්ථාපිත කරන ලද අතර, කර්මාන්තයේ ගෝලීය වෙළඳපොළ ප්‍රවේශය සහ නියාමන අනුකූලතාව ශක්තිමත් කරන ලදී. තවද, අපනයන සැපයුම් දාමයේ වැඩිදියුණු කළ තත්ත්ව සහතිකයට සහාය වෙමින්, පරීක්ෂණ සේවා

විවිධාංගීකරණය කිරීම සහ රසායනාගාර හැකියාවන් පුළුල් කිරීම සඳහා පුළුල් යෝජනාවක් ජාතික තත්ත්ව යටිතල පහසුකම් (NQI) ව්‍යාපෘතිය වෙත ඉදිරිපත් කරන ලදී. ඊට අමතරව, පේෂකර්ම සහ ඇඟලුම් කර්මාන්තය සඳහා යෝජිත කාබන් පියසටහන් දත්ත සමුදාය සකස් කිරීමේ ව්‍යාපෘතිය 2026 දී ක්‍රියාත්මක කිරීම සඳහා අනුමත කර ඇති අතර, එය එම අංශයේ තිරසාරභාවය ඉලක්ක සහ පාරිසරික වගවීම සඳහා වැදගත් පියවරක් සනිටුහන් කරයි.

### ශ්‍රම බලකාය සංවර්ධනය සහ කුසලතා සංවර්ධනය කිරීම

ජාතික ශ්‍රම බලකාය ශක්තිමත් කිරීම සහ පේෂකර්ම සහ ඇඟලුම් අංශයේ කුසලතා පරතරය පියවීම සඳහා ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගෙන ඇත. තෙවන කාර්තුවේ ඉලක්කය ඉක්මවා යමින් සහ රට පුරා ව්‍යවසායන් සඳහා තාක්ෂණික විසඳුම් ලබා දෙමින් දියත් කළ පුහුණු වැඩසටහන් 57 ක් පවත්වන ලදී. මීට අමතරව, ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනයෙහි ශක්තිමත් ව්‍යාප්තිය සහ පුහුණු හැකියාව පිළිබිඹු කරමින්, අඛණ්ඩ ජාතික ශ්‍රම බලකායේ සංවර්ධන ඉල්ලීම් සපුරාලීම සඳහා පෙර සැලසුම් කල පුහුණු වැඩසටහන් 67 ක් පවත්වන ලදී. සැලසුම් කළ සේවා මට්ටම් ඉක්මවා යමින් පරීක්ෂණ 22,587 ක් සිදු කරමින් කාර්මික අනුකූලතාව සහ නිෂ්පාදන ප්‍රමිතීකරණයට සහාය විය. වසර තුළ ප්‍රධාන සන්ධිස්ථානයක් වූ පේෂකර්ම සහ ඇඟලුම් අධ්‍යයන පීඨය ස්ථාපිත කිරීම සහ ක්‍රියාත්මක කිරීම, උසස් අධ්‍යාපන ධාරිතාව සහ අධ්‍යයන ප්‍රගති මාර්ග වැඩි දියුණු කිරීම සඳහා දායකත්වය සපයා ඇත. තවද, කාර්ය මණ්ඩල දැනුම සහ කුසලතා වැඩිදියුණු කිරීම මගින් ආයතනික විශේෂඥතාව සහ සේවා විශිෂ්ටත්වය ශක්තිමත් කර ඇත.

### කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර බලගැන්වීම සහ කලාපීය බලපෑම

ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය, කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත (SMI) බලගැන්වීම සඳහා අඛණ්ඩව වැදගත් කාර්යභාරයක් ඉටු කළ අතර, රට පුරා කාන්තාවන් විසින් මෙහෙයවනු ලබන පේෂකර්ම සහ ඇඟලුම් ව්‍යවසායකයන් වැඩිදියුණු කිරීම කෙරෙහි දැඩි අවධානයක් යොමු කර ඇත. ඉලක්කගත තාක්ෂණික උපදේශන සහාය සහ ප්‍රායෝගික කුසලතා සංවර්ධන පුහුණුව හරහා, මෙම ව්‍යවසායකයින්ට නිෂ්පාදන ගුණාත්මකභාවය, ඵලදායිතාව සහ වෙළඳපල සූදානම වැඩිදියුණු කිරීමට හැකි වූ අතර, ප්‍රාදේශීය ආර්ථිකය නඟා සිටුවීමට දායකත්වය සපයා ඇත. ඊට සමගාමීව, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවර්ධනය සඳහා එහි උපායමාර්ගික සහාය ශක්තිමත් කිරීම සඳහා සංවර්ධන යෝජනා 16 ක් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී. මෙයින් වැඩසටහන් 5 ක් දැනටමත් අමාත්‍යාංශය විසින් අනුමත කර ඇත. එමගින් ජාතික ප්‍රමුඛතා සමඟ ශක්තිමත් පෙළගැස්වීම සහ කර්මාන්ත ධාරිතා ගොඩනැගීම සඳහා ප්‍රවේශයන් ලබා ගෙන ඇත.

### යටිතල පහසුකම් සහ සම්පත් ප්‍රශස්තිකරණය

ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනයෙහි ආරක්ෂිත, කාර්යක්ෂම සහ නවීන ආයතනික පරිසරයක් සහතික කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම්හි සංවර්ධනයක් සිදු කිරීමේ අරමුණින් ඉදිරි මායිම (තාප්පය) ප්‍රතිසංස්කරණය සිදුකිරීම ආරම්භ කල අතර එම ප්‍රතිසංස්කරණ කටයුතු 75% ක් අවසන් කර ඇත. එමගින් ආරක්ෂාව ශක්තිමත් කර පරිශ්‍රයේ සමස්ත සෞන්දර්යාත්මක වටිනාකම වැඩි දියුණු කිරීමට කටයුතු සිදුකරමින් පවතී. සූර්ය බලශක්තිය භාවිතා කිරීමේ ව්‍යාපෘතිය 50% දක්වා ප්‍රගතියක් ලබා ඇති අතර, මෙහෙයුම් බලශක්ති පිරිවැය අඛණ්ඩව අඩු කිරීමට සහ ජාතික තිරසාර ප්‍රමුඛතාවයන්ට සහාය වීමට සෘජුවම දායක වෙමින් පවතී. ඊට අමතරව, ඩිජිටල්කරණය සහ විධිමත් ක්‍රියාවලීන් තුලින් ප්‍රසම්පාදන කාර්යක්ෂම ලෙස වැඩිදියුණු කර ඇත. එමගින් වේගවත් සේවාවක් සැපයීම, වඩා හොඳ සම්පත් කළමනාකරණයක් සහ සංවිධානය තුළ මූල්‍ය වගවීම වැඩි දියුණු කිරීමට කටයුතු කරමින් පවතී.

මෙම මුලපිරීම් ඒකාබද්ධ ධනාත්මක ආර්ථික බලපෑමක් ඇති කිරීමට උපකාරීවන අතර කලාපීය රැකියා නියුක්තිය පුළුල් කිරීම, කුසලතා වැඩි දියුණු කිරීම සහ කාර්මික සේවා ප්‍රවේශය ස්ථාවරව සංවර්ධනය කරයි.

### ප්‍රධාන අභියෝග සහ අවම කිරීමේ ක්‍රියාමාර්ග

මූල්‍ය ප්‍රතිපාදන හිඟතාවය සහ පරිගණක පද්ධති සංවර්ධන අවශ්‍යතා හේතුවෙන් පළමු කාර්තු තුන තුළ උපායමාර්ගික ක්‍රියාකාරකම් කිහිපයක් අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා

මන්දගාමී තත්වයක් ඇතිවී තිබේ. එබැවින් පර්යේෂණ වාණිජකරණය සහ තාක්ෂණ හුවමාරුව සම්බන්ධ උත්සාහයන් ප්‍රමාදයන්ට ලක් විය. ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය වාණිජමය වශයෙන් වැදගත්වන පර්යේෂණ තෝරා ගැනීමට ප්‍රමුඛත්වය දී ඇති අතර 2027 සිට තෝරාගත් පර්යේෂණ ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තුවේ. LMS සහ CRM පද්ධති යෙදවීමේ ප්‍රගතිය ICT සම්පත් සීමිතවීම හේතුවෙන් ක්‍රියාත්මක කිරීම පසු බෑමකට ලක්වී ඇත. එබැවින් 2026 අයවැය සඳහා පූර්ණ ඩිජිටල් පරිවර්තනය කඩිනම් කිරීම සඳහා අමාත්‍යාංශයෙන් මූල්‍ය අරමුදල් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත.

තවද, වෘත්තීය දැනුම ඇගයීම සඳහා පෙර දැනුම ඇගයීමේ ක්‍රමවේදය (RPL) ඔස්සේ සහතික නිකුත් කිරීම ඉලක්කයට වඩා අඩු මට්ටමක පවතී. ඊට ප්‍රතිචාර වශයෙන්, සහතික කිරීමේ ක්‍රියාවලිය තවදුරටත් වේගවත් කිරීම සඳහා ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය, පේෂකර්ම, ඇඟලුම්, සම් සහ පාවහන් ක්ෂේත්‍රයන් තුළ ප්‍රවර්ධන ව්‍යාපාර සහ ප්‍රවර්ධන වැඩසටහන් තීව්‍ර කිරීමට බලාපොරොත්තුවේ.

ඊට අමතරව, කාර්ය සාධනය මත පදනම් වූ ඇගයීම් පද්ධතිය ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබූ අතර ජාතික රාජ්‍ය අංශයේ ප්‍රතිසංස්කරණ සමඟ පෙළගැස්වූ ව්‍යුහගත සහ විනිවිද පෙනෙන ක්‍රමවේදයක් උපායමාර්ගික ප්‍රතිසංස්කරණ වැඩසටහන යටතේ සිදුකිරීමට බලාපොරොත්තුවේ.

## 27.3 අනාගත සැලැසුම් - 2026

- **විෂය නිර්දේශ පුළුල් කිරීම :** නව ඩිප්ලෝමා වැඩසටහන් ප්‍රතීතනය සඳහා ප්‍රමුඛත්වය ලබා දීම සහ කර්මාන්තයේ අවශ්‍යතාවන්ට සරිලන පරිදි විෂය නිර්දේශ යාවත්කාලීන කිරීම.
- **පර්යේෂණ සහ සංවර්ධන කටයුතු:** කර්මාන්තයට අදාළ නවෝත්පාදන දිරිමත් කිරීම සඳහා විශ්ව විද්‍යාල සහ පර්යේෂණ ආයතන සමග පවත්නා හවුල් සබඳතා ශක්තිමත් කිරීම.
- **කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය වෙත පුළුල් සහායක් දැක්වීම:** කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ සිටින තරුණ සහ කාන්තා ව්‍යවසායකයින්ගේ නිපුණතා සංවර්ධනය සහ වෙළඳපොළ ප්‍රවේශය සඳහා ඇති ඉඩහසර පුළුල් කිරීම පිණිස නව වැඩසටහන් දියත් කිරීම.
- **තිරසාරබවේ මූලාරම්භයන්:** පරිසර හිතකාමී හුරුපුරුදු ප්‍රවර්ධනය කිරීම පිණිස සූර්ය බලශක්තිය යොදා ගැනීම සහ ජල සංරක්ෂණ ක්‍රම භාවිතය ඉහළ දැමීම
- **පනත සංශෝධනය කිරීම:** ආයතනයේ නෛතික ව්‍යුහය යළි බලගැන්වීම මගින් මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ කර්මාන්තය වෙත ලබා දෙන සේවාව වැඩි දියුණු කිරීම පිණිස ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟළුම් ආයතන පනත සංශෝධනය කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම.
- **විද්‍යාගාර පහසුකම් පුළුල් කිරීම:** අති නවීන පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සඳහා සහාය දැක්වීම පිණිස නූතන විද්‍යාගාර පහසුකම් ඇති කිරීම.
- **පෙර දැනුම ඇගයීමේ අංශයක් (RPL) ස්ථාපනය කිරීම:** විධිමත් අධ්‍යාපන ක්‍රමවේදයෙන් ඔබ්බට ගොස් අත්පත් කරගත් නිපුණතා සහ දැනුම හඳුනාගෙන සහතික කිරීම සඳහා පෙර දැනුම ඇගයීමේ අංශයක් (RPL) ස්ථාපනය කිරීම.
- **සෞඛ්‍ය සම්පන්න බව හා ආරක්ෂිත බව සහතික කිරීම:** නිෂ්පාදනයේ ආරක්ෂිත බව සහ පාරිභෝගික විශ්වාසය තහවුරු කිරීම පිණිස ළමා ඇඟළුම් සඳහා සෞඛ්‍ය සම්පන්න බව හා ආරක්ෂිත බව සම්බන්ධයෙන් සහතිකයක් නිකුත් කිරීම
- **යටිතලපහසුකම් සංවර්ධනය:** නවීන පුස්තකාලයක්, ශ්‍රවණාගාරයක් සහ අති නවීන විලාසිතා සැකසුම් මැදිරියක් පිහිටුවීම සඳහා ගොඩනැගිලි සංකීර්ණය නවීකරණය කිරීම.
- **ක්ෂේත්‍රයට ගැලපෙන සහ අත්‍යවශ්‍ය නව උපාධි පාඨමාලා ආරම්භ කිරීම සහ විෂය මාලා සකස්කර උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීම.**

# 28

# ජාතික මෝස්තර මධ්‍යස්ථානය (NDC)

## 28.1 හැඳින්වීම

ජාතික මෝස්තර මධ්‍යස්ථානය 1982 අංක 35 දරණ ජාතික ශිල්ප සභා හා අනුබද්ධ ආයතන පනත යටතේ 1983 වර්ෂයේදී ආරම්භ කරන ලද, මේ වන විට කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන දේශිය හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය නංවාලීම තුළින් ශිල්පීන්ගේ අභිවෘද්ධිය මූලික අරමුණ කරගත් ව්‍යවස්ථාපිත ආයතනයකි.

**පනත ප්‍රකාරව ආයතනයේ අරමුණු ඉටු කර ගැනීම සඳහා හස්තකර්මාන්ත ක්ෂේත්‍රයට සපයනු ලබන සේවාවන්**

- නිර්මාණ සංවර්ධනය
- කුසලතා සංවර්ධනය
- පර්යේෂණ හා සංවර්ධන
- අලෙවි ප්‍රවර්ධනය
- පොදු පහසුකම්
- උපදේශන සේවා
- නිර්මාණ අධ්‍යාපනය

## 28.2 ප්‍රගතිය 2025 සැප්තැම්බර් මස අවසානයට

**අනුමත ප්‍රාග්ධන ප්‍රතිපාදන වෙන්කිරිම - රු.මි.** 40.000

**මූල්‍ය ප්‍රගතිය - රු.මි.** 8.840

ඉහත සඳහන් ප්‍රාග්ධන ප්‍රතිපාදන මෙන්ම බාහිර අරමුදල් ප්‍රභවයන් හරහා අරමුදල් සපයන ලද ව්‍යාපෘති යටතේ පහත සඳහන් සංවර්ධන ක්‍රියාකාරකම් සිදු කරන ලදී:

### ❖ නිර්මාණ දැනුවත්භාවය ගොඩනැගීම සඳහා මූලාකෘති සංවර්ධනය/නියැදි නිෂ්පාදනය

මූලාකෘති සංවර්ධනයේ සහ නියැදි නිෂ්පාදනයේ මූලික අරමුණ වන්නේ ශිල්පීන් සහ ව්‍යවසායකයින් අතර නිර්මාණ දැනුවත්භාවය ගොඩනැගීමයි. ව්‍යාපෘතිය යටතේ,

- **314** ක් නිර්මාණ සංවර්ධනය
- නිර්මාණ මූලාශ්‍ර **254** සිදු කිරීම
- නව නිර්මාණ 58ක් ශිල්පින් 12 දෙනෙක්ට හඳුන්වාදීම
- ප්‍රතිලාභීන් 468 දෙනෙක්ට නිර්මාණ ආශ්‍රිත සේවාවන් සැපයිම සිදු කරන ලදි.

### ❖ රට තුළ නිර්මාණ/වෙළඳපොළ පිළිබඳ දැනුවත්භාවය ගොඩනැගීම

- නිර්මාණ සහ වෙළඳපල ප්‍රවණතා පිළිබඳ දැනුවත්භාවය ගොඩනැගීමේ අරමුණ වන්නේ දේශීය හස්ත කර්මාන්ත අංශයේ තරඟකාරිත්වය සහ තිරසාරභාවය ශක්තිමත් කිරීමයි.
- පුහුණු වැඩසටහන් (සැලසුම් කරන ලද හා ඉල්ලීම් මත)

| | | |
|---|---|---|
| **වැඩසටහන් සංඛ්‍යාව** | - | 10 |
| **ප්‍රතිලාභීන් සංඛ්‍යාව** | - | 224 |
| **හඳුන්වාදෙන ලද නිර්මාණ සංඛ්‍යාව** | - | 60 |

**නිර්මාණ සහ වෙළඳපල ප්‍රවණතා පිළිබඳ පුහුණු වැඩසටහන්**



**කෙටි කාලීන පුහුණු සැසි**

ආයතනය විසින් විවිධ හස්ත කර්මාන්ත අංශ ආවරණය කරමින් ආයතනයේ වැඩබල පරිශ්‍රයේදී කෙටි කාලීන පුහුණු සැසි පවත්වනු ලැබේ. මෙම වැඩසටහන් සැලසුම් කර ඇත්තේ තම කුසලතා වැඩි දියුණු කර ගැනීමට සහ තම ශිල්පයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමට අපේක්ෂා කරන ව්‍යවසායකයින්ට සහාය වීම සඳහා ය. මේ දක්වා, පුද්ගලයින් **26** දෙනෙකු මෙම පුහුණු අවස්ථාවන්ගෙන් ප්‍රතිලාභ ලබා ඇත.

**කෙටි කාලීන පුහුණු සැසි**



**'හැඩවැඩ සටහන' වැඩසටහන**

විශේෂ මුලපිරීමක් ලෙස, සංචාරකයින්ට සහ දේශීය උනන්දුවක් දක්වන්නන්ට සාම්ප්‍රදායික අත්කම් අත්දැකීම් ලබා දීම අරමුණු කරගත් *'හැඩවැඩ සටහන'* යන නව සංකල්පය යටතේ වැඩසටහන **03**ක් ක්‍රියාත්මක කරන ලදී.

'හැඩවැඩ සටහන' වැඩසටහන



මෙම වැඩසටහන් සඳහා දේශීය හා විදේශීය ප්‍රතිලාභීන් **198** දෙනෙකු සහභාගී විය.

ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් පිරිනමනු ලබන සාම්ප්‍රදායික ශිල්ප අත්දැකීම් විවිධ පුද්ගලයින් රැසකට ප්‍රතිලාභ ලබා දෙයි. සංචාරකයින්ට ශ්‍රී ලංකාවේ පොහොසත් ශිල්පීය උරුමය පිළිබඳ ඔවුන්ගේ අගය ප්‍රකාශ කරන අව්‍යාජ සංස්කෘතික අන්තර්ක්‍රියා සඳහා ප්‍රවේශය ලැබෙන අතර සිසුන්, කලාකරුවන් සහ ශිල්ප වෘත්තිකයන් ඇතුළු දේශීය උනන්දුවක් දක්වන්නන්ට සාම්ප්‍රදායික ශිල්පීය හැකියාවන් සංරක්ෂණය කිරීමට, ඉගෙනීමට සහ ක්‍රියාකාරීව සම්බන්ධ වීමට හැකියාව ලැබේ. මෙම අත්දැකීම් සංස්කෘතික අඛණ්ඩතාව පෝෂණය කිරීම, තිරසාර ජීවනෝපායන් සඳහා සහාය වීම සහ දේශීය ශිල්ප පිළිබඳ පුළුල් අගය කිරීම දිරිමත් කරයි.

**විශ්ව විද්‍යාල ශිෂ්‍ය සහභාගීත්වය**

ආයතනය, නිර්මාණ ආශ්‍රිත අධ්‍යයනයන් හදාරන විශ්ව විද්‍යාල සිසුන්ට විශේෂිත වැඩමුළු හරහා අත්කම් ක්ෂේත්‍රයේ ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීමට නිරන්තරයෙන් අවස්ථා නිර්මාණය කර ඇත. මේ දක්වා, විශ්ව විද්‍යාල සිසුන් **27** දෙනෙකු මෙම අත්දැකීම් සහිත ඉගෙනුම් වැඩසටහන් වලින් ප්‍රතිලාභ ලබා ඇත.

## ❖ හස්ත කර්මාන්ත සඳහා පර්යේෂණ සහ සංවර්ධනය

මෙම ව්‍යාපෘතිය යටතේ, නවෝත්පාදන සහ ධාරිතා වර්ධනය තුළින් දේශීය හස්ත කර්මාන්ත අංශය වැඩිදියුණු කිරීම සඳහා අධ්‍යයන ආයතන සහ අනෙකුත් පාර්ශ්වකරුවන් සමඟ සහයෝගයෙන් විවිධ මුලපිරීම් සිදු කරන ලදී.

- ***දැනුවත් කිරීම සහ නිරූපණය:***
  ශිල්පීන් 47 දෙනෙකු තල්කොළ අත්කම් සඳහා යෙදිය හැකි දිලීර නාශක දියරයක් පිළිබඳව දැනුවත් කරන ලද අතර, තල්කොළ ඉරීමේ යන්ත්‍රයක් සඳහා සකසන ලද පර්යේෂණ මූලාකෘතිය ශිල්පීන්ට ඉදිරිපත් කරන ලදි.

- ***සහයෝගී පර්යේෂණ ව්‍යාපෘති:***
  තල් කොළ ඉරීමේ යන්ත්‍රය සංවර්ධනය කිරීම සඳහා කැලණිය විශ්වවිද්‍යාලය සමඟ ව්‍යාපෘතියක් සිදුකරමින් පවතියි.
  "ජෛව ප්‍රතිකර්ම භාවිතයෙන් බතික් අපජලය පිරිපහදු කිරීමේ හැකියාව සොයාබැලීම" සඳහා මොරටුව විශ්ව විද්‍යාලය සමඟ තවත් පර්යේෂණ ව්‍යාපෘතියක් සිදුකරයි.

- ***බතික් අංශය සඳහා සහාය:***
  *හොඳ නිෂ්පාදන පිළිවෙත් (GMP) සූදානම සඳහා බතික් ශිල්පීන් 3 දෙනෙකුට මග පෙන්වීම ලබා දෙන ලදී.*

- ***මැටි අංශ සංවර්ධනය (NWS&DB සමඟ සහයෝගයෙන්):***
  NWS&DB මැටි මහයාල මැටි පුහුණු මධ්‍යස්ථානයට ලබා දී දේශීය ශිල්පීන් විසින් භාවිතා කිරීම සඳහා සූදානම් කරන ලදී. මහයාලෙන් පැමිණි ශිල්පීන් ඇතුළු ශිල්පීන් පස් දෙනෙකු සකස් කළ මැටි ලබාගෙන භාවිතා කළහ.

කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB) විසින් සංවර්ධනය කරන ලද මැටි ලාම්පු සාදන යන්ත්‍රයක් මහයාල ප්‍රදේශයේ ශිල්පීන් 15 දෙනෙකුට හඳුන්වා දෙන ලදී.

- *අමුද්‍රව්‍ය භාවිතයේ නවෝත්පාදන*

අම්පාර ප්‍රදේශයේ ජල පිරිපහදු ඒකක 02කින් ඉවතලන රොන්මැටි විසිතුරු අත්කම් සඳහා භාවිතා කිරීමේ හැකියාව පරීක්ෂා කිරීම සඳහා අධ්‍යයනයක් සිදු කළ අතර ඒ සඳහා උගණ ශිල්පීන් 13ක් සම්බන්ධ වූහ. NDC හි ශිල්ප උපදේශකයින් දෙදෙනෙකු සඳහා කොහු කෙඳි ආශ්‍රිත නිෂ්පාදන සෑදීමේ තාක්ෂණය හඳුන්වා දෙන ලදි.

උණ බම්බු ජලබෝතල සඳහා විකල්පයක් ලෙස උණ බම්බු පිටත ආවරණය සහිත නිර්මාණ සැකසීම මෙහෙයවන ලදි.



### ❖ වෙළඳපල දැනුවත්භාවය ගොඩනැගීම තුළින් හස්ත කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම

වෙළඳපල හඳුනාගැනීම ශක්තිමත් කිරීම සහ දේශීය හස්ත කර්මාන්ත ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව, ඉලක්කගත ප්‍රවර්ධන ක්‍රියාකාරකම් කිහිපයක් සිදු කරන ලදී:

- සිංහල හින්දු අලුත් අවුරුදු සඳහා නිෂ්පාදන ප්‍රවර්ධන වැඩසටහනක් පැවැත්වීම.
- දේශීය හා විදේශීය සංචාරකයින් ඉලක්ක කර නව නිර්මාණ ප්‍රවර්ධනය වැඩසටහන් හැව්ලොක් සිටි පෝට් සිටි හි පවත්වන ලදි.
- ISA කලාපීය කමිටු ආසියා සහ පැසිෆික් කලාපයේ හත්වන රැස්වීමට සමගාමීව පවත්වන ලද ප්‍රදර්ශණයේ හා ශ්‍රී ලංකා AIESEC හි ජාත්‍යන්තර සම්මේලනය 2025 වෙනුවෙන් පවත්වන ලද උත්සවයට සමගාමීව ප්‍රවර්ධනය වැඩසටහන් සිදුකිරීම හා SLITA Runway-2025 හා සම්බන්ධ වී දේශීය අත්කම් නිර්මාණ සමග විලාසිතා දැක්ම පැවැත්වීම.

**SLITA Runway-2025**





නිමැවුම්: වෙළඳපොළට නව නිර්මාණ 31ක් හඳුන්වා දෙන ලදී. පුළුල් ප්‍රේක්ෂක පිරිසකට නව නිර්මාණ 70ක් ප්‍රදර්ශනය කරන ලදී. විභව ගැනුම්කරුවන් සහ ව්‍යාපාරික හවුල්කරුවන් සමඟ ශිල්පීන් සම්බන්ධ කරමින් වෙළඳපල සම්බන්ධතා පහක් ස්ථාපිත කරන ලදී.

### ❖ නව නිර්මාණ ප්‍රවර්ධනය කිරීම සඳහා නව නිර්මාණ ප්‍රදර්ශනය

**දේශීය හස්තකර්මාන්ත, සංචාරක කර්මාන්තය තුළ ප්‍රචලිත කිරීමේ හා ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව ලාක්ෂා නිර්මාණ ප්‍රමුඛ කොට නව නිර්මාණ ප්‍රදර්ශණයක් නොවැම්බර් මාසයේදී මහනුවරදී පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත.**

මෙහි මුලපිරීමක් ලෙස, පළමු අදියර මහනුවර කැන්ඩි සිටි සෙන්ටර් හි පැවැත්විණි. මෙම අවස්ථාවට නව නිර්මාණ 50 ක් ප්‍රදර්ශනය කරන ලද අතර දේශීය හා සංචාරකයින් ඇතුළු නරඹන්නන් 950 ක් පමණ ආකර්ෂණය විය.

මෙම ප්‍රදර්ශනය හරහා

- දේශීය ශිල්පීන්ගේ නිර්මාණශීලිත්වය සහ කුසලතා ප්‍රදර්ශනය කිරීම

- සාම්ප්‍රදායික අත්කම් කෙරෙහි උනන්දුවක් දක්වන දේශීය හා විදේශීය නරඹන්නන් සඳහා ගිලීහී යන අත්දැකීම් ලබා දීම

- ශ්‍රී ලංකාවේ පොහොසත් ශිල්ප උරුමය ප්‍රකාශණයේදී ශිල්පීන් පුළුල් වෙළඳපොළවල් සමඟ සම්බන්ධ කිරීමට අවස්ථාව උදා කිරීම ආදිය දැක්විය හැක.

### ❖ එදිනෙදා ජීවිතයට නිර්මාණයේ බලපෑම ඉස්මතු කිරීම සඳහා මහජන දැනුවත් කිරීම

ජාත්‍යන්තර ප්‍රවණතා, අපනයන අවශ්‍යතා සහ වෙළඳපල අවස්ථා පිළිබඳ දැනුම වැඩිකිරීමේ අරමුණු ඇතිව, බතික්, පොල්කටු, පිත්තල, සම් සහ වේවැල් සහ උණ බම්බු යන අත්කම් අංශවල ශිල්පීන් 44 දෙනෙකු සඳහා විදේශීය වෙළඳපොළ පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.ඊට අමතරව වර්ණ සංයෝජනය, නිර්මාණ කුසලතා සහ නිර්මාණාත්මක ප්‍රකාශනය වැඩි දියුණු කිරීම පිළිබඳ ප්‍රායෝගික පුහුණු සැසියකට ප්‍රවීන බතික් ශිල්පීන් 20 දෙනෙකු සහභාගී විය.

දේශීය ශිල්පීන්ගේ වෙළඳපල සූදානම සහ තරඟකාරිත්වය ශක්තිමත් කිරීමේ අරමුණින්, නිර්මාණ සංවර්ධනය, ඇසුරුම්කරණය සහ විකුණුම් අවස්ථා කෙරෙහි අවධානය යොමු කරන ලද තවත් වැඩසටහන් ඉදිරි කාලය තුළ ක්‍රියාත්මක කිරීමට නියමිතය.

### ❖ අත්දැකීම් පාදක කරගත් සංචාරක ව්‍යාපාරය ඉලක්ක කරගත් සාම්ප්‍රදායික හස්තකර්මාන්ත ගම්මාන සංවර්ධනය කිරීම

මෙම ව්‍යාපෘතිය යටතේ, මහනුවර නත්තරම්පොත ශාඛා කාර්යාලයේ සංවර්ධන කටයුතු ආරම්භ කර ඇති අතර, දේශීය හා විදේශීය සංචාරකයින් සඳහා පහසුකම් සපයන සාම්ප්‍රදායික අත්කම් අත්දැකීම් සඳහා මධ්‍යස්ථානයක් ලෙස මෙය ක්‍රියාත්මක වේ. මෙම මුලපිරීම ශ්‍රී ලංකාවේ ගිලිහී යන හස්තකර්මාන්ත සංරක්ෂණය අරමුණු කොට ප්‍රායෝගික අවස්ථා ලබා දීමෙන් ශ්‍රී ලංකාවේ පොහොසත් කලාත්මක උරුමය ඉස්මතු කිරීමට උත්සාහ කරන අතරම, සංස්කෘතික ඒකාබද්ධතාවය තුළින් සංචාරක කර්මාන්තයේ වර්ධනයට සහාය වේ.

### ❖ <u>නිර්මාණ උපදේශන සේවා</u>

රටවල් අතර මිත්‍රත්වයේ සංකේතයක් ලෙස රාජ්‍ය තාන්ත්‍රික නායකයෙකුට පිරිනමනු ලබන **මිත්‍ර විභූෂණ සම්මානය** නිර්මාණය කිරීමේ වගකීම ජාතික මෝස්තර මධ්‍යස්ථානයට පැවරුණු අතර, එහි නිර්මාණ සැලසුම් අප විසින් සිදු කරන ලද අතර, සම්මානය නිෂ්පාදනය දක්වා ක්‍රියාවලිය අප ආයතනයේ අධීක්ෂණය යටතේ සිදු කරන ලදී.

### ❖ නිර්මාණ අංශය සඳහා ප්‍රමිතිගත පාඨමාලා පැවැත්වීම

පෙර වර්ෂ වල ආරම්භ කරන ලද පාඨමාලා හැදෑරූ සිසුන් 72ක් පාඨමාලා සම්පූර්ණ කර ඇත. ජාතික පිරිනිර්මාණ ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සිසුන් 74ක් බඳවා ගන්නා ලදි.ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත. පාඨමාලා ගාස්තු වශයෙන් රු.මි. 5ක් උපයා ඇත.

### ❖ ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික නිර්මාණ ප්‍රතිපෝෂණය කිරීම

අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ විශේෂ ව්‍යාපෘතියක් ලෙස ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් ක්‍රියාත්මක කරනු ලබන මෙම ව්‍යාපෘතිය හරහා, මෙතෙක් භාවිතයට නොගත් සාම්ප්‍රදායික මෝස්තර ගවේශණය කොට ඒවා අනාගත පරපුරට භාවිතා කිරීමට හැකිවන පරිදි ඩිජිටල් අවකාශයකට ගෙන සිදු කිරීමට අපේක්ෂිතයි. මෙම ව්‍යාපෘතියට අදාල මූලික කටයුතු මේ වනවිට සිදු කරමින් පවතී.

## 28.3 අනාගත සැලැසුම් - 2026

2026 වසර සඳහා යෝජිත ප්‍රාග්ධන අවශ්‍යතාවය රුපියල් මිලියන 76.656 කි. ඒ යටතේ පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති අතර ඒ හරහා හස්තකර්මාන්ත ක්ෂේත්‍රයට ඵලදායි සේවාවන් රැසක් ලබාදීමට අපේක්ෂිතයි.

| ව්‍යාපෘතිය | ප්‍රතිපාදන (රු.මි. ) |
|---|---|
| නිර්මාණ දැනුවත්භාවය ගොඩනැගීම සඳහා මූලාකෘති සංවර්ධනය/නියැදි නිෂ්පාදනය | 9.850 |
| රට තුළ නිර්මාණ/වෙළඳපොළ පිළිබඳ දැනුවත්භාවය ගොඩනැංවීම | 8.850 |
| හස්තකර්මාන්ත සඳහා පර්යේෂණ සහ සංවර්ධනය | 5.700 |
| වෙළඳපොළ දැනුවත්භාවය ගොඩනැගීම තුළින් හස්ත කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම | 4.600 |
| කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය තුළ වෙළඳපළට ගැලපෙන නිර්මාණ පරතරය පිරවීම සඳහා වූ නිර්මාණ තරඟය | 3.000 |
| අත්දැකීම් පාදක කරගත් සංචාරක ව්‍යාපාරය ඉලක්ක කරගත් සාම්ප්‍රදායික හස්තකර්මාන්ත ගම්මාන සංවර්ධනය කිරීම. | 19.000 |
| අභ්‍යන්තර ධාරිතාව වැඩිදියුණු කිරීම තුළින් වඩාත් ඵලදායී සේවාවක් | 8.856 |
| නව නිර්මාණ ප්‍රවර්ධනය කිරීම සඳහා නව නිර්මාණ ප්‍රදර්ශනයක් පැවැත්වීම | 9.800 |
| එදිනෙදා ජීවිතයට නිර්මාණයේ බලපෑම ඉස්මතු කිරීම සඳහා මහජන දැනුවත්භාවය | 7.000 |
| නිර්මාණ අංශය සඳහා ප්‍රමිතිගත පාඨමාලා පැවැත්වීම | බාහිර ප්‍රතිපාදන |
| නිර්මාණ උපදේශන සේවා | බාහිර ප්‍රතිපාදන |

# 29

# ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල)(SLHB)

## 29.1 හැඳින්වීම

ලක්සල යනුවෙන් ජනප්‍රියත්වය දිනා සිටින ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය "ස්වයං මූල්‍යය රාජ්‍ය වාණිජ ආයතනයක්" වන අතර දිවයින පුරා පිහිටා ඇති ස්වකීය ප්‍රදර්ශනාගාර එකොළහක් (11) මගින් සිය දේශීය අත්කම් නිර්මාණ අලෙවිය ප්‍රවර්ධනයෙහි නියැලී සිටියි. වසර 1964 දී ලක්සල ස්වකීය සමාරම්භයේ සිටම සාම්ප්‍රදායික අත්කම් නිර්මාණකරුවන් හට සිය නිෂ්පාදන අලෙවි කර ගැනීම පිණිස මෙම ප්‍රදර්ශනාගාර ජාලය මගින් දේශීය මෙන්ම විදේශීය අත්‍යවශ්‍ය වෙළඳපොළ සබඳතා සලසා දෙනු ලබයි. එම කාල වකවානුව තුළ බොහෝ දුරට පැවති වෙළඳපොළ ඒකාධිකාරී තත්වය හේතුවෙන් උද්ගතව තිබූ සංවෘත ආර්ථික වාතාවරණය යටතේ ලක්සල ආයතනය ලාභ ලබන ආයතනයක් ලෙස පැවතියේ ය. 1983 වසරේ දී මෙම ආයතනය "1982 අංක 35 දරන ජාතික ශිල්ප සභා සහ අනුබද්ධ ආයතන පිහිටුවීමේ පනත" යටතේ ක්‍රියාත්මක වේ.

ලක්සල, ශ්‍රී ලංකාව පුරා ගෘහ ආශ්‍රිත කර්මාන්ත මගින් සපයන අත්කම් නිර්මාණ අලෙවි කරන එකම රාජ්‍ය ආයතනය වේ.

## ප්‍රධාන අරමුණු/ පරමාර්ථ

- අගය නිර්මාණය කිරීම සහ ග්‍රාමීය ප්‍රජාව අතර වටිනාකම් හුවමාරු කිරීම.
- හොඳම පාරිභෝගික තේරීම සඳහා බහු විධ මුහුණුවරකින් යුත් අවස්ථාවන් සැලසීම.
- ගුණාත්මක බව, විශ්වාසදායක බව හා ගෙවන මුදලට සරිලන වටිනාකම ලබාදීම.
- සේවා විශිෂ්ටත්වය මගින් පාරිභෝගික සංතෘප්තය ඇති කිරීම.

**සාම්ප්‍රදායික අත්කම් නිර්මාණ, අත් යන්ත්‍ර රෙදිපිළි, බතික්, තේ, සම් ආශ්‍රිත නිෂ්පාදන**



## 29.2 ප්‍රගතිය 2025 සැප්තැම්බර් මස අවසානයට

**කාර්ය සාධනය**

| විෂයාංගය | 2025 |
|---|---|
| විකුණුම් පිරිවැටුම (රු. මි.) | 688.70 |
| ප්‍රදර්ශනාගාර නිෂ්පාදන මිල දී ගැනීම (රු. මි.) | 296.30 |

*මූලාශ්‍රය: ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල)*

## 29.3 අනාගත සැලැසුම් - 2026

- ලක්සලෙහි මෙහෙයුම් කටයුතු ඒකාබද්ධව ක්‍රියාත්මක කරනු ලබන ජාතික ශිල්ප සභාව සහ ජාතික මෝස්තර මධ්‍යස්ථානය යන ආයතන ත්‍රිත්වය ඒකාබද්ධ කිරීමට නියමිතය.
- එම ක්‍රියාවලියේ කොටසක් ලෙස 2026 වසරේදී ජාතික ශිල්ප සභාව යටතේ ක්‍රියාත්මක වන ගාල්ල කොටුව සහ කොළඹ ලන්දේසි රෝහලෙහි පවතින ප්‍රදර්ශනාගාර දෙකක් අත්පත් කර ගැනීමට නියමිතය.
- 2026 වර්ෂය සඳහා පුරෝකථනය කරන ලද මුළු විකුණුම් පිරිවැටුම රු. මිලියන 1,060,000 කි.
- 2026 වසර සඳහා පුරෝකථනය කරන ලද ප්‍රදර්ශනාගාර අලෙවිය මිලදී ගැනීම් රු. මිලියන 512.70 කි.
- මීගමුව ලක්සල නව ප්‍රදර්ශනාගාරය නිල වශයෙන් ආරම්භ කිරීම.
- "පැරණි කොටුව ලක්සල ගොඩනැගිල්ල" වඩාත් ක්‍රියාකාරී සහ වාණිජමය වශයෙන් ඵලදායී අවකාශයක් බවට පරිවර්තනය කිරීමට සැලසුම් කිරීම.

# 30

# ජාතික ශිල්ප සභාව (NCC)

## 30.1 හැඳින්වීම

හස්ත කර්මාන්ත සංරක්ෂණය සහ සංවර්ධනය මෙන්ම හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ නියුතු ශිල්පීන්ගේ ආර්ථික හා සමාජ තත්ත්වයන් නංවාලීම ප්‍රධාන අරමුණ කොට 1982 අංක 35 දරණ ජාතික ශිල්ප සභා සහ අනුබද්ධිත ආයතන පනත යටතේ ජාතික ශිල්ප සභාව ස්ථාපිත විය. පසුගිය දශක කිහිපය තුළ ජාතික ශිල්ප සභාව විසින් හස්ත කර්මාන්ත සංරක්ෂණය, සංවර්ධනය සහ හස්ත කර්මාන්ත ශිල්පීන්ගේ සුභ සාධනය වෙනුවෙන් විවිධ ව්‍යාපෘතින් හා වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කර ඇත.

## අරමුණු / ඉලක්ක

1. වසර 2030 වන විට දළ දේශීය නිෂ්පාදිතයට හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයෙන් කරනු ලබන දායකත්වය 50% කින් ඉහළ නැංවීම

2. වසර 2030 වන විට හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය ආශ්‍රිත ස්වයං රැකියා 4000 ක් ජනිත කිරීම

3. වසර 2030 වන විට හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය ආශ්‍රිත තරුණ හා කාන්තා ව්‍යවසායකයින් 400 ක් නිර්මාණය කිරීම

4. වසර 2030 වන විට දළ දේශීය නිෂ්පාදිතයෙහි හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය ආශ්‍රිත අපනයන කොටස 50% කින් ඉහළ නැංවීම

### කාර්යභාරය

- හස්ත කර්මාන්ත ආශ්‍රිත පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ශිල්පීය හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ස්වයං රැකියා ආරම්භ කිරීම සඳහා පහසුකම් සැලසීම.
- අමුද්‍රව්‍ය ආශ්‍රිත ගැටළු අවම කිරීම සඳහා සම්බන්ධීකරණය සහ සහාය වීම.
- හස්ත කර්මාන්ත ආශ්‍රිත අමුද්‍රව්‍ය ක්‍රියාවලිකරණය සඳහා නව තාක්ෂණය හඳුන්වා දීම
- දේශීය හා විදේශීය අළෙවි ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ශිල්පීන් සඳහා මූල්‍ය පහසුකම් ලබාදීම සඳහා සම්බන්ධීකරණය කිරීම.
- හස්ත කර්මාන්ත නිෂ්පාදන සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- හස්ත කර්මාන්ත ශිල්පීන් අපනයන මට්ටමේ ව්‍යවසායකයින් බවට පත් කිරීම.
- පළාත් හා ජාතික මට්ටමින් ශිල්ප අභිමාණී තරඟ, ප්‍රදර්ශන පැවැත්වීම සහ සම්මාන ලබා දීම.
- ශිල්පීන් සඳහා සුභ සාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- හස්ත කර්මාන්ත ශිල්පීන් හඳුනාගෙන ලියාපදිංචි කිරීම හා හැඳුනුම්පත් නිකුත් කිරීම.
- සාම්ප්‍රදායික හස්ත කරමාන්ත සංරක්ෂණය කිරීම.
- හස්ත කර්මාන්ත ශිල්පීන්ගේ ආර්ථිකමය, සමාජ හා ජීවන මට්ටම ඉහළ නැංවීම.

## 30.2 ප්‍රගතිය 2025 සැප්තැම්බර් මස අවසානයට

### 1. හස්ත කර්මාන්ත ආශ්‍රිත පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

මෙම වැඩසටහන යටතේ දිවයින පුරා විසිරී ඇති ශිල්පීය පුහුණු මධ්‍යස්ථාන 62 මඟින් වාර්ෂිකව පූර්ණ කාලීන ලෙස පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන අතර එය න්‍යායාත්මකව හා ප්‍රායෝගික යන අංශයන්ගෙන් සමන්විතය. පුහුණුලාභීන් සංඛ්‍යාව - 574

සය මාසික ගුරු ශිල්පී පුහුණු වැඩසටහන යටතේ ගුරු ශිල්පී පුහුණු පන්ති 22 ක ආධුනිකයින් 262 දෙනෙකු පුහුණුව ලබමින් සිටී.

එක් එක් ආයතන හා කණ්ඩායම් විසින් කරනු ලබන ඉල්ලීම් පදනම් කර ගනිමින් කෙටි කාලීන පුහුණු වැඩසටහන්ද ක්‍රියාත්මක කරනු ලැබේ. මේ යටතේ විශේෂ පුහුණු වැඩසටහන් 13ක් මඟින් 436 දෙනෙකු සඳහා පුහුණු පහසුකම් ලබා දී ඇත.

| අ.අ | පුහුණු වැඩසටහන | වැඩසටහන් සංඛ්‍යාව | පුහුණුලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | ශිල්පීය පුහුණු මධ්‍යස්ථාන මඟින් පුහුණු පහසුකම් ලබා දීම | 62 | 574 |
| 2 | ගුරු ශිල්පී පුහුණු පාඨමාලා | 22 | 262 |
| 3 | විශේෂ පුහුණු වැඩසටහන් මඟින් පුහුණු පහසුකම් ලබා දීම | 13 | 436 |
| | **එකතුව** | **97** | **1272** |

*මූලාශ්‍රය : ජාතික ශිල්ප සභාව*

### 2. හස්ත කර්මාන්ත ශිල්පීන් අපනයන මට්ටමේ ව්‍යවසායකයින් බවට පත් කිරීම.

හස්ත කර්මාන්ත ආශ්‍රිත නිර්මාණකරණයේ යෙදෙන කර්මාන්තකරුවන් ව්‍යාපාර ක්ෂේත්‍රය කෙරෙහි උනන්දු කරවා ග්‍රාමීය කර්මාන්ත ක්ෂේත්‍රයේ උන්නතිය සඳහා දායක කර ගනිමින් අපනයන වෙළඳපොල අභිමුඛ නිෂ්පාදන කටයුතු සිදු කරන ග්‍රාමීය කර්මාන්තකරුවන් / ව්‍යවසායකයන් බිහිකිරීමේ මූලික අරමුණ ඇතිව රට තුළට ගලා එන විදේශ විනිමය ප්‍රමාණය වැඩිකිරීම හා නිර්මාණශීලී හැකියාවෙන් යුත් නව රැකියා අවස්ථා උත්පාදනය කිරීම මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කිරීමට අපේක්ෂිත අතර මෙම වැඩසටහන යටතේ 2025 වර්ෂය තුල ශිල්පීන් 50 දෙනෙකු අපනයන මට්ටමේ ව්‍යවසායකයින් බවට පත් කිරීමට අපේක්ෂිතය.

### 3. ස්වයං රැකියා ආරම්භ කිරීම සඳහා පහසුකම් සැලසීම.

ජාතික ශිල්ප සභාව මගින් ක්‍රියාත්මක කරනු ලබන සියලුම පුහුණු වැඩසටහන්වල පුහුණුලාභීන් හා සහජ හැකියාවන් ඇති ශිල්පීන්ට හස්ත කර්මාන්ත ආශ්‍රිත ස්වයං රැකියා ආරම්භ කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම තුලින් රැකියා ජනිත කිරීමේ ඉලක්කය සපුරාලීම සඳහා සහාය වීම මෙන්ම හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයෙන් ජාතික ආර්ථිකයට හැකි උපරිමයෙන් දායක කර ගැනීම සඳහා දිරිගැන්වීම මෙම වැඩසටහනින් අපේක්ෂිතය. 2025 වර්ෂයේදී ශිල්පීන් 200 දෙනෙකු සඳහා පහසුකම් සැලසීමට අපේක්ෂිත ය.

### 4. සංචාරක ගමනාන්ත ආශ්‍රිත ජංගම අලෙවිකුටි පවත්වාගෙන යාම.

ශ්‍රී ලංකාවේ ප්‍රධානතම සංචාරක ගමනාන්තයන් වන නිලාවේලි, පාසිකුඩා, කොළඹ, ඇල්ල සහ නුවර යන ස්ථානයන්හි සංචාරකයින් විශාල වශයෙන් පැමිණෙන කාල වකවානුවල හස්ත කර්මාන්ත ආශ්‍රිත නිර්මාණ අලෙවි හා ප්‍රවර්ධනය කිරීමේ මූලික අරමුණින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ. ශ්‍රී ලාංකීය හස්ත කර්මාන්ත නිර්මාණ දෙස් විදෙස් සංචාරකයින් අතරේ ජනප්‍රිය කරවීම සහ හස්ත කර්මාන්ත ශිල්පීන්ගේ ආදායම් මට්ටම ඉහළ නැංවීම සඳහා ද මේ යටතේ අවස්ථාව සැලසෙනු ඇත.

**නිලාවේලි ජංගම අලෙවි කුටි**





### 5. ශිල්ප අභිමානී පළාත් සහ ජාතික තරඟය

ශිල්ප අභිමානී පළාත් සහ ජාතික තරඟයට සමගාමීව පළාත් නවයම ආවරණය වන පරිද්දෙන් පළාත් තරඟ නවයක් ජාතික ශිල්ප සභාව, පළාත් කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව සහ පළාත් සභා සමඟ එක්ව සංවිධානය කරනු ලබයි. මූලික හස්ත කර්මාන්ත ක්ෂේත්‍ර 31 ක් යටතේ වර්ගීකරණය කරන ලද අත්කම් ක්ෂේත්‍ර 66 ක් නියෝජනය කරමින් පවත්වන ජාතික හස්ත කර්මාන්ත තරඟයේදී සාම්ප්‍රදායික අංශ සහ සාම්ප්‍රදාය රැක ගනිමින් නව නිර්මාණ අංශ සඳහා ස්වර්ණ සම්මාන දෙකක්, රජත සම්මාන සමඟින් ජාතික සම්මාන ප්‍රථම, දෙවන, තෙවන ස්ථාන සහ කුසලතා ස්ථාන සඳහා මූල්‍ය තිළිණ සහ සහතික පත් පිරිනැමීම මේ යටතේ සිදු කරනු ලබයි.
(වියදම රු.මි.0.645)

### 6. ශිල්පීය පුහුණු හා නිෂ්පාදන මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම.

ජාතික ශිල්ප සභාව මගින් පුහුණු හා නිෂ්පාදන පහසුකම් ලබා දීම සඳහා භාවිතා කරනු ලබන පුහුණු හා නිෂ්පාදන මධ්‍යස්ථාන බහුතරයක් වසර තිහකටත් වඩා පැරණි ඒවා වන බැවින් හා අදාල මධ්‍යස්ථාන වලට අත්‍යවශ්‍යම පහසුකම් වන සනීපාරක්ෂක, ජලය සහ විදුලිය මෙන්ම අත්‍යවශ්‍ය අළුත්වැඩියාවන් සිදු කිරීම මේ යටතේ සිදුකරනු ලබයි.

2025 වසර තුලදී පුහුණු මධ්‍යස්ථාන 07ක් සංවර්ධනය කරමින් පවතී. (රත්නපුර - කුරුවිට, ගාල්ල - හබරාදුව,

කුරුණෑගල - වාරියපොල, කොළඹ - බත්තරමුල්ල, ත්‍රිකුණාමලය - කන්නිය, යන පුහුණු මධ්‍යස්ථානවල සංවර්ධන කටයුතු සිදු කරමින් පවතින අතර මොණරාගල - නන්නපුරාව සහ මඩකලපුව - තිරුපෙරුම්තුරයි මධ්‍යස්ථාන සංවර්ධන කටයුතු අවසන් කර ඇත). (වියදම රු.මි.2.495)

## 7. දේශීය හා විදේශීය අළෙවි ප්‍රවර්ධන වැඩසටහන

හස්ත කර්මාන්ත ශිල්පීන්ගේ කාලීන තොරතුරු විස්තරාත්මකව ලබාගෙන දත්ත පද්ධතිය යාවත්කාලීන කර ඔවුන් සඳහා ජාතික ශිල්ප සභා ලියාපදිංචිය ලබාදී නව හැඳුනුම්පත් නිකුත් කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම මෙමඟින් අපේක්ෂිතය. (වියදම රු.මි.0.035)

- ලියාපදිංචි නව ශිල්පීන් සංඛ්‍යාව - 804
- නිකුත් කර ඇති හැඳුනුම්පත් සංඛ්‍යාව - 333
- සමස්ත ලියාපදිංචි ශිල්පීන් සංඛ්‍යාව - 20,869

දත්ත පද්ධතිය ස්ථාපිත කිරීමට අදාලව මූලික කටයුතු සිදු කරමින් පවතී.

## 8. ශිල්ප සමාජ ස්ථාපිත කිරීම හා සම්බන්ධීකරණය

දිවයින පුරා විසිරී සිටින හස්ත කර්මාන්ත ශිල්පීන් ඒකරාශී කර ඔවුන් සංවිධාන ගත කිරීමේ අරමුණින් ප්‍රාදේශීය, දිස්ත්‍රික් සහ ජාතික මට්ටමින් ශිල්ප සමාජ ස්ථාපිත කිරීම හා සම්බන්ධීකරණය කිරීම, මෙමඟින් සිදු කෙරේ.

- 2025 වර්ෂයේ දී ස්ථාපිත කර ඇති නව ප්‍රාදේශීය ශිල්ප සමාජ සංඛ්‍යාව - 08
- දිස්ත්‍රික් ශිල්ප සමාජ සංඛ්‍යාව - 25
- පළාත් ශිල්ප සමාජ සංඛ්‍යාව - 08
- සමස්ත ප්‍රාදේශීය ශිල්ප සමාජ සංඛ්‍යාව - 211
  (වියදම රු.මි.0.126)

## 9. මූල්‍යමය නොවන සංවර්ධන වැඩසටහන්

මෙම වැඩසටහන යටතේ මූල්‍ය පහසුකම් සම්බන්ධීකරණය, අමුද්‍රව්‍ය පහසුකම් සඳහා සහය සේවා ලබා දීම, අලෙවි පහසුකම් සම්බන්ධීකරණය, ජාත්‍යන්තර තරඟ සඳහා ශිල්පීන් යොමු කිරීම සහ වෙනත් මූල්‍යමය නොවන සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

| විස්තරය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|
| මූල්‍ය පහසුකම් සම්බන්ධීකරණය | 88 |
| අමුද්‍රව්‍ය පහසුකම් සඳහා සහය සේවා ලබා දීම | 159 |
| අලෙවි පහසුකම් සම්බන්ධීකරණය | 502 |
| ජාත්‍යන්තර තරඟ සඳහා ශිල්පීන් යොමු කිරීම | 10 |
| වෙනත් මූල්‍යමය නොවන සංවර්ධන වැඩසටහන් | 228 |
| **මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව** | **987** |

*මූලාශ්‍රය : ජාතික ශිල්ප සභාව*

## 10. දේශීය හා විදේශීය අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

### i. පලාත්/දිස්ත්‍රික් මට්ටමින් අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
(වියදම රු.මි.3.725)

පලාත්/දිස්ත්‍රික් මට්ටමින් අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් 08 ක්‍රියාත්මක කර ඇත (කුලියාපිටිය, කොළඹ, රත්නපුර, බදුල්ල, යාපනය, නුවර, අනුරාධපුරය, පොළොන්නරුව).
අනෙකුත් දිස්ත්‍රික්කයන්හිදී අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීමට සැලසුම් කර ඇත.

### ii. ලක්ශිල්ප අලෙවිසැල් සංවර්ධනය කිරීම.
මහනුවර - පල්ලෙකැලේ සහ ගාල්ල - සිප්නාරා අලෙවිසැල් සංවර්ධන කටයුතු සම්පූර්ණ කර ඇත.

### iii. ශිල්පීය හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
නේපාලය, බංගලාදේශය සහ ඉන්දුනීසියාව යන රටවල් සමඟ ශිල්පීය හුවමාරු වැඩසටහන් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

**iv.ජාත්‍යන්තර හස්ත කර්මාන්ත අලෙවි ප්‍රවර්ධන වැඩසටහන**

ශ්‍රී ලංකාවේ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය සමඟ ඒකාබද්ධව ශ්‍රී ලාංකික ශිල්පීන් 50 දෙනෙකු හා ඉන්දියානු ශිල්පීන් 50 දෙනෙකුගේ සහභාගීත්වයෙන් කොළඹ නිදහස් චතුරශ්‍රයේදී මෙම වැඩසටහන 2025 නොවැම්බර් මස ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

**11. දැව මෝස්තර හා නිර්මාණ නවෝත්පාදන මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම.**

දැව ආශ්‍රිත කර්මාන්ත ක්ෂේත්‍රයට අත්‍යවශ්‍යව පවතින නවීන තාක්ෂණය, නව මෝස්තර, පර්යේෂණ හා නවෝත්පාදන යන අංශවල අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා වසර 10 ක් පමණ ඌණ උපයෝජිතව පැවති කටුබැද්ද යාන්ත්‍රික වඩු කර්මාන්ත මධ්‍යස්ථානයේ ගොඩනැඟිලි හා යන්ත්‍ර සූත්‍ර භාවිතයට ගැනීමට මූලික අළුත්වැඩියා හා වැඩ සැලැස්ම ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, එහි ඉතිරි කටයුතු සම්පූර්ණ කර මෙරට දැව කර්මාන්ත ක්ෂේත්‍රයට අත්‍යවශ්‍ය ප්‍රමිතිගත ශිල්පීන් බිහි කිරීම හා ක්ෂේත්‍රයට අත්‍යවශ්‍ය සේවාවන් සැපයීම, ජාතික වෘත්තීය සුදුසුකම් සහිත පුහුණු ශ්‍රමිකයින් බිහි කිරීම, යන ප්‍රධාන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ඇත. මෙම මධ්‍යස්ථානයේ නවීකරණ කටයුතු වලට අදාල මූලික කටයුතු සිදු කරමින් පවතී.

## 30.3 අනාගත සැලැසුම් - 2026

**1. "විශ්මිත නිමවුමෙන් උරුමයන් රැකදෙන" හස්ත කර්මාන්ත ආශ්‍රිත නිර්මාණ ප්‍රවර්ධන වැඩසටහන.**

ශ්‍රී ලාංකීය හස්ත කර්මාන්ත ආශ්‍රිත නිර්මාණ සඳහා පුළුල් වෙළඳපොල අවස්ථා ලබාදී, විදේශ විනිමය උත්පාදනය කරමින් ශිල්පීන්ගේ ජීවන තත්වය ඉහළ නැංවීමේ මූලික අරමුණු පදනම්ව, හස්ත කර්මාන්ත ආශ්‍රිත නිර්මාණ විදේශ සංචාරකයින් ඉලක්ක කර ගනිමින් ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සමඟ ඒකාබද්ධව විශේෂ හස්ත කර්මාන්ත ආශ්‍රිත නිර්මාණ ප්‍රවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.

**2. හස්ත කර්මාන්ත ආශ්‍රිත නිෂ්පාදන අපනයන ප්‍රවර්ධනය.**

ශ්‍රී ලාංකීය හස්ත කර්මාන්ත ආශ්‍රිත නිෂ්පාදන විදේශීය රටවල්හි වෙළඳපොල තුල අලෙවි කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් සියළුම තානාපති කාර්යාල නිළධාරීන් සම්බන්ධකර ගනිමින් සකස් කර එමඟින් හස්ත කර්මාන්ත ආශ්‍රිත නිෂ්පාදන අපනයන වටිනාකම ඉහළ නංවා විදේශ විනිමය උත්පාදනය කිරීම යන මූලික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

# 31

# සීමාසහිත ලංකා සළුසල (LSL)

## 31.1 හැදින්වීම

වර්ෂ 1967 ඔක්තෝම්බර් මස 01 වන දින ශ්‍රී ලංකා රජයේ වාණිජ (රෙදිපිළි) නීතිගත සංස්ථාව ලෙස ස්ථාපනය වූ සළුසල ආයතනයේ මුඛ්‍ය පරමාර්ථය වූයේ දේශීය නිෂ්පාදනය නගා සිටුවීම හා දේශීය රෙදිපිළි හා ඒ ආශ්‍රිත නිෂ්පාදන සැපයීමේ පුරෝගාමියා වීම සහ ශ්‍රී ලංකාව තුළ රෙදිපිළි කර්මාන්තයේ නියැළී සිටින කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින් ඉහළ තලයකට පැමිණීම සඳහා පූර්ණ සහයෝගය ලබාදීමයි.

මෙහි ව්‍යාපාර කටයුතු තවදුරටත් පුළුල් කරගැනීම සඳහා 1991.11.28 වන දින සී/ස ලංකා සළුසල සමාගමක් ලෙස ස්ථාපනය කරන ලදී. 1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හෝ රජයට අයත් වෙළඳ ව්‍යාපාර රාජ්‍ය සමාගම් බවට පරිවර්ථනය කිරීමේ පනත අනුව 1991.12.21 වන දින පලකරන ලද ගැසට් නිවේදනය අනුව ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (රෙදිපිළි) නීතිගත සංස්ථාව වත්කම්, වගකීම් සහ ව්‍යාපාරික මෙහෙයුම් කටයුතු මෙම සමාගමට පවරන ලදි.

### අරමුණු

- නිෂ්පාදන ආශ්‍රිත යටිතල පහසුකම් සහ සැලසුම් සංවර්ධනය සඳහා පහසුකම් සපයන අග්‍රස්ථ රාජ්‍ය ආයතනය ලෙස ක්‍රියා කිරීමෙන්,දේශීය අත්යන්ත්‍ර, බතික් සහ ඇඟලුම් සඳහා වෙළෙඳපොළ අවස්ථා දියුණු කිරීම තුළින් දේශීය නිෂ්පාදකයින්ට නිෂ්පාදනය ඉහළ නැංවීමට අවස්ථාවක් උදාකර දෙන අතර, එමඟින් ග්‍රාමීය ආර්ථිකයේ සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශයේ සංවර්ධනයට දායක වේ.

- පුද්ගලික අංශය සමඟ සහයෝගයෙන් කර්මාන්ත ශාලා විවෘත කිරීම මගින් මහා පරිමාණ දේශීය නිෂ්පාදන ස්ථාපිත කිරීම ප්‍රවර්ධනය කිරීම මගින් නිල ඇඳුම් ආනයනය සහ අනෙකුත් ද්‍රව්‍ය අවශ්‍යතා සඳහා වැය වන රජයේ මුදල් ඉතිරි කිරීම.

- රාජ්‍ය අංශයේ සංවිධානවල (B2G) සියලුම රෙදිපිළි, රෙදිපිළි සහ අදාළ අවශ්‍යතාවල එකම සැපයුම්කරු වීම.

- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශයේ ශිල්පීන් සඳහා නිෂ්පාදනය සඳහා සහ අනෙකුත් සැපයුම්කරුවන් සඳහාත් කර්මාන්තය තුළ නිෂ්පාදනය සඳහා ඉඩකඩ සැපයීම.

- දැරිය හැකි මිලකට ගුණාත්මක ද්‍රව්‍ය ලබා දීමෙන් දේශීය සහ විදේශීය වෙළෙඳපොළ තුළ පාරිභෝගිකයන් සඳහා වඩාත්ම විශ්වාසදායක සන්නාමය වීම.

- දේශීය සහ එතෙර වෙළඳපළ නඟා සිටුවීමට සහ නංවාලීමට රෙදිපිළි, ඇඟලුම් සහ බතික් අත්යන්ත්‍ර කර්මාන්ත නියාමනය කිරීමට පෙරමුණ ගැනීම.

- රාජ්‍ය අංශයේ ප්‍රාග්ධන වියදම් ඉවත් කිරීම මගින් JV සහ PPP වලට පිවිසීමෙන් කර්මාන්තයේ වෙනසක් ඇති කිරීම.

- අපනයන ආදායම ඉහළ නැංවීම සඳහා කලාපයේ සහ විදේශීය වෙළෙඳපොළ තුළ ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත බතික් අත්යන්ත්‍ර සහ ඇඟලුම් ප්‍රවර්ධනය කිරීම තුළින් රටේ ඩොලර් සංචිත ඉහළ නැංවීම.

## 31.2 ප්‍රගතිය 2025 සැප්තැම්බර් මස අවසානයට

සැප්තැම්බර් 30 වන දින වන විට සමාගමට ආදායම වැඩි කිරීමට, අලෙවිකරණ සහ විකුණුම් අවස්ථා නිර්මාණය කිරීමේදී කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට අවශ්‍ය සහය ලබා දීමෙන් එහි මූලික අරමුණ නැවත පන ගැන්වීමට හැකි වී ඇති අතර, මෙහෙයුම පවත්වා ගත හැකි ස්ථාවර ස්ථානයකට සංවිධානය ගෙනවිත් ඇත. සංවිධානය තවමත් කරදරකාරී තත්වයෙන් මිදී නොමැති අතර අධිකරණ නඩු, ණයගැතියන් සහ අපේක්ෂිත වැට් බදු ගෙවීම් ඇති අතර ඒවා විසඳා ගත යුතු අතර අනුමැතීන්ට අදාල මූල්‍යමය නොවන රජයේ සහය අපේක්ෂා කරනු ඇත.

### මූල්‍ය තත්ත්වය

පහත වගුව (වගුව 1) මඟින් වාර්තා කරන කාලසීමාව සඳහා ලංකා සළුසල සීමිත සමාගමේ සියලුම ගෙවීම් සහ ලැබීම් පිලිබඳ සාරාංශයක් සපයයි. වහාම දත්ත මෙහෙයුම් අලාභයක් පෙන්වනු ඇත. නමුත් කල් ඉකුත් වූ වැට් නිෂ්කාෂණයක් හේතුවෙන් සළුසලට රු.(16,151,844.81) ක හිඟ මුදල් එකතු කිරීමට නොහැකි වී ඇත. (වගුව 2) එමඟින් සළුසල වසර අවසන් කිරීමට මෙහෙයුම් ලාභයක් (බදු ගෙවීමට පෙර) ලබා දෙනු ඇත.

**2025 සැප්තැම්බර් 30 දිනට ලැබීම් සහ ගෙවීම්**

| මාසය | ලැබීම් (රු.) | ගෙවීම් (රු.) | ලාභ සහ අලාභ (රු.) |
|---|---|---|---|
| ජනවාරි | 1,259,906.23 | 2,957,564.91 | (1,697,658.68) |
| පෙබරවාරි | 904,645.44 | 105,365.68 | 799,279.76 |
| මාර්තු | 2,221,361.34 | 2,027,849.92 | 193,511.42 |
| අප්‍රේල් | 1,772,161.97 | 2,264,534.09 | (492,372.12) |
| මැයි | 1,947,315.76 | 1,041,971.05 | 905,344.71 |
| ජූනි | 1,511,261.04 | 3,122,317.39 | (1,611,056.35) |
| ජූලි | 5,226,264.60 | 10,109,113.27 | (4,882,848.67) |
| අගෝස්තු | 5,076,397.62 | 6,186,040.23 | (1,109,642.61) |
| සැප්තැම්බර් | 2,411,981.24 | 3,150,464.21 | (738,482.97) |
| එකතුව | 22,331,295.24 | 30,965,220.75 | (8,633,925.51) |

***මූලාශ්‍රය: සීමාසහිත ලංකා සළුසල***

ලැබිය යුතු මුදල් /චෙක්පත්

| ලැබිය යුතු මුදල් /චෙක්පත් | වටිනාකම (රු.) |
|---|---|
| ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානය | 3,894,000.00 |
| ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය | 3,021,980.00 |
| මධ්‍යම ප්‍රසම්පාදන දෙපාර්තමේන්තුව - කොළඹ මහ නගර සභාව | 2,034,435.00 |
| කොළඹ විශ්වවිද්‍යාලය | 752,840.00 |
| මධ්‍යම ප්‍රසම්පාදන දෙපාර්තමේන්තුව - කොළඹ මහ නගර සභාව | 458,972.00 |
| කොළඹ ජාතික රෝහල | 274,114.00 |
| කාන්තාවන් සඳහා කාසල් වීදිය | 271,140.00 |
| ද සොයිසා කාන්තා රෝහල | 117,244.80 |
| පොලිස් වෛද්‍ය සේවා අංශය - නාරාහේන්පිට | 107,675.00 |
| ජාතික වකුගඩු රෝග ආයතනය, ඩයලිසිස් බද්ධ කිරීම | 91,573.90 |
| කොළඹ මහ නගර සභාව | 73,410.75 |
| ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 54,459.36 |
| DSI ටයර් වලින් කුලී අත්තිකාරම් | 5,000,000.00 |
| මුළු ලැබිය යුතු මුදල් | 16,151,844.81 |

*මූලාශ්‍රය: සීමාසහිත ලංකා සළුසල*

## 31.3 අනාගත සැලැසුම් - 2026

**1. වෙළඳපල සංවර්ධනය සහ ව්‍යාප්තිය: අනෙකුත් රෙදිපිළි සිල්ලර වෙළෙන්දන්, සිල්ලර නවෝත්පාදන, ෆ්‍රැන්චයිස් සහ ඩිජිටල් පරිවර්තනය (මාර්ගගත පැවැත්ම වැඩි දියුණු කිරීම) සමඟ හවුල්කාරිත්වයන් හරහා** ලංකා සළුසල දේශීයව සහ ගෝලීය වශයෙන් පුළුල් කිරීම. උත්සව, සංචාරක කලාප සහ ආයතනික සිදුවීම් වලදී ජංගම පොප්-අප් වෙළඳසැල් හඳුන්වා දීම. කොළඹ ප්‍රදේශයේ හා බතික් සහ අත්යන්ත්‍ර රෙදිපිළි කලාත්මක බව ප්‍රදර්ශනය කරන ප්‍රධාන සංචාරක මධ්‍යස්ථානවල ප්‍රමුඛ අත්දැකීම් වෙළඳසැල් විවෘත කිරීම.

**2. නිෂ්පාදකයින් සවිබල ගැන්වීම සහ සැපයුම් දාමය නැවත ගොඩනැගීම:** නිෂ්පාදක ලේඛනයක් ස්ථාපිත කිරීම, කලාපීය සමුපකාර සමඟ හවුල්කාරිත්වයන් ඇති කර ගැනීම, අමාත්‍යාංශ/භාණ්ඩාගාර සහාය ලබන ක්ෂුද්‍ර මූල්‍යකරණය සහ පුහුණුව ප්‍රවර්ධනය කිරීම සහ සැපයුම්කරුවන් සමඟ විශ්වාසය නැවත ගොඩනැංවීම සහ ඔරොත්තු දෙන, ඇතුළත් සැපයුම් දාමයක් නිර්මාණය කිරීම.

**3. වෙළඳ නාමකරණය සහ නිෂ්පාදන වෙනස:** විවිධ ප්‍රේක්ෂකයින් සමඟ අනුනාද වන ශක්තිමත්, නවීන වෙළඳ නාම අනන්‍යතාවයක් ගොඩනැංවීම. නව ටැග්ලයින් එකක් ("ශ්‍රී ලාංකික ආත්මය සමඟ වියන ලද") දියත් කිරීම. නිෂ්පාදන රේඛා සැදීම: යොවුන් ඇඳුම්, සංස්කෘතික උරමයන් ලත් ඇඳුම්, නිවාඩු නිකේතන ඇඳුම්, ආයතනික තෑගි, ගෘහ රෙදිපිළි. කැප්සියුල එකතු කිරීම් සම-නිර්මාණය කිරීම සඳහා දේශීය බලපෑම්කරුවන් සහ විලාසිතා නිර්මාණකරුවන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම. ජාත්‍යන්තර රෙදිපිළි සහතික සඳහා අයදුම් කරන්න (OEKO-TEX, සාධාරණ වෙළඳාම).

**4. ඩිජිටල් පරිවර්තනය සහ අලෙවිකරණය:** සජීවී මාර්ගගත පැවැත්මක් සහ දත්ත මත පදනම් වූ අලෙවිකරණය ගොඩනැංවීම. බලපෑම්කාරී ව්‍යාපාර සහ SEO ප්‍රශස්තිකරණය සමඟ ඊ-වාණිජ්‍ය වෙළඳසැල දියත් කර ප්‍රවර්ධනය කිරීම. අන්තර්ගත කුළුණු සමඟ සමාජ මාධ්‍ය ප්‍රතිසංස්කරණය කිරීම, කලාකරුවන්ගේ කතා, නිෂ්පාදන ඉස්මතු කිරීම්, තිරය පිටුපස, පාරිභෝගික සාක්ෂි. Facebook, Instagram සහ Google හි තරුණයින්, සංචාරකයින් සහ ආයතනික ගැනුම්කරුවන් සඳහා ඉලක්කගත දැන්වීම් ව්‍යාපාර ක්‍රියාත්මක කිරීම හා පක්ෂපාතිත්ව වැඩසටහන් සහ ඒ සඳහා යොමු කිරීමේ දිරිගැන්වීම් වැඩසටහන් හඳුන්වා දීම.

**5. ආදායම් විවිධාංගීකරණය සහ තිරසාරභාවය:** නව්‍ය ආදායම් මාර්ග හරහා මූල්‍ය තිරසාරභාවය සහතික කිරීම සහ සියලු ණය ගෙවා ඇති බව සහතික කිරීම. භාවිතයට නොගත් ඉඩම් රෙදිපිළි නිෂ්පාදකයින්ට, සංචාරක ව්‍යාපාරයට හෝ පුහුණු මධ්‍යස්ථානවලට බදු දීම. බැංකු, ගුවන් සේවා සහ රජයේ ආයතන සඳහා ආයතනික රෙදිපිළි තෑගි පිරිනැමීම. සංචාරකයින් සඳහා රෙදිපිළි වැඩමුළු සහ අත්දැකීම් දියත් කිරීම. (උදා: බතික් ඩයි කිරීම, අත්යන්ත්‍ර රෙදි වියීම). මාසිකව සකස් කරන ලද රෙදිපිළි අයිතම සඳහා ආකෘතියක් සැදීම.

# 32

# ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය (NGJA)

## 32.1 හැඳින්වීම

1993 අංක 50 දරන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරි පනත මඟින් ශ්‍රී ලංකාවේ මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තය සංවර්ධනය, නියාමනය සහ ප්‍රවර්ධනය සඳහා ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පිහිටුවා ඇත.

ඒ අනුව කර්මාන්තකරුවන් දැනුවත්කිරීම හා මඟ පෙන්වීම, මැණික් ඉඩම් වෙන්දේසි මගින් රජයේ ඉඩම් වල මැණික් කැණීමේ අයිතිය කර්මාන්තකරුවන් වෙත ලබාදීම, රසායනාගාර සේවා සැලසීම වැනි කටයුතු කර්මාන්තයේ සංවර්ධනය වෙනුවෙන්ද මැණික් කැණීම් හා මැණික් වෙන්දේසි සඳහා බලපත්‍ර නිකුත් කිරීම හා නිරන්තර අධීක්ෂණය හා වැටලීම් මගින් කර්මාන්තය නියාමනයද දේශීය හා ජාත්‍යන්තර ප්‍රදර්ශන වලට ශ්‍රී ලංකාව නියෝජනය , නව වෙළඳපොලවල් කරා කර්මාන්තකරුවන් යොමුකිරීම මගින් ප්‍රවර්ධනය යන කාර්යයන් ද සිදු කරනු ලබයි. මීට අමතරව මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයෙහි නියුතු සහ ඒ පිළිබඳ උනන්දුවක් දක්වන සියලු පාර්ශවයන් ධෛර්යමත් කිරීම, පහසුකම් සැපයීම, ඒ සඳහා අදාල වන්නාවූ දැනුම වර්ධනය කිරීම යනාදී ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීමේ කාර්යයන් වලද නිරතව සිටී. ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ ව්‍යාපාරික ආකෘතිය, ස්වාධීනව නැගීසිට ස්වයං මූල්‍ය ස්ථාවරත්වය සහ රජය තුල තිරසාර බවින් යුත් අධිකාරිය යන සංකල්පය මත පදනම් වී ඇත.

## ප්‍රධාන අරමුණු

- මැණික් සහ ස්වර්ණාභරණ ක්ෂේත්‍රයට අදාලව වර්ෂ 2029 වන විට මැණික් සහ ස්වර්ණාභරණ අපනයන වටිනාකම ඇමරිකානු ඩොලර් බිලියන 2.5ක් ( US $ bn ) දක්වා වැඩි කිරිම.
- 2029 වන විට අධිකාරියේ ආදායම රුපියල් බිලියන 2 (RS.Bn) දක්වා වර්ධනය කිරීම.
- හරිත, සාධාරණ හා තිරසර මැණික් පතල් කැණිමේ සහ වෙළදාම් ක්‍රමවේදය සංවර්ධනය කිරීම.
- මැණික් හා ස්වර්ණාභරණ තක්සේරු කිරීමේ හා පරීක්ෂා කිරීමේ කටයුතු (Assessing and Testing) ජාත්‍යාන්තර පිළිගැනීමක් ලබාගත හැකි තත්ත්වයට උසස් කිරීම.
- සමස්ත කාර්ය මණ්ඩලය නවීන තාක්ෂණයෙන් හා මෘදු කුසලතාවලින් සවිබල ගැන්වීම.

## ආයතනයේ ප්‍රධාන කාර්යයන්

1993 අංක 50 දරණ ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ 14 වන වගන්තිය ප්‍රකාරව අධිකාරියේ කාර්යභාරය පහත පරිදි වේ.

- සංවර්ධනය සහ ප්‍රවර්ධනය
- නියාමනය සහ බලාත්මක කිරිම
- පර්යේෂණ සහ නවෝත්පාදනය
- සමාජීය සහ පාරිසරික වගකීම
- පුහුණුව සහ හැකියාවන් සංවර්ධනය

## 32.2 ප්‍රගතිය 2025 සැප්තැම්බර් මස අවසානයට

### මූල්‍ය ප්‍රගතිය

**ලාභ ඉපයීම්**

| විස්තරය (රු.මි) | ප්‍රගතිය |
|---|---|
| ආදායම | 669.31 |
| වියදම | 558.22 |
| බදුවලට පෙර ශුද්ධ ලාභය | 111.09 |

*මූලාශ්‍රය: ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය*

**අධිකාරියේ විවිධ ආදායම් ප්‍රභවයන්**

| විස්තරය | ආදායම (රු.මි) | ප්‍රගතිය % |
|---|---|---|
| අපනයන සේවා ගාස්තු අදායම | 183.57 | 34% |
| මැණික් ගැරීම් බලපත්‍ර | 56.04 | 112% |
| වෙළඳ බලපත්‍ර | 107.37 | 114% |
| මැණික් කැපුම් බලපත්‍ර | 0.30 | 113% |
| මැණික් වෙන්දේසි බලපත්‍ර | 3.92 | 99% |
| වැටලීම් | 27.7 | 91% |
| ඉඩම් වෙන්දේසි | 0.67 | 0.2% |
| රන් ප්‍රමාණය නිශ්වය කිරීම | 13.3 | 49% |
| මැණික් රසායනාගාරය | 13.3 | 77% |
| අනෙකුත් මෙහෙයුම් ආදායම් | 36.72 | 87% |
| උපදේශන සේවා සැපයීම-දේශීය | 20.86 | 37% |
| යාන්ත්‍රික මැණික් ගැරීමේ අනුමැතිය | 140.41 | 92% |
| වෙනත් ආදායම් | 65.02 | 96% |
| ශුද්ධ මූල්‍ය ආදායම | 81.45 | 134% |
| මුළු ආදායම | 669.31 | 45% |

*මූලාශ්‍රය: ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය*

**මැණික්, ස්වර්ණාභරණ හා දියමන්ති ප්‍රතිඅපනයන ආදායම් (ඇ.ඩො.මි)**

| මුළු අපනයන (ඇ.ඩො.මි ) | ඉලක්කය | ප්‍රගතිය |
|---|---|---|
| මැණික් | 503 | 153.02 |
| ස්වර්ණාභරණ | 37.87 | 12.73 |
| දියමන්ති ප්‍රතිඅපනයන | 197.22 | 117.92 |
| රළු ආනයන ප්‍රතිඅපනයන (මැණික්) | 8.93 | 2.22 |
| රළු ආනයන ප්‍රතිඅපනයන (ස්වර්ණාභරණ) | 1.51 | 0.91 |
| දියමන්ති එබ්බවූ ස්වර්ණාභරණ | 8.26 | 1.10 |
| ගෙවුඩ/ගෙවුඩ කට්ට | 0.09 | 0.02 |
| රළු නොවන ගෙවුඩ | - | 0.02 |
| මුළු අපනයන | 756.87 | 287.9 |

*මූලාශ්‍රය: ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය*

| | ඉලක්කය | ප්‍රගතිය |
|---|---|---|
| මැණික් රසායනාගාරය (සහතිකපත් ප්‍රමාණය) | 10,305 | 6,992 |
| රන් ප්‍රමාණය නිශ්චය කිරීම (පරීක්ෂා කළ අයිතම ප්‍රමාණය) | 22,450 | 11,601 |

**විවිධ රසායනාගාර පහසුකම් සැපයීම**

*මූලාශ්‍රය: ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය*

**විවිධ බලපත්‍ර නිකුත් කිරීම්**

| බලපත්‍ර වර්ගය (නිකුත්කරණ ලද බලපත්‍ර සංඛ්‍යාව) | ඉලක්කය | ප්‍රගතිය |
|---|---|---|
| මැණික් ගැරීම් බලපත්‍ර | 5,665 | 4,245 |
| වෙළඳ බලපත්‍ර මැණික් | 5,415 | 5,322 |
| කැපුම් බලපත්‍ර මැණික් | 196 | 157 |
| වෙන්දේසි බලපත්‍ර | 1,318 | 1,294 |
| වැටලීම් (සිදුකරන ලද වැටලීම් ප්‍රමාණය) | 1,755 | 1,152 |

*මූලාශ්‍රය: ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය*

## 32.3 අනාගත සැලැසුම් - 2026

- සියලු පුද්ගලික රසායනාගාර ලියාපදිංචිය සඳහා වන පනත ක්‍රියාත්මක කර රසායනාගාර ලියාපදිංචි කර වාර්ෂික බලපත්‍රයක් ලබාදීම.
- කොළඹ ප්‍රධාන කාර්යාලීය ගොඩනැඟිල්ල ඉදිකිරීම.
- ජාත්‍යන්තර ප්‍රදර්ශන වලදී ශ්‍රී ලංකා මණ්ඩපය සංවිධානය කිරීම.
- ඉහළ අපනයන ඉලක්කයන් සපුරා ගැනීම සඳහා පවතින වෙළඳපොලවල් පුළුල් කිරීම හා නව වෙළඳපොළවල් සඳහා ප්‍රවිෂ්ඨ වීම.
- ස්වර්ණාභරණ හා රිදී නිෂ්පාදනය කරන කර්මාන්තකරුවන් නගා සිටුවීම සඳහා වැඩපිළිවෙලක් සකස් කිරීම.
- ස්වර්ණාභරණ ශිල්පීන්ට ජාත්‍යන්තර ප්‍රදර්ශන නැරඹීම සඳහා අවස්ථාව ලබාදීම.
- විදේශිකයින් සඳහා කපා ඔපදමන මැණික් වෙළඳාමට පහසුකම් සැලසීම.
- අන්තර්ජාතික වශයෙන් කර්මාන්තය දියුණු කිරීම උදෙසා Facets Sri Lanka, Gem Sri Lanka සහ Jewels ප්‍රදර්ශනයන් සඳහා අනුග්‍රාකත්වය ලබාදීම සහ ප්‍රධාන සංවිධායක ලෙස කටයුතු කිරීම.
- GEM CITY RATHNAPURA ජාත්‍යන්තර ප්‍රදර්ශනය නොකඩවා ඉදිරි වර්ෂවලත් පැවැත්වීම.
- ආයතනයේ කටයුතු සම්පූර්ණයෙන්ම ඩිජිටල්කරණය කිරීම.

# 33

# මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය (GJRTI)

## 33.1 හැඳින්වීම

මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය 1950 අංක 50 දරණ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරී පාර්ලිමේන්තු පනතේ අංක 25(I) වගන්තිය ප්‍රකාරව මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය පාලනය කිරීම, නඟා සිටුවීම සහ සංවර්ධනය කිරීම සඳහා පුහුණු හා පර්යේෂණ පහසුකම් සැලසීමේ පරමාර්ථයෙන් මෙම ආයතනය ස්ථාපනය කර ඇත.

### ආයතනය වෙත පැවරී ඇති බලතල

- ශ්‍රී ලංකාවේ මැණික් ඛණිජ පිළිබඳ සමීක්ෂණයක් කිරීම.
- පිහිටීම, හඳුනාගැනීම, මැණික් ගල් අනර්ඝීකරණය කිරීමේ ක්‍රම, වෙනත් අදාළ ක්ෂේත්‍රයන් හා අදාළ රත්න විද්‍යාත්මක පර්යේෂණ සිදු කිරීම.
- පතල් කැණීම, මැණික් කැපීම, ස්වර්ණාභරණ සෑදීම, මැණික් ගල් පිලිස්සීම සඳහා ක්‍රම සහ ස්වර්ණාභරණ තැනීම වැනි ක්ෂේත්‍රයන්හී මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය සංවිධානය කිරීම සඳහා යන්ත්‍ර සූත්‍ර නිපදවීම ඇතුළත් ශිල්පීය සහ අනෙකුත් උපදෙස් සැපයීම.

- මැණික් කැපීම, ස්වර්ණාභරණ සැදීම, දියමන්ති ඇතුළු රත්නවිද්‍යාව, ස්වර්ණාභරණ මෝස්තර සකස් කිරීම, මැණික් ගල් අනර්ගීකරණය, මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ වෙත් අදාළ අංශ පිළිබඳව පුහුණුව ලබා දීම
- වැඩමුළු, සම්මන්ත්‍රණ පැවැත්වීම සහ අදාළ මාතෘකා හා කරන ලද වැඩ කටයුතු ආදිය පිළිබඳ පත්‍රිකා හා පොත්පත් පළ කිරීම.
- ආයතනයේ කර්තව්‍යයන් නිසි ලෙස ඉටු කිරීම පහසුකිරීමට අවශ්‍ය වෙනත් දෑ කිරීම.

## 33.2 ප්‍රගතිය 2025 සැප්තැම්බර් මස අවසානයට

**<u>පර්යේෂණ අංශය</u>**

### 2.1 ශ්‍රී ලංකාවේ මැණික් නිධි ගවේෂණය හා තක්සේරුව ව්‍යාපෘතිය

- **කර්මාන්තයේ ඇති අභියෝග සහ අඩුපාඩු සඳහා ශක්‍යතා අධ්‍යයන සැපයීම හරහා ශ්‍රී ලංකාවේ මැණික් කැණීම් වැඩි කිරීම**

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය (NGJA) සමඟ සම්බන්ධීකරණය ආරම්භ කර, පවතින බලපත්‍රලාභී පතල්වල දත්ත ලබා ගත යුතු ප්‍රදේශ හඳුනාගෙන ක්‍රියාත්මක කර ඇත. දැදුරු ඔය ගංගා ද්‍රෝණියේ ක්ෂේත්‍ර චාරිකා සිදු කළ අතර භූ විදුම් සාම්පල ලබා ගැනීමට නියමිතය. විභව සිතියම් සකස් කිරීම සිදු වෙමින් පවතී.

- **ද්විතියික මැණික් නිධියක ලාක්ෂණික ගුණාංග හඳුනා ගැනීම සඳහා භූ රසායනික හා ඛනිජ විද්‍යාත්මක අධ්‍යයනය: කැලණි ගංගා ද්‍රෝණියේ අවස්ථා අධ්‍යයනයක්.**

එකතු කරන ලද සාම්පල ක්ෂුද්‍රදර්ශීය පරීක්ෂණයකට භාජනය කරන ලදී. දත්ත සැකසීම සහ අර්ථ නිරූපණය සඳහා මයික්‍රොසොෆ්ට් එක්සෙල් (Microsoft Excel) භාවිතා කරමින් ඛනිජ විද්‍යාත්මක විශ්ලේෂණයක් සිදු කරන ලදී. එකතු කරන ලද XRF දත්ත භාවිතා කරමින් හාකර් විචල්‍යතා සටහන් (Harker variation diagrams) නිර්මාණය කරන ලද අතර පැතිකඩෙහි මූලද්‍රව්‍ය ලක්ෂණ විශ්ලේෂණය කරන ලදී. භූ රසායනික දර්ශකයක් හඳුනාගෙන ඇති අතර එය ප්‍රකාශයට පත් කිරීමට නියමිතය.

### 2.2 නවීන තාක්ෂණය භාවිතයෙන් මැණික් සඳහා අගය එකතු කිරීම

#### 2.2.1 කර්මාන්තයට නව පිරියම් ක්‍රම හඳුන්වාදීම

- රතු ගෙවුඩ තාප පිරියම් කිරීම සඳහා නව ක්‍රමයක් හඳුන්වා දෙන ලද අතර එමඟින් ගෙවුඩ තුළ ඇති අන්තර්ගතයන් ඵලදායී ලෙස ඉවත් කළ හැකිය.
- නවීකරණය කරන ලද ගෑස් උදුනක් භාවිතා කර අතිරේක ඔක්සිකාරක වායුගෝලයක අධික උෂ්ණත්වයකදී දෙගුණ තාප පිරියම් කිරීම අත්හදා බැලූ අතර සාර්ථක ප්‍රතිඵල ලබාගත හැකි විය.
- Raman වර්ණාවලීක්ෂණය සහ ක්ෂුද්‍ර රූප මත පදනම්ව ගෙවුඩ තාප පිරියම් කිරීමේ ප්‍රතිඵලයේ වර්ණ පුරෝකථන ආකෘතියක් (colour prediction model) වැඩි දියුණු කර ඇත.
- සිල්කි ගෙවුඩ තාප පිරියම් කිරීමේ ක්‍රියාවලියේදී ඉල්මනයිට් වල කාර්යභාරය හඳුනාගෙන ඇත.




#### 2.2.2 මැණික් ගල් විකිරණ ප්‍රතිකාර හඳුනා ගැනීම සඳහා විශ්ලේෂණ ක්‍රම සංවර්ධනය සහ ඇගයීම

විකිරණ ප්‍රතිකාර කළ ගල් හඳුනා ගැනීමට ක්‍රමවේදයක් සොයාගැනීම සඳහා හැකි ක්‍රමයක් ලබා ගැනීම සඳහා Raman අධ්‍යයනයක් සිදු කෙරේ. ඒ අනුව විකිරණ පරීක්ෂණ සිදු කිරීමට නියමිතය.

### 2.2.3 ලා පැහැති මැණික් සඳහා සම්මත කැපුම් හඳුන්වා දීම

මෙම ව්‍යාපෘතිය යටතේ Gem Cut Studio මෘදුකාංගය භාවිතයෙන් මැණික් මුහුණු ගණන සහ කැපුම් කෝණ වෙනස් කිරීම මගින් කැපුම් ආදර්ශන නිර්මාණය කරමින් පවතී.




## 2.3 ජාත්‍යන්තර මැණික් හා ස්වර්ණාභරණ වෙළෙඳපොළක්

### 2.3.1 දේශීය හා විදේශීය වෙළඳපොළ ඉලක්ක කරගනිමින් කර්මාන්ත ගත කිරීම සඳහා ශ්‍රී ලාංකීය සංස්කෘතීන් පදනම් කරගත් ස්වර්ණාභරණ මෝස්තර ඇතුළත් ගොනුවක් නිර්මාණය කිරීම.

ගොනුව සඳහා නියැදි පිටුවක් සම්පූර්ණ කරමින් පවතී. කෞතුකාගාරයේ ඇති භාණ්ඩ නිර්මාණ වර්ග හඳුනා ගනිමින් පවතී. අදාල ගිවිසුම් අත්සන් කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී.

### 2.3.2 ස්වර්ණාභරණ නිෂ්පාදනය සඳහා නැනෝ-වර්ණ රන් මිශ්‍ර ලෝහයක් හඳුන්වා දීම

මෙම ව්‍යාපෘතිය යටතේ, රන් නැනෝ අංශු නිපදවීමට අදාළ පර්යේෂණ සිදු කරන ලද අතර රතු සහ දම් නැනෝ අංශු සාර්ථකව සකස් කරන ලදී. වැඩිදුර විද්‍යාගාර පරීක්ෂණ දැනට සිදු කෙරෙමින් පවතී.

**නැනෝ වර්ණ රන් මිශ්‍ර ලෝහ නිෂ්පාදනයේදී රසායනාගාර පරීක්ෂණ සිදුකිරීම**



## 2.4 ශ්‍රී ලංකාවේ මුතු වගාවේ විභවතාවය ගවේෂණය කිරීම

මෙම ව්‍යාපෘතිය යටතේ, විභව ස්ථාන හඳුනා ගැනීම සඳහා වයඹ දිග වෙරළබඩ ප්‍රදේශයට ක්ෂේත්‍ර චාරිකා සංවිධානය කරන ලද අතර නියැදි එකතු කිරීම සහ විශ්ලේෂණය සඳහා රසායනාගාර සේවා පිළිබඳව විමසීමට සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ (MEPA) නිලධාරීන් හමුවිය. විදෙස් ආයතන හරහා විශේෂ විශ්ලේෂණය සඳහා ජාන විශ්ලේෂණය සංවිධානය කිරීම සඳහා වයඹ විශ්ව විද්‍යාලයේ ජාන විද්‍යාඥයින් සමඟ සාකච්ඡා සංවිධානය කරන ලදී. 2025-2034 සඳහා වූ තාවකාලික ක්‍රියාකාරී සැලැස්ම සහ 2025 සැප්තැම්බර් මස දක්වා වූ ප්‍රගති වාර්තාව ඇතුළුව මණ්ඩලයක පත්‍රිකා ඉදිරිපත් කරන ලදී.

## 2.4 ජාත්‍යන්තර මට්ටමේ මැණික් පර්යේෂණාගාරය

මෙම ව්‍යාපෘතියට අදාළව, තත්ත්ව සහතික අත්පොත (Quality Manual) සහ ක්‍රියා පටිපාටි අත්පොත (Procedure Manual) සම්පාදනය කර ඇති අතර උපකරණ ප්‍රමාණ ශෝධන කිරීම් (equipment calibrations) සිදු කරමින් පවතී.

## 2.5 කර්මාන්තය සඳහා ඩිජිටල් ක්‍රමවේද හඳුන්වා දීම

### 2.5.1 මැණික් ඇගයීම සඳහා පරිගණක පාදක තාක්ෂණික ක්‍රම ස්ථාපිත කිරීම

මැණික් සඳහා මූලික වටිනාකම (benchmark values) ලබා ගැනීම සඳහා පරිගණක පාදක යෙදුමක් (computer based application) ස්ථාපිත කර ඇත. වෙබ් යෙදුමක් (web application) සංවර්ධනය කිරීම සඳහා මූලික පියවර ගෙන ඇත.

### 2.5.2 ස්වර්ණාභරණ ඇගයීම සඳහා පරිගණක පාදක තාක්ෂණික ක්‍රම ස්ථාපිත කිරීම

ස්වර්ණාභරණ සඳහා මිණුම් ලකුණු ලබා ගැනීම සඳහා පරිගණක පාදක යෙදුමක් ස්ථාපිත කර ඇත. වෙබ් යෙදුමක් සංවර්ධනය කිරීම සඳහා මූලික පියවර ගෙන ඇත.

## 2.6 තාක්ෂණ කර්මාන්ත ගත කිරීම

### 2.6.1 පර්යේෂණ සම්මන්ත්‍රණ පැවැත්වීම

GJRTI ජාත්‍යන්තර සම්මන්ත්‍රණය 2025 ඔක්තෝබර් 10 වන දින ශ්‍රී ලංකා පදනමේදී පැවැත්වීමට සංවිධානය කර ඇත. කර්මාන්තයේ ප්‍රවීණයන්ගේ සහ පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් මෙම සම්මන්ත්‍රණය 3 වන වරටත් පැවැත්වීමට නියමිතය.

### 2.6.2 ගෙවුඩ තාප පිරියම් කිරීම පිළිබඳ පොතක් ප්‍රකාශයට පත් කිරීම

ගෙවුඩ තාප පිරියම් කිරීම පිළිබඳ පොතේ පරිච්ඡේද පහක් ලිවීම සම්පූර්ණ කර ඇත. පොත සඳහා ඡායාරූප සැකසීම සිදු කරමින් පවතී.

### 2.6.3 ගෙවුඩ නිල් මැණික් හඳුනා ගැනීම, තාප පිරියම් කිරීම සහ නවීන පරීක්ෂණ ක්‍රම පිළිබඳ උසස් තාක්ෂණික වැඩමුළුව

“ගෙවුඩ නිල් මැණික් හඳුනා ගැනීම, තාප පිරියම් කිරීම සහ නවීන පරීක්ෂණ ක්‍රම පිළිබඳ උසස් තාක්ෂණික වැඩමුළුව” නමින් දින 4 ක වැඩමුළුවක් 2025.07.05, 06, 12 සහ 13 යන දිනවල කර්මාන්තකරුවන් 8 දෙනෙකුගේ සහභාගීත්වයෙන් GJRTI ප්‍රධාන කාර්යාලයේදී සාර්ථකව පවත්වන ලදී.

**ගෙවුඩ නිල් මැණික් හඳුනා ගැනීම, තාප පිරියම් කිරීම සහ නවීන පරීක්ෂණ ක්‍රම පිළිබඳ වැඩමුළුව**





### 2.6.4 ඔට්ටු සහ යං ගෙවුඩ තාප පිරියම් කිරීම පිළිබඳ වැඩමුළුව

ඔට්ටු සහ යං ගෙවුඩා තාප පිරියම් කිරීම පිළිබඳ දෙදින වැඩමුළුවක් 2025.08.12 සහ 13 යන දිනවල රත්නපුර ප්‍රාදේශීය මධ්‍යස්ථානයේදී කර්මාන්තකරුවන් 48 දෙනෙකුගේ සහභාගීත්වයෙන් සාර්ථකව පවත්වන ලදී.

### පුහුණු අංශය

පුහුණු අංශය මගින් කර්මාන්තයට අවශ්‍ය නවීන දැනුම, තාක්ෂණික දක්ෂතා සහ නිපුණතා ඇති තාක්ෂණික ශිල්පීන් හා වෘත්තියවේදීන්, ජාතික වෘත්තීය සුදුසුකම් NVQ යටතේ සහ ජාත්‍යන්තර සුදුසුකම් සහිතව බිහිකරනු ලබයි. ගෝලීය තරඟකාරී වෙළඳපොළ තුල ශ්‍රී ලංකාවට තරඟකාරී වාසියක් ලබා ගැනීම සඳහා ජාත්‍යන්තර මට්ටමේ ඉල්ලුමට ගැලපෙන පුහුණු ශිල්පීන් බිහි කිරීම සඳහා කර්මාන්තයට අවශ්‍ය තාක්ෂනික , ශිල්පීය හා කළමණාකරණ දැනුම අංශය හරහා ලබා දෙනු ලබයි . මේ යටතේ පුහුණු අංශය විසින් 2025 ක්‍රියාකාරි සැලැස්ම යටතේ පහත සඳහන් පුහුණු පාඨමාලා හා අධ්‍යාපන සංවර්ධන කාර්යයන් ක්‍රියාත්මක කිරීමට කටයුතු සැළසුම් කරනු ලැබු අතර 2025 සැප්තැම්බර් 30 වන විට අත්කර ගත් ප්‍රගතිය පහත දක්වා ඇත.

ක්‍රියාකාරි සැළසුම යටතේ සැළසුම්ගත වැඩසටහන් පහත පරිදි වේ.

### පුහුණු වැඩසටහන්

- බ්‍රිතාන්‍ය රත්න විද්‍යා සංගමයේ රත්න විද්‍යා පදනම් හා ඩිප්ලෝමා පාඨමාලා පැවැත්වීම
- පාඨමාලා ගාස්තු අයකර පාඨමාලා පැවැත්වීම
- ගාස්තු අයකිරීමකින් තොරව නොමිලයේ පාඨමාලා පැවැත්වීම
- දහතුන් වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන යටතේ පාඨමාලා පැවැත්වීම
- පෙර පුහුණු දැනුම මත ( RPL ) ජාතික වෘත්තීය සුදුසුකම් සහතික පත්‍ර නිකුත් කිරීම
- තාක්ෂණික වැඩමුළු පැවැත්වීම

**සංවර්ධන වැඩසටහන්**

- මැණික් හා ස්වර්ණාභරණ විද්‍යාවේදී උපාධි සුදුසුකම් පිරිනැම්මේ පාඨමාලාව සකස් කිරීම.
- මැණික් කැපීම සහ ඔප දැම්මේ විෂයය සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් නිපුණතා සම්මත (NVQ 5) ප්‍රමිති මට්ටම අත්කර ගැනිමට අවශ්‍ය විෂයමාලා සංවර්ධනය
- කර්මාන්තයට අදාල අධ්‍යාපන හා පුහුණු ප්‍රතිපත්තියක් හඳුන්වා දීම VET

ඉහත සැළසුම්ගත වැඩසටහන් වලට අදාලව 2025 තුන් වන කාර්තුව අවසානය වන විට අත්කර ගත් ප්‍රගතිය පහත පරිදි වේ.

**පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

**මැණික් හා ස්වර්ණාභරණ ක්ෂ්ත්‍රයේ පාඨමාලා මෙහෙයවීම**

කර්මාන්තයේ නව වෙළඳපොළ හා තාක්ෂණික අභියෝගයන්ට ගැලපෙන නවීන පුහුණු වැඩසටහන් සංවර්ධනය කිරීමේ කටයුතු TVEC ප්‍රමිති හා මාර්ගෝපදේශ අනුව ක්‍රියාත්මක කරන ලදී. මෙහි අරමුණ වන්නේ කර්මාන්තයේ නවකයින් සහ දැනට සේවයේ නිරත පුද්ගලයන් සඳහා වෘත්තීය දැනුම හා ප්‍රායෝගික හැකියාවන් වර්ධනය කිරීමය. එම මගින් දිගු හා කෙටි කාලීන පාඨමාලා සාර්ථකව ක්‍රියාත්මක කරමින් 2025 සැප්තැම්බර් 30 වන විට සිසුන් 1082 ක් බඳවාගෙන රු. මි. 33.70 ක ආදායම් වර්ධනයක් ලබා ගැනීමට කටයුතු කර ඇත.

| | | |
|---|---|---|
| මුදල් අයකර පාඨමාලා ක්‍රියාත්මක කිරීම | - | 665 |
| නොමිලයේ පාඨමාලා ක්‍රියාත්මක කිරීම | - | 211 |
| දහතුන් වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන ක්‍රියාත්මක කිරීම | - | 186 |
| ස්වර්ණාභරණ ඩිප්ලෝමා පාඨමාලාව ක්‍රියාත්මක කිරීම | - | 12 |
| GEM A රත්න විද්‍යා පදනම් පාඨමාලාව ක්‍රියාත්මක කිරීම | - | 08 |
| පෙර පුහුණුව මත සහතික පත් නිකුත් කිරීම | - | 25 |

මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයට අදාල පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කිරීම හා බෙදා හැරීමේ ක්‍රියාවලිය යටතේ වඩාත් උසස් හා ගුණාත්මක පුහුණුවක් ලබා දිම සඳහා සෙසු සංවර්ධන ක්‍රියාවලියන් ද ක්‍රියාත්මක කිරීම සඳහා අංශය කටයුතු කර ඇත.

**රත්න විද්‍යාව විෂයයට අදාලව ජාත්‍යන්තර පාඨමාලා ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිතනනය යටතේ රත්නවිද්‍යා පදනම් හා ඩිප්ලෝමා පාඨමාලා ක්‍රියාත්මක කිරීම.**

මහා බ්‍රිතාන්‍ය රත්න විද්‍යා සංගමයේ සාමාජිකත්වය ලබා ගනිමින් ජාත්‍යන්තර ප්‍රතිතනනය යටතේ අංශය විසින් රත්න විද්‍යා පදනම් සහ ඩිප්ලෝමා පාඨමාලා ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත. මේ යටතේ අංශය විසින් පාඨමාලා මාතෘකා සංවර්ධනය , උසස් උපකරණ හා පරික්ෂණාගාර පහසුකම් නවීකරණය , උසස් මට්ටමේ අධ්‍යාපන හා පුහුණු කාර්ය මණ්ඩලය පිහිටුවීම , යනාදි කාර්යයන් සිදු කර ඇත. GEM – A පදනම් පාඨමාලාව ආරම්භ කර අවසන් කර ඇති අතර GEM A ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සඳහා සිසුන් 08 ක් ලියාපදිංචි වී ඇති අතර පාඨමාලාව 2025 ඔක්තෝබර් මස දි ආරම්භ කිරීමට සැළසුම් කර ඇත.

**පෙර පුහුණු දැනුම මත ක්ෂ්ත්‍රයේ නිරත වන්නන් සඳහා NVQ සහතික පත්‍ර පිරිනැම්මේ ක්‍රියාවලිය පවත්වා ගෙන යාම**

මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ විධිමත් දැනුමක් සහිත වුවත් එය සනාථ කර ගැනිමට වෘත්තීය සුදුසුකම් නොමැති පිරිස හඳුනා ගනිමින් ඔවුන් සඳහා මෙම කර්මාන්තයේ NVQ 3 / 4 ට අදාල සුදුසුකම් ලබා දිමේ වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබන අතර මේ වන විට පුද්ගලයින් 25 ක් සඳහා පෙර පුහුණු දැනුම මත NVQ සුදුසුකම් තත්ත්වය පිරිනැම්මට අංශය කටයුතු කර ඇත.

**ස්වර්ණාභරණ ක්ෂ්ත්‍රයේ තෝරා ගත් විෂයය ක්ෂ්ත්‍රයන් වෙනුවෙන් (ස්වර්ණාභරණ තක්සේරුකිරීම හා මුද්‍රා තැබීම) තාක්ෂණික වැඩමුළු ක්‍රියාත්මක කිරීම.**

ස්වර්ණාභරණ කර්මාන්තය රටේ විදේශ විනිමය ඉපැයීම හා නිර්මාණාත්මක කාර්මික වටිනාකමක් ඇති විශේෂිත ක්ෂේත්‍රයක් වන බැවින්, එය තවත් සංවර්ධනයකට පත් කිරීම අත්‍යවශ්‍ය වේ. ඒ අනුව, අංශය විසින් ස්වර්ණාභරණ තක්සේරුකිරීම හා මුද්‍රා තැබීම පිළිබඳ තාක්ෂණික වැඩමුළු ක්‍රියාත්මක කිරීම, කර්මාන්තයේ ගුණාත්මකත්වය හා විශ්වාසනීයභාවය වැඩිදියුණු කිරීමට විශාල දායකත්වයක් ලබා දේ. මෙම තාක්ෂණික වැඩමුළු ක්‍රියාත්මක කිරීම, ශ්‍රී ලංකාවේ ස්වර්ණාභරණ කර්මාන්තය තවත් ගුණාත්මක, විද්‍යාත්මක හා ජාත්‍යන්තර මට්ටමේ විශ්වාසනීය ක්ෂේත්‍රයක් බවට පත් කිරීමට ඉතා වැදගත් පියවරකි. ඒ අනුව මේ වන විට අංශය විසින් තාක්ෂණික වැඩමුළු දෙකක් පැවැත්වීමට කටයුතු කර ඇති අතර ඉන් එක් වැඩමුළුවක් 2025 ඔක්තෝබර් මස අලියාන්ස් මුලා ආයතනය කේන්ද්‍ර කර ගනිමින් පැවැත්වීමට සැළසුම් කර ඇත.

**මහනුවර ප්‍රාදේශිය මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම**

මහනුවර ප්‍රාදේශිය මධ්‍යස්ථානය හරහා ක්‍රියාත්මක කරනු ලබන පුහුණු පාඨමාලා සංඛ්‍යාව හා ප්‍රමාණය වඩාත් පුළුල් කරමින් ප්‍රදේශය තුල මෙම කර්මාන්තයේ වර්ධනයක් ඇති කිරීම සඳහා මහනුවර මධ්‍යස්ථානය වඩාත් ඉඩකඩ සහිත සංවර්ධිත යටිතල හා පුහුණු පහසුකම් වලින් පිරි නව ගොඩනැගිල්ලක් වෙත රැගෙන යාමට අවශ්‍ය මූලික කටයුතු ඉටු කර ඇත.

**නව මධ්‍යස්ථාන ව්‍යාප්ත කරමින් බේරුවල නව මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමට කටයුතු කිරීම**

අධ්‍යාපන අමාත්‍යාංශය , බේරුවල අල් හුමයිස්රා මධ්‍ය විද්‍යාලය , බේරුවල මැණික් හා ස්වර්ණාභරණ වෙළඳුන්ගේ සංගමය හා අපි ආයතනය ඒකාබද්ධතාවයෙන් බේරුවල අල් හුමයිස්රා මධ්‍ය විද්‍යාලය තුල අපි ආයතනයේ රත්න විද්‍යා පුහුණු මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමට අදාල මූලික කටයුතු ක්‍රියාත්මක කර ඇත. මේ යටතේ අදාල පාර්ශව විසින් එළඹීමට නියමිත එකගතා ගිවිසුම් සකස් කර පාර්ශවයන් වෙත යොමු කර ඇති අතර එකගතාවය ලද පසුව මධ්‍යස්ථානය ආරම්භ කිරීමේ හැකියාව පවති.

**ගුණාත්මක පුහුණු අධ්‍යාපනයක් සුරක්ෂිත කිරීම සඳහා නව තාක්ෂණය සමග සම්බන්ධ වීම**

මෙම ක්ෂ්ත්‍රෙය් පුහුණු හා අධ්‍යාපනය ගුණාත්මක හා ප්‍රමාණාත්මක අයුරින් වර්ධනය කර සංවර්ධනය කිරීම සඳහා හා වඩාත් නිරවද්‍යතාවයෙන් , කාර්යක්ෂම හා ඵලදායිතාවයෙන් පුහුණු කටයුතු හා ශිෂ්‍ය කළමණාකරණ කටයුතු සිදු කිරීම සඳහා ඉගෙනුම් කළමණාකරණ ක්‍රමවේදයක් Learning Management System හා Management Information System හඳුන්වා දීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවති.

**සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

**මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයට අදාලව විද්‍යාවේදි උපාධි සුදුසුකම් පිරිනැමීමේ පාඨමාලාව සකස් කිරීම**

ශ්‍රී ලංකාවේ මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ ගුණාත්මක මට්ටම ඉහළ නැංවීමේ අරමුණින්, විද්‍යා උපාධි සුදුසුකම් ලබාදීම සඳහා විශේෂ උපාධි පාඨමාලාවක් සංවර්ධනය කිරීම ආරම්භ කර ඇත. මෙම උපාධි පාඨමාලාව විද්‍යාත්මක මූලධර්ම සහ නව තාක්ෂණික දැනුම මත පදනම්ව, තාකෂණික හා නිර්මාණාත්මක ක්ෂේත්‍ර දෙකම තවත් සවිමත් කිරීමට උදව් කරනු ඇත. එම අරමුණ සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, ඌව වෙල්ලස්ස, සබරගමුව, මොරටුව විශ්වවිද්‍යාල සහ ආයතනය එක්ව උපාධි පාඨමාලාව සකස් කිරීමේ කටයුතු දැනට ක්‍රියාත්මක කර ඇත. සකස් කළ මූලික විෂයමාලා සැලැස්ම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමට නියමිතය.

මැණික් කැපීම හා ඔපදැම්ම විෂයය සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් සම්මත NVQ 5 ලබා ගැනිම අවශ්‍ය විෂයමාලා සංවර්ධනය

මැණික් කැපීම සහ ඔප දැම්ම විෂයය ක්ෂ්ත්‍රය සඳහා මේ වන විට පවතිනුයේ ජාතික වෘත්තීය සුදුසුකම් නිපුණතා මට්ටම NVQ 3 හා 4 පමණකි. නමුත් මෙම විෂයය සඳහා ද ඩිප්ලෝමා සුදුසුකම NVQ 5 සකස් කිරීමට අදාල කටයුතු අංශයේ මූලිකත්වයෙන් ආරම්භ කර ඇත. ඒ අනුව ලංකාවේ තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිසන් සභාව ( TVEC ) හා ජාතිත ආධුනිකත්ව හා පුහුණු කිරීමේ අධිකාරිය (NAITA) සහයෝගිතාවයෙන් ඒ ඒ පාර්ශවයන් හරහා සිදු කර ගත යුතු කාර්යය සැළසුම් කර ගැනිමින් මෙම කාර්යය 2025 වසරේ සැප්තැම්බර් මස සිට ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විට ආරම්භ කර ඇත.

**කර්මාන්තයට අදාල අධ්‍යාපන හා පුහුණු ප්‍රතිපත්තියක් හඳුන්වා දීම VET**

තෘතිය හා වෘත්තීය අධ්‍යාපන කොමිසන් සභාව TVEC සමග ඒකාබද්ධතාවයෙන් මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය කේන්ද්‍රකර ගත් වෘත්තිය අධ්‍යාපන ගුණාත්මකතාවය රැකගැනිමේ පුහුණු සැලැස්මක් සකස් කිරීම සඳහා අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇත.

## 33.3 අනාගත සැලසුම් - 2026

- ගංගා ද්‍රෝණි ආශ්‍රිතව මැණික් විභවය පිළිබඳ විද්‍යාත්මක අධ්‍යනයක් සිදු කිරීම.
- ද්වීතික මැණික් නිධි වල විභවතා ආදර්ශනය කිරීම සඳහා භූ රසායන විද්‍යාත්මක ත්‍රිමාණ මොඩලයක් සංවර්ධනය කිරීම.
- රළු මැණික් සඳහා අවශ්‍ය නව පිරියම් ක්‍රම සංවර්ධනය කිරීම.
- විකිරණ පිරියම් කරන ලද මැණික් හඳුනාගැනීමට විශ්ලේෂණ ක්‍රමවේද හඳුනා ගැනීම.
- ශ්‍රී ලාංකීය සංස්කෘතීන් පදනම් කර ගත් ස්වර්ණාභරණ මෝස්තර ඇතුලත් ගොනුවක් ප්‍රකාශයට පත්කිරීම.
- ශ්‍රී ලංකාවේ මුතු වගාව පිළිබඳ ශක්‍යතා අධ්‍යනයක් සිදු කිරීම.
- ජාත්‍යන්තර මට්ටමේ පර්යේෂණ විද්‍යාගාරයක් පිහිටුවීම.
- මැණික් හා ස්වර්ණාභරණ තක්සේරු කිරීම සඳහා අන්තර්ජාල යෙදුම් සංවර්ධනය කිරීම.
- වාර්ෂිකව මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂ හා අභ්‍යාස ආයතනයේ ජාත්‍යන්තර පර්යේෂණ සම්මන්ත්‍රණය පැවැත්වීම.
- ග්‍රන්ථය ප්‍රකාශයට පත් කිරීම.
- පුහුණු හා අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
  - මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයට අදාල පුහුණු පාඨමාලා මධ්‍යස්ථාන 15 ක් හරහා ක්‍රියාත්මක කිරීම
  - තාක්ෂණික වැඩමුළු , වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
  - පුහුණු ලාභින් සඳහා සහතිකපත් ප්‍රදානෝත්සවයක් ක්‍රියාත්මක කිරීම
  - පුහුණු ලාභින් 1500 ක ප්‍රමාණයක් නිපුණ , තාක්ෂණික හා ව්‍යාවසායකයින් ලෙස කර්මාන්තයට හඳුන්වා දි රැකියාගත කිරීම.
  - මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයට අවශ්‍ය අගය වැඩිදියුණු කිරීමේ ක්ෂ්ත්‍ර හඳුන්වා දීම
  - පාඨමාලා ප්‍රවර්ධනය සඳහා දැනුවත් කිරීම් හා ප්‍රචාරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

- විෂයමාලා සංවර්ධනය
  - මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය විද්‍යාවේදි උපාධිය සකස් කිරිමේ කටයුතු අවසන් කර උපාධිය සඳහා සිසුන් බඳවා ගැනීමට කටයුතු කිරීම.
  - මැණික් කැපීම හා ඔපදැමීම විෂයය සඳහා ජාතික වෘත්තිය නිපුණතා NVQ 5 මට්ටම (ඩිප්ලෝමා) සඳහා විෂයය නිර්දේශ සකස් කිරීම
- පුහුණු යටිතල හා තාක්ෂණික පහසුකම් සංවර්ධනය
  - පාඨමාලා ව්‍යාප්ත කිරීම සඳහා අවම වශයෙන් නව පුහුණු මධ්‍යස්ථාන දෙකක් ආරම්භ කිරීම
  - නවීන තාක්ෂණය සහිත පුහුණු ඒකක නිර්මාණය කිරීම
  - අගය වැඩි දියුණු කිරීමේ වැඩසටහන් සඳහා අවශ්‍ය නවීන තාක්ෂණික පහසුකම් සැපයිමට කටයුතු කිරීම

# 34

# සීමාසහිත ලංකා සීනි පුද්ගලික සමාගම

## 34.1 හැඳින්වීම

ලංකා සීනි සමාගම කර්මාන්ත හා ව්‍යවසායකත්ව අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ක්‍රියාත්මක වන පූර්ණ රජය සතු සමාගමක් වන අතර එය දුඹුරු සීනි, එතනෝල් සහ අනෙකුත් අතුරු නිෂ්පාදන නිෂ්පාදනය කරන මෙරට විශාලතම කෘෂිකර්මය පදනම් කරගත් නිෂ්පාදන සමාගමකි.

2011 අංක 43 දරන ඌන ක්‍රියාකාරී ව්‍යවසාය හෝ ඌන උපයෝගිතා වත්කම් පුනර්ජීවනය කිරීමේ පනත යටතේ එතෙක් පුද්ගලික හිමිකාරිත්වය යටතේ පැවති පැල්වත්ත සහ සෙවණගල සීනි කර්මාන්ත ශාලා රජයට පවරා ගන්නා ලදී. 2012 පටන් පැල්වත්ත සහ සෙවනගල කර්මාන්තශාලා, සීමාසහිත ලංකා සීනි පුද්ගලික සමාගම යටතේ ක්‍රියාත්මක වේ.

සමාගම පිටස්තර වගාකරුවන්ගෙන් සහ තමන්ගේම වතුවලින් උක් සපයා ගනී. දැනට සමාගමේ ගොවීන් 10,000 ක් සහ සේවකයින් 5,367 ක් පමණ සිටිති.

## 34.2 2025 සැප්තැම්බර් මස අවසානයට

**නිෂ්පාදන කාර්ය සාධනය (2025.09.30 වන දින දක්වා)**

| විස්තරය | ඒකකය | අයවැයගත | සත්‍ය | වෙනස |
|---|---|---|---|---|
| උක් නිෂ්පාදනය | මෙ.ටො. | 677,873 | 510,691 | (167,182) |
| සීනි නිෂ්පාදනය | මෙ.ටො. | 49,543 | 30,011 | (19,532) |
| සීනි උකහා ගැනීමේ ප්‍රතිශතය | % | 7.3 | 5.9 | 1.4 |
| මොලැසස් නිෂ්පාදනය | මෙ.ටො. | 32,781 | 17,517 | (15,264) |
| ENA නිෂ්පාදනය | ලීටර | 9,186,125 | 6,030,657 | (3,155,468) |

*මූලාශ්‍රය: සීමාසහිත ලංකා සීනි පුද්ගලික සමාගම*

**මූල්‍ය කාර්ය සාධනය (2025.09.30 වන දිනට)**

| විස්තරය | ඒකකය | අයවැයගත | සත්‍ය | වෙනස |
|---|---|---|---|---|
| **ආදායම** | රු. | **20,044,399,067** | **7,687,279,298** | **(12,357,119,769)** |
| විකුණුම් පිරිවැය | රු. | (15,253,924,538) | (8,016,585,069) | 7,237,339,469 |
| **දළ ලාභය** | රු. | **4,790,474,529** | **(329,305,771)** | **(5,119,780,300)** |
| අනෙකුත් ආදායම් ලාභ | රු. | 65,861,890 | 297,283,049 | 231,421,159 |
| මූල්‍ය ආදායම | රු. | 249,197,450 | 147,320,934 | (101,876,516) |
| පරිපාලන වියදම් | රු. | (2,417,139,690) | (1,813,675,566) | 603,464,124 |
| මූල්‍ය පිරිවැය | රු. | (186,427,473) | (250,776,115) | (64,348,642) |
| **ශුද්ධ ලාභය (බදු වලට පෙර)** | රු. | **2,501,966,706** | **(1,949,153,469)** | **(4,451,120,175)** |

*මූලාශ්‍රය: සීමාසහිත ලංකා සීනි පුද්ගලික සමාගම*

## 34.3 අනාගත සැලැසුම් - 2026

ලංකා සීනි සමාගමේ (පුද්ගලික) සමාගමේ උපායමාර්ගික සැලැස්මට අනුකූලව, සමාගම 2026 දී කාර්යක්ෂමතාව වැඩි කිරීම සහ තිරසාර වර්ධනය කෙරෙහි අවධානය යොමු කරනු ඇත.

2026 වන විට සමාගම පහත නිෂ්පාදන ඉලක්ක සපුරා ගැනීමට අපේක්ෂා කරයි.

| විස්තරය | ඒකකය | 2026 |
|---|---|---|
| **උක් නිෂ්පාදනය** | Mt | 645,668 |
| **සීනි උකහා ගැනීමේ ප්‍රතිශතය** | % | 6.96% |
| **සීනි නිෂ්පාදනය** | Mt | 44,920 |
| **මොලැසස් උකහා ගැනීමේ ප්‍රතිශතය** | % | 4.89% |
| **මොලැසස් නිෂ්පාදනය** | Mt | 31,595 |
| **මොලැසස් භාවිතය** | Mt | 40,661 |
| **ENA නිෂ්පාදනය** | Ltrs | 10,752,231 |
| **ENA උකහා ගැනීමේ අගය** | Ltrs | 264 |

*මූලාශ්‍රය: සීමාසහිත ලංකා සීනි පුද්ගලික සමාගම*

### 2026 වර්ෂය සඳහා ප්‍රධාන සැලැස්ම

- සීනි සඳහා විකුණුම්, අලෙවිකරණ සහ බෙදා හැරීමේ ආකෘතියක් හඳුන්වා දීම.
- ENA නිෂ්පාදනය වැඩි කිරීම
- ගොවීන් විසින් නියමිත වේලාවට නැවුම් උක් මිලදී ගැනීමෙන් RCS 6.9% ට වඩා පවත්වා ගැනීම.
- නියාමන අවශ්‍යතා කළමනාකරණය කිරීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් අපජල පිරිපහදු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම.
- කාබන් තීරු සමඟ එතනෝල් ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සහ ආසවනාගාරවල අනෙකුත් වැඩිදියුණු කිරීම.
- උක් ඇඹරුම් මඩ සහ ආසවනාගාර අපද්‍රව්‍ය භාවිතා කරමින් ජෛව පොහොර කම්හල ක්‍රියාත්මක කිරීම
- පුනර්ජනනීය බලශක්ති භාවිතය වැඩි දියුණු කිරීම සඳහා සෙවනගල 1 MW සූර්ය බලශක්ති පද්ධතියක් ක්‍රියාත්මක කිරීම.

# 35

# කන්තලේ සීනි සමාගම (KSCL)

## 35.1 හැඳින්වීම

- 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ කන්තලේ සීනිපුර කොට්ඨාශයේ කන්තලේ සීනි සංස්ථාව නමින් සීනි කර්මාන්ත ශාලාවක් 1957 දී ස්ථාපිත කරන ලදී.

- ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය නමින් ව්‍යාපාරික කටයුතු පවත්වා ගෙන ගිය මෙය එවකට පැවැති රජය විසින් ගනු ලැබූ තීරණයක් අනුව 1989 වර්ෂයේදී 1987 අංක 23 දරණ පොදු සමාගම් පනතින් රාජ්‍ය සමාගමක් ලෙසට පරිවර්තනය කරන ලදි. එතැන් සිට ශ්‍රී ලංකා සීනි සමාගම යනුවෙන් ව්‍යාපාරික කටයුතු පවත්වා ගෙන යාම සිදු විය.

- 1990 දී කැබිනට් මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයකට අනුව, ශ්‍රී ලංකා සීනි සමාගම සතු කර්මාන්තශාලා තුන ස්වාධීන ආයතන තුනක් බවට පරිවර්තනය කරන ලද අතර, එම ස්වාධීන ආයතන තුන සඳහා අධ්‍යක්ෂ මණ්ඩල තුනක් පත් කරන ලද අතර, ශ්‍රී ලංකා සීනි සමාගමේ සියලු වත්කම් පිළිවෙලින් කන්තලේ සීනි කර්මාන්තශාලා සමාගම, හිඟුරාන සීනි කර්මාන්තශාලා සමාගම සහ සෙවනගල සීනි කර්මාන්තශාලාව යන නම් යටතේ ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා ආයතන තුනට පවරා දෙන ලද අතර, ශ්‍රී ලංකා සීනි සමාගම ඈවර කරන ලදී.

- 1994 වර්ෂයේ දී කන්තලේ සිනි කර්මාන්ත ආයතනය වසා දැමීම හා සේවක පිරිස 231 දක්වා අඩු වීම නිසා එහි ඇති නිවාස හා සම්පත් ආරක්ෂා කිරීමට කලාප හතරෙහි සේවක පිරිස යෙදවීමටත් යාය 24 පොලිස් මුරපොලක් ස්ථාපනය කිරීමත් කරන ලදි. පසුව 1997 වසරේ ජනවාරි 28 දින ගැසට් පත්‍රයක් මගින් මෙම ආයතනය සම්පූර්ණයෙන්ම රජයට පවරා ගන්නා ලදි.

- ආයතනය සතු සම්පූර්ණ ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 8696 ක් වන අතර උක් වගාව සඳහා හෙක්ටයාර් 4887ක් සංවර්ධනය කර ඇත. හෙක්ටයාර් 2650 කැළෑවෙන් ද ඉතිරි හෙක්ටයාර් 1159 නිවාස, ඇලමාර්ග, පාරවල් හා දියබස්නා ඇලවල් වලට අයත්වේ.

- මෙම කර්මාන්තශාලාවේ දිනකට උක් ගස් මෙට්‍රික් ටොන් 1200 ඇඹරිමේ ධාරිතාවක් ඇති අතර ඇඹරුම් වාරයේ දින 160 තුල උක් ගස් මෙට්‍රික් ටොන් 192000 ඇඹරීමෙන් වාර්ෂිකව සිනි මෙට්‍රික් ටොන් 16320( උකහා ගැනීම 8.5%) නිෂ්පාදනය කර ගත හැකිය. තවද ස්කාගාරයෙන් දිනකට මොලෑසස් මෙට්‍රික් ටොන් 30ක් හා වාර්ෂිකව මෙට්‍රින් ටොන් 9000 නිෂ්පාදනය කල හැක.

- විවිධ හේතු මත සේවක පිරිස තවදුරටත් අඩු වීම හා ප්‍රවාහන පහසුකම් නොමැති වීමත් වල් අලි ආරක්ෂක තාප්ප කඩා දැමීමත් නිසා වර්තමානයේ ගැටළුකාරි තත්වයක් උද්ගතව ඇත. උක් වගා කිරීම සඳහා 647 දෙනෙකුට ලබාදුන් ඉඩම් වී ගොවිතැන් කිරීම හා බලපත්‍ර ගෙන මැණික් ගැරීම ආදි කටයුතු වල යෙදී ඇත.

- දැනට මෙම කර්මාන්තශාලාවට අයත් ඉඩම්, ඉඩම් කොමසාරිස් ජෙනරාල් වෙත පවරා ත්‍රිකුණාමලය මහ දිසාපතිතුමා භාරයේ කන්තලේ සහකාර ඉඩම් කොමසාරිස් යටතේ ගොවිතැන් කටයුතු සඳහා ජනතාවට බෙදා දී ඇත.

# 36

# ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම

## 36.1 හැඳින්වීම

ගල්ඔය වැවිලි සමාගම යනු හිඟුරාන සීනි කර්මාන්තය පුනර්ජීවනය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය සහ පෞද්ගලික අංශය අතර හවුල් ව්‍යාපාරයක් ලෙස පිහිටුවන ලද සමාගමක් වන අතර එහි අයිතියෙන් 51% ක් ශ්‍රී ලංකා රජය සතුව හා 49% ක හිමිකාරීත්වය බ්‍රවුන් සහ සමාගම හා LOLC හෝල්ඩිංස් සමාගම සතු වේ. ගල්ඔය වැවිලි සමාගමේ කළමනාකාරීත්වය ගිවිසුමක් යටතේ පෞද්ගලික අංශය වෙත ලබා දී ඇත.

වර්තමානය වන විට සාර්ථක ලෙස ක්‍රියාත්මක වෙමින් පවතින ගල්ඔය වැවිලි සමාගම මගින් සෘජු සේවකයන් 1,250 ක් පමණ ප්‍රමාණයකට රැකිය ලබා දෙමින් හෙක්ටයාර 7,766 ක කෘෂි ඉඩම්වල ගොවීන් 8,403 ක් සම්බන්ධ කර ගනිමින් උක් භෝග වගාවේ නිරත වන අතර 60,000කට අධික පිරිසක් මෙම ව්‍යාපෘතියෙන් වක්‍ර රැකියා අවස්ථා ලබා ගෙන ඇත. ගල්ඔය වැවිලි කර්මාන්තායතනය පුනර්ජීවනය කර දහස් ගණනකට රැකියා උත්පාදනය කර දීම පමණක් නොව එය ලාභදායී ආයතනයක් බවට පත් කර ගැනීමට හැකි විය. නවීන යන්ත්‍රෝපකරණ සහ නිසි කෘෂිකාර්මික ක්‍රමවේදයන් භාවිතයෙන් ඵලදායිතාව ඉහළ නංවා ගැනීම ද සිදු කර ඇත. මෙම කර්මාන්තායතනයේ සීනි නිෂ්පාදනයට අමතරව එහි අතුරු නිෂ්පාදනයන් ලෙස ENA, කාබනික පොහොර නිෂ්පාදනය, විදුලිය උත්පාදනය හා කාබන්ඩයොක්සයිඩ් (CO2) නිෂ්පාදනය කිරීම සිදු කර ගෙන යනු ලබයි.

ශ්‍රී ලංකාවේ විශාලතම කාබනික පොහොර අංගනය ද ගල්ඔය වැවිලි සමාගම සතු වේ. ගල්ඔය වැවිලි සමාගම මගින් සිදු කිරීමට නියමිත වූ ව්‍යාපෘති අතරින් සීනි කර්මාන්තශාලා විස්තාරණය කිරීමේ ව්‍යාපෘතිය, සූර්ය බලශක්ති ව්‍යාපෘතිය මෙන්ම කාබන්ඩයොක්සයිඩ් නිෂ්පාදන ව්‍යාපෘතිය මේ වන විට අවසන් කර ඒවායේ මෙහෙයුම් කටයුතු ඉතාමත් සාර්ථක ලෙස සිදු කරගෙන යනු ලබයි.

දිගාමඩුල්ලෙහි ආර්ථිකය වඩාත් ශක්තිමත් කිරීමට පවතින ආයතනය අතුරින් ගල්ඔය වැවිලි සමාගම ප්‍රධාන දායකත්වයක් ගෙන කටයුතු සිදු කර ගෙන යනු ලබයි. ඉඩම් පරිහරණය, වගාව සහ එහි සේවා, නිෂ්පාදන මෙහෙයුම්, රැකියා අවස්ථා, මූල්‍ය අංශය මෙන්ම පොදු පරිපාලන කටයුතු ආදී සියලු ක්ෂේත්‍රවල කාර්යක්ෂමතාව ඉහළ නංවමින් අගය එකතු කළ නිෂ්පාදනයන් සඳහා පවතින සියලු සම්පත් ප්‍රයෝජනයට ගැනීමට ගල්ඔය වැවිලි කළමනාකාරිත්වය පුළුල් දැක්මකින් ක්‍රියා කරණු ලබයි. සාධක සීමා නොකර, කළමනාකරණය විසින් ශ්‍රී ලාංකීය කර්මාන්තයට ආදර්ශයක් ලෙස 360˚ ක විවිධාංගීකරණය වූ පරිසර හිතකාමී කර්මාන්තයක් ලෙස ගල්ඔය වැවිලි සමාගම පත් කිරීම සඳහා නිෂ්පාදනයන් වැඩිදියුණු කිරීම දැනටමත් ආරම්භ කර ඇත.




## 36.2 ප්‍රගතිය 2025 සැප්තැම්බර් මස අවසානයට

ගල්ඔය වැවිලි (පුද්) සමාගම 2025 ජනවාරියේ සිට සැප්තැම්බර් (මාස 9) කාලය සඳහා ප්‍රගතිය පහත පෙන්නුම් කර ඇත. පෙන්වා දී ඇති දත්ත අනුව උක් වගා ප්‍රදේශ, උක් ගොවීන් සංඛ්‍යාව, සීනි, ENA, කාබනික කොම්පෝස්ට් හා කාබන්ඩයොක්සයිඩ් (CO2) නිෂ්පාදනය් සහ බලශක්ති උත්පාදනයන් පිලිබඳ විස්තර පහත දක්වා ඇත.

**මූලික කාර්ය සාධනය**

| විස්තරය | ප්‍රමාණය |
|---|---|
| වගා වපසරිය (හෙක්ටයාර) | 11,005 |
| ගොවීන් සංඛ්‍යාව | 11,613 |
| උක් දඬු සැපයුම (ඇඹරීම සඳහා) (මෙ.ටො.) | 348,847 |
| සීනි නිෂ්පාදනය (මෙ.ටො.) | 20,819 |
| සීනි උකහා ගැනීමේ ප්‍රතිශතය (%) | 6.15 |
| ENA නිෂ්පාදනය (ලීටර්) | 3,206,427 |
| කොම්පෝස්ට් නිෂ්පාදනය (මෙ.ටො.) | 4,503 |
| බලශක්ති උත්පාදනය (මෙ.වො.පැ) | 26,695 |
| සූර්ය බලශක්ති උත්පාදනය (මෙ.වො.පැ.) | 2,144 |
| ජීව වායු නිෂ්පාදන (කි.ග්‍රෑ.) | 624,841 |

*මූලාශ්‍රය : **ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම***

ශ්‍රී ලංකාවේ සීනි කර්මාන්තය වර්තමානයේ එහි පැවැත්මට තර්ජනයක් වන දැඩි මූල්‍ය අභියෝගවලට මුහුණ දී සිටී. මෑතක දී සීනි හා ENA වෙළඳපොල මිල පහත වැටීම හේතුවෙන් උක් කර්මාන්තය බරපතල මූල්‍ය අර්බුදයකට ලක්ව ඇත. ඉහළ නිෂ්පාදන පිරිවැය සහ අඩු වෙළඳපොල ප්‍රතිලාභ හේතුවෙන් කර්මාන්තයේ මූල්‍ය ස්ථාවරයට දැවැන්ත පීඩනයක් එල්ල වී ඇත.

සීනි සහ ENA මිල පහත වැටුණ ද කර්මාන්තයේ නියැලී සිටින ගොවීන් සඳහා උක් ටොන් එකක් සඳහා ගෙවන මිල අඩු කිරීම කළ නොහැකි අතර, එම මූල්‍යමය වෙනස

මෙම සීනි නිෂ්පාදන ආයතන විසින් දරාගැනීම මිස වෙනත් විකල්පයක් නොමැත. තවද, නිෂ්පාදන පිරිවැය හා විදේශ විනිමය අනුපාතයේ අසමතුලිතතාව සීනි කර්මාන්තායතනවලට දරා ගැනීමට සිදුව ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස මෙම ආයතනවල මූල්‍ය අර්බුදය තව තවත් උත්සන්න වී ඇත.

මේ සඳහා රජය සෘජුවම මැදිහත් වී කඩිනමින් ක්‍රියාමාර්ග නොගතහොත් සීනි නිෂ්පාදන කර්මාන්තයේ අනාගතය ඉතා අවිනිශ්චිත විය හැකිය. එමගින් දේශීයව සිදු කරන නිෂ්පාදනය රටට අහිමි වනවා මෙන්ම උක් ගොවියා ඇතුළු මෙම දේශීය කර්මාන්තය වටා බිහිව ඇති 60,000 කට අධික සෘජු හා වක්‍ර රැකියා විශාල ප්‍රමාණයක් අස්ථාවර වනු ඇත.

**සටහන :**

ඉහත සියළුම දත්තයන් 2025.01.01 දින සිට 2025.09.30 දක්වා වේ.

අපගේ මූල්‍ය වර්ෂය 2025.04.01 වන දින සිට 2026.03.31 දක්වා වන බැවින් පහත මූල්‍ය අංශයේ දත්තයන් 2025.04.01 – 2025.09.30 කාලපරිච්ඡේදයට අනුව ඉදිරිපත් කර ඇත.

**මූල්‍ය අංශය**

**ව්‍යවස්ථාපිත ගෙවීම් තත්ත්වය**

| විස්තරය | ගෙවා ඇති අගය (රු.) |
|---|---|
| සමාජ ආරක්ෂණ දායකත්ව බදු | 56,338,946 |
| මොලැසස් පරිභෝජනය සඳහා සුරාබදු බදු | 70,318,182 |
| සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සඳහා | 41,688,566 |
| මුද්දර ගාස්තු | 98,100 |

*මූලාශ්‍රය : **ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම***

**මූල්‍ය ප්‍රගතිය**

| විස්තරය | 2025/26 (මාස 09 සඳහා වටිනාකම (රු.මි.) |
|---|---|
| ආදායම | 3,459.68 |
| දළ ලාභය | 1,014.92 |
| පොලිය, බදු, ක්ෂයවීම් හා ක්‍රමක්ෂය වලට පෙර ඉපැයීම් | 707.19 |
| මෙහෙයුම් ලාභය | 20.64 |
| ශුද්ධ මූල්‍ය පිරිවැය | 1832.40 |
| ශුද්ධ ලාභ/අලාභ | (1,811.76) |
| මුළු වත්කම | 35,295.02 |
| රඳවා ගත් ඉපයුම | (1,984.07) |
| මුළු කොටස් ප්‍රාග්ධනය | 4,416.12 |

*මූලාශ්‍රය : **ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම***

## 36.3 අනාගත සැලැසුම් - 2026

- මේ වන විට මත්පැන් බෝතල් කිරීමේ කර්මාන්තශාලාව ආරම්භ කිරීමේ මූලික කාර්යයන් සිදු වෙමින් පවතී.
- මෙහි නිෂ්පාදන කටයුතු 2026 වර්ෂයේදී ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.

# 37

# උක් පර්යේෂණ ආයතනය (SCRI)

## 37.1 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ උක් කර්මාන්තයේ ඵලදායිතාව, ලාභදායිත්වය සහ තිරසාරභාවය ඉහළ නැංවීම මඟින් එහි තරඟකාරිත්වය ශක්තිමත් කිරීමේ අරමුණින් උක් පර්යේෂණ ආයතනයේ පර්යේෂණ වැඩසටහන ප්‍රධාන අංශ අටක් යටතේ ක්‍රියාත්මක කරන ලදී.

- බෝග වැඩිදියුණු කිරීම
- බෝග සහ සම්පත් කළමනාකරණය
- බෝග පෝෂණය
- බෝග ආරක්ෂණය
- සැකසීම සහ නිෂ්පාදන සංවර්ධනය
- යාන්ත්‍රිකරණ තාක්ෂණ
- ආර්ථික විද්‍යාව, ජෛවමිතික සහ තොරතුරු තාක්ෂණය
- තාක්ෂණ හුවමාරු

2007 ශ්‍රේණියේ නව උක් ප්‍රභේද දෙකක් 2025 වර්ෂයේදී වාණිජ වගාව සඳහා නිකුත් කරන ලදී. පිරිසිදු බීජ නිෂ්පාදනය සඳහා ප්‍රවේශන 470ක් පමණ මෙරික්ලෝන කරන ලද අතර, කාබනික පෝෂණය, රිකිලි දැරීමේ හැකියාව මේරීම පිළිබඳ අධ්‍යයන සහ ඩ්‍රෝන යානා මඟින් වල්නාශක යෙදීම ආවරණය වන පරිදි ක්ෂේත්‍ර පර්යේෂණ පුළුල් කරන ලදී. විශ්ලේෂණ සේවා මඟින් පාංශු. පත්‍ර සහ උක් සාම්පල 100කට වැඩි ප්‍රමාණයක් විශ්ලේෂණය කිරීම. ගොවීන් සහ කර්මාන්ත අංශය සඳහා පුහුණු වැඩසටහන් 10කට අධික සංඛ්‍යාවක් පවත්වා, සහභාගිවන්නන් 250කට වඩා වැඩි පිරිසක් දැනුවත් කරන ලද අතර, ගොවි සංවිධාන වෙත හකුරු සහ සිරප් නිෂ්පාදනය සඳහා බීජ උක් ටොන් 15ක් පමණ බෙදා හරින ලදී.

## 37.2 ප්‍රගතිය 2025 සැප්තැම්බර් මස අවසානයට

### බෝග වැඩිදියුණු කිරීම

- 2007 ශ්‍රේණියේ නව උක් ප්‍රභේද දෙකක් වන SL 07 3505 සහ SL 07 3498 වාණිජ වගාව සඳහා නිකුත් කරන ලදී.
- ජාන සම්පත් ප්‍රවේශන 2,600කට අධික ප්‍රමාණයක් එන්සල්වත්ත (1,660) සහ උඩවලව (950) හි සංරක්ෂණය කරන ලදී.
- පිරිසිදු බීජ නිෂ්පාදනය සඳහා ප්‍රවේශන 470ක් පමණ මෙරික්ලෝන කරන ලදී.
- ජාන ප්‍රකාශන අධ්‍යයන සඳහා RNA නිස්සාරණය, cDNA සංස්ලේෂණය සහ PCR නිම කරන ලද අතර, දෙමුහුන් හඳුනා ගැනීම සඳහා DNA නිස්සාරණය සිදු කරන ලදී.
- 2018–2024 ශ්‍රේණිවල ක්ලෝනවල බහු-අදියර පරීක්ෂණ විවිධ කෘෂි-පාරිසරික කලාපවල PYT, RYT, සහ ගුණ කිරීමේ බිම් කොටස් හරහා ඉදිරියට ගෙන යන ලදී.

### බෝග සම්පත් කළමනාකරණය

- මෙරීමේ රටා, සිටුවීමේ ක්‍රම, රිකිලි දැරීමේ හැකියාව සහ පත්‍ර පෝෂක යෙදීම අධ්‍යයනය කිරීම සඳහා නව පර්යේෂණ අරඹන ලදී.
- Saflufenacil 68 g/L + Dimethenamid-P 600 g/L වල්නාශකය මත නව වල්නාශක පරීක්ෂාව සඳහා ඇගයීම් අවසන් කර ROP වෙත වාර්තා ඉදිරිපත් කරන ලදී.
- ඩ්‍රෝන යානා පාදක කරගත් වල්නාශක යෙදවීම සඳහා මාර්ගෝපදේශ ආරම්භ කරන ලද අතර, නව වල්නාශක ඇගයීමට ලක් කරන ලදී.
- කිලිනොච්චි සංවර්ධන ව්‍යාපෘතිය නව වගාවන්, තවාන් නැවත සිටුවීම සහ ගොවි පුහුණු වැඩසටහන් සමඟ පුළුල් කරන ලදී.

### බෝග පෝෂණය

- හිඟුරාන සහ ඇතිමලේ හි පාංශු සමීක්ෂණ සහ ඩිජිටල් සිතියම්කරණය අවසන් කරන ලද අතර, අතුරු පොහොර නිර්දේශ ලබා දීම සිදුකරන ලදී.
- සෙවනගල දී GIS සිතියම්කරණය සහ පාංශු සාම්පල යොදා ගනිමින් ස්ථානවිශේෂිත පොහොර-කළමනාකරණ අධ්‍යයන සිදු කරන ලදී.
- SL 96 128 සහ Co 0775 යන උක් ප්‍රභේද යොදා ගනිමින් කාබනික පෝෂණ පර්යේෂණ සිදු කරන ලදී.
- ක්ෂේත්‍ර මට්ටමේ පරීක්ෂණ සඳහා උක් බොයිලේරු අළු වලින් නයිට්‍රජන් වලින් පොහොසත් කාබන් පොහොර නිෂ්පාදනය කරන ලදී.
- පර්යේෂණ අංශ, උක් කර්මාන්ත සහ රේගුව ඇතුළු බාහිර ගනුදෙනුකරුවන්ට සහාය වීම සඳහා පාංශු, පත්‍ර සහ උක් සාම්පල සඳහා විශ්ලේෂණ සේවා සපයන ලදී.

### බෝග ආරක්ෂණය

- උගුල් බෝගක් වන IND 8180 ශාකයට සාපේක්ෂව ඉහල පත්‍ර ආසාදන මට්ටමක් පෙන්නුම් කළ අතර, එය උක් ශාකයට හානි කරන කඳ විදින සලබයන් හසු කරගැනීමේ ඉහල විභවතාවයක් පෙන්වයි.
- B. bassiana සහ Metarhizium ඇතුළු කීට රෝගකාරක දිලීර, කඳ විදින්නන්, වෙයන් සහ WLD රෝග වාහකයන් පාලනය කිරීම සඳහා හුදකලා කර අධ්‍යයනය කරන ලදී.
- වෙයන් පාලනය සඳහා ශාක පාදක පෙති නිපදවා ක්ෂේත්‍රයේ පරීක්ෂා කරන ලදී.
-

- බහු ශ්‍රේණිවල ) 2012, 2013, 2014, 2015, සහ 2016) ප්රභේද Smut, LSD, සහ WLD සඳහා ප්රතිරෝධය පරීක්ෂා කරන ලදී.
- ක්ෂේත්‍ර පරීක්ෂාවන් සහ WLD වාහක ගහන සමීක්ෂණ ඇතුළුව කර්මාන්ත සහ ගොවීන් සඳහා බෝග ආරක්ෂණ සේවා සපයන ලදී.

**සැකසුම් තාක්ෂණය**

- උක් ආශ්‍රිත වට්නාකම් එකතු කළ නිෂ්පාදන වන වයින්, මින්ට් රසැති හකුරු, කාබනික සිරප් සහ බැගැස් වලින් ආහාරයට ගත හැකි තන්තු පිළිබඳ පර්යේෂණ සිදු කරන ලදී.
- උක් කාබනික වගාව උක් හකුරු වල ගුණාත්මකභාවයට සිදුවන බලපෑම අධ්‍යයනය කිරීම සඳහා පර්යේෂණ සිදු කරන ලදී.
- ජෛව පොහොර සඳහා ඇති හැකියාව විශ්ලේෂණය කිරීම සඳහා ක්ෂුද්‍ර ජීවීන් අනු-වගා කරන ලදී.
- උක් හකුරු සාදන උඳුනක කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා බැගැස් පහසුවෙන් ඇතුල් කිරීමට උපකරණයක් නිර්මාණය කරන ලදී.
- තෝරාගත් උක් ප්‍රභේදවල අස්වනු නෙලීමෙන් පසු සිදුවන හානි සහ දාහක කාර්යක්ෂමතාව මනින ලදී.

**යාන්ත්‍රීකරණ තාක්ෂණය**

- SRI, ගල්-ඔය සහ සමාගම පැල්වත්ත ඒකකයේහි පිහිටි උණු වතුර ප්‍රතිකාර (HWT) පද්ධති නඩත්තු කර ඇගයීමට ලක් කරන ලදී.
- HWT පද්ධතිවල හදිසි අලුත්වැඩියාවන් සහ බලශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීම් සිදු කරන ලදී.
- කාබනික පොහොර කැට සහ කුඩු පොහොර සඳහා වන පොහොර යොදන යන්ත්‍රයක් ක්ෂේත්‍ර පරීක්ෂණ වලදී ඇගයීමට ලක් කරන ලදී.

**ආර්ථික විද්‍යාව, ජෛවමිතික සහ තොරතුරු තාක්ෂණය**

- සීනි කර්මාන්තයේ සැපයුම් දාම විශ්ලේෂණය සඳහා ගොවි සමීක්ෂණ ප්‍රශ්නාවලියක් සකස් කරන ලදී.
- 2024 වර්ෂයේ උක් වල වාණිජ වට්නාකම විවිධ සීනි කම්හල් ඒකක හරහා ඇස්තමේන්තු කරන ලදී.
- විවිධ සීනි කම්හල් ප්‍රදේශ සඳහා උක් වගාවේ පිරිවැය-ප්‍රතිලාභ විශ්ලේෂණයන් යාවත්කාලීන කරන ලදී.
- ක්ෂේත්‍ර පරීක්ෂණ සැලසුම්, සංඛ්‍යානමය සත්‍යාපනය සහ දත්ත විශ්ලේෂණය සඳහා ජෛවමිතික සහාය සපයන ලදී.
- ජාල වැඩිදියුණු කිරීම් සහ අලුත්වැඩියාවන් මගින් ආයතන පුරා තොරතුරු තාක්ෂණ සේවා ශක්තිමත් කරන ලදී.

**තාක්ෂණ හුවමාරුව සහ සංවර්ධනය**

- උක් හකුරු සහ උක් සිරප් නිෂ්පාදන ව්‍යාපෘති සඳහා ගොවි සංවිධාන වෙත බීජ උක් ටොන් 16ක් පමණ බෙදා හරින ලදී.
- ගොවීන්, කර්මාන්ත කාර්ය මණ්ඩලය සහ සිසුන් ඇතුළුව සහභාගිවන්නන් 250කට වඩා වැඩි පිරිසකට ප්‍රතිලාභ ලබා දෙමින් පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් 10කට වඩා වැඩි ප්‍රමාණයක් පවත්වන ලදී.
- සීනි කර්මාන්තයේ පාර්ශවකරුවන් සඳහා ඩ්‍රෝන තාක්ෂණය සහ ICT යෙදුම් පිළිබඳ වැඩමුළු සංවිධානය කරන ලදී.

- SL 00 652 සහ SL 96 128 ඇතුළු නිරූපණ සහ ප්‍රභේද බිම් කොටස් උක් පර්යේෂන ආයතනයේ ගොවිපලෙහි නඩත්තු කරන ලදී.

- SRI පුවත් පත්‍රිකාව වෙළුම (13) සහ වාර්ෂික වාර්තාව 2023 ප්‍රකාශන අවසන් කර බෙදා හරින ලදී.

## 37.3 අනාගත සැලැසුම් - 2026

- උක් ජාන සම්පත් ප්‍රවේශනවල ගති ලක්ෂණ හඳුනා ගැනීම.
- හිඟුරාන සහ ඇතිමලේ පාංශු ලක්ෂණ හඳුනා ගැනීම.
- හිඟුරාන උක් වගා කරන ප්‍රදේශය සඳහා ඩිජිටල් පාංශු සිතියම් සංවර්ධනය කිරීම.
- උක් නිෂ්පාදන අලෙවිසැලක් ස්ථාපිත කිරීම.
- පාර්ශවකරුවන් සඳහා NVQ සහතික පාඨමාලා සංවර්ධනය කිරීම.
- උක් වගාව සඳහා ස්ප්‍රේ ඩ්‍රෝන යෙදවීම සඳහා නිර්දේශ ලබා දීම.
- පර්යේෂණ මඟින් සංවර්ධනය කරන ලද නිෂ්පාදන සහ ප්‍රොටෝකෝල වාණිජකරණය කිරීම සහ බුද්ධිමය දේපළ අයිතිවාසිකම් (IPs) ලබා ගැනීම.

# 38

# ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (SLEDB)

## 38.1 හැඳින්වීම

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) 1979 වර්ෂයේ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත් අංක 40 යටතේ පිහිටුවන ලද අතර, ශ්‍රී ලංකාවේ අපනයන ක්ෂේත්‍රයේ සංවර්ධනය සහ ප්‍රවර්ධනය සඳහා ප්‍රධාන ආයතනයක් ලෙස කටයුතු කරයි. අපනයන සංවර්ධන මණ්ඩලය, තම කාර්යභාරය ඉටු කිරීමේදී ප්‍රතිපත්ති උපදේශක, නිරීක්ෂක, ප්‍රවර්ධක, පහසුකම් සැපයුම්කරුවා සහ දැනුම් සපයන්නා ලෙස කටයුතු කරමින්, රජයේ සංවර්ධන අරමුණු සහ ශ්‍රී ලංකාවේ ගෝලීය තරඟකාරීත්වය ශක්තිමත් කිරීමේ අරමුණ ඉලක්ක කරගනී. තවද, 2025 වර්ෂය වනවිට භාණ්ඩ සහ සේවා අපනයනවලින් ඇමරිකානු ඩොලර් බිලියන 18.2ක් උපයා ගැනීමේ අරමුණ සපුරා ගැනීමට, යාවත්කාලීන කළ ප්‍රවර්ධන මාර්ගෝපදේශයක් සකස් කර ඇත.

2025 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ, භාණ්ඩ සහ සේවා අපනයන එකතුව ලෙස ශ්‍රී ලංකාවේ සමස්ත අපනයන ආදායම ඇමරිකානු ඩොලර් බිලියන 12.96 ක් වාර්තා වී ඇති අතර, මෙය 2024 වර්ෂයේ අනුරූප කාල පරාසය සමඟ සැසඳුමේදී 6.7% ක වර්ධනයක් පෙන්වයි. සැප්තැම්බර් අවසන් වන විට වාර්ෂික ඉලක්කය වන ඇමරිකානු ඩොලියර් 18.2 බිලියනයේ 70.86% ක් සම්පූර්ණ වීම, ශ්‍රී ලංකා අපනයන ක්ෂේත්‍රයේ ස්ථාවරත්වය සහ EDB විසින් ක්‍රියාත්මක කරන ප්‍රවර්ධන උත්සාහයන්ගේ කාර්යක්ෂමතාව දැක්වයි.

## 38.2 ප්‍රගතිය 2025 සැප්තැම්බර් මස අවසානයට

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ප්‍රධාන ව්‍යාපෘති ක්ෂේත්‍ර 7 යටතේ ක්‍රියාකාරකම් 126ක් සැලසුම් කර තිබේ, ඒවා අතර ප්‍රතිපත්ති පිළිබඳ වැඩපිළිවෙළ, වෙළඳපොළ තොරතුරු සහ අපනයන ප්‍රමුඛ ආයෝජන, වෙළඳ ප්‍රවර්ධන, වෙළඳ සන්නාමය, වෙළඳ පහසුකම් සැපයීම, කුඩා සහ මධ්‍යම ව්‍යවසාය සංවර්ධනය, සහ තොරතුරු තාක්ෂණය ඇතුළත් වේ. 2025 සැප්තැම්බර් අවසන් වන විට, සැලසුම් කරන ලද ක්‍රියාකාරකම්වල 55% ක භෞතික ප්‍රගතියක් ලගා කරගෙන ඇති අතර, වසරේ වෙන්කර තිබූ රුපියල් මිලියන 300 මුදලෙන් රුපියල් මිලියන 130.39 ක් වියදම් කර ඇත. සමහර ක්‍රියාකාරකම් අපනයනකරුවන් සහ පෞද්ගලික අංශ අතර සහයෝගීතාවයෙන් සිදු වී ඇති අතර, අපනයනකරුවන්ගේ ආධාර රුපියල් මිලියන 373.1 ක්, සහ පෞද්ගලික අංශ ආධාර රුපියල් මිලියන 36.8 ක් ලෙස වාර්තා වී ඇත. මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී, අපනයන සංවර්ධන අමාත්‍ය මණ්ඩල රැස්වීම් පැවැත්වීම සහ 2025–2029 ජාතික අපනයන සංවර්ධන සැලැස්ම නිර්මාණය කිරීම වැනි වැදගත් උත්සාහයන් සිදු කරන ලදී.

### අපනයන පිළිබඳ රාජ්‍ය සම්බන්ධීකරණය

අපනයනකරුවන් මුහුණ දෙන අභියෝග පිළිබඳ ප්‍රතිචාර ලෙස, අපනයන සංවර්ධන අමාත්‍ය මණ්ඩලය (EDCM) ගරු ජනාධිපතිතුමාගේ සභාපතිත්වයෙන් සහ ප්‍රධාන අමාත්‍යවරුන්, ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පැවැත්විය. මෙම මණ්ඩලය අපනයන සංවර්ධන සම්බන්ධතා ඉහල මට්ටමකින් නැවත ආරම්භ කරමින්, 2030 වන විට ඇමරිකානු ඩොලර් බිලියන 36ක අපනයන ඉලක්කය ඉටු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ව්‍යුහගත බාධක විසඳීම සහ ගෝලීය තරඟකාරීත්වය ශක්තිමත් කිරීමේ රජයේ කැපවීම ප්‍රදර්ශනය කරයි.

2025 වර්ෂයේදී ජනාධිපති ලේකම් කාර්යාලයේ පැවැත්වූ රැස්වීම් දෙකකදී මූලික වශයෙන් දේශීය කර්මාන්ත නැවත සක්‍රීය කිරීම, විදේශ ආයෝජන ආකර්ෂණය, අපනයන- මූලික ආර්ථිකයට පරිවර්තනය වේගවත් කිරීම සහ අඩු වියදම් සහ යහපත් යටිතල පහසුකම් මගින් සහයෝගී පරිසරයක් නිර්මාණය කිරීම පිළිබඳව සාකච්ඡා කරන ලදී.

ජනාධිපති ලේකම් කාර්යාලයේ පැවැත්වූ රැස්වීම්



මෙම රැස්වීම්වලදී හඳුන්වා දෙන ලද ප්‍රධාන උත්සාහයන් අතර සංචාරකයින් සඳහා VAT ආපසු ගෙවීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීම, කටුනායක ගුවන්තොටුපළේ ස්වයංක්‍රීය අපනයන පරීක්ෂණ පහසුකම් පිහිටුවීම, සහ දුම්රිය එන්ජින්වල දේශීය පරීක්ෂණයට අනුමැතිය ලබාදීම ඇතුළත් වේ. EDCM මණ්ඩලය තවත් ප්‍රමුඛ අවධානයක් යොමු කළේ නවීන තාක්ෂණ භාවිතය, නවීන / පුනර්ජනනීය බලශක්තිය හඳුන්වා දීම හා, නිෂ්පාදන වියදම් අඩු කිරීම සහ තරඟකාරීත්වය වැඩි කිරීම සඳහා නවීන තාක්ෂනය හඳුන්වා දීම කෙරෙහිය. අමතර ක්‍රියාමාර්ග අතර මැණික් හා රන් ආභරණ අංශයට විශේෂ සහාය, ඉලෙක්ට්‍රොනික නිෂ්පාදකයන් සඳහා රේගු පහසුකම්, අපනයන ක්‍රියාවලීන් සඳහා ඩිජිටල් ක්‍රමවේද සහ සේවා අපනයන සඳහා බැංකු ගැරන්ටි සීමා ඉහළ දැමීම ඇතුළත් වේ.

දෙවන රැස්වීමේදී, ගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මහතාගේ සභාපතිත්වයෙන් මෙම ක්‍රියාමාර්ගවල ප්‍රගතිය සමාලෝචනය කරන ලදී. මැණික් හා රන් ආභරණ, ඖෂධ, කුකුල් මස්, තේ සහ කුළු බඩු

වර්ගවලට ප්‍රමුඛතාව දෙන ලදී. එමෙන්ම ත්‍රිකුණාමලේ වරාය සංවර්ධනය, අපනයන මධ්‍යස්ථානය ආකෘති ප්‍රවර්ධනය, නව අපනයන-සම්බන්ධ ආයෝජන ආකර්ෂණය, සහ බදු ව්‍යුහය සම්බන්ධ ගැටළු විසඳීමට ද අවධානය යොමු කළේය.

### ජාතික අපනයන සංවර්ධන සැලැස්ම 2025–2029

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය, කර්මාන්ත හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති-මූලික ණය වැඩසටහන යටතේ ආසියානු සංවර්ධන බැංකුව (ADB) සමඟ එක්ව ජාතික අපනයන සංවර්ධන සැලැස්ම (NEDP) 2025–2029 ආරම්භ කර ඇත. NES 2018–2022 මත පදනම්ව, NEDP ශ්‍රී ලංකාවේ අපනයන අංශය ශක්තිමත් කිරීම සඳහා දත්ත මූලික සැලැස්මක් සපයයි. මෙහිදී ඩිජිටල්කරණය, තිරසාරභාවය, වෙළඳ පහසුකම් සැපයීම, ගෝලීය තරඟකාරීත්වය, යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ තාක්ෂණ නව්‍යකරණය මූලික කර ඇත.

2025 අප්‍රේල් සහ ජූනි මාසවලදී සිදු කළ පාර්ශවකරුවන්ගේ සාකච්ඡා සහ වෙළඳ පරිසරයෙන් ලබාගත් තොරතුරු ජාතික අපනයන සංවර්ධන සැලැස්ම සඳහා මාර්ගෝපදේශය සපයයි. සැප්තැම්බර් සිට නොවැම්බර් 2025 දක්වා නිර්මාණාත්මක සාකච්ඡා මෙහෙයුම් දෙකක් පැවැත්වෙන අතර, එහිදී වෙළඳ ප්‍රවාහන හා සැපයුම් කළමනාකරණය, වෙළඳ පහසුකම්, ප්‍රමිතීන්, ගුණාත්මකභාවය, තිරසාරභාවය, වෙළඳ මූල්‍ය සහ ආයෝජන වාතාවරණ, වෙළඳ ප්‍රවර්ධන, වෙළඳ සබඳතා, ව්‍යවසාය, නව්‍යකරණය සහ කුසලතා පිළිබඳව සාකච්ඡා කෙරේ. ජාතික අපනයන සංවර්ධන සැලැස්ම (NEDP) 2025–2029, 2025 අවසන් වන විට අවසන් කිරීමට බලාපොරොත්තු වන අතර, 2030 වන විට ඇමරිකානු ඩොලර් බිලියන 36 ක අපනයන ඉලක්කය සාක්ෂාත් කර ගැනීම සඳහා පුළුල් සැලැස්මක් සපයයි. මෙය ශ්‍රී ලංකා අපනයන අංශයට ශක්තිමත්, ස්ථිර සහ තිරසාර වර්ධනයක් සපයන අතර, ගෝලීය වෙළඳපොළ සමඟ ගැඹුරු සම්බන්ධතා ස්ථාපිත කරයි.

### අපනයන ප්‍රවර්ධන

### අන්තර්ජාතික වෙළඳ ප්‍රදර්ශන

2025 වර්ෂයේදී, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය ජාත්‍යන්තර ප්‍රදර්ශනවල ශ්‍රී ලංකා සමාගම් 142කට (කුඩා සහ මධ්‍යම ව්‍යවසාය 66ක් ඇතුළුව) සහභාගී වීමට පහසුකම් සලසා දුන් අතර, ඒ අතර Gulfood, Biofach, IFE (UK), Hong Kong Gift & Lifestyle Fair, Natural & Organic Product UK, Foodex Saudi 2025, Seafood Expo Global, SIAL Canada, Japan IT Week, Thaifex Anuga Asia, සහ Middle East Rubber & Tyre Expo වැනි ප්‍රමුඛ ජාත්‍යන්තර ප්‍රදර්ශන ඇතුළත් වේ. මෙම ප්‍රදර්ශන ශ්‍රී ලංකා අපනයනකරුවන්ට වෙළඳපොළ ප්‍රවේශය පුළුල් කිරීමේ සහ ගෝලීය දෘශ්‍යමානතාව ශක්තිමත් කිරීමේ අවස්ථා සපයයි.

අන්තර්ජාතික වෙළඳ ප්‍රදර්ශන



### දේශීය වෙළඳ ප්‍රදර්ශන

දේශීය වෙළඳ ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින්, Complast Rubber Expo 2025 වැනි ප්‍රදර්ශන සංවිධානය කරන ලදී. එහිදී, EDB ප්‍රදර්ශන කුටි මඟින් ව්‍යාපාරික සම්බන්ධතා පිහිටුවීම සඳහා අවස්ථා සපයන ලද අතර හා ශ්‍රී ලංකා කර්මාන්ත හැකියාවන්ද ප්‍රදර්ශනය කරන ලදී. Footwear & Leather Fair 2025, BMICH හි දීපෙබරවාරි 6 සිට 9 දක්වා සාර්ථකව පැවැත් වූ අතර, කුඩා සහ මධ්‍යම ව්‍යවසායක සමාගම් 7ක් EDB ප්‍රදර්ශන

කුටි යටතේ සහභාගී විය. ප්‍රදර්ශකවරු 38 දෙනෙකු නව ව්‍යාපාර සම්බන්ධතා පිහිටුවමින්, මුළු විකුණුම් රුපියල් මිලියන 1.9 ක් වාර්තා කළහ. මෙම ප්‍රදර්ශනය නැරඹීමට 26,900 පමණ පිරිසක් පැමිණියහ.

### ධාරිතා සංවර්ධන වැඩසටහන්

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය, කුඩා සහ මධ්‍යම ව්‍යවසායක සමාගම් සහ කාන්තා ව්‍යවසායකයින් සඳහා තාක්ෂණික සහ වෙළඳපොළ සංචාර සංවිධානය කර, වෙළඳ රැස්වීම්, වෙළඳ ප්‍රවණතා සහ අපනයන අවශ්‍යතා පිළිබඳ ප්‍රායෝගික දැනුම ලබා දී ඇත. නැගෙනහිර පළාතේ ව්‍යවසායකයින් 250කට පමණ කුසලතා, දැනුම් හුවමාරු සහ අපනයන සඳහා සූදානම කිරීම් ශක්තිමත් කරන ලදි.

අත්කම්, තෑගි භාණ්ඩ, සහ සෙල්ලම් තෑගි භාණ්ඩ බඩු පිළිබඳව දැනුවත් කිරීමේ සැසිවලදී, කුඩා සහ මධ්‍යම ව්‍යවසායකයින් 100කට අපනයන අවස්ථා, ඇසුරුම්කරණ, ඩිජිටල් වෙළඳපොළ, ලොජිස්ටික්ස් සහ කර්මාන්ත නායකයින්ගේ අත්දැකීම් හුවමාරු කිරීමට අවස්ථා සලසා දුන්හ.

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සහ JICA ආයතනය 2024 දී ආරම්භ කළ strategic partnership වැඩසටහන යටතේ ශ්‍රී ලංකා ICT/BPM SME සහ startups 30කට වෙළඳ න්‍යාය, පුහුණුකිරීම, matchmaking, Proof of Concept (POC) අරමුදල, සහ ToT පුහුණුව ලබා දී, නව්‍යකරණය, තාක්ෂණ හුවමාරු සහ ජපානය සමඟ වෙළඳ සබඳතා ශක්තිමත් කරයි. මෙය 2026 දක්වා පැවැත්වෙන අතර, අලුත් වෙළඳ අවස්ථා උදා කරයි.

2025 සැප්තැම්බර් මාසයේදී, ජාතික කාබනික පාලන ඒකකය (NOCU) අනුරාධපුර දිස්ත්‍රික්කයේ සිව්වන වතාවට දිවයින පුරා වැඩසටහනක් සංවිධානය කර, කාබනික සහතිකය (SLS 1324:2018), තිරසාර ක්‍රියාපටිපාටි සහ ඩිජිටල් වෙළඳපොළ පිළිබඳ අධ්‍යාපනමය දැනුම ලබා දෙන ලදී.

### අපනයනකරුවන් සඳහා පහසුකම්

25වන අපනයනකරුවන්ගේ රාජ්‍ය මණ්ඩල රැස්වීම, කර්මාන්ත හා ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමාගේ සභාපතිත්වයෙන් පැවැත්වූ අතර, එහිදී ගැටළු 37ක් සාකච්ඡා කර, ගැටළු 2ක් විසඳූ අතර, අනෙකුත් ගැටළු සඳහා මාර්ගෝපදේශය ලබා දුන්හ. මෙම අවස්ථාවෙන් රජයේ අපනයන සහාය සහ මහජන හා පෞද්ගලික අංශ අතර සහයෝගීතාවය ශක්තිමත් කිරීමේ කැපවීම ප්‍රදර්ශනය විය. රැස්වීමේදී ප්‍රධාන අමාත්‍යවරු, නිලධාරීන් සහ විවිධ අංශ නියෝජිතයින් සහභාගී විය.

### විශේෂ ක්‍රියාකාරකම්

26 වන ජනාධිපති අපනයන සම්මාන උලෙල 2025 පෙබරවාරි මාසයේදී පැවැත්වුණි. මෙම අවස්ථාවට ජනාධිපතිතුමා, අමාත්‍යවරු සහ රාජ්‍ය තානාපතින් ඇතුළු අමුත්තන් 1,500ක් සහභාගී වූ අතර, අපනයන ක්ෂේත්‍රයේ සාර්ථකවීම් සැමරීම හා ජාතික ආර්ථිකයේ අපනයන වැදගත්කම තහවුරු කිරීමේ අවස්ථාවක් විය.

26 වන ජනාධිපති අපනයන සම්මාන 2023/24 හි සම්මාන 82ක් අපනයනකරුවන්ට පිරිනමන ලදී. මෙයට ප්‍රධාන සම්මාන 62ක් (14 සමස්ත, 48 කර්මාන්ත, කෘෂිකර්මාන්ත, සේවා සහ අංශ වර්ග) සහ 20 merit awards ඇතුළත් වේ.

**ජනාධිපති අපනයන සම්මාන උලෙල 2025**



EDB සහ ජර්මනියේ Import Promotion Desk අතර ඇති සහයෝගීතාවය ස්වභාවික සහ සැකසුම් කළ ආහාර වලට අමතරව, ශ්‍රී ලංකාවේ ඩිජිටල් නිෂ්පාදන සහ සේවා ක්ෂේත්‍රය සඳහාද දියුණු කරන ලදි. මෙය කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායක සමාගම් සඳහා යුරෝපීය වෙළඳපොළ ප්‍රවේශය, තිරසාරභාවය සහ නියාමන පුහුණුව, උපදේශන සේවා, ව්‍යාපාර උපදේශනය, matchmaking සහ වෙළඳ උළෙල සහ sourcing මෙහෙයුම්වලට සහභාගී වීමේ අවස්ථා ලබා දේ. එමෙන්ම, කාන්තා නායකත්වය සහිත ව්‍යවසාය ශක්තිමත් කරමින්, EDB උපදේශන හැකියාව වැඩිදියුණු කරයි.

## 38.3 අනාගත සැලැසුම් - 2026

ජාතික සංවර්ධන ඉලක්කයන් සහ 2030 වන විට අපනයන ආදායමෙන් ඇමරිකානු ඩොලර් බිලියන 36 ක් ලබා ගැනීමේ ශ්‍රී ලංකා රජයේ ඉලක්කයට අනුකූලව, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) 2026-2030 කාලය සඳහා විස්තීර්ණ ආයතනික සැලැස්මක් සකස් කරමින් සිටී. මෙම උපායමාර්ගික සැලැස්ම සැලසුම් කර ඇත්තේ ප්‍රතිඵල දායක, තිරසාර වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කිරීමෙන් රටේ අපනයන අංශය නවීකරණය කිරීම, පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා ය.

### ප්‍රමුඛ ව්‍යාපෘති (2026–2028)

2025–2030 සඳහා වන උපායමාර්ගික සැලසුමේ කොටසක් ලෙස, ශ්‍රී ලංකාවේ අපනයන කාර්ය සාධනය සැලකිය යුතු ලෙස ඉහළ නැංවීම අරමුණු කරගත් ප්‍රමුඛ ව්‍යාපෘති දෙකක් ක්‍රියාත්මක කිරීම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලයට රජයේ අනුමැතිය ලැබී තිබේ. පළමු ව්‍යාපෘතිය වන ශ්‍රී ලංකා එක්ස්පෝ (Sri Lanka Expo) 2026, ලබන වසරේ දී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනයක් වන අතර එහි ඇස්තමේන්තුගත ආයෝජනය රුපියල් මිලියන 450 කි. මෙම වැඩසටහනට දේශීය අපනයන විභවය ගෝලීය ගැනුම්කරුවන්ට, ආයෝජකයින්ට සහ කොටස්කරුවන්ට ප්‍රදර්ශනය කිරීමෙන් ඇමරිකානු ඩොලර් මිලියන 1,000 ක විදේශ විනිමයක් උපයා ගැනීමට අපේක්ෂා කෙරේ.

දෙවන ව්‍යාපෘතිය වන **"Creative Sri Lanka 2030"**, මගින් හස්ත කර්මාන්ත සහ අනෙකුත් නිර්මාණාත්මක කර්මාන්තවල ශ්‍රී ලාංකික සන්නාම දහයක් සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම ඉලක්ක කරයි. රුපියල් මිලියන 21 ක සැලසුම්ගත ආයෝජනයක් සමඟින්, මෙම ව්‍යාපෘතිය 2026 වන විට ඇමරිකානු ඩොලර් මිලියන 3 ක අපනයන ආදායමක් උපයා ගැනීම අරමුණු කරන අතර එමඟින් ජාත්‍යන්තර වෙළඳපොළ තුළ ශ්‍රී ලාංකික නිර්මාණාත්මක නිෂ්පාදනවල දෘශ්‍යතාව සහ තරඟකාරිත්වය වැඩි දියුණු වේ.

මීට අමතරව, දැනට ක්‍රියාත්මක කර ඇති වැඩසටහනක් වන **"ජාතික අපනයන සන්නාම සංවර්ධන වැඩසටහන"** ඉදිරි වසර තුන තුළත් අඛණ්ඩව දියත්කෙරෙන අතර, ඒ සඳහා රුපියල් මිලියන 20 ක් වෙන් කර ඇත. මෙම ව්‍යාපෘතිය මඟින් ජාතික අපනයන සන්නාමය ශක්තිමත් කිරීම සහ ගෝලීය වෙළඳපොළ තුළ ස්ථානගත කිරීම වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් ඇමරිකානු ඩොලර් මිලියන 50 ක අපනයන ආදායමක් උපයා ගැනීමට අපේක්ෂා කෙරේ.

### ප්‍රධාන උපායමාර්ගික ක්‍රියාමාර්ග සහ වැඩසටහන් (2025–2030)

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) විසින් එහි ආයතනික සැලැස්ම සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා, 2025 සහ 2030 අතර සිදු කළ යුතු ප්‍රධාන උපායමාර්ගික ක්‍රියාමාර්ග සහ වැඩසටහන් මාලාවක් දක්වා ඇත. වඩාත්ම වැදගත් කාර්යයන්ගෙන් එකක් වන්නේ **"ජාතික අපනයන සංවර්ධන සැලැස්ම"(NEDP 2025-2029)** ක්‍රියාත්මක කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව (ADB) සමඟ

සහයෝගයෙන් කටයුතු කිරීමයි. එය 2030 වන විට ශ්‍රී ලංකාව ඇමරිකානු ඩොලර් බිලියන 36 ක ජාතික අපනයන ඉලක්කයක් කරා මෙහෙයවන ප්‍රධාන ව්‍යාපෘතිය ලෙස ක්‍රියා කරයි. මීට අමතරව, ප්‍රතිපත්ති මට්ටමේ අපනයන ගැටළු විසඳීම සඳහා **අපනයන සංවර්ධන අමාත්‍ය මණ්ඩල සභාව (EDCM)** සක්‍රීය කිරීමට ද EDB කටයුතු කළ අතර, 2026 වර්ෂය සඳහා ද සැසියක් සැලසුම් කර ඇත.

ඊට සමගාමීව, දේශීය අපනයනකරුවන් අතර දැනුම සහ නිපුණතා වැඩි දියුණු කිරීම සඳහා **අපනයනකරුවන් දැනුවත් කිරීම සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන්** 50 කට අධික සංඛ්‍යාවක් පවත්වනු ලැබේ. වාර්ෂිකව සිව් වතාවක් පැවැත්වීමට නියමිත **අපනයනකරුවන්ගේ සංසදය,** අපනයනකරුවන්ට විශේෂිත වූ අභියෝග විසඳීම සහ සංවාදයට පහසුකම් සැලසීම සඳහා ව්‍යුහගත වේදිකාවක් සපයනු ඇත. තවද, **ශ්‍රී ලංකා අපනයන මූල්‍ය පහසුකම් වැඩසටහන (SLEFFP)** ජාත්‍යන්තර වෙළඳපොළට පිවිසීමේ ක්‍රියාකාරකම් සඳහා අපනයනකරුවන් 100 දෙනෙකුට ඉලක්කගත මූල්‍ය ආධාර ලබා දෙන අතරම අත්‍යවශ්‍ය සහතික කිරීම්, තාක්ෂණික වැඩිදියුණු කිරීම්, ඇසුරුම්කරණය සහ ලේබල් කිරීම වැඩිදියුණු කිරීම සඳහා සමාගම් 70 කට සහාය වනු ඇත. අපනයන ප්‍රජාව තුළ විශිෂ්ටත්වය හඳුනා ගැනීම සහ දිරිගැන්වීම සඳහා **ජනාධිපති අපනයන සම්මාන උළෙල** පැවැත්වීමේ සම්ප්‍රදාය ද ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) විසින් දිගටම කරගෙන යනු ඇත. මෙම උත්සාහයන්ට අනුපූරකව, වෙළඳපල ප්‍රවේශය පුළුල් කිරීම සහ ශ්‍රී ලාංකික නිෂ්පාදන ගෝලීය වශයෙන් ප්‍රවර්ධනය කිරීම සඳහා **දේශීය හා ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශන, ව්‍යාපාරික නියෝජිත කණ්ඩායම් සහ B2B රැස්වීම්** මාලාවක් සංවිධානය කරනු ලැබේ. සාමූහිකව, මෙම වැඩසටහන් සැලසුම් කර ඇත්තේ ශ්‍රී ලංකාවේ අපනයන අංශය වර්ධනය, සහ ගෝලීය තරඟකාරිත්වය හමුවේ ඔරොත්තු දීමේ හැකියාව මෙහෙයවන ශක්තිමත්, අපනයන-හිතකාමී පරිසරයක් නිර්මාණය කිරීම සඳහා ය.

මෙම උපායමාර්ගික වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුළින්, අපනයනකරුවන්ට සහාය වන සක්‍රීය පරිසරයක් නිර්මාණය කිරීමට, ගෝලීය වෙළෙඳපොළ තුළ ශ්‍රී ලංකාවේ පැවැත්ම වැඩි දියුණු කිරීමට සහ දිගුකාලීන, ආර්ථික වර්ධනයක් ළඟාකර ගැනීමට ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය කැපවී සිටී. 2030 වන විට ශ්‍රී ලංකාවේ අපනයන අංශය ගෝලීය වෙළෙඳපොළ තුළ ගතික, තරඟකාරී සහ ඔරොත්තු දෙන බලවේගයක් ලෙස ස්ථානගත කිරීම ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයෙහි දැක්මයි.

# 39

# ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය (NPS)

## 39.1 හැඳින්වීම

ශ්‍රී ලංකාව 1966 වසරේදී ආසියානු ඵලදායිතා සංවිධානයේ සාමාජිකත්වය ලබාගැනීමෙන් අනතුරුව ජාතික ඵලදායිතා සංවිධානය (NPO) ස්ථාපිත වූ අතර, මෙම කාර්යය වඩාත් පුළුල් කිරීම සඳහා 1994 වසරේදී ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය ස්ථාපිත කරන ලදී. වර්තමානයේදී, ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය යටතේ ස්ථාපිතව ඇත. මෙම ආයතනයේ ක්‍රමික විකාශය සමගින් 1997 – 2006 දශකය “ඵලදායිතා දශකය” ලෙස නම්කරන ලද අතර, ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ දායකත්වය තුලින් විවිධ ආයතන හා ප්‍රජාව තුල ඵලදායිතා සංකල්ප බද්ධ වූ සංස්කෘතියක් නිර්මාණය විය. මෙම ක්‍රමවේදය අඛණ්ඩව ක්‍රියාත්මක වන අතර, පුහුණු වැඩසටහන්, ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන්, උපදේශන සේවා, ආසියානු ඵලදායිතා සංවිධානය හා එක්ව දියත් කරන විවිධ වැඩසටහන්, මාධ්‍ය හා ප්‍රවර්ධන වැඩසටහන්, තරඟාවලි හා සම්මාන ප්‍රදානෝත්සව වැනි නොයෙකුත් ක්‍රියාකාරකම් හරහා විවිධ ආයතන හා ප්‍රජාව වෙත ඵලදායිතා සංකල්ප, මෙවලම් හා තාක්ෂණය, ව්‍යාප්ත කිරීමේ මෙහෙවරක ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය මේ වනවිට ද කටයුතු කරනු ඇත. ප්‍රධාන වශයෙන්ම, රාජ්‍ය, අධ්‍යාපන, සේවා හා නිෂ්පාදන, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක හා ප්‍රජා යන ක්ෂේත්‍රයන් අරමුණු කර ගනිමින් නොයෙකුත් වැඩසටහන් වාර්ෂිකව දිවයින පුරා ක්‍රියාත්මක කරනු ලැබේ.

ආසියානු ඵලදායිතා සංවිධානය (Asian Productivity Organization) හා එක්ව නිරන්තරව කටයුතු කිරීම හේතුවෙන් විවිධ පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ, තාක්ෂණික විශේෂඥ සේවාවන්, විවිධ ව්‍යාපෘති, පර්යේෂණ, අත්දැකීම් හුවමාරු වැඩසටහන්, වැනි දෑ ක්‍රියාත්මක කිරීම මගින්, විවිධ මට්ටමේ ප්‍රතිලාභ ශ්‍රී ලංකාව වෙත ලැබෙන අතර, මෙමගින් "දැනුම කේන්ද්‍රික සමාජයක්" බිහිකිරීමට අවශ්‍ය පරිසරය ද මේ වනවිට ක්‍රියාත්මක වෙමින් පවතී.

### ප්‍රධාන කාර්යයන්

- මානව සම්පත හා ආයතනික විශිෂ්ඨත්වය සඳහා පුහුණු හා උපදේශන සේවාවන් ලබාදීම
- ජාතික ඵලදායිතා සම්මාන තරඟාවලිය හා සම්මාන ප්‍රදානෝත්සවය පැවැත්වීම
- ආසියානු ඵලදායිතා සංවිධානය සමඟ සහයෝගිතාවයෙන් ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- රාජ්‍ය, නිෂ්පාදන හා සේවා, අධ්‍යාපන, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක සහ ප්‍රජා යන විවිධ ක්ෂේත්‍රයන් සඳහා ඵලදායිතා ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම
- ඵලදායිතා විශේෂඥයන් බිහිකිරීම හා ආයතන සහතිකකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- විවිධ ක්ෂේත්‍රයන් ට අනුගත වූ සුවිශේෂී වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- මාධ්‍ය හා ප්‍රචාරණ වැඩසටහන් සිදුකිරීම

## 39.2 ප්‍රගතිය 2025 සැප්තැම්බර් මස අවසානයට

### මූල්‍ය ප්‍රගතිය

**ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම්**

| විස්තරය | ඇස්තමේන්තු මුදල රුපි. මිලි. | සත්‍ය වියදම රු. මි. | % |
|---|---|---|---|
| පුනරාවර්තන | 664.1 | 485.183 | 73% |
| ප්‍රාග්ධන | 83 | 33.788 | 41% |

*මූලාශ්‍රය: ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය*

### භෞතික ප්‍රගතිය

| ව්‍යාපෘතිය | ක්‍රියාකාරකම | ප්‍රධාන කාර්ය සාධක දර්ශකය | සංඛ්‍යාව | මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|---|
| 1.පුහුණුව හා උපදේශනය තුලින් මානව ප්‍රාග්ධනය හා ආයතනික විශිෂ්ඨත්වය වර්ධනය කිරීම | රාජ්‍ය අංශය සඳහා උසස් සහතික පත්‍ර පාඨමාලාව<br>ඵලදායිතාව හා ව්‍යාපාර ක්‍රියාවලි ප්‍රතිනිර්මාණය පිලිබඳ සහතික පත්‍ර පාඨමාලාව | පවත්වන ලද මොඩියුල සංඛ්‍යාව | 24 | 52% |
| | 5S විගණකවරුන් සඳහා පුහුණු වැඩසටහන්<br>ඵලදායිතා විශේෂඥයින් බිහිකිරීම සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන්<br>ඵලදායිතාවය හා ක්‍රියාවලි වැඩිදියුණු කිරීම පිලිබඳ සහතික පත්‍ර පාඨමාලාව<br>සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් ඵලදායිතා සංකල්ප තුලින් සවිබල ගැන්වීම සහ ප්‍රජා ඵලදායිතාවය පිලිබඳ ඵලදායිතා සංවර්ධන නිලධාරීන් වෙත ලබාදෙන පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන | පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව | 14 | |
| | ඵලදායිතාවය හා නව්‍යකරණය පිලිබඳ සහතික පත්‍ර පාඨමාලාව | පවත්වන ලද පාඨමාලා සංඛ්‍යාව | 44 | |

| ව්‍යාපෘතිය | ක්‍රියාකාරකම | ප්‍රධාන කාර්ය සාධක දර්ශකය | සංඛ්‍යාව | මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|---|
